**248 වන කාණ්ඩය - 2 වන කලාපය**
**தொகுதி 248 - இல. 2**
**Volume 248 - No. 2**

**2016 නොවැම්බර් 11 වන සිකුරාදා**
**2016 நவம்பர் 11, வெள்ளிக்கிழமை**
**Friday, 11th November, 2016**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය
විද්‍යුත් ඡන්ද ක්‍රමය සඳහා ඇඟිලි සලකුණු ලබා ගැනීම

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ආබාධිත රණවිරු උද්ඝෝෂණයට පහර දීම

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) - [ගරු මයන්ත දිසානායක මහතා] - පළමුවන වර කියවන ලදී

**විසර්ජන පනත් කෙටුම්පත, 2017 [පළමුවැනි වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**කල්තැබීමේ යෝජනාව:**
උතුර හා නැඟෙනහිර ඉගැන්වීම් කටයුතුවල ස්වේච්ඡාවෙන් නිරතවූවන් ගුරු සේවයට බඳවා ගැනීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயரது சான்றுரை
இலத்திரனியல் வாக்களிப்பு முறைமைக்காக கைவிரல் அடையாளம் பெறல்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
அங்கவீனமுற்ற படையினரின் ஆர்ப்பாட்டத்தின் மீதான தாக்குதல்

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
இலங்கை காப்புறுதி நிறுவகம் ( கூட்டிணைத்தல்) – [மாண்புமிகு மயந்த திசாநாயக்க] - முதன்முறை மதிப்பிடப்பட்டது

**ஒதுக்கீட்டுச் சட்டமூலம் , 2017 : [ஒதுக்கப்பட்ட முதலாம் நாள்]**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
வடக்கு, கிழக்கில் தொண்டர் அடிப்படையில் கற்பித்தோரை ஆசிரிய சேவையில் இணைத்தல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speakers Certificate
Obtain Fingerprints for Electronic Voting System

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Attack on Protest by Disabled War Heroes

PRIVATE MEMBERS' BILLS:
Sri Lanka Insurance Institute (Incorporation) - [The Hon. Mayantha Dissanayake] – Read the First time

APPROPRIATION BILL, 2017 - [First Allotted Day]:
Second Reading – Debate Adjourned

ADJOURNMENT MOTION:
Absorption of Volunteers Engaged in Teaching in North and East into Teachers' Service

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2016 නොවැම්බර් 11 වන සිකුරාදා***
*2016 நவம்பர் 11, வெள்ளிக்கிழமை*
*Friday, 11th November, 2016*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால) தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව,

2016 නොවැම්බර් මස 01 වන දින -

එකතු කළ අගය මත බදු (සංශෝධන) නමැති පනත් කෙටුම්පතෙහි ද;

2016 නොවැම්බර් මස 07 වන දින -

වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන);

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන); සහ

විසර්ජන (සංශෝධන)

නමැති පනත් කෙටුම්පත්වල ද, සහතික ගරු කථානායකතුමා විසින් සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### විද්‍යුත් ඡන්ද ක්‍රමය සඳහා ඇඟිලි සලකුණු ලබා ගැනීම
### இலத்திரனியல் வாக்களிப்பு முறைமைக்காக கைவிரல் அடையாளம் பெறல்
### OBTAIN FINGERPRINTS FOR ELECTRONIC VOTING SYSTEM

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තු සභා ගර්භයේ අලුතින් සවි කර ඇති සම්මන්ත්‍රණ පද්ධතියට සමගාමීව සවි කර තිබෙන විද්‍යුත් ඡන්ද ක්‍රමය සඳහා සෑම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේම ඇඟිලි සලකුණු ලබා ගැනීම අත්‍යවශ්‍ය බැවින්, ඒ සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජුලි 13 දිනැති අංක 1975/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008, 2009, 2010, 2011, 2012, 2013 සහ 2014 වර්ෂ සඳහා ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, පැරකුම් මාවත, අංක 942 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එස්. බොතේජු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගලගෙදර, මැදගොඩ, අංක 31 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.එම්. ආතර් අලුවිහාරේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මහින්ද අමරවීර මහතා - පැමිණ නැත
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - පැමිණ නැත

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇල්පිටිය, සිත්තරවත්ත, 11 කණුව දරන ස්ථානයේ පදිංචි ලංකා බුද්ධිනී ගාල්ලගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ත්‍රිකුණාමලය, මහදිවුල්වැව, 1 වෙනි පියවර, අංක 67 ආර් දරන ස්ථානයේ පදිංචි ඩී.එම්. ප්‍රසන්න කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) උඩකරවිට, ගඟ අද්දර හේන දරන ස්ථානයේ පදිංචි ආර්. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ශ්‍රී ලංකාවේ තිරිඟු නිෂ්පාදනය: විස්තර
### இலங்கையில் கோதுமை உற்பத்தி : விபரம்
### WHEAT PRODUCTION IN SRI LANKA: DETAILS

525/'16

**2. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ තිරිඟු වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා වසර පහ තුළ තිරිඟු නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම තිරිඟු මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් තිරිඟු ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) තිරිඟු නිෂ්පාදනය ඉහළ දැමීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டளவில் இலங்கையில் கோதுமை பயிர்செய்யப்பட்ட நிலப்பரப்பு எவ்வளவு;

(ii) 2010 தொடக்கம் 2015 வரையான ஐந்து வருட காலப்பகுதியில் கோதுமை உற்பத்தி ஆண்டுவாரியாக வெவ்வேறாக எத்தனை கிலோகிராம்;

(iii) அரசாங்கம் விவசாயிகளிடமிருந்து நேரடியாக கோதுமையைக் கொள்வனவு செய்கின்றதா;

(iv) ஆமெனில், கடந்த ஐந்து ஆண்டுகளில் அரசாங்கத்தினால் கொள்வனவு செய்யப்பட்ட கோதுமையின் அளவு ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கோதுமை உற்பத்தியை அதிகரிப்பதற்கு அரசாங்கம் நடவடிக்கை மேற்கொள்ளுமா;

(ii) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minster of Agriculture:

(a) Will he inform this House-

(i) the extent of land in which wheat has been grown in Sri Lanka by the year 2015;

(ii) the wheat production in each year during the five years from the year 2010 up to 2015 separately in kilogrammes;

(iii) whether the Government directly purchases wheat from farmers; and

(iv) if so, the quantity of wheat purchased in each year during the last five years separately ?

(b) Will he also inform this House-

(i) whether steps will be taken to enhance wheat production; and

(ii) if so, the aforesaid steps;

(c) If not, why?

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture) **

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ තිරිඟු වගා නොකෙරේ

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) තිරිඟු වගාවට අවශ්‍ය වන විශේෂිත දේශගුණික සාධක සහිත ශ්‍රී ලංකාවේ සීමිත ප්‍රදේශ කිහිපය සැලකීමේදී ඒවායේ ආර්ථික වශයෙන් ලාභදායී ලෙස වගාව සිදු කළ නොහැක.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අතුරු ප්‍රශ්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අතුරු ප්‍රශ්න නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 4 -716/'16- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 7 -811/'16- (2), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්නයටම අදාළවද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ප්‍රශ්නයට අදාළ ගරු ඇමතිතුමා දැන් මෙතැන හිටියා. ප්‍රශ්නයක් අහන වෙලාවේදී ඇමතිතුමා එළියට යනවා. මොකක්ද මේ කරන විකාරය? ඇමතිතුමා මේ පාර්ලිමේන්තු සභා ගැබේ මේ වනකම් ඉඳලා ප්‍රශ්නයක් මතු වන වෙලාවේදී ප්‍රශ්නයෙන් මඟ හරින සම්ප්‍රදායක් හදනවා.

ඇමතිවරු සියලුදෙනාම මේ සම්ප්‍රදාය අනුගමනය කළොත් මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? සෑම ඇමතිවරයෙක්ම තමන්ගේ ප්‍රශ්නය එන විට සභා ගැබෙන් එළියට යන සම්ප්‍රදායක් ඇති වුණොත් මේ ප්‍රශ්න ඇසීමෙන් ඇති වැඩේ මොකක්ද? එම නිසා අදාළ අමාත්‍යවරයා මේ සභාවට ඇවිල්ලා පිළිතුරු දෙන්න ඕනෑ, එහෙම නැත්නම් කල් ගන්නට ඕනෑ. ඔබතුමාත් දැක්කා, ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා සභා ගර්භයේ සිටි බව. මෙවැනි සම්ප්‍රදායක් මේ පාර්ලිමේන්තුවේ හදන්නට ඉඩ දෙන්න එපා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව: ණය අය කර ගැනීම්
### லங்காபுத்ர அபிவிருத்தி வங்கி : கடன் அறவீடு
### LANKAPUTHRA DEVELOPMENT BANK: RECOVERY OF LOANS

827/'16

**8. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ ණය අය කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩසටහනක් වර්තමාන සභාපති ප්‍රමුඛ කළමණාකාරිත්වය සතුව තිබේ ද;

(ii) ණය නොගෙවන්නන්ගේ ලැයිස්තුවේ ඇති රුපියල් මිලියන 600ට අධික ණය අයකර ගැනීම සම්බන්ධයෙන් පසු ගිය වසර හා සැසඳීමේදී ප්‍රගතියක් ලබා තිබේ ද;

(iii) බැංකුවට රුපියල් මිලියන 20ට වඩා ණය ලබා දීමට හැකියාවක් නොමැති වුව ද, එම සීමාව ඉක්මවා ණය ලබා දී තිබේ ද;

(iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති රීතිවලට පටහැනිව සේවකයන් බඳවා ගැනීම, ක්‍රමවත් පටිපාටියෙන් බැහැරව උසස්වීම් ලබා දීම සහ තඹුත්තේගම සහ අකුරැස්ස යන ස්ථානවල තොරතුරු මධ්‍යස්ථාන විවෘත කිරීම මඟින් බැංකු රෙගුලාසි පනත උල්ලංඝනය කර තිබේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) லங்காபுத்ர அபிவிருத்தி வங்கியின் தற்போதைய தலைவர் உட்பட முகாமைத்துவத்திடம் கடன் அறவீட்டுக்கென முறைசார்ந்த வேலைத் திட்டமொன்று உள்ளதா என்பதையும்;

(ii) கடன் செலுத்தாதோர் பட்டியலில் காணப்படுகின்ற 600 மில்லியன் ரூபாய்க்கும் அதிகமான கடன் தொகையை அறவிடுதல் தொடர்பில், கடந்த ஆண்டுடன் ஒப்பிடும்போது முன்னேற்றம் காணப்படுகிறதா என்பதையும்;

(iii) வங்கி, 20 மில்லியன் ரூபாய்க்கும் அதிகமான தொகையை கடனாக வழங்கும் ஆற்றலைக் கொண்டிராதபோதிலும், அந்த எல்லையை விஞ்சி கடன் வழங்கியுள்ளதா என்பதையும்;

(iv) இலங்கை மத்திய வங்கியின் சட்டதிட்டங்களுக்கு முரணான விதத்தில் பணியாளர் ஆட்சேர்ப்பு, உரிய நடைமுறைகளைப் பின்பற்றாது பதவி உயர்வு அளித்தல் மற்றும் தம்புத்தேகம, அக்குரெஸ்ஸ ஆகிய இடங்களில் தகவல் நிலையங்களைத் திறந்து வைத்தல் ஆகியன மூலம் வங்கியின் ஒழுங்குவிதிச் சட்டம் மீறப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise Development:

(a) Will he inform this House-

(i) whether the present management led by the Chairman has a systematic programme to recover the loans of Lankaputhra Development Bank;

(ii) whether any progress has been achieved in recovering the loans of more than Rs. 600 million found in the list of persons who have not repaid loans when compared with the previous year;

(iii) whether the bank has given loans more than Rs. 20 million even though the bank is not permitted to grant loans exceeding that limit; and

(iv) whether the Bank Regulations Act has been contravened by acts such as recruitment of employees in contravention with the rules of the Central Bank of Sri Lanka, giving promotions outside the proper procedure and opening information centres in Thambuththegama and Akuressa?

(b) If not, why?

**ගරු කබීර් හාෂිම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. එනම්,

සිහි කැඳවීමේ ලිපි යැවීම.

සියලුම අක්‍රමික ණය මාසිකව ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණය යටතේ ශාඛා කළමනාකරුවන් හා සමාලෝචනය කිරීම.

සාකච්ඡා මට්ටමින් ණයකරු උනන්දු කර අක්‍රමික ණය, ක්‍රමික තත්ත්වයට හරවා ගැනීම.

ණය ප්‍රතිලේඛනගත හා ප්‍රතිව්‍යුහගත කිරීම.

සුළු ණය සමථ මණ්ඩලයට යොමු කිරීම.

එන්තරවාසි යැවීම.

ණය අයකර ගැනීමේ කඳවුරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ගෙවීම් පැහැර හරින්නන් සඳහා නඩු දැමීම.

දේපොළ සුරැකුම් මත මිලියන 5ට වැඩි ණය පැහැර හරින්නන් සඳහා පරාට් හිමිකම යටතේ ක්‍රියා කිරීම.

මාසිකව ණය අයකර ගැනීමේ අංශය හා නීති අංශය සමඟ ප්‍රගති සමාලෝචනය සිදු කිරීම.

නෛතික කටයුතු සඳහා නීති උපදේශකවරුන්ගේ සේවය පූර්ණ කාලීනව ලබා ගැනීම.

- රුපියල් මිලියන 20ට වැඩි අක්‍රමික ණය අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සමාලෝචනය කිරීම හා ඉදිරි පියවර සඳහා උපදෙස් දීම.

(ii) පසු ගිය වසර හා සැසඳීමේදී ප්‍රගතියක් ලබා ඇත.

(iii) බැංකුව ආරම්භයේදී ණය දීම සඳහා කිසිදු සීමාවක් නොවුණි. 2008 වසරේදී එක් ගනුදෙනුකරුවෙකුට එක් ව්‍යාපෘතියක් සඳහා ලබාදිය හැකි ණය සීමාව රුපියල් මිලියන 30ක් බවට බැංකුව විසින්ම තීරණයක් ගෙන තිබුණි. කෙසේ වුවද, 2011 ජූලි 26වන දින බැංකුවේ එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා අමාත්‍යාංශයේ අනිකුත් නිලධාරින් සමඟ පැවති රැස්වීමකදී එක් ගනුදෙනුකරුවෙකුට එක් ව්‍යාපෘතියක් සඳහා දිය හැකි උපරිම ණය සීමාව රුපියල් මිලියන 20කට සීමා කරන ලෙස බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට උපදෙස් ලබාදී ඇත. පසු ගිය කාල වකවානුවේදී බැංකුව විසින් තෝරා ගත් ව්‍යාපෘති කිහිපයකට පමණක් මෙම රුපියල් මිලියන 20ක සීමාව ඉක්මවා ගරු මුදල් අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යාංශයේ නිලධාරින්ගේ අනුදැනුම ඇතිව ණය ලබා දී ඇත.

(iv)
- සේවකයන් බඳවා ගැනීම - පහළ ශ්‍රේණි සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් කිසිදු විශේෂිත වූ උපදෙස් ලබා දී නොමැත.
- උසස්වීම් ලබාදීම - උසස්වීම් ලබා දී ඇත්තේ වැඩි වශයෙන්ම බැංකුවේ පවතින චක්‍රලේඛවලට අනුකූලව වන අතර, ව්‍යතිරේක අවස්ථාවලදී ද විනිවිදභාවයකින් යුතුව කටයුතු කර ඇති අතර, සියලු උසස්වීම් අදාළ අංශ ප්‍රධානියාගේ නිර්දේශ ඇතිව ලබාදී ඇත.
- තොරතුරු මධ්‍යස්ථාන විවෘත කිරීම - තඹුත්තේගම සහ අකුරැස්ස තොරතුරු මධ්‍යස්ථාන විවෘත කිරීම සිදු කරනු ලැබුවේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, මහ බැංකුවේ අනුමැතියට යටත්ව එම ප්‍රදේශවල අවශ්‍යතා ඇති පුද්ගලයන්හට මූල්‍ය පහසුකම් ලබාදීමේ අරමුණ පෙරදැරි කරගෙනය. කෙසේ වුවද, මහ බැංකුව විසින් මෙම තොරතුරු මධ්‍යස්ථාන විවෘත කිරීම සඳහා අනුමැතිය ලබාදී නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය මීට ටික කලකට පෙර යොමු කළ ප්‍රශ්නයක් නිසා, අතුරු ප්‍රශ්න අහන්න කලින් ඔබතුමාගෙන් කාරණයක් දැන ගන්න කැමැතියි. මේ ප්‍රශ්නයෙන් මා අහලා තිබෙන්නේ, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ ණය අය කර ගැනීම සඳහා වර්තමාන සභාපති ඇතුළු කළමනාකාරිත්වය සතුව ක්‍රමවේදයක් තිබෙනවාද කියලායි. මා දැන ගන්න කැමැතියි, මේ බැංකුවේ දැන් සිටින සභාපතිවරයා කවුද කියලා. මොකද, ඒ සභාපතිවරයා සම්බන්ධයෙන්ම ප්‍රශ්න පැන නැඟුණාට පස්සේ ඒ සභාපතිවරයා ඉවත් කිරීම පිළිබඳව මහ බැංකුවෙන් නිර්දේශයක් කර තිබුණා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

දැනට එහි සභාපතිවරයෙක් නැහැ. වැඩ බලන සාමාන්‍යාධිකාරිවරයෙක් තමයි ඉන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ඔබතුමා කියනවා, ණය අය කර ගැනීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළක්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

තිබුණාය කියලා. නමුත්, ඇත්තටම ණය අය කර ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ, ගරු ඇමතිතුමනි.

අනික් කාරණය තමයි, ණය අනුමත කරන්න සභාපතිවරයාට බලයක් නැති නමුත් සභාපතිවරයාම ණය අනුමත කිරීම් කර තිබෙන එක. ණය අයදුම් පතක් ඉදිරිපත් නොකළ අයට පවා ණය අනුමත කිරීම් කර තිබුණා.

මේ ප්‍රශ්නයේ (iv) කොටසට පිළිතුර දීමේදී ඔබතුමා සේවකයන් බඳවා ගැනීම ගැන සඳහන් කළා. මා දන්නා තරමට සේවකයින් බඳවා ගැනීම සඳහා අනුමැතිය දෙන්න, අත්සන් තබන්න සභාපතිතුමාට බැහැ. බඳවා ගැනීමේ පටිපාටියට අනුව ඒ බලතල තිබෙන්නේ සාමාන්‍යාධිකාරීතුමාටයි. ඔහු තමයි බඳවා ගැනීමේ නිලධාරියා. ඒ නිසා ඔබතුමා පිළිගන්නවාද, සාමාන්‍යාධිකාරීවරයාට තිබෙන බලයක් සභාපතිවරයා විසින් පාවිච්චි කරලා, අසවල් අසවල් අය බඳවා ගන්නය කියලා අනුමත කරලා, පත්වීම් ලිපි ලබා දෙන එක සුදුසුයි කියලා?

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නයට ඒ අතුරු ප්‍රශ්නය අදාළ නොවුවත් මා පිළිතුරක් දෙන්නම්. බඳවා ගැනීමේ ක්‍රමවේදය බැංකුව තුළ සකස් කරලා තිබෙනවා. ඒ ක්‍රමවේදය තුළයි බඳවා ගැනීම් කරන්න පුළුවන් වන්නේ. සභාපතිවරයාට බඳවා ගැනීම්වලට අනුමැතිය දෙන්න බැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නිවැරදියි. සාමාන්‍යාධිකාරීතුමා තමයි ඒ තීන්දු තීරණ ගන්නේ. වෙනත් විධියකට පත්වීම් ලිපියක් දීලා තිබෙනවා නම් එය වලංගු නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. යම් පුද්ගලයෙකුට බැංකුවකින් ණයක් අනුමත කළාට පස්සේ ඒ බැංකුවට ඔහුගෙන් පොලියක් අය කර ගන්න තිබෙනවා. ඒ පොලිය අය කර ගැනීමේදී, මේ පොලී අනුපාතය නොවෙයි, මීට වඩා අඩු පොලියක් ඔහුගෙන් අය කර ගන්න කියලා සභාපතිවරයාගේ අභිමතය මත සභාපතිවරයාගේ අත්සනින් යුතුව දැනුම් දෙන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නැතිව?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නැතිව, "අදාළ පොලී ප්‍රමාණය වෙනුවට ඊට අඩු පොලියක් අසවල් පුද්ගලයාගෙන් අය කරන්න"යි කියලා සභාපතිතුමාම ඒ ලේඛනයේ අත්සනක් දමනවා. අපි හිතමු, පොලිය සියයට 14යි කියලා. ඒ සියයට 14 පොලිය වෙනුවට සියයට 9ක පොලියක් අය කරන්න කියලා සඳහන් කරනවා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමාත් කිව්ව පරිදි සාමාන්‍යයෙන් පොලී අනුපාතය තීරණය කිරීමේ බලය තිබෙන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ තිබෙන Credit Committee එකටයි. ඒ කොමිටියට තමයි විවිධ පොලී අනුපාත වෙනස් කරන්න පුළුවන් වන්නේ. සභාපතිතුමාගේ තනි මතයෙන් පොලී අනුපාත වෙනස් කරන්න බැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තුන්වෙනි අතුරු ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ගරු ඇමතිතුමා කිව්වා, 2008 දී ණය දිය හැකි සීමාව රුපියල් මිලියන 30ක් කියන එකඟතාවකට ඇවිල්ලා තිබුණා, 2011දී මේ සීමාව රුපියල් මිලියන 20ක් කියන එකඟතාවකට ආවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සීමාවත් මුළුමනින්ම බිඳ තිබෙනවා. සමහර අවස්ථාවල රුපියල් මිලියන 200කට අධික ණය දීපු ආයතන තිබෙනවා. ඒ විධියට රුපියල් මිලියන 700ක් ණය දීපු ආයතනත් තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නඟා සිටුවීමේ අරමුණෙන් මේ බැංකුව පිහිටුවා තිබුණත්, ණය දීමේ ක්‍රියාවලියේදී ඒ මූලික අරමුණට පටහැනිව මේ බැංකුව කටයුතු කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා කිව්වා, ඔබතුමන්ලා විසින් අලුතෙන් පත් කරන ලද සභාපතිවරයා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ මත ඉවත් කරලා තිබෙනවාය, ඒ වෙනුවට සාමාන්‍යාධිකාරීවරයා වැඩ බලනවාය කියලා.

ගරු ඇමතිතුමනි, මා දන්නා පරිදි සාමාන්‍යාධිකාරීවරයාත් වැඩ තහනමට ලක්වී තිබෙනවා. එතකොට සභාපතිවරයාත් නැහැ, සභාපතිවරයාගේ වැඩ බැලීම සඳහා සාමාන්‍යාධිකාරීවරයකුත් නැහැ. මේ අයථා මූල්‍ය ගනු-දෙනු හේතුකොටගෙන සාමාන්‍යාධිකාරීවරයාත් දීර්ඝ කාලයක් මුළුල්ලේ වැඩ තහනමට ලක්වී සිටිනවා. ඒ නිසා මහ ජනයාගේ මුදල් විශාල ප්‍රමාණයෙන් නාස්ති වන ආයතනයක් බවට මේ බැංකුව පත්වී තිබෙනවා. ඒ තත්ත්වය වෙනස් කිරීම සඳහා ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග කවරේද කියා දැන ගන්න කැමැතියි.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි, සභාපතිවරයකු අලුතෙන් පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලයේ අනුමැතියට යවා තිබෙනවා. ඒ අනුව නව සභාපතිවරයෙක් හැකි ඉක්මනින් පත්වෙයි. ඒ වාගේම සාමාන්‍යාධිකාරීවරයා සම්බන්ධයෙන් කරන චෝදනා පිළිබඳව දැනට කටයුතු කර ගෙන යනවා. අධ්‍යක්ෂ මණ්ඩලය දැන් වග කීමක් සහිතව ක්‍රියා කරනවා. රුපියල් මිලියන 20 සීමාව ඉක්මවා ගිය ණය ගැන ඔබතුමා ඇසූ ප්‍රශ්නය වැදගත් ප්‍රශ්නයක්. විශේෂයෙන්ම කියන්න ඕනෑ, 2015 ජනවාරි 08වෙනි දා යහ පාලන ආණ්ඩුව පත් වෙන්න කලින් රුපියල් මිලියන 20

ඉක්මවූ එවැනි ණය විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවාය කියලා. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තොරව, මුදල් අමාත්‍යාංශයේ අනුමැතියෙන් තොරව ලබාදී තිබෙනවා. ඒ කාලපරිච්ඡේදය තුළ Non-Performing Loans - NPLs - ප්‍රමාණය සියයට 44 ඉක්මවා ගිහින් තිබෙනවා. පසු ගිය වසරේදී ඒ ප්‍රමාණය සියයට 35 දක්වා අඩු කරන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම පසු ගිය කාලයේ, එනම් 2015 ජනවාරි 08වෙනි දාට කලින් රුපියල් මිලියන 20 ඉක්ම වූ ණය විශාල පිරිසකට දීලා තිබෙනවා.

මැතිවරණ සමයේ එක් පුද්ගලයෙකුට රුපියල් මිලියන 67ක් ලබා දීලා තිබෙනවා. මේවා පරීක්ෂා කිරීම සඳහා දැන් පියවර ගෙන තිබෙනවා. මේ අලුත් රජය පත් වුණාට පසුව, හතරදෙනෙකුට රුපියල් මිලියන 20කට වැඩි ප්‍රමාණයක් ණය ලබා දීලා තිබෙනවා. අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සහ මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය අරගෙන, නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් තමයි ඒ මුදල් දීලා තිබෙන්නේ.

## දිවි නැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ තනතුර: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### 'வாழ்வின் எழுச்சி' மாவட்டப் பணிப்பாளர் பதவி :திருகோணமலை மாவட்டம்

### POST OF DISTRICT DIRECTOR OF DIVINEGUMA : TRINCOMALEE DISTRICT

895/'16

**10.** **ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිවිනැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ තනතුර කොපමණ කාලයක සිට පුරප්පාඩුව පවතින්නේද;

(ii) පුරප්පාඩු කාල සීමාවේදී එම තනතුරෙහි වැඩබැලූ අයගේ නම්, සුදුසුකම් සහ වෙනත් විස්තර කවරේද;

(iii) මේ දක්වා ස්ථිර නිලධාරියෙක් පත් නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම පුරප්පාඩුව පිරවීම සඳහා ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් විසින් නිලධාරියෙකු නිර්දේශ කරන ලද බවත්;

(ii) එම නිලධාරියා ශ්‍රී ලංකා සැලසුම් සේවයට අයත් වීම හේතුවෙන් දිවිනැගුම දෙපාර්තමේන්තුව එම නිර්දේශය අනුමත නොකළ බවත්;

(iii) එබැවින් එම තනතුර දිගින් දිගටම පුරප්පාඩු වී පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ත්‍රිකුණාමලය දිවිනැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ ධුරයේ පුරප්පාඩුව පිරවීම හෝ දිස්ත්‍රික් ලේකම් නිර්දේශ කළ නිලධාරියාට එම පත්වීම ලබාදීම හෝ මේ දක්වා සිදු නොකිරීමට හේතුව කවරේද;

(ii) දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කළ නිලධාරියාට එම පත්වීම පිරිනැමීමෙන් දිවිනැගුම වැඩසටහනට බාධාවක් සිදුවිය හැකිද;

(iii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් නිර්දේශ කළ නිලධාරියා ත්‍රිකුණාමලය දිවිනැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ වශයෙන් පත් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தில் வாழ்வின் எழுச்சி மாவட்டப் பணிப்பாளர் பதவி எவ்வளவு காலமாக வெற்றிடமாக உள்ளது என்பதையும்;

(ii) வெற்றிடமான காலப்பகுதியில் மேற்படி பதவியில் பதில் கடமையாற்றியவர்களின் பெயர்கள், தகைமைகள் மற்றும் வேறு விபரங்கள் யாவை என்பதையும்;

(iii) இதுவரை நிரந்தர அலுவலர் ஒருவரை நியமனம் செய்யாமைக்கான காரணம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வெற்றிடத்தை நிரப்புவதற்கு திருகோணமலை மாவட்ட செயலாளரினால் அலுவலர் ஒருவர் சிபாரிசு செய்யப்பட்டுள்ளார் என்பதையும்;

(ii) மேற்படி அலுவலர் இலங்கை திட்டமிடல் சேவைக்கு உரித்தாவதன் காரணமாக வாழ்வின் எழுச்சித் திணைக்களம் மேற்படி சிபாரிசை அங்கீகரிக்கவில்லை என்பதையும்;

(iii) எனவே, மேற்படி பதவி தொடர்ந்தும் வெற்றிடமாகக் காணப்படுகின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(இ) (i) திருகோணமலை வாழ்வின் எழுச்சி மாவட்டப் பணிப்பாளர் பதவியின் வெற்றிடத்தை நிரப்புவதற்கு அல்லது மாவட்ட செயலாளர் சிபாரிசு செய்துள்ள அலுவலருக்கு மேற்படி நியமனத்தை வழங்குவதற்கு இதுவரை நடவடிக்கை மேற்கொள்ளாமைக்கான காரணம் யாது என்பதையும்;

(ii) மாவட்ட செயலாளரினால் சிபாரிசு செய்யப்பட்ட அலுவலருக்கு மேற்படி நியமனத்தை வழங்குவதன் மூலம் வாழ்வின் எழுச்சி நிகழ்ச்சித்திட்டத்திற்கு தடையேதும் ஏற்படுமா என்பதையும்;

(iii) திருகோணமலை மாவட்ட செயலாளர் சிபாரிசு செய்துள்ள அலுவலரை திருகோணமலை மாவட்ட வாழ்வின் எழுச்சி பணிப்பாளராக நியமனம் செய்ய நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment and Welfare:

(a) Will he inform this House -

(i) as to how long the post of District Director of Divineguma in the Trincomalee District has been vacant;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

(ii) the names, qualifications and other details of the persons who were holding that post in acting capacity in the period during which it has been vacant; and

(iii) the reason as to why a permanent officer has not been appointed to that position to date?

(b) Is he aware that -

(i) in order to fill this vacancy, an officer was recommended for this post by the District Secretary, Trincomalee;

(ii) Divineguma Department did not approve that recommendation as the aforesaid officer belongs to Sri Lanka Planning Service; and

(iii) the aforesaid position has been vacant continuously due to this reason?

(c) Will he also inform this House -

(i) the reason for not filling the vacancy in the post of Divineguma District Director to date or for not giving the appointment to the officer that has been recommended by the District Secretary;

(ii) whether any interruption would be caused to the activities of the Divineguma programme by giving the appointment to the officer recommended by the District Secretary; and

(iii) whether action will be taken to appoint the officer recommended by the District Secretary of Trincomalee, to the post of Divineguma District Director ?

(d) If not, why?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2014.05.13 සිට 2015.05.19 දින දක්වා.

(ii) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කේ.පී. ප්‍රේමදාස මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I) වැඩ ආවරණය කරන ලදී.

(iii) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1284 සහ 2014.11.19 හා 2016.09.15 දිනැති ලිපි මඟින් අනුමත කාර්ය මණ්ඩලය තුළ පහත සඳහන් පරිදි දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරු අනුමත කර ඇත.

<u>තනතුරු නාමය</u> <u>සේවය</u> <u>තනතුරු ගණන</u>

1. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය) 20

2. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය (I ශ්‍රේණිය) 05

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු ඉදිරිපත් නොවීම මෙයට හේතුවයි.

(ආ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරප්පාඩු පවතින දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් විසින් වැඩ බැලීමේ පදනම මත එම රාජකාරි ආවරණය කළ අතර, රාජකාරි හා වගකීම් බහුල වීම හේතු කොටගෙන ඔහු මුහුණ පා ඇති අපහසුතා සැලකිල්ලට ගෙන දැනට පුරප්පාඩු පවතින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරට ඒ.සී.එම්. මුසීල් මහතා (ශ්‍රී ලං.ක්‍ර.සේ. II) පත් කරන ලෙස 2016.02.10 වන දින ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් විසින් ඉල්ලීමක් කර තිබුණි.

(ii) ඒ.සී.එම්. මුසීල් මහතා ශ්‍රී ලං.ක්‍ර.සේ. II ශ්‍රේණියේ නිලධාරියකු වන බැවින්ද, ඒ වන විටත් ශ්‍රී.ල.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරියකු වන කේ.පී. ප්‍රේමදාස මහතා එම තනතුරේ රාජකාරි ආවරණය කරන බැවින්ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය විසින් ඒ.සී.එම්. මුසීල් මහතා පත් කිරීමට අනුමැතිය ලබා දීම පසුවට තබන ලදී.

(iii) කේ.පී. ප්‍රේමදාස මහතා (ශ්‍රී.ල.ප.සේ. I) විසින් රාජකාරි ආවරණය කරන බැවින් එම තනතුර පුරප්පාඩු වී නොමැත.

(ඇ) (i) කේ.පී. ප්‍රේමදාස මහතා (ශ්‍රී.ල.ප.සේ. I) විසින් රාජකාරි ආවරණය කරන බැවින් හා ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වන බැවින්ද, 2015.05.19 දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ඔහු පත් කර ඇති බැවිනි.

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් විසින් පරිපාලනමය දුෂ්කරතා මතුවීම මත මෙම නිලධාරින් දෙදෙනාට නිර්දේශය ලබා දී ඇති අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව ශ්‍රී.ල.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරියා වැඩ බැලීම සඳහා මේ වන විටත් පත් කර ඇත.

(iii) 2015.05.19 දින සිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා කේ.පී. ප්‍රේමදාස මහතා (ශ්‍රී.ල.ප.සේ. I ) පත් කර ඇති බැවින්, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු පත් කිරීමට අවශ්‍ය නොවේ.

(ඈ) දැනට අප අමාත්‍යාංශයට අයිති සැලසුම් සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරින් 5 දෙනා වෙනුවට 10 දෙනෙකු ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමෘද්ධිය සම්බන්ධව මේ වාගේ ප්‍රශ්න රට පුරාම තිබෙනවා. අපේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් මේ වාගේ වැඩ බලන නිලධාරින් පත් කරලා තිබෙන නිසා ගොඩක් ප්‍රශ්න ඇතිවෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දුන්නු උත්තරය අනුව ඒ නිලධාරින් වැඩි කරගන්න කොච්චර කාලයක් ගත වෙයිද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරින් 10දෙනෙක් සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරින් 5දෙනෙක් වශයෙන් තිබෙන එක වෙනස් කර ගැනීමට අපි මීට කලිනුත් උත්සාහ කළා. හැබැයි, ඒකට එකඟත්වය ලබා දෙන්නේ නැහැ. ඒකට හේතුව, ඒ තැන්වල ඉන්න වැඩි දෙනෙක් රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරින් වන නිසා. ඒ කාරණය පිළිබඳව මම කැබිනට් මණ්ඩලයේත් අවධානය යොමු කරවලා තිබෙනවා. නමුත්, ඔබතුමා කියන ඔය II වැනි ශ්‍රේණියේ නිලධාරියා ඒ තනතුරට පත් කරන්න බැහැ. මොකද, මේක I වැනි ශ්‍රේණියේ තනතුරක් නිසා. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I වැනි ශ්‍රේණියේ නිලධාරින් අපට ඕනෑ තරම් ඉන්නවා. එවැනි අය අපේ අමාත්‍යාංශයේත් ඉන්නවා. හැබැයි, ඒ අය පත් කර ගන්න බැහැ, ඒ තනතුරු පහම අපි මේ වනකොට පුරවලා තිබෙන නිසා. අවුරුදු හතක් තිස්සේ අපේ යාපනය දිස්ත්‍රික් අධ්‍යක්ෂතුමා ඉන්නවා. එතුමා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ. එතුමා Iවැනි ශ්‍රේණියේ නොවෙයි, විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක්. ඒත් තවමත් වැඩ බලනවා. හැබැයි, අපට ඔහු ස්ථිර කරන්න බැහැ. මොකද, ක්‍රමසම්පාදන සේවයේ quota එක අනුව පහ දීලා අවසන්වෙලා තිබෙන නිසා. ඉතින් ඒ ප්‍රමාණය වැඩි කර ගන්න ඕනෑ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මටත් අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Anura Dissanayake is asking the third Supplementary Question.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
හොඳයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ඔබතුමා කිව්වා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ අයගෙන් 10දෙනයි. ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ අයගේ 5දෙනයි. ඔක්කොම 15දෙනයි. ක්‍රමසම්පාදන සේවයේ පුරප්පාඩු 5ම පිරිලා තිබෙනවා. නමුත්, ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම්තුමා විසින් ඉල්ලා තිබෙන නිලධාරියා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි ශ්‍රේණියේ නිසා ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා කියලා. මොකද, ක්‍රමසම්පාදන සේවයේ පුරප්පාඩු 5ම පිරිලා තිබෙන නිසා. නමුත්, දිස්ත්‍රික්ක 20ක් තිබෙනවා. එතකොට, දිස්ත්‍රික් අධ්‍යක්ෂ තනතුරට පත් කරන්න ඔබතුමාට පුළුවන්කම තිබෙන්නේ 15 දෙනායි.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, අනෙක් හැම තැනකම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් පත් කරලා තිබෙනවා, වෙන කෙනෙක් නැති නිසා. මෙතැන ඉල්ලන්නේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරියෙක්. අපට කොහොමටවත් ඒ quota එක නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එම පුරප්පාඩු ආවරණය කරන මට්ටමින් පවත්වාගෙන යනවා වෙනුවට, අඩුම තරමින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි ශ්‍රේණියේ නිලධාරියකු හෝ පත් කරන්න පුළුවන් නේ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
පරිපාලන සේවයේ නම් ලෙහෙසියෙන්ම පත් කරන්න පුළුවන්. මොකද, ඒක රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන නිසා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙම පුරප්පාඩු ආවරණය කරන මට්ටමෙන් තියාගෙන යන්නේ. ඒකයි හොඳ නැත්තේ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
අපි මේ ප්‍රශ්නය ඉක්මනින්ම විසඳා ගන්න කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

## රජයේ නිලධාරින් සමෘද්ධි සහනාධාර ලබා ගැනීම : ගත් ක්‍රියා මාර්ග

அரச ஊழியர்கள் சமுர்த்தி நிவாரணம் பெறல் : நடவடிக்கை

PUBLIC SERVANTS OBTAINING SAMURDHI ALLOWANCE: ACTION TAKEN

681/'16

**11. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රජයේ නිලධාරින්ට සමෘද්ධි සහනාධාරය ලබා ගත හැකිද;

(ii) රජයේ නිලධාරින්ට ලබාගත හැකි, රජයෙන් ලබා දෙන ආධාර හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ රජයේ සේවකයන් සමෘද්ධි සහනාධාරය ලබාගන්නා බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරින්ගේ නම්, තනතුරු හා සේවා ස්ථාන කවරේද;

(iii) එම පුද්ගලයන්ට එරෙහිව ගත් ක්‍රියා මාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) அரசாங்க உத்தியோகத்தர்கள் சமுர்த்தி நிவாரணம் பெற்றுக்கொள்ள முடியுமா என்பதையும்;

(ii) அரசாங்க உத்தியோகத்தர்களால் பெற்றுக் கொள்ளக்கூடிய, அரசாங்கத்தினால் வழங்கப் படுகின்ற உதவிகள் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i ) குருநாகல் மாவட்டத்தின், பன்னல பிரதேச செயலாளர் ஆளுகைப் பிரிவில் அரசாங்க ஊழியர்கள் சமுர்த்தி நிவாரணம் பெறுகின்றார் களென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி உத்தியோகத்தர்களின் பெயர்கள், பதவிகள் மற்றும் சேவை நிலை யங்கள் யாவையென்பதையும்;

(iii ) மேற்படி ஆட்களுக்கு எதிராக மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment and Welfare:

(a) Will he inform this House-

(i) whether the Government servants are entitled for the Samurdhi allowance; and

(ii) the assistance and allowances provided by the Government that can be obtained by the public servants?

(b) Will he also inform this House-

(i) whether he is aware of the fact that the public servants of the Pannala Divisional Secretary's Division in the Kurunegala District obtain Samurdhi allowance;

(ii) if so, the names, positions and places of work of the aforesaid officers;

(iii) the measures that were taken against the aforesaid persons?

(c) If not, why?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නොහැක.

(ii) මෙම දෙපාර්තමේන්තුවට අදාළ නොවන්නකි.

මා දන්නා විධියට එම දෙපාර්තමේන්තුවල සුභසාධන අරමුදල්වලින් ලබා දෙන ආධාර හෝ දීමනා ක්‍රම තිබෙනවා හැරෙන්න, රජයේ නිලධාරින්ට එහෙම සහනාධාර දෙන ක්‍රමයක් නැහැ.

(ආ) (i) මේ පිළිබඳව මා වෙත වාර්තා වී ඇත.

(ii) ඇමුණුම අංක 02හි සඳහන් වේ.

(iii) 2015 වර්ෂයේ සිට රජයේ සේවයේ නියුතු ප්‍රතිලාභීන් සිටින පවුල්වල සහනාධාර 367ක් පමණ දැනට ඉවත් කර ඇත. ඇමුණුම 01 බලන්න.

තවදුරටත් සහනාධාර 117ක පමණ ප්‍රමාණයක් ඇති බව ග්‍රාම නිලධාරි හා දිවිනැඟුම සංවර්ධන නිලධාරී මඟින් තොරතුරු තහවුරු කර ගෙන ඇත. එම සහනාධාරලාභීන් 2016 නොවැම්බර් මාසයේ සිට ඉවත් කිරීමට කටයුතු යොදා ඇත. ඇමුණුම් අංක 02හි අදාළ නම් සඳහන්ව ඇත. ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුරු ලබා දීම ගැන මා ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්නට කැමැතියි, රජයේ සේවයේ යෙදී සිටින අය කොහොමද මේ සමෘද්ධි සහනාධාරය ලබා ගැනීමට ඇතුළත් වුණේ කියලා. මා දන්නවා, මේක යම්කිසි දේශපාලන මැදිහත් වීමක් එක්ක සිද්ධ වෙලා තිබෙන දෙයක් බව. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව අධිකරණ ක්‍රියා මාර්ගයකට ගිහිල්ලා තිබෙනවාද? ඒ වියදම් කළ මුදල් යළි අය කර ගැනීමේ ක්‍රමවේදයක් තිබෙනවාද? මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් ගෙන යන වැඩ පිළිවෙළ මොකක්ද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන කොටත් අපි මේ පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කර තිබෙනවා. ඇත්තටම සිදු වන්නේ මෙයයි. මෙම සහනාධාර ලබමින් ඉන්න කොට ඒ අයගේ පවුලේ කෙනෙකුට රජයේ රැකියාවක් හම්බ වනවා. හැබැයි, එයා ඒක හෙළිදරවු කරන්නේ නැතිව ඉන්නවා. එසේ හෙළිදරවු නොකළත් මෙවැනි අවස්ථාවල අදාළ සමෘද්ධි සංවර්ධන නිලධාරියාගේ හා කළමනාකරුවන්ගේ වගකීම වන්නේ, සොයා බලා එම සහනාධාර ලබා දීම නැවැත්වීමයි. අපි මේ කාරණය පිළිබඳව දැන් විනය කටයුතු ආරම්භ කර තිබෙනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, මේක ඔබතුමා අදාළ අමාත්‍ය ධුරය දරපු වකවානුවේ සිද්ධ වුණු දෙයක් නොවෙයි, නමුත් ඊට පෙර ඇති වූ ඛේදනීය තත්ත්වයක්. රජයේ නිලධාරින්ට සමෘද්ධි සහනාධාරය ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් යටතේ, රජයේ නිලධාරින් එක්කෙනෙක්, දෙදෙනෙක් නොවෙයි, විශාල ප්‍රමාණයක් සමෘද්ධි ප්‍රතිලාභය ලබලා තිබෙනවා. ඒ අයගෙන් දැන් එම සහනාධාරය ඉවත් කරනවා. නමුත්, මේ හා සමානව රජයේ සේවකයන් නොවන සමෘද්ධි සහනාධාරය ලබා ගැනීමට නුසුදුසු, එහෙත් සමෘද්ධි සහනාධාරය ලබා ගන්නා පිරිස් ඉන්න අතරේ, සමෘද්ධි සහනාධාර ලැබිය යුතු, එහෙත් නොලැබෙන පිරිසක් ඉන්නවා. අමාත්‍යාංශය පරිගණක ආශ්‍රයෙන් මේ පිළිබඳව තොරා ගැනීම් කළත්, සමහර සමෘද්ධි නියාමකයන් තමන්ගේ දේශපාලන කෝණයෙන් තමයි ඒ අදාළ තොරතුරු ලබාගෙන පරිගණකයට ඇතුළත් කරන්නේ. එතකොට පරිගණකය තුළට ඇතුළු වෙන දත්ත අනුව තමයි පරිගණකය ඒ සඳහා අවශ්‍ය පිළිතුරු ලබා දෙන්නේ. ඒ දත්තවල විශ්වාසනීයත්වය පිළිබඳව ගරු සභාවට සහතිකයක් දෙන්න ගරු ඇමතිතුමාට පුළුවන්ද ?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

අපි අදාළ තොරතුරු පත්‍රිකාව හැදුවේ, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මේ පිළිබඳ විශේෂඥයන් සහ විශ්වවිද්‍යාලයේ මේ පිළිබඳ විශේෂඥයන් සමඟ එකතු වෙලායි. සාමාජිකයා ඔහුගේ තත්ත්වය පිළිබඳව එක තැනකින් මඟ හැරියත්, තවත් තැනකින් ඔහු පිළිබඳව සත්‍ය තොරතුරු මතු වෙන විධියේ බොහොම සංකීර්ණ ප්‍රශ්න පත්‍රයක් හදලා තිබෙන්නේ. එම ප්‍රශ්න පත්‍රය පුරවන නිලධාරියා එහි අත්සන් කරන්න ඕනෑ. ඒක අදාළ ග්‍රාම නිලධාරිවරයා සහතික කරන්න ඕනෑ. ඒ තොරතුරු සත්‍යයි කියලා, කළමනාකාරතුමා සහතික කරන්නත් ඕනෑ. මේවා සියල්ලක්ම ප්‍රාදේශීය ලේකම්තුමා හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමා විසින් සැලසුම් අධ්‍යක්ෂ එක්ක එකතු වෙලා බලනවා. එහෙම බලලා තමයි මේවා පරිගණකගත කරන්නේ.

එහෙම ප්‍රශ්න එන්න පුළුවන්. මම ඔබතුමා කියන දේ පිළිගන්නවා. හැබැයි, මේ තේරීම්වලින් පස්සේ අපි මේ වෙනුවෙන් හදලා තිබෙන මෘදුකාංගය අනුව ඒ අය වර්ග කරනවා. එසේ වර්ග කළාම, එතැන වරදක් තිබෙනවා නම් ඒ අයට ප්‍රාදේශීය ලේකම්තුමාට, දේශපාලනඥයන්ට, එහෙම නැත්නම් දිසාපතිවරයාට, ඒ වාගේ ඕනෑම කෙනෙකුට පැමිණිලි කරන්න පුළුවන්. ඒ මූලික තේරීම් කටයුතු සඳහා අපි ප්‍රාදේශීය ලේකම්තුමා, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමා හෝ තුමිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින සැලසුම් අධ්‍යක්ෂතුමා, මූලස්ථාන කළමනාකාරතුමා සහ සමාජ සේවා නිලධාරිතුමා පත් කර තිබෙනවා. මේ නිසා එම කණ්ඩායමට නැවත අභියාචනයක් කරලා ඒ වරද නිවැරදි කරගන්න පුළුවන්. අප වෙතට වුණත් ඕනෑම කෙනෙකුට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු ඇමතිතුමා දැන් සඳහන් කරපු සියලුම දෙනා නිලධාරින්. එම නිලධාරින් සමඟ එක්කෝ ගමේ ස්වේච්ඡා සංවිධානවල නියෝජිතයන්, නැත්නම් ගමේ ජනතාව අතරින් තෝරාගන්නා නියෝජිතයන්ගෙන් සමන්විත යාන්ත්‍රණයකුත් මේකට එකතු කළොත් මේ වැඩ පිළිවෙළ වඩා යථාර්ථවාදී වෙනවා. එසේම, 2016 වසර පුරාවටම මෙම තෝරාගැනීම් සිදු වුණා. 2017 අවුරුද්දේවත් එම කටයුත්ත කෙළවර කරලා, සැබැවටම සමෘද්ධිය ලැබිය යුතු සමෘද්ධිලාභින් තෝරාගෙන ඒ ප්‍රතිලාභ ලබා දීමේ වැඩ පිළිවෙළක යෙදෙනවාද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ස්වේච්ඡා සංවිධානවල නිලධාරින් මේකට සම්බන්ධ කර ගන්න අමාරුයි. හැබැයි, ඒ අයට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. ස්වේච්ඡා සංවිධානවල නිලධාරින් ගත්තොත්, ඒ අය නොයෙකුත් දේශපාලන පක්ෂවලට සම්බන්ධ අය වෙන්න පුළුවන්. එතකොට ලොකු ගැටලුවක් ඇති වෙනවා. නමුත්, මේ කණ්ඩායම තෝරාගත් පසුව ඕනෑම කෙනෙකුට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඊට පස්සේ අපට ඒ ගැන බලන්න පුළුවන්.

ඔබතුමා කියන ඊළඟ කාරණයේදී අපට ප්‍රශ්නයක් මතු වෙනවා. අපේ අමාත්‍යාංශයේ සේවක පුරප්පාඩු 7,000ක් තිබෙනවා. ඒ පුරප්පාඩු පුරවාගන්න බැරුවයි අපි දඟලන්නේ. දැන් forms ලක්ෂ 25ක් පුරවලා තිබෙනවා. Form එකක පිටු 17ක් තිබෙනවා. දවසකට මේවායෙන් දහයකට වඩා computer එකට ඇතුළත් කරන්න බැහැ. මේ සේවක පුරප්පාඩු පිරවීම සඳහා අපි කිහිප වතාවක්ම ඉල්ලීම් කර තිබෙනවා. අදත් රැස්වීමක් තිබෙනවා. අපි පෙරේදා කැබිනට් එකේදීත් මේ ගැන කථා කළා. මෙම පුරප්පාඩු ටික ඉක්මනින් පුරවා ගන්න පුළුවන් වෙයි කියා මම හිතනවා. අපි බලන්නේ ජනවාරි වෙනකොටවත් මේ තේරීම් අවසන් කරන්නයි.

## උදයංග වීරතුංග මහතාට එරෙහිව ඇති චෝදනා: විමර්ශන ප්‍රගතිය

### திரு. உதயங்க வீரதுங்க மீதான குற்றச்சாட்டுக்கள் : விசாரணைகளின் முன்னேற்றம்

### CHARGES AGAINST MR. UDAYANGA WEERATUNGA: PROGRESS OF INVESTIGATIONS

707/'16

**12. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) රුසියාවේ, ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස උදයංග වීරතුංග මහතා කටයුතු කළ කාලවකවානුව කවරේද;

(ii) ඔහුට එරෙහිව ඇති චෝදනා කවරේද;

(iii) එම චෝදනා සම්බන්ධයෙන් සිදු කර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(iv) ඔහුට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(v) ඔහුව අත් අඩංගුවට ගැනීම සඳහා ජාත්‍යන්තර පොලිසියේ සහාය ඉල්ලා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ரஷ்யாவின், இலங்கைத் தூதுவராக திரு. உதயங்க வீரதுங்க கடமையாற்றிய காலஎல்லை யாது என்பதையும்;

(ii) இவருக்கு எதிராக உள்ள குற்றச்சாட்டுக்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி குற்றச்சாட்டுக்கள் தொடர்பாக மேற் கொள்ளப்பட்டுள்ள விசாரணைகளின் முன்னேற்றம் யாது என்பதையும்;

(iv) இவருக்கு எதிராகச் சட்ட நடவடிக்கை மேற் கொள்ளப்படுதல் தாமதமடைவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) இவரைக் கைதுசெய்வதற்கு சர்வதேசபொலிசின் உதவி கோரப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House -

(i) the period of time during which Mr. Udayanga Weeratunga had functioned as the Sri Lankan Ambassador to Russia;

(ii) what the charges against him are;

(iii) the progress of the investigations conducted regarding those charges;

(iv) the reasons for the delay in taking legal action against him; and

(v) whether the assistance of Interpol has been sought to arrest him?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்ட லுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) උදයංග වීරතුංග මහතා 2006.07.18 දින සිට 2015.02.28 දින දක්වා කාලය තුළ රුසියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් සේවය කොට ඇත.

(ii) මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට අනුව 2006 වසරේදී යුක්රේන් රාජ්‍යයෙන් මිග් 27 ගුවන් යානා හතරක් (4) මිලදී ගැනීමේදී සිදු වූ විශාල මූල්‍ය වංචාවට වීරතුංග මහතා සම්බන්ධ වී ඇති අතර එහිදී ශ්‍රී ලංකා රජයට මූල්‍යමය වශයෙන් විශාල පාඩුවක් දැරීමට සිදුවී ඇත. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු මෙහෙයවයි.

(iii) විමර්ශන කටයුතු 2015 මාර්තු 10 වැනි දින ආරම්භ වූ බව වාර්තා වී ඇත. කෙසේ වුවද, මෙය නඩු අංක B 639/15 යටතේ කොළඹ කොටුව මහේස්ත්‍රාත් උසාවියට යොමුකොට ඇත. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පදනම් කොට ගනිමින් මහේස්ත්‍රාත්වරයා විසින් 2016 ඔක්තෝබර් 20 වන දින උදයංග වීරතුංග මහතා වෙත ජාත්‍යන්තර පොලීසිය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා වූ විවෘත වරෙන්තුවක් නිකුත් කරන ලදී. ඒ කියන්නේ Interpol එක හරහා.

(iv) මෙම නඩුවට අදාළ ලේඛන/තොරතුරු යුක්රේන, සිංගප්පූරු සහ හොංකොං යන රාජ්‍යවල අදාළ බලධාරින්ගෙන් ලබාගත යුතු වූ බැවින් මෙම ක්‍රියාවලිය සඳහා කාලයක් ගත වන බව ද වාර්තා වී ඇත.

(v) ඔව්. මූලික වශයෙන් යුක්රේන සහ සිංගප්පූරු රාජ්‍යයන්ගෙන් ජාත්‍යන්තර පොලිස් සහාය අපේක්ෂා කර ඇති බව වාර්තා වී තිබේ. ඉන් පසුව උදයංග වීරතුංග මහතා සැකකරුවකු වශයෙන් නම් කර ඇති බවත්, විමර්ශන කටයුතුවලට සහාය දැක්වීම සඳහා උසාවියේ පෙනී සිටින ලෙස දැනුම් දීම් ගණනාවක් යවා තිබියදීත් ඔහු හිතා මතාම අධිකරණ පටිපාටිය මඟ හරිමින් සිටින බවත් පැහැදිලි කරමින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් 2016 ඔක්තෝබර් 16වන දින උසාවිය වෙත ඉදිරිපත් කළ තවත් වාර්තාවකින් දැක්වෙන බව දැනගන්නට ලැබී තිබේ.

ඉහත සඳහන් වාර්තාව පදනම් කර ගනිමින් ජාත්‍යන්තර පොලීසිය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා වූ විවෘත වරෙන්තුවක් 2016 ඔක්තෝබර් 20 වන දින මහේස්ත්‍රාත්වරයා නිකුත් කර ඇත. මෙම නඩුව 2016 නොවැම්බර් 25 වැනි දින විභාග කිරීමට නියමිතය.

තවද, ශ්‍රී ලංකාවේ මධ්‍යම අධිකාරිය හරහා ඒ ඒ රටවලට අන්‍යෝන්‍ය නෛතික සහාය ඉල්ලීම් - mutual legal assistance - යවා ඇති අතර ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් සිටී.

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ජනාධිපතිවරණය පවත්වා වසර දෙකකට කිට්ටු කාලයක් වනවා. හවුල් ආණ්ඩුව ඇවිල්ලා අවුරුද්දකුත් මාස තුනක් වනවා. උදයංග වීරතුංග සම්බන්ධ පරීක්ෂණය ආණ්ඩුවටත් ලිට්මස් පරීක්ෂාවක් වාගෙයි. මොකද, ඔබතුමා කිව්වා වාගේ මිග් යානා ගනුදෙනුව නිසා රටට අපකීර්තියක් අත් පත් වෙලා තිබෙනවා; රජයට මූල්‍ය අවාසියක් සිද්ධ වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා. ඒ වාගේම, තවත් චෝදනා දෙකක් තිබෙනවා. ඒවා තමයි, යුක්රේනයේ බෙදුම්වාදීන්ට අවි සැපයීම සහ රුසියානු තානාපති කාර්යාලයේ සේවය කළ තරුණයකුගේ හදිසි මරණය. දැන් මේ ප්‍රමාදයට හේතුව විධියට ඔබතුමන්ලා සඳහන් කරන්නේ යුක්රේන සහ සිංගප්පූරු රාජ්‍යයන්ගෙන් ජාත්‍යන්තර පොලීසියේ සහාය ගන්න ඕනෑ බව දැනුම් දී තිබෙනවා කියායි. පරීක්ෂණ කටයුතු ආරම්භ කළේ 2015 මාර්තු මාසයේයි. මේ පුද්ගලයාටත් ඔහුගේ බිරිඳටත් සාමාන්‍ය ගමන් බලපත්‍ර ලබා දෙන්න විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ආගමන විගමන පාලකවරයා වෙත ලියුමක් නිකුත් කළේ 2015 පෙබරවාරියේයි. ඒ

අනුව ඒ දෙදෙනාගේම සාමාන්‍ය ගමන් බලපත්‍ර ලබා ගන්න -රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රය වෙනුවට සාමාන්‍ය ගමන් බලපත්‍ර ලබාගැනීම සඳහා- උදයංග වීරතුංගගේ බිරිඳ මාර්තු මාසයේ 6වන දා ලංකාවට ඇවිත් ඒ passports දෙක අරගෙන ගියා.

එහෙම නිකුත් කරන්න සිදු වුණේ, මේ සියලු චෝදනා තිබියදී විදේශ කටයුතු අමාත්‍යාංශය විදේශ ගමන් බලපත්‍ර නිකුත් කරන්න කියලා ආගමන විගමන පාලකවරයාට නිර්දේශ කරපු නිසයි. තමුන්නාන්සේලා දැන් ජාත්‍යන්තර පොලීසියේ සහාය පතනවා, අරෙහෙ මෙහේ හොයනවා; හැබැයි අතට ආපු කුරුල්ලාව අල්ලා ගන්න බැරි වුණා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම නිර්දේශයක් කරලා තිබෙනවා කියලා ඔබතුමා කිව්වාට මෙතැන එහෙම දෙයක් ගැන සඳහන් වෙලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒ පිළිබඳව හරි උත්තරයක් දෙන්න නම්, ඒ පිළිබඳව අපේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් විමසලා එය ඇත්තද-නැත්තද කියලා හරියට දැන ගන්න ඕනෑ. ඔබතුමා එසේ කිව්වාට මෙතැන එහෙම සඳහන් වෙලා නැහැ. මම ඊළඟ දවසේ ඒ සම්බන්ධයෙන් ඔබතුමාව දැනුවත් කරන්නම්. 2015.06.17 වන දින email මඟින් ඔහු දෙ-තුන් වතාවක්ම එකඟ වෙලා තිබෙනවා, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය අමාත්‍යාංශයට භාර දෙන බවට. නමුත් ඒක භාර දීලා නැහැ. Immigration and Emigration Department එකෙන් එතුමාගේ භාර්යාවට සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍රයක් ලබා දීම පිළිබඳව මෙතැන කථා වුණා. නමුත් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් එහෙම කරන්න කිව්වා කියලා මෙතැන සඳහන් වෙලා නැහැ. ඒ නිසා ඒ ගැන සොයා බලන්න වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මම මේ ගරු සභාවේදීම ප්‍රශ්නයක් ඇහුවාට පස්සේ නාවින්න ඇමතිවරයා පිළිතුරු දීලා, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ආගමන විගමන පාලකවරයා වෙත යවන ලද ලිපිය සභාගත කළා. ඒ ලිපිය අනුව තමයි උදයංග වීරතුංගටත්, ඔහුගේ බිරිඳටත් රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර වෙනුවට සාමාන්‍ය ගමන් බලපත්‍ර නිකුත් කරන්න කියලා ආගමන විගමන පාලකවරයාට නියෝග කරලා තිබෙන්නේ. ඒ නිසා විදේශ කටයුතු අමාත්‍යාංශය එතැනදී තමන්ගේ වගකීම පැහැර හැරලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මොකක්ද, එතකොට ප්‍රශ්නය?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒක තමයි ප්‍රශ්නය.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
"පැහැර හැරලා තිබෙනවාද?" කියන එකද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
පැහැර හැරලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඉතින් එතැන ප්‍රශ්නයක් නැහැ නේ, ඔබතුමා එහෙම කියනවා නම්. [බාධා කිරීමක්] "පැහැර හැරලා තිබෙනවාද?" කියන එකද ප්‍රශ්නය?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඔව්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක ඔබතුමාට නිගමනය කරන්න බැහැ නේ. "පැහැර හැරලා තිබෙනවාද?" කියලා මගෙන් අහන්න. එතකොට මම කියන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මගේ නිගමනය මම කිව්වා. ඔබතුමා කියන්න කෝ, ඔබතුමාගේ නිගමනය.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කලින් සඳහන් කළ පරිදි ඒ පිළිබඳව මා දැනුවත් වෙලා නැහැ. නාවින්න ඇමතිතුමා එහෙම ලිපියක් සභාගත කළා නම්, මම ඒ පිළිබඳව වහාම ලේකම්තුමාගෙන් විමසලා ඔබතුමාට හරියාකාර උත්තරයක් ලබා දෙන බවට මේ අවස්ථාවේදී පොරොන්දු වෙනවා. සාමාන්‍යයෙන් පුද්ගලයෙක් -ලංකාවේ පුරවැසියෙක්- passport එකක් ඉල්ලුවාම passport එකක් දෙන්න අපි බැඳිලා ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, උදයංග වීරතුංගගේ භාර්යාව පිළිබඳවත් ඔබතුමා කථා කළා. [බාධා කිරීමක්] ඔව්. ඒක තමයි. උදයංග වීරතුංගගේ භාර්යාව සම්බන්ධයෙන් කිසිම චෝදනාවක් තිබෙන බවක් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලබා දුන් තොරතුරු අනුව මට පෙනෙන්න නැහැ.

මම දන්නා ආකාරයට නම් එතුමා භාර ගත් විධියට ඒ වගකීම ඉෂ්ට කර නැහැ. එතුමා එතුමාගේ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය අපේ අමාත්‍යාංශයට භාර දෙනවා කියලා ලිඛිතව පොරොන්දු වෙලා තිබෙනවා. නමුත් එතුමා ඒක කරලා නැහැ. එහෙම නොකර එතුමාට තවත් බලපත්‍රයක් ලබා දුන්න එක පිළිබඳව ගැටලුවක් තිබෙනවා. මම ඒක පිළිගන්නවා. ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නයේ මේක නැහැ. ඒ නිසා අපේ ලේකම්තුමා ඒ ප්‍රශ්නයට පිළිතුරක් මට දීලා නැහැ. ඒ නිසා මම ඒ ගැන සොයලා ඔබතුමාව දැනුවත් කරන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා අහන්නේ පිළිතුරු ලබා දුන් ඒවා සම්බන්ධයෙන්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. මේක ගරු නියෝජ්‍ය ඇමතිතුමා ගොඩක් අමාරුවේ වැටෙන කාලයක් වාගේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේකෙන් ඇහෙන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්නයක් තිබෙනවා. මේකේ දෝංකාරගතිය වැඩියි. හොඳට තියුණුවට ඇහෙන්නේ නැහැ. ඊයේත් මම දැක්කා, පැහැදිලි නැහැයි කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇත්තටම මට ඇහෙන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොකක්ද කරන්නේ? ඒත් මේක අහන්න වෙනවා, නියෝජ්‍ය ඇමතිතුමනි. ඇහුණේ නැහැයි කියලා ඉන්න බැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇහුණේ නැහැයි කියලා පැනලා යන්නේ නැහැ. ආයෙත් කියන්න කෝ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදයංග වීරතුංග මහත්මයාට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ ඔහු තානාපතිවරයෙක් නිසායි. ඔහුගේ තානාපති ධුරය අහෝසි වෙන කොටම රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රය වෙනුවට වෙනත් බලපත්‍රයක් ගත යුතුව තිබෙනවා. ඔබතුමා කියන පරිදි උදයංග වීරතුංග තවමත් ඒ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රය විදේශ කටයුතු අමාත්‍යාංශයට භාර දීලා නැහැ. එහෙම නම් ඇයි ඔබතුමන්ලා system එක හරහා එම බලපත්‍රය අවලංගු නොකළේ. මොකද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ ප්‍රශ්නය විදේශ කටයුතු ඇමතිතුමාට අදාළ ද; ආගමන විගමන දෙපාර්තමේන්තුවට අදාළ ද; පොලීසියට අදාළ ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ඔක්කොම සම්බන්ධයි. ආණ්ඩුවෙන් තමයි අහන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේක ස්ථාවර නියෝග 23(2) යටතේ අහන්න තිබුණා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාත් උදයංග වීරතුංග ගැන වුවටක් හරි - එහෙම නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ. මේක ස්ථාවර නියෝග 23(2) යටතේ තමයි ඔබතුමාට අහන්න තිබුණේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිටපු ජනාධිපතිතුමා මැලේසියාවේ සංචාරයක නිරත වූ වෙලාවේ ඔහු ආසන්නයේම පුටුවේ උදයංග වීරතුංග මහත්මයා වාඩි වී සිටිනවා මා දැක්කා. එහෙම නම් ඔහු ඉන්න රටේ සිට තවත් රටකට ඒම සඳහා ගමන් බලපත්‍රයක් උපයෝගී කොට ගෙන තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මැලේසියාවේ නම් හිටියේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මැලේසියාවේ නැත්නම් ඉන්දුනීසියාවේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මැලේසියාවේ නම් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම නම් ජපානයේ හරි තායිලන්තයේ හරි. එතුමා ගිය රටක. මම දන්නේ නැහැ, රට පොඩ්ඩක් පැටලුනා. ඔබතුමා රට හරියටම දන්නවා වාගේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ආසන්නයේම වාඩි වී සිටියා. ඒකෙන් පෙන්නුම් කරන්නේ ඔහු මේ ගමන් බලපත්‍රය උපයෝගී කර ගන්නා බවයි. මට ඕනෑකම තිබෙන්නේ එතුමාගේ ඥාතිකම කියන්න නොවෙයි. මට ඕනෑකම තිබෙන්නේ ඔහු ගමන් බලපත්‍රය උපයෝගී කර ගෙන විදෙස් සංචාරවල නිරත වන බව ඒ හරහා තහවුරු වන බව කියන්නයි.

තානාපතිවරයෙක් හැටියට උපයෝගී කර ගන්නා රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍රය භාර දී නොමැතිව ඔහු එම බලපත්‍රය උපයෝගී කර ගන්නවා නම් ඒ පිළිබඳව ගරු ඇමතිතුමා ගන්නා පියවර මොකක්ද කියා දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තරය, ඒක එහෙම නොවෙයි කියන එකයි. ඒක අවංලගු කරලා තිබෙනවා. උදයංග වීරතුංග මැතිතුමාගේ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රය අවලංගු කරලායි තිබෙන්නේ. ඔහු ඒකෙන් යනවා නම් ඒ හොරටයි යන්නේ. ඒ ගමන් බලපත්‍රය පාවිච්චි කරලා එතුමාට එහෙම යන්න පුළුවන්ය කියා මම හිතන්නේ නැහැ. ඒ ගමන් බලපත්‍රය අවලංගු කරන්නය කියා Immigration and Emigration Department එකටයි හැම තැනකටම අපි දැනුම් දීලායි තිබෙන්නේ. ඒක එකක්.

දෙවන කාරණාව තමයි, ඔහුට සාමාන්‍ය ගමන් බල පත්‍රයක් තිබෙනවාය කියන එක. ඒ ගමන් බලපත්‍රය හරහා තමයි, ඔහු නොයෙකුත් රටවලට යන්නේ. මම ඔබතුමාට ඉස්සෙල්ලා කිව්වා වාගේ ඒ ප්‍රශ්නය නොවෙයි මෙතැන අහලා තිබුණේ. ඊළඟ වතාවේදී මම ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් ඔබතුමා දැනුවත් කරන්නම්. එතුමාට Interpol එකෙන් දී තිබෙන්නේ Apartment No.20, House No.7, Menanister Lane, Q03110, Ukraine. නමැති ලිපිනයයි. ඒක තමයි දී තිබෙන ලිපිනය. ඒ ලිපිනයේ සොයන විට එතුමා එතැන නැහැ. අපි දන්නේ නැහැ, එතුමා කොහේද ඉන්නේ කියලා. අපිත් internet එකෙන් දැක්කා, එතුමා නොයෙකුත් පුද්ගලයන් එක්ක නොයෙකුත් තැන්වල වාඩි වෙලා ඉන්නවා. මේ පුද්ගලයා Interpol එකෙන් හොයනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

බොළඳ කථා කියන්න එපා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Interpol එකෙන් හොයනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, I think we have to -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Minister, anybody can travel through airlines. So, you can get the details from the particular airline. Do not make irresponsible statements.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

I do not make irresponsible statements. My statement is a very responsible one.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ඔහුට ජාත්‍යන්තර වරෙන්තුවක් තිබෙනවාය කියා. If there is an international warrant issued on somebody, we should be able to trace the man, wherever he travels. Is it not? He does not have to carry a specific passport.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Hon. Deputy Speaker, I have to correct you, there. The Interpol arrest warrant was issued only on the 20th of October, 2016.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Recently.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Just recently.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, you also said that the case would be proceeded with or without his presence, from 25th of November.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

The case will be proceeded from 25th of November. But the Hon. Member, earlier said that he was seen. Yes, he was seen. We all saw him, but that was before the Interpol arrest warrant was issued.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, thank you. ප්‍රශ්න අංක 14 - 682/'16 - ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට සහභාගි වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම් : විස්තර
## ஐ.நா. சபை பொதுக் கூட்டத்தில் கலந்துகொண்ட இலங்கைப் பிரதிநிதிகள் : விபரம்
## SRI LANKAN DELEGATIONS ATTENDED UNITED NATIONS GENERAL ASSEMBLY: DETAILS

375/'15

**1. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5) :

(අ) වර්ෂ 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට (General Assembly) සහභාගි වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල,

(i) ප්‍රධානත්වය දැරුවේ කවුරුන්ද;

(ii) නියෝජිතයන් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිටියේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) වැය කළ මුළු මුදල කොපමණද;

(vi) එම වියදම ගුවන් ගමන්, හෝටල් හා නවාතැන් වියදම් ලෙස එක් එක් ශීර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2005-2015ஆம் ஆண்டுகளில் ஐக்கிய நாடுகள் சபையின் பொதுக் கூட்டத்தில் (General Assembly) கலந்துகொண்ட இலங்கைப் பிரதிநிதிகள் குழுக் களுக்கு,

(i) தலைமை வகித்தவர்கள் யார் என்பதையும்;

(ii) பிரதிநிதிகளின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(iii) இவர்களிடையே பாராளுமன்ற உறுப்பினர்கள் இருந்திருப்பார்களாயின், அவர்களுடைய பெயர்கள் யாவை என்பதையும்;

(iv) வெளிநாட்டலுவல்கள் அமைச்சு உத்தியோகத் தர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(v) செலவிடப்பட்ட மொத்த பணத்தொகை எவ்வள வென்பதையும்;

(vi) மேற்படி செலவு விமானப் பயணங்கள், ஹோட்டல் மற்றும் தங்குமிட செலவுகள் என்ற வாறு ஒவ்வொரு தலைப்புக்கமைய வெவ் வேறாக யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House, in relation to the Sri Lankan delegations that attended the United Nations General Assembly in the years from 2005-2015 -

(i) as to who headed the delegations;

(ii) the number of delegates;

(iii) the names of the Members of Parliament among the delegates, if any;

(iv) the number of officers from the Ministry of Foreign Affairs;

(v) the total amount of money spent; and

(vi) the breakdown of that expenditure under Heads such as Airfares, Hotels and Accommodation separately?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පිළිතුර සභාගත කරන්නද, මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
පිළිතුර කියවන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. පස්වෙනි වතාවට මේ අහන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දෙවෙනි වටය නිසා සභාගත කරන්නට පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විනාඩි 5ක් ගෙන පිළිතුර කියවන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
විනාඩි 5ක් ගෙන පිළිතුර කියවන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

ප්‍රශ්නය අහන්නේ 2005 සිට 2015 දක්වා එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට සහභාගි වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම් ගැනයි. මේ සියල්ලම මට කියන්නට බැහැ, මූලික කාරණා ටික පමණක් කියන්නම්. ඉතිරි ටික සභාගත කරන්නම්.

නියෝජිත කණ්ඩායමේ ප්‍රධානී ලෙස 2005දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත්, 2006දී මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ ශිරන්ති රාජපක්ෂ මැතිනියත්, 2007දී මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ ශිරන්ති රාජපක්ෂ මැතිනියත්, 2008දී මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, 2009දී රත්නසිරි වික්‍රමනායක මැතිතුමාත්, 2010දී මහින්ද රාජපක්ෂ මැතිතුමා, ශිරන්ති රාජපක්ෂ මැතිනිය සහ රෝහිත රාජපක්ෂ මැතිතුමාත්, 2011දී මහින්ද

රාජපක්ෂ මැතිතුමා සහ ශිරන්ති රාජපක්ෂ මැතිනියත්, 2012දී (මහාචාර්ය) ජී.එල්. පීරිස් මැතිතුමාත්, 2013දී මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ ශිරන්ති රාජපක්ෂ මැතිනියත්, 2014දී මහින්ද රාජපක්ෂ මැතිතුමා, ශිරන්ති රාජපක්ෂ මැතිනිය සහ රෝහිත රාජපක්ෂ මැතිතුමාත්, 2015දී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ දහම් සිරිසේන මහතා සහභාගි වෙලා තිබෙනවා.

ඊළඟට අහනවා, "නියෝජිතයන් සංඛ්‍යාව කවරේද?" කියලා. "නියෝජිත කණ්ඩායමේ ප්‍රධානීන් කවුද?" කියලා කලින් කිව්වා. නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 2015දී 7යි. එහෙම නම් මම මෙහෙම කියන්නම්. ඔබතුමා මතක තියා ගන්න, මම මොනවාද කියන්නේ කියලා. ඉස්සෙල්ලාම කියන්නේ නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව, ඊළඟට විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරින් ගණන, වෙනත් නියෝජිතයින් ගණන, සම්පූර්ණ නියෝජිතයන් ගණන, වෙනත් සහභාගිවූවන් ගණන සහ සම්පූර්ණ සහභාගිවූවන් ගණන. මතකයි නේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හරි, හරි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
2005දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීන් ගණන 7යි; විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයන් ගණන 10යි; වෙනත් නියෝජිතයන් ගණන 10යි; සම්පූර්ණ නියෝජිතයන් ගණන 28යි, වෙනත් සහභාගිවූවන් ගණන 13යි, සම්පූර්ණ සහභාගි වූවන් ගණන 41යි.

2006දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීන් ගණන 16යි; විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයින් ගණන 13යි; වෙනත් නියෝජිතයන් ගණන 23යි; සම්පූර්ණ නියෝජිතයින් ගණන 54යි; වෙනත් සහභාගිවූවන් ගණන 17යි; සම්පූර්ණ සහභාගි වූවන් ගණන 71යි.

2007දී මන්ත්‍රීන් නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු ගණන 6යි; විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයින් ගණන 12යි; වෙනත් නියෝජිතයන් ගණන 17යි; සම්පූර්ණ නියෝජිතයින් ගණන 37යි; වෙනත් සහභාගිවූවන් ගණන 35යි; සම්පූර්ණ සහභාගි වූවන් ගණන 72යි.

2008දී මන්ත්‍රීන් ගණන 5යි; විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයින් ගණන 08යි, වෙනත් නියෝජිතයන් ගණන 08යි, සම්පූර්ණ නියෝජිතයින් ගණන 22යි, වෙනත් සහභාගිවූවන් ගණන 19යි, සම්පූර්ණ සහභාගි වූවන් ගණන 41යි.

2009දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන 02යි; විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහභාගි වූ නිලධාරින් ගණන 04යි; වෙනත් නියෝජිතයන් ගණන 10යි; සම්පූර්ණ නියෝජිතයන් ගණන 17යි; සහභාගි වූ වෙනත් අයගේ ගණන 09යි; සම්පූර්ණ සංඛ්‍යාව 26යි.

2010දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන 15යි; විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහභාගි වූ නිලධාරින් ගණන 08යි; වෙනත් නියෝජිතයන් ගණන 14යි; සම්පූර්ණ නියෝජිතයන් ගණන 40යි; සහභාගි වූ වෙනත් අයගේ ගණන 65යි; සම්පූර්ණ සංඛ්‍යාව 105යි.

2011දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන 05යි; අපේ අමාත්‍යාංශයෙන් සහභාගි වූ නිලධාරින් ගණන 09යි; වෙනත් නියෝජිතයන් ගණන 14යි; සම්පූර්ණ නියෝජිතයන් ගණන 30යි; සහභාගි වූ වෙනත් අයගේ ගණන 68යි; සම්පූර්ණ සංඛ්‍යාව 98යි.

2012දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන 06යි; විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහභාගි වූ නිලධාරින් ගණන 06යි; වෙනත් නියෝජිතයන් 01යි; සම්පූර්ණ නියෝජිතයන් ගණන 14යි; වෙනත් අයගේ ගණන 02යි; සම්පූර්ණ සංඛ්‍යාව 16යි.

2013දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන 08යි; විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහභාගි වූ නිලධාරින් ගණන 13යි; වෙනත් නියෝජිතයන් ගණන 17යි; සම්පූර්ණ නියෝජිතයන් ගණන 40යි; සහභාගි වූ වෙනත් අයගේ සංඛ්‍යාව 42යි; සහභාගි වූ සම්පූර්ණ සංඛ්‍යාව 82යි.

2014දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන 11යි; විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහභාගි වූ නිලධාරින් ගණන 11යි; වෙනත් නියෝජිතයන් ගණන 10යි; සම්පූර්ණ නියෝජිතයන් ගණන 35යි; සහභාගි වූ වෙනත් අයගේ ගණන 57යි; සහභාගි වූ සම්පූර්ණ සංඛ්‍යාව 92යි.

2015දී නියෝජිත කණ්ඩායම්වලට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන 04යි; විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහභාගි වූ නිලධාරින් ගණන 11යි; වෙනත් නියෝජිතයන් ගණන 12යි; සම්පූර්ණ නියෝජිතයන් ගණන 29යි; සහභාගි වූ වෙනත් අයගේ ගණන 15යි; සහභාගි වූ සම්පූර්ණ සංඛ්‍යාව 44යි.

ඔබතුමා අසා තිබෙන ඊළඟ ප්‍රශ්නය වන්නේ, "මේ වෙනුවෙන් වැය කළ මුළු මුදල කොපමණද?" යන්නයි. ඒ සියලුම විස්තර මෙම පිළිතුරේ තිබෙනවා. මම එය සභාගත කරන්නම්. දැන් සම්පූර්ණ වියදම විතරක් කියන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඔව්, එකතුව විතරක් කිව්වාම ඇති, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි, වියදමේ එකතුව රුපියල් මිලියනවලින් කියනවා නම් 2005දී 27.5යි; 2006දී 49.4යි; 2007දී 48.2යි; 2008දී 75.4යි; 2009දී 67.1යි; 2010දී 129.9යි; 2011දී 169.1යි; 2012දී 30යි; 2013දී 125.2යි; 2014දී 162යි; 2015දී 90යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට අදාළ සම්පූර්ණ පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කරුණාකර Iවන ඇමුණුමෙහි 1වන තීරුව බලන්න.
(ii) කරුණාකර Iවන ඇමුණුමෙහි V වන තීරුව බලන්න.
(iii) කරුණාකර Iවන ඇමුණුමෙහි II වන තීරුව බලන්න.
(iv) කරුණාකර I වන ඇමුණුමෙහි III වන තීරුව බලන්න.
(v) කරුණාකර II වන ඇමුණුම බලන්න.
(vi) කරුණාකර II වන ඇමුණුම බලන්න.

(ආ) පැන නොනඟී.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ඇමුණුම -1

## 2005 සිට 2015 දක්වා එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්

| | I | II | III | IV | V | VI | VII |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | නියෝජිත කණ්ඩායමේ ප්‍රධානී | නියෝජිත කණ්ඩායම් වලට සහභාගී වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් | විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් ගණන | වෙනත් නියෝජිතයින් ගණන | සම්පූර්ණ නියෝජිතයින් ගණන | වෙනත් සහභාගිවූවන් ගණන | සම්පූර්ණ සහභාගි වූවන් ගණන |
| 2005 | අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය | 1. ගරු ලක්ෂ්මන් කදිර්ගාමර් මැතිතුමා<br>2. ගරු ඩී.ඊ.ඩබ්.ගුණසේකර මැතිතුමා<br>3. ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය<br>4. ගරු ඒ.එල්.එම්.අතාවුල්ලා මැතිතුමා<br>5. ගරු මහින්දානන්ද අළුත්ගමගේ මැතිතුමා<br>6. ගරු මහින්ද අමරවීර මැතිතුමා<br>7. ගරු ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමා | 10 | 10 | 28 | 13 | 41 |
| 2006 | අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා<br>ශිරන්ති රාජපක්ෂ මැතිනිය | 1. ගරු මංගල සමරවීර මැතිතුමා<br>2. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා<br>3. ගරු එස්.සූරියආරච්චි මැතිතුමා<br>4. ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා<br>5. ගරු මහින්ද සමරසිංහ මැතිතුමා<br>6. ගරු ගුණරත්න වීරකෝන් මැතිතුමා<br>7. ගරු ආතාවුද සෙනෙවිරත්න මැතිතුමා<br>8. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා<br>9. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා<br>10. ගරු නිර්මල කොතලාවල මැතිතුමා<br>11. ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා<br>12. ගරු ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මැතිතුමා<br>13. ගරු සුසිල් ප්‍රේමජයන්ත් මැතිතුමා<br>14. ගරු ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමා<br>15. ගරු විශ්වා වර්ණපාල මැතිතුමා<br>16. ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා | 13 | 23 | 54 | 17 | 71 |
| 2007 | අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා<br>ශිරන්ති රාජපක්ෂ මැතිනිය | 1. ගරු රෝහිත බෝගොල්ලාගම මැතිතුමා<br>2. ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා<br>3. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා<br>4. ගරු ටී.බී.ඒකනායක මැතිතුමා<br>5. ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා<br>6. ගරු ආර්.එම්.සී.බී.රත්නායක මැතිතුමා | 12 | 17 | 37 | 35 | 72 |
| 2008 | අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා | 1. ගරු රෝහිත බෝගොල්ලාගම මැතිතුමා<br>2. ගරු සුසිල් ප්‍රේමජයන්ත් මැතිතුමා<br>3. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා<br>4. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා<br>5. ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා | 08 | 08 | 22 | 19 | 41 |

| | I | II | III | IV | V | VI | VII |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | නියෝජිත කණ්ඩායමේ ප්‍රධානී | නියෝජිත කණ්ඩායම් වලට සහභාගී වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් | විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් ගණන | වෙනත් නියෝජිතයින් ගණන | සම්පූර්ණ නියෝජිතයින් ගණන | වෙනත් සහභාගීවූවන් | සම්පූර්ණ සහභාගී වූවන් ගණන |
| 2009 | ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා | 1. ගරු රෝහිත බෝගොල්ලාගම මැතිතුමා<br>2. ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා | 04 | 10 | 17 | 09 | 26 |
| 2010 | අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා<br>ශිරන්ති රාජපක්ෂ මැතිනිය<br>රෝහිත රාජපක්ෂ මැතිතුමා | 1. ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මැතිතුමා<br>2. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා<br>3. ගරු ඩබ්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා<br>4. ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා<br>5. ගරු ප්‍රියංකර ජයරත්න මැතිතුමා<br>6. ගරු ඒ.එච්.එම්.අස්වර් මැතිතුමා<br>7. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා<br>8. ගරු සජින් ද වාස් ගුණවර්ධන මැතිතුමා<br>9. ගරු ශ්‍රී රංග මැතිතුමා<br>10. ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමා<br>11. ගරු තේනුක විදානගමගේ මැතිතුමා<br>12. ගරු අර්ල් ගුණසේකර මැතිතුමා<br>13. ගරු ජෝන් අමරතුංග මැතිතුමා<br>14. ගරු මනූෂ නානායක්කාර මැතිතුමා<br>15. ගරු ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමා | 08 | 14 | 40 | 65 | 105 |
| 2011 | අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා<br>ශිරන්ති රාජපක්ෂ මැතිනිය | 1. ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මැතිතුමා<br>2. ගරු සජින් ද වාස් ගුණවර්ධන මැතිතුමා<br>3. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා<br>4. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා<br>5. ගරු මහින්ද සමරසිංහ මැතිතුමා | 09 | 14 | 30 | 68 | 98 |
| 2012 | ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මැතිතුමා | 1. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා<br>2. ගරු ආර්.ඒ.පී.සී.රණවක මැතිතුමා<br>3. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා<br>4. ගරු සජින් ද වාස් ගුණවර්ධන මැතිතුමා<br>5. ගරු උදය ගම්මන්පිල මැතිතුමා<br>6. ගරු රාවුෆ් හකීම් මැතිතුමා | 06 | 01 | 14 | 02 | 16 |
| 2013 | අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා<br>ශිරන්ති රාජපක්ෂ මැතිනිය | 1. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා<br>2. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා<br>3. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා<br>4. ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මැතිතුමා<br>5. ගරු සජින් ද වාස් ගුණවර්ධන මැතිතුමා<br>6. ගරු ලොහාන් රත්වත්ත<br>7. ගරු ආතාවුද සෙනෙවිරත්න මැතිතුමා<br>8. ගරු රාවුෆ් හකීම් මැතිතුමා | 13 | 17 | 40 | 42 | 82 |

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

| | I | II | III | IV | V | VI | VII |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | නියෝජිත කණ්ඩායමේ ප්‍රධානී | නියෝජිත කණ්ඩායම් වලට සහභාගී වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් | විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් ගණන | වෙනත් නියෝජිතයින් ගණන | සම්පූර්ණ නියෝජිතයින් ගණන | වෙනත් සහභාගීවූවන් | සම්පූර්ණ සහභාගී වූවන් ගණන |
| 2014 | අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා<br>ශිරන්ති රාජපක්ෂ මැතිනිය<br>රෝහිත රාජපක්ෂ මැතිතුමා | 1. ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මැතිතුමා<br>2. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා<br>3. ගරු සුසිල් ප්‍රේමජයන්ත් මැතිතුමා<br>4. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා<br>5. ගරු සජින් ද වාස් ගුණවර්ධන මැතිතුමා<br>6. ගරු නිරුපමා රාජපක්ෂ මැතිනිය<br>7. ගරු ඒ.එච්.එම්.අස්වර් මැතිතුමා<br>8. ගරු ජේ.ආර්.පී.සූරියප්පෙරුම මැතිතුමා<br>9. ගරු නෙරංජන් වික්‍රමසිංහ මැතිතුමා<br>10. ගරු කනක හේරත් මැතිතුමා<br>11. ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා | 11 | 10 | 35 | 57 | 92 |
| 2015 | අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා<br>දහම් සිරිසේන මහතා | 1. ගරු මංගල සමරවීර මැතිතුමා<br>2. ගරු මහින්ද සමරසිංහ මැතිතුමා<br>3. ගරු විජේදාස රාජපක්ෂ මැතිතුමා<br>4. ගරු ඩී.එම්.ස්වාමිනාදන් මැතිතුමා | 11 | 12 | 29 | 15 | 44 |

ඇමුණුම- II

වියදම් වාර්තාව - එක්සත් ජාතීන්ගේ මහ සමුළුව 2005 සිට 2015 දක්වා

| වර්ෂය | නවාතැන් | | ප්‍රවාහන | | සන්නිවේදන | | වෙනත් වියදම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | US $ | SLRs | US $ | SLRs | US $ | SLRs | US $ | SLRs | US $ | SLRs |
| **2005** | 127,188.49 | 12,883,510.08 | 113,866.28 | 11,644,741.93 | 10,791.98 | 1,101,574.64 | 31,460.53 | 1,882,287.86 | **283,307.28** | **27,512,114.51** |
| **2006** | 158,848.24 | 16,595,347.42 | 112,325.14 | 12,015,344.17 | 30,023.11 | 1,850,219.13 | 72,999.93 | 19,003,690.65 | **374,196.42** | **49,464,601.37** |
| **2007** | 222,691.66 | 25,199,056.53 | 107,987.60 | 12,219,294.99 | 27,954.97 | 3,136,048.91 | 68,694.74 | 7,737,292.58 | **427,328.97** | **48,291,693.01** |
| **2008** | 336,913.71 | 37,397,421.81 | 190,542.90 | 21,150,261.90 | 19,907.43 | 2,209,724.73 | 132,660.45 | 14,658,979.72 | **680,024.49** | **75,416,388.16** |
| **2009** | 273,198.46 | 31,636,381.66 | 126,562.05 | 14,655,885.39 | 15,478.56 | 1,792,299.13 | 164,083.76 | 19,000,899.41 | **579,322.83** | **67,085,465.59** |
| **2010** | 633,255.20 | 71,484,324.61 | 389,432.43 | 36,062,842.60 | 56,367.90 | 6,375,209.49 | 141,194.95 | 15,969,148.84 | **1,220,250.48** | **129,891,525.54** |
| **2011** | 972,581.90 | 109,999,007.23 | 131,082.50 | 14,825,430.75 | 60,081.08 | 6,795,170.14 | 331,611.77 | 37,505,291.18 | **1,495,357.25** | **169,124,899.30** |
| **2012** | 92,915.41 | 12,264,834.12 | 86,111.21 | 11,366,679.72 | 12,839.88 | 1,694,864.16 | 36,489.69 | 4,816,639.08 | **228,356.19** | **30,143,017.08** |
| **2013** | 564,111.04 | 74,462,657.28 | 236,156.20 | 31,172,618.40 | 29,407.47 | 3,881,786.04 | 118,930.53 | 15,698,829.96 | **948,605.24** | **125,215,891.68** |
| **2014** | 750,000.00 | 99,000,000.00 | 264,594.76 | 36,062,842.60 | 61,357.65 | 8,099,209.80 | 139,619.59 | 18,785,789.88 | **1,215,572.00** | **161,947,842.28** |
| **2015** | 437,698.80 | 62,493,716.03 | 152,982.24 | 21,797,726.95 | 4,130.00 | 574,951.52 | 38,364.06 | 5,527,132.68 | **633,175.10** | **90,393,527.18** |

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයේ (අ) (i) කොටස වන, "වර්ෂ 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට සහභාගි වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල ප්‍රධානත්වය දැරුවේ කවුද?" කියන එකට ඔබතුමා මහින්ද රාජපක්ෂ, ශිරන්ති රාජපක්ෂ කියන නම් දෙකට අමතරව, අවස්ථා දෙකකදී තවත් රාජපක්ෂ කෙනෙකුගේ නමක් කිව්වා. ප්‍රධානත්වය දැරූ ඒ අය කවුද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, මේ දීලා තිබෙන ලේඛනවල විස්තර අනුව වගකීමක් ඇතිවයි මම මේ කියන්නේ. නියෝජිත කණ්ඩායමේ ප්‍රධානීන් ලෙස, "අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, ශිරන්ති රාජපක්ෂ මැතිනිය, රෝහිත රාජපක්ෂ මැතිතුමා" කියන අයගේ නම් තමයි එම ලේඛනවල 'ප්‍රධානී' කියලා සඳහන් වන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් අහන්නේ දෙවැනි අතුරු ප්‍රශ්නයයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් මම පැහැදිලි කර ගැනීමක් විතරයි කර ගත්තේ. මොකද, මේ sound එක නිසා කලින් මට ඒ නම පැහැදිලිව ඇහුණේ නැහැ. "රාජපක්ෂ" කියා විතරයි ඇහුණේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ඔබතුමාට ඕනෑ ඒ නම තනියම කියවා ගන්නද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

'රෝහිත රාජපක්ෂ' කියන්නේ අපි දන්නා විධියට හිටපු ජනාධිපතිතුමාගේ තුන්වැනි පුතා; බාලයා. එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධානත්වය දරන්න ඔහුට තිබෙන සුදුසුකම මොකක්ද, මහින්ද රාජපක්ෂ මහතාගේ පුතා වීම හැර?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මා මේ ගැන හොයා බලන්නම්. නමුත්, මට පෙනෙන විධියට - [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, you can give a short answer. We are running out of time.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් කරන්න සිද්ධ වෙනවා. මේකෙදී ඒ පවුලේ පුද්ගලයින් යනවා නම් ප්‍රධානීන්ගේ කණ්ඩායමට ඒ සියලුම දෙනා ඇතුළත් කර තිබෙනවා. නමුත්, එක ප්‍රධානියායි ඉන්නේ. ප්‍රධානියා වන්නේ, රටේ ජනාධිපති යනවා නම් එතුමායි; එහෙමත් නැත්නම් ඒ කණ්ඩායම lead කරන පුද්ගලයායි. සමහර වෙලාවට අගමැතිතුමා වෙන්න පුළුවන්. ඉතින් අගමැතිතුමා හෝ ජනාධිපතිතුමා තමයි ප්‍රධානියා. නමුත්, පවුලේ අය යනවා නම් ඒ අයත් ඒ ප්‍රධානියා ඇතුළත් කරන column එකේ ඇතුළත් කරන බව තමයි - [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි, පැහැදිලියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, 2010 සහභාගි වූ සංඛ්‍යාව 105යි, 2011 සහභාගි වූ සංඛ්‍යාව 98යි කියලා. ඒ වාගේම 2011 වසරේ වැය කළ මුදල රුපියල් මිලියන169යි, 2010 වසරේ වැය කළ මුදල රුපියල් මිලියන 129යි කියලා සඳහන් කළා. දැන් 2011 වසර ගත්තොත්, රුපියල් මිලියන 169ක් වියදම් කරලා සියයකට වැඩි සංඛ්‍යාවක් එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට අරගෙන ගියත්, රට වෙනුවෙන් ඒ සමස්ත කණ්ඩායමටම ඒ සමුළුව පැවැති ශාලාව ඇතුළටවත් යන්න ඉඩ දීලා තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මා හිතන විධියට ඒ අවස්ථාවේදී හයදෙනකුට විතර ශාලාවට යන්න පුළුවන්. ඔබතුමා ඇහුවේ 2010 වසර ගැනද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඉතිරි අය Trump Tower එකේ හිටියා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ 2010 ගැන නේ. අනෙක් අවුරුදුවල කියන්න බැහැ. මා 2010 ගැන විතරක් කියන්නම්. Head of Delegation: the Hon. Mahinda Rajapaksa, Madam Shiranthi Rajapaksa, Mr. Rohitha Rajapaksa; Names of

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Members of Parliament: the Hon. (Prof.) G.L. Peiris, the Hon. Nimal Siripala De Silva, the Hon. W.D.J. Senewiratne, the Hon. Douglas Devananda, the Hon. Piyankara Jayaratne, the Hon. A.H.M. Azwer, the Hon. Arumugan Thondaman, the Hon. Sajin De Vas Gunawardhana, the Hon. J. Sri Ranga, the Hon. Shantha Bandara, the Hon. Thenuka Vidanagamage, the Hon. Earl Gunasekara, the Hon. John Amaratunaga, the Hon. Manusha Nanayakkara and the Hon. Namal Rajapaksa.

ඊට පස්සේ Officials of the Ministry of External Affairs: C.R. Jayasinghe, Secretary, Wijewardene, C.H.M. Wijeratne, A.L. Ratnapala, Lalith Weeratunga, Secretary to the President -ඔහු අපේ කෙනෙක් නොවෙයි - Shenuka Senewiratne, Rasika Wasalathantri, Kosala Perera, T.N. Gamlath, Jaliya Wickramasuriya, W.T. Wijeratne, R.K. Lenegala, Samantha Jayasuriya and M.H. Hemasiri.

ඊට පස්සේ "other officials" කියලා මේ නම් ටික සඳහන් කරලා තිබෙනවා: Mohan Peiris, Anoma Wickramasuriya, Keerthi Disanayake, Prof. S.D. Jayaratna, Major A.A.R.L. de Silva, Daya Gallage, Umeshini Liyanapatabedi, Chandani Bandara, Shamali Indika, Ajith Nivard Cabraal, Malini Amaratunga and Chitra Jayawardene.

ඊට පස්සේ security එකේ අය 46 සිට 78 දක්වා සඳහන් කර තිබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. John Amaratunga?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පොඩ්ඩක් ඉන්න. 46, 56, 66, 76 යටතේ security එකේ අය 32ක් ඉන්නවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේ සංචාරය සඳහා මටත් ආරාධනා කරලා තිබුණා. යන්න අවශ්‍ය නැහැයි කියලා අගමැතිතුමා මට කිව්වා. ඒ නිසා මා ගියේ නැහැ. ඒ නිසා ඔය ලේඛනය හදා ගන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේ ලේඛනය හදා ගන්න ඕනෑද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔව්, දැන් හදා ගන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා එක සංචාරයකට ගියා නේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඊට පස්සේ රෝම සංචාරයට සහභාගි වුණා. ඒ සංචාරය ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයට සම්බන්ධයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඊට පස්සේ මාධ්‍යයෙන් ගිහිල්ලා තිබෙනවා, රාජකරුණානායක, සුදත් සිල්වා, විජයානන්ද හේරත්, ඒ.එල්. සිගේරා, එච්.එන්. ප්‍රසන්න, ටී.ජී. ධම්මික, එම්.ඒ. අරුණ පීරිස්, මිලින්ද රත්නායක, එම්.එල්. කරුණාරත්න, ජී.කේ.ඩී.එස්.ආර්. වසන්ත, ආර්.කේ.ඒ. සුමින්ද කීර්තියන්, ශ්‍යාමලී තුඩාවේ යන අය. ඊට පස්සේ ඒකට business delegation එකකුත් ගිහින් තිබෙනවා. මේ සියලුදෙනාම එකතු වුණාම තමයි ඒ 105 හැදෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අද කාල වේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. එක්සත් ජාතීන්ගේ මහා සමුළුවට මෙවැනි දැවැන්ත වන්දනා නඩයක් රැගෙන යෑම විදේශ කටයුතු අමාත්‍යාංශය සාධාරණීකරණය කරලා තිබෙන්නේ කොහොමද? එය නිර්දේශ කරලා තිබෙන්නේ කවුද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරයා යම් කිසි චාරිකාවක යනවා නම්, කවුද රැගෙන යන්නේ කියලා එතුමා තීරණය කරනවා. ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයට දන්වනවා. එහෙම වෙන්න ඇති, මේ 105දෙනා රැගෙන ගිහින් තිබෙන්නේ. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මේ සියලුදෙනාටම ගෙවීම් කරන්නේ නැහැ. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ගෙවීම් කරන්නේ, ඒ delegation එකට officially සම්බන්ධ වන අයට පමණයි. මා එක උදාහරණයක් කියන්නම්.

දැනට සති තුනකට හෝ සති හතරකට කලින් මා ගරු ජනාධිපතිතුමා සමඟ BRICS-BIMSTEC සමුළුවට ගියා. ඒ සමුළුවට සහභාගි වන අයගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරලා තිබුණා. මා ඒ ලැයිස්තුව ජනාධිපතිතුමාට පෙන්වා කිව්වා, "ගරු ජනාධිපතිතුමනි, මේ සංචාරයට යන සෙනඟ වැඩියි. අපි මෙපමණ පිරිසක් ගෙන යන්න ඕනෑ නැහැ"යි කියලා. ගරු ජනාධිපතිතුමා ඒ ලැයිස්තුව අරගෙන මා ඉදිරිපිට එතුමාගේ ලේකම්තුමාට කථා කරලා, security එකට කථා කරලා, media එකට කථා කරලා කිව්වා, මෙපමණ පිරිසක් ගෙන යන්න ඕනෑ නැහැ, මේ ලැයිස්තුවෙන් නම් කපන්නය කියලා. ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරයකු වශයෙන් මා පමණයි එතුමා සමඟ ගියේ. එතකොට official delegation එකේ සිටියේ අපි දෙදෙනාත්, අපේ Ambassador සහ තවත් එක් කෙනෙක් හෝ දෙදෙනෙක් පමණයි. ඉතාමත්ම කුඩා කණ්ඩායමක් එක්ක තමයි අපි ගියේ. ඒ අවස්ථාවේදී විදේශ කටයුතු අමාත්‍යාංශය ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරලා ඒ list එකෙන් නම් කැපුවා. අවසානයේදී බොහොම සුළු පිරිසක් තමයි ඒ delegation එකේ සිටියේ. ඉස්සර ඒ විධියට වුණේ නැති නිසා වෙන්න ඇති මේ ආකාරයට එකසිය ගණනක් යන්න ඇත්තේ.

## ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය: මාධ්‍ය ප්‍රචාරය සඳහා වැය කළ මුදල

### தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சு: ஊடக விளம்பரச் செலவு

### MINISTRY OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS: MONEY SPENT ON MEDIA PROPAGANDA

704/'16

**3. ගරු වාසුදේව නානායක්කාර මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)**

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)

(The Hon. Vasudeva Nanayakkara on behalf the Hon. Udaya Prabhath Gammanpila)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2016 අප්‍රේල් මස සිට ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන්හි පළ කරන, ණය අර්බුදය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එකී ප්‍රචාරක දැන්වීම් පළ කරන ලද පුවත් පත්වල නම් සහ එක් එක් පුවත් පතේ දැන්වීම් පළ කිරීමට වැය වූ මුදල, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී දැන්වීම් විකාශනය කිරීම සඳහා රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකාවන්ට ගෙවූ මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත් ආකාරය කවරේද;

(v) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත්තේ රජයේ මුදල් භාවිතයෙන් නම්, ඒ සඳහා අරමුදල් සපයා ගත් වැය ශීර්ෂය කවරේද;

(vi) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත්තේ අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල අනුග්‍රහයෙන් නම්, එම ආයතනවල නම් සහ එක් එක් ආයතනයෙන් ලබා දුන් මුදල්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2016 ஏப்பிரல் மாதம் தொடக்கம் தேசிய கொள்கைள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சினால் அச்சு மற்றும் இலத்திரனியல் ஊடகங்களில் வெளியிடப்பட்ட, கடன் நெருக்கடி பற்றிய விளம்பரங்களுக்கென செல விடப்பட்ட மொத்தப் பணத்தொகை எவ்வள வென்பதையும்;

(ii) மேற்படி விளம்பரங்கள் பிரசுரிக்கப்பட்ட பத்திரிகைகளின் பெயர்கள் மற்றும் ஒவ்வொரு பத்திரிகையிலும் விளம்பரங்களை பிரசுரிப்பதற் காக செலவிடப்பட்ட பணத்தொகை ஆகியன தனித்தனியே யாதென்பதையும்;

(iii) இவ்விளம்பரங்களை ஒளி/ஒலி பரப்புவதற்காக தொலைக்காட்சி மற்றும் வானொலி அலை வரிசைகளுக்கு செலுத்தப்பட்ட பணத்தொகை தனித்தனியே எவ்வளவென்பதையும்;

(iv) மேற்படி விளம்பரங்களுக்கு நிதி பெறப்பட்ட விதம் யாதென்பதையும்;

(v) மேற்படி விளம்பரங்களுக்கான நிதி அரசாங்க பணத்தை பயன்படுத்தி பெறப்பட்டிருப்பின், இதற்கான நிதி பெறப்பட்ட செலவுத் தலைப்பு யாதென்பதையும்;

(vi) இவ்விளம்பரங்களுக்கான நிதி பெறப்பட்டது அரச சார் மற்றும் தனியார் துறை நிறுவனங் களின் அனுசரணையில் எனின், இந்நிறுவனங் களின் பெயர்கள் மற்றும் ஒவ்வொரு நிறுவனமும் பெற்றுக்கொடுத்த பணத்தொகை தனித்தனியே யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the total amount of money spent for the propaganda advertisements on debt crisis in print and electronic media by the Ministry of National Policies and Economic Affairs from April, 2016;

(ii) separately, the names of the newspapers in which the aforesaid advertisements were published along with the amount of money spent for that;

(iii) separately, the amount of money paid to the TV and radio channels to broadcast those advertisements;

(iv) as to how the funds were raised for those advertisements;

(v) if the funds for those advertisements were obtained from public funds, the Expenditure Heads from which those funds were obtained; and

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

(vi) if the funds for those advertisements were obtained through semi-government and private sector sponsorship, the names of those institutions and the amount of money obtained from each institution, separately?

(b) If not, why?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රුපියල් 26,862,715.07 (රුපියල් දෙකෝටි හැටඅටලක්ෂ හැටදෙදහස් හත්සිය පහළොවයි ශත හතක් පමණි.

(ii)

| අංකය | පුවත්පතේ නම | වැය වූ මුදල රු. |
|---|---|---|
| 1. | දිනමිණ | 160,500.00 |
| 2. | ඩේලිනිව්ස් | 253,000.00 |
| 3. | සන්ඩේ ඔබ්සවර් | 520,000.00 |
| 4. | ලංකාදීප | 789,245.00 |
| 5. | ලංකාදීප (ඉරිදා) | 1,872,000.00 |
| 6. | අද | 204,000.00 |
| 7. | ඩේලිඑෆ්ටී | 200,000.00 |
| 8. | ඩේලිමිරර් | 574,080.00 |
| 9. | සන්ඩේ ටයිම්ස් | 729,000.00 |
| 10. | දිවයින | 113,400.00 |
| 11. | දිවයින (ඉරිදා) | 594,000.00 |
| 12. | මව්බිම (ඉරිදා) | 892,500.00 |
| 13. | රාවය | 240,000.00 |
| 14. | වීරකේසරි | 372,300.00 |
| 15. | වීරකේසරි (ඉරිදා) | 367,200.00 |
| 16. | තිනක්කුරල් | 49,980.00 |
| 17. | උදයන් | 90,000.00 |
| 18. | උදයන් (ඉරිදා) | 108,000.00 |
| එකතුව | | 8,129,205.00 |

(iii)

| අංකය | රූපවාහිනී නාලිකාවේ නම | වැය වූ මුදල (රු.) |
|---|---|---|
| 1. | හිරු ටීවී | 3,490,006.50 |
| 2. | අයිටීඑන් | 2,337,993.00 |
| 3. | සිරස ටීවී | 1,953,045.00 |
| 4. | දෙරණ | 1,723,208.40 |
| 5. | ස්වර්ණවාහිනී | 1,415,250.00 |
| 6. | එම් ටීවී | 1,358,640.00 |
| 7. | ටීඑන්එල් ටීවී | 815,184.00 |
| 8. | ඩයලොග් ටීවී | 452,880.00 |
| එකතුව | | 13,546,206.90 |

ගුවන් විදුලි නාලිකා සඳහා ගෙවූ මුදල

| අංකය | ගුවන් විදුලි නාලිකාවේ නම | වැය වූ මුදල (රු.) |
|---|---|---|
| 1. | හිරු එෆ් එම් | 1,585,080.00 |
| 2. | නෙත් එෆ් එම් | 849,150.00 |
| 3. | රිදම් එෆ් එම් | 396,270.00 |
| 4. | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 339,660.00 |
| එකතුව | | 3,170,160.00 |

(iv) අංක 16/0563/702/022 හා 28.03.2016 දින අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද අතිරේක ප්‍රතිපාදන මඟින්.

(v) 104-01-02-0-1405-3-11

(vi) අර්ධ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් අරමුදල් සපයාගෙන නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 5 -723/'16- (3), ගරු ටී.රංජිත් ද සොයිසා මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரி. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කැවැන්ඩිස් කෙසෙල් වගාව : වනාන්තර ඉඩම් ලබා දීම

## கெவென்டீஸ் வாழைச் செய்கை: வனப் பிரதேச காணி வழங்கியமை

## CULTIVATION OF CAVENDISH BANANAS: ALLOCATION OF FOREST LAND

730/'16

**6.** ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අපනයනය සඳහා කැවැන්ඩිස් කෙසෙල් ප්‍රභේදය වගා කිරීමට ඩෝල් නමැති බහුජාතික සමාගමේ ලංකාවේ හවුල්කාර සමාගම වන ඩෝල් ලංකා සමාගමට මොනරාගල දිස්ත්‍රික්කයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම් ලබා දී ඇති පදනම කවරේද;

(ii) ඉහත සමාගමට ලබා දී ඇති වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) කිරිඳි ඔයේ හා මැණික් ගඟේ ස්ථාපිත කර ඇති අධි බලැති ජල මෝටර් මඟින් මෙම සමාගමේ වගා බිම්වලට ජලය ලබා ගැනීමට අවසර ලබාදී ඇති ආයතනය සහ අවසර ලබා දීමේ පදනම කවරේද;

(iv) ලෝකයේ අපකීර්තිමත්ම සමාගමකට ලංකාවේ ඉඩම් ලබා දීමටත්, අධික ලෙස කෘෂි රසායන භාවිත කරමින් කැවැන්ඩිස් කෙසෙල් වගා බිම් පිහිටුවීමටත් අනුමතිය ලබා දුන් ආයතනය සහ අනුමතිය ලබා දීමේ පදනම කවරේද;

(v) මෙම සමාගමට ඉඩම් ලබා දීම සඳහා කැබිනට් අනුමතිය ලබා ගෙන තිබේද;

(vi) වන සංරක්ෂණ ආඥා පනත සහ ජාතික පාරිසරික පනත උල්ලංඝනය කරමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම්වල නීති විරෝධීව මහා පරිමාණ වගා බිම් ස්ථාපිත කිරීමට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஏற்றுமதிக்காக கெவென்டீஸ் வாழை இனத்தை பயிரிடுவதற்கு டோல் என்ற பல்தேசியக் கம்பனியின் இலங்கையின் பங்காண்மைக் கம்பனியான டோல் லங்கா கம்பனிக்கு மொனராகலை மாவட்டத்தில் வன பாதுகாப்புத் திணைக்களத்திற்கு சொந்தமான காட்டுப் பிரதேச காணிகள் கொடுக்கப்பட்டுள்ள அடிப்படை யாதென்பதையும்;

(ii) மேற்படி கம்பனிக்கு பெற்றுக்கொடுக்கப்பட்டுள்ள வன பாதுகாப்புத் திணைக்களத்திற்கு சொந்தமான காணியின் அளவு எவ்வளவென்பதையும்;

(iii) கிரிந்தி ஓயா மற்றும் மாணிக்க கங்கையில் நிறுவப்பட்டுள்ள அதி சக்திவாய்ந்த நீர் இறைக்கும் இயந்திரங்களின் மூலம் இக்கம்பனியின் விளை நிலங்களுக்கு நீரைப் பெற்றுக் கொள்வதற்கு அனுமதியளித்துள்ள நிறுவனம் மற்றும் அனுமதி வழங்கப்பட்டுள்ள அடிப்படை யாதென்பதையும்;

(iv) உலகில் இகழ்ச்சிக்குள்ளான கம்பனியொன்றுக்கு இலங்கையின் காணிகளை பெற்றுக் கொடுப்பதற்கும், அதிகளவில் விவசாய இரசாயனப் பொருட்களை பயன்படுத்தி கெவென்டீஸ் வாழைச் செய்கை நிலங்களை உருவாக்குவதற்கும் அங்கீகாரம் பெற்றுக்கொடுத்த நிறுவனம் மற்றும் அங்கீகாரம் பெற்றுக் கொடுக்கப்பட்ட அடிப்படை யாதென்பதையும்;

(v) மேற்படி கம்பனிக்கு காணி பெற்றுக்கொடுக்க அமைச்சரவை அங்கீகாரம் பெறப்பட்டுள்ளதா என்பதையும்;

(vi) காடு பேணல் கட்டளைச் சட்டம் மற்றும் தேசிய சுற்றாடல் சட்டத்தை மீறுகின்ற வகையில் வன பாதுகாப்புத் திணைக்களத்திற்குச் சொந்தமான வனக் காணிகளில் சட்டவிரோதமாக பாரியளவில் விளை நிலங்களைத் தாபிப்பதற்கு எதிராக சட்டம் அமுல்படுத்தப்படாமைக்கான காரணம் யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the basis on which the forest lands of the Monaragala District belonging to the Department of Forest Conservation were allotted to Dole Lanka Private Limited, which is the partner company in Sri Lanka of multinational company called Dole to cultivate the Cavendish banana species;

(ii) the extent of land of the Department of Forest Conservation given to the above company;

(iii) the institution that granted permission to this company to pump water to its farming lands using high-powered motor pumps installed at Kirindi Oya and Menik Ganga and the basis of granting such permission;

(iv) the institution which granted permission for the allocation of lands and the establishment of Cavendish banana farm lands using excessive amounts of agrochemical, to one of the most scandalous companies in the world and the basis of granting such approval;

(v) whether the approval of the Cabinet of Ministers has been obtained to allot lands to this company; and

(vi) the reason for not invoking the law against the establishment of large-scale farming lands illegally in forest lands belonging to the Department of Forest Conservation,

[ගරු බිමල් රත්නායක මහතා]

violating the Forest Conservation Ordinance and the National Environmental Act?

(b) If not, why?

**ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම් "ඩෝල් ලංකා සමාගම" වෙත ලබා දී නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අයත් ආයතන කිසිවක් විසින් මේ සඳහා අනුමැතිය ලබා දී නොමැත.

(iv) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අයත් ආයතන කිසිවක් විසින් මේ සඳහා අනුමැතිය ලබා දී නොමැත.

(v) සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඇත.

(vi) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනාන්තර ඉඩම්වල නීති විරෝධීව මහා පරිමාණ වගා බිම් ස්ථාපිත කිරීමට එරෙහිව අදාළ නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇත.

(ආ) පැන නොනඟී.

## "තේ ශක්ති" තේ කර්මාන්තශාලා : විස්තර
## 'தே சக்தி' தேயிலைத் தொழிற்சாலைகள் : விபரம்
## "TEA SHAKTHI" TEA FACTORIES : DETAILS

877/'16

**9. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු විදුර වික්‍රමනායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு விதுர விக்கிரமநாயக்க சார்பாக)
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. Vidura Wickramanayaka)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයිනේ විවිධ පළාත්වල පවත්වා ගෙන යනු ලබන `තේ ශක්ති' තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) කර්මාන්තශාලා ආරම්භ කළ දින සිට මේ දක්වා එක් එක් කර්මාන්ත ශාලාවේ සේවය කළ සේවක සංඛ්‍යාව, නිෂ්පාදනය කළ තේ කිලෝ ප්‍රමාණය සහ ලැබූ ලාභය හෝ අලාභය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වන විට එම කර්මාන්තශාලා පාලනය කිරීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රයිගම් කෝරළයේ, `තේ ශක්ති' තේ කර්මාන්ත ශාලාවේ වත්මන් පාලනය භාර ආයතනය කවරේද;

(ii) එහි සේවය අහිමි වූ සේවකයන්ට ලබා දුන් සහන කවරේද;

(iii) එම කර්මාන්තශාලාව සතු යන්ත්‍රෝපකරණවලින් උපරිම නිෂ්පාදනයක් ලබා නොගැනීමට හේතුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டின் பல்வேறுபட்ட பிரதேசங்களிலும் பேணிவரப்படும் 'தே சக்தி' தேயிலைத் தொழிற்சாலைகளின் எண்ணிக்கை யாது;

These people who have made this proposal have made a public statement dated 20th October, 2016, captioned, "A Statement on the 65,000 Houses Project in the North and East." Ten persons have signed this document. They have published it saying, "We have made this, we have forwarded it, but we do not have a response from the Government to date." When the Hon. Minister of Finance made the Proposal yesterday saying, "50,000 houses for Rs. 5 billion," - it is Rs. 1 million per house - and I take it that it is this proposal that he referred to and not the prefabricated housing project that is being promoted by the Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs.

I also **table*** the statement made by the members of the civil society, dated 20th October, 2016.

Apart from that, there is an allocation of Rs. 180 million, which is grossly inadequate. It says that it is for reconciliation work. It does not outline what it is. I met the Minister of Finance and made certain proposals with regard to the North and the East; with regard to sectors such as agriculture, fisheries and animal husbandry, because those three together would account for about 85 per cent of our peoples' livelihood and urged him to make specific allocations. After the devastation of the war, people have to get back on their feet. Housing is one thing. But livelihood is as important. I made detailed proposals to the Hon. Minister and I am sad that none of that has been included or considered in these Proposals.

There is a proposal to construct a vertical building for mixed development which will include office space, recreational facilities and entertainment facilities and an allocation of Rs. 1 billion has been made for this. I wonder why he says, "a vertical building" as opposed to a

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

horizontal building. Who wants a vertical building for all of these? Why does he allocate Rs. 1 billion for one building? He says, “Construct a vertical building for Rs.1 billion in the North.” We did not ask for it; our people have not asked for it. They want to get back on their feet; they want to do their farming, fishing and their animal husbandry and get on with their lives. Give them something to boost their economy without putting up vertical buildings for Rs. 1 billion. Rs. 1 billion for one building. Who asked for this? Why does the Hon. Minister of Finance not consult the Representatives of the people from those areas? - [*Interruption*.] Yes, obviously it is not for the people. He must consult us. I even visited him and gave him some of the priorities. I can understand the difficulty in making the allocations that we want, but, at least, you can consider some of those. Surely, we represent the people; we will prioritize what our people want. If the Government is serious about actually rebuilding the areas that were ravaged by the war, then you must address some of these priorities we have pointed out. The previous Government was wrong in concentrating so much on infrastructure development alone. Not that that is not important; that is important and this Government is also continuing with that, which is welcome. But, that alone will not rebuild the lives of the people. So, I urge the Government to move away from all of these fancy ideas of putting up towers that is not useful for the people living there, but obviously for some others and to consult with us and make allocations that will be meaningful so that our people can actually benefit by it.

There are some other allocations for integrated township development in Samanthurai and Kalmunai amounting to Rs. 200 million. We need to see what those are and how that is going to be implemented. We have a particular situation with regard to the Kalmunai Town, something sensitive that needs to be resolved. If money is being allocated for township development in Kalmunai, we will have to look at that very carefully so that the two communities which live side by side in that important town do not come into any kind of confrontation, that both are consulted properly. So, merely allocating money is not sufficient.

Then, there is Rs. 1 billion for upgrading infrastructure facility in Trincomalee. I will leave it to the Hon. Leader of the Opposition to deal with development of Trincomalee. We are not against development, but in the guise of development, there are certain activities that are now taking place and this maybe the appropriate time to sound the first warning bell to the Government. What happened through irrigation schemes in the past seems to be happening through developmental projects now and this is not good; this is not good at all, if the Government is serious about reconciliation. Some of the root causes for alienation of our people from national life were due to such projects. If this Government is also proceeding in those lines or being unmindful of serious impact this can cause to relations between communities, then it is our duty to bring it to your notice, and we hope you will take that into account seriously.

Thank you very much.

[පූ.භා. 11.21]

**ගරු කබීර් හාෂීම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න කාලය ලබාදීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම ජනතා හිතවාදී, සංවර්ධන කේන්ද්‍රීය අය වැයක් හැටියට කවුරුත් දකින 2017 වසර සඳහා වූ මෙම අය වැය ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු මුදල් අමාත්‍යතුමාටත්, ඒ වාගේම එම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු දෙනාටමත් ස්තුතිය පුද කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ අය වැය ජනතා ජයග්‍රහණයක් හැටියටයි අපි දකින්නේ. ඒකට හේතුවක් තිබෙනවා. පසු ගිය වසරේ අය වැය ඉදිරිපත් කළාම විවිධ විවේචන, අවලාදවලට මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. ඒ විවේචන ධනාත්මක විවේචන වෙන්න පුළුවන්; ඍණාත්මක විවේචන වෙන්නත් පුළුවන්. ජනතාවට ඇහුම්කන් දෙන ආණ්ඩුවක් හැටියට ඒවාට ඇහුම්කන් දීලා එයට අදාළව අපි ජනතාවට යන බර අවම කිරීමට සමහර තැන්වල තීරණ වෙනස් කළා.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු තවත් දේශපාලන පක්ෂ කීපයක්ම අපත් එක්ක ආණ්ඩුව තුළ සිටිනවා. එසේ ආණ්ඩුව තුළ ඉන්න අපි සියලු දෙනාටම යම් යම් තැන්වලදී අමාරු තීරණ ගන්න සිද්ධ වුණා. සමහර අය රටක් ගැන හිතන්නේ නැතිව තමන්ගේ බලය තහවුරු කිරීම සඳහා තීරණ ගන්නවා. අපි අපේ බලය ගැන හිතන්නේ නැතිව මේ රටට යහපත් දේ මොකක්ද කියලා හිතලා සමහර අමාරු තීරණ ගන්න අපට සිද්ධ වුණා. සමහර තීරණ රසවත් වෙන්න පුළුවන්, සමහර තීරණ තිත්ත වෙන්න පුළුවන්. නමුත්, හරි දේ කරන්න අපට ඒ හයිය තිබුණා; අපට වගකීමක් තිබුණා. ඒ අමාරු තීරණ අරගෙන විනාශ වුණු, ලෙඩ වුණු, කඩා වැටුණු ආර්ථිකය අවුරුදු එක හමාරක් ඇතුළත ආණ්ඩු බලයෙන් කොටසක් විතරක් තියාගෙන, ඒ ආර්ථිකය හරවලා, එහි පළමුවැනි අඩි තාලම දාලා, මේ රට අලුත් ආර්ථික, සමාජ ගමනක් යන්න පුළුවන් තැනකට මේ වනකොට ගෙනැල්ලා තිබෙනවා. ඒක ලොකු ජයග්‍රහණයක්. ඒක ජනතා ජයග්‍රහණයක් හැටියට තමයි මම දකින්නේ. මොකද, 2014 වසරේදී මේ රට වැටී තිබුණු වළෙන් ගොඩ ගන්නට ගරු අග්‍රාමාත්‍යතුමා විශේෂ කැපවීමක් කළා. ඒ වෙලාවේ එතුමාට විවිධ අවලාද කළා. [බාධා කිරීමක්] බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමා මොකක්ද කිව්වේ? [බාධා කිරීමක්] මම කියන්නම්, අපේ රට කොතැනදී ද වැටුණේ කියලා. මම මේ කාරණා නිකම් කියන්නේ නැහැ. අපේ රජය රටට උරුම කර දුන්නු නිදහස දඩමීමා කරගෙන, ඒකාබද්ධ විපක්ෂයත් එක්ක අන්තගාමී දේශපාලන කණ්ඩායම් එකතුවෙලා ඒකට අකුල් හෙළන්න දිගටම කටයුතු කළා. ඒ වුණාට අපි ආපස්සට තල්ලු වුණේ නැහැ. අපි අපේ වැඩ පිළිවෙළ දිගටම කරගෙන ඇවිල්ලා, ජනතාවට අවශ්‍ය දේවල් කරන්නට කටයුතු කරපු නිසා තමයි මම කියන්නේ මේක "ජනතා ජයග්‍රහණයක්" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ පාර්ලිමේන්තුවේ ගරු සභාව දෙස බැලුවාම පෙනෙනවා, විවිධ පක්ෂ මේ පාර්ලිමේන්තු ගරු සභාව නියෝජනය කරන බව. විවිධ පක්ෂ වාගේම විවිධ මත තිබෙනවා. දෙමළ ජාතික සන්ධානය හැර මේ සියලුම පක්ෂ කවදා හෝ රට පාලනය කරන හවුල් ආණ්ඩුවක් තුළ වගකීම් දරලා තිබෙන අය කියලා මම විශ්වාස කරනවා. හැම කෙනෙක්ම ආණ්ඩුවක කොටස්කරුවෙකු වෙලා තිබෙනවා කියාත් මම විශ්වාස කරනවා.

[ගරු කබීර් හාෂිම් මහතා]

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා හිටපු ඇමතිවරයෙක්, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා හිටපු ඇමතිවරයෙක්, බන්දුල ගුණවර්ධන මැතිතුමා හිටපු ඇමතිවරයෙක්, රෝහිත අබේගුණවර්ධන මැතිතුමා හිටපු ඇමතිවරයෙක්. මේ හැම කෙනෙක්ම හිටපු ඇමතිවරු. සමහර අය අවුරුදු 10ක්, සමහර අය අවුරුදු 20ක් පසු ගිය කාලයේ අපේ රට පාලනය කළා. එතුමන්ලා දීර්ඝ කාලීනව රට පාලනය කළ අය. උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමාත් පළාත් සභාවේ ඇමතිවරයෙක් හැටියට කටයුතු කළා. නමුත් අවුරුදු 10ක්, අවුරුදු 20ක් ආණ්ඩු බලයේ ඉඳලා තනතුරු ආදී හැම දෙයක්ම දැරූ කාල පරිච්ඡේදය තුළ ඔවුන් විසින් මේ සමාජය තුළ නිර්මාණය වූ ප්‍රශ්නවලට උත්තර සැපයුවේ නැහැ; ඒ ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරන්නට නියෝජනයක් දැක්වූයේ නැහැ. අවුරුදු 10ක්, අවුරුදු 15ක්, අවුරුදු 20ක් බලයේ හිටපු කාලයේ ආපු ප්‍රශ්න තමයි අද සමාජගතවෙලා තිබෙන්නේ. විපක්ෂය අද කථා කරන මේ රටේ තිබෙන ආර්ථික හෝ සමාජ ගැටලු මේ අවුරුද්ද තුළ නිර්මාණය වුණු දේවල් නොවෙයි. එම ප්‍රශ්න මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යටතේ හෝ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා යටතේ නිර්මාණය වූ ප්‍රශ්න නොවෙයි. මේ එන ප්‍රශ්න, අද ඒකාබද්ධ විපක්ෂය කථා කරන, දිගටම කෑ ගහන ප්‍රශ්න හැම එකක්ම තමන් ඇමතිවරුන් හැටියට ඉන්න කොට තමන් නියෝජනය නොකරපු ප්‍රශ්න කියලා මා විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. සමහර අය රඟපෑම්වලට බොහොම හොඳයි; හොඳට රඟපෑම් කරනවා; හොඳ නළුවෝ. සමහර අයට amnesia රෝගය හැදිලා; amnesiaවලට එහා ගිහින් dementia රෝගයත් හැදිලා. තමන් ඇමති ධුර දරපු කාලයේ මේ ප්‍රශ්න වෙනුවෙන් තමන් පෙනී සිටියේ කොහොමද, නියෝජනය වුණේ කොහොමද කියන එක අද තමන්ට මතක නැහැ. මා හිතනවා, ඔබතුමන්ලා නිර්මාණය කරපු ප්‍රශ්න, ඔබතුමන්ලා උත්තර නොදීපු ප්‍රශ්න ගැන තමයි, අද මේ ජනතාවට පෙනෙන්න බොරුවට රඟපාමින් කථා කරන්න උත්සාහ කරන්නේ කියලා. අවුරුදු 10ක් තුළ ඔබතුමන්ලා මේ ප්‍රශ්න විසඳුවේ නැත්තේ ඇයි? එදා මේ ප්‍රශ්න වෙනුවෙන් ඔබතුමන්ලාගේ කට හඬ අවදි කරන්න පුළුවන් අවස්ථාවේ දී ඒ කට හඬ අවදි නොකර, වෙඩි හඬ අවදි කරලා, මිනිසුන් පාගලා මර්දනය කළා. ඒක තමයි එදා තිබුණු වෙනස. අද අපි එහෙම නොකර මිනිසුන්ට ඇහුම් කන් දෙනවා; මිනිසුන්ට කථා කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. මේ amnesia රෝගය හැදුණු හිටපු ඇමතිවරු දැන් මහ ලොකුවට බඩු මිලයි, VAT එකයි, අර බද්දයි, මේ බද්දයි ගැන කථා කරන එක ගැන මට පුදුමයි. ඒ ගැන මා තව පොඩ්ඩක් කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කියමනක් මතක් වුණා. "නිරුවතින් පීනුවේ කවුදැයි සෑම විටම අනාවරණය වෙන්නේ වඩදිය බැස ගියාට පසුවයි" කියලා කියමනක් තිබෙනවා. නිරුවතින් පීනුවේ කවුදැයි කියන එක අපට පැහැදිලිව පෙනී යන්නේ වඩදිය බැස ගියාට පසුවයි. ආණ්ඩුවෙන් විපක්ෂයට ගියාට පසුව තමයි නිරුවත හොඳටම පෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වාමීන් වහන්සේ නමක් යමෙකුට කියා ඇති බවට ජනප්‍රවාදයේ පවතින කථාවක් මට මතක් වෙනවා. එම කථාවේ සඳහන් වන්නේ මෙහෙමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ස්වාමීන් වහන්සේ නමක් ධර්ම දේශනයක් පැවැත්වීමට අදාළ ස්ථානය සොයා ගෙන කැලයක් මැදින් යනවා. ඒ කැලෑව මැදින් යන කොට ගඟක් තිබෙනවා. මනුෂ්‍යයෙක් ඒ ගඟේ දිය නාමින් සිටිනවා. මේ ස්වාමීන් වහන්සේට පාර සොයා ගන්න බැරිව, ගඟේ දිය නාමින් සිටින මනුෂ්‍යයාගෙන් එම ස්ථානයට යන පාර අහගන්න උත්සාහ කරනවා. ඒ මනුෂ්‍යයා කැලෑව ඇතුළේ තිබෙන ගඟේ නාන්නේ නිරුවතින්. ඒ මනුෂ්‍යයා ස්වාමීන් වහන්සේව දැක්කා. ස්වාමීන් වහන්සේ කථා කළත් ඔහුට එතැනට යන්න බැහැ. හොඳ වෙලාවට ගඟේ ජල මට්ටමත් එක්ක ගහ දිගේ බාල්දියක් පා වෙලා එනවා. ඒ මනුෂ්‍යයා ඒ බාල්දිය කෙසේ හෝ අල්ලා ගෙන, බාල්දියෙන් තමන්ගේ නිරුවත වහ ගත්තා. තමන්ගේ නෑම නතර කළ නිසා ඔහු පොඩ්ඩක් කලබලයෙන්, පොඩ්ඩක් තරහින් වාගේ ස්වාමීන් වහන්සේට කථා කරලා, "ස්වාමීන් වහන්ස, මොකක්ද වෙන්න ඕනෑ?" කියලා ඇහුවා. ඊට පස්සේ ඔහු ස්වාමීන් වහන්සේට කිව්වා, "ස්වාමීන් වහන්ස, මෙහෙම ගමනක් යන කොට යන තැන සොයා ගන්න ඕනෑ නේ. යන තැන නොදැනුවත්ව කොහොමද ගමන් යන්නේ?" කියලා. එතකොට ස්වාමීන් වහන්සේ කිව්වා, "හරි, පුතේ. ඔයා නානවා නේ. ඔයාට කියන්න බැරි නම්, යන තැන මා සොයා ගන්නම්. නමුත්, ඔබේ හිතේ තිබෙන්නේ මොකක්ද කියලා මට නම් කියන්න පුළුවන්" කියලා. එතකොට ඒ මනුෂ්‍යයා කියනවා, "ස්වාමීන් වහන්සේ යන තැනවත් දන්නේ නැතුව මගේ හිතේ තිබෙන දේ ඔබවහන්සේ දන්නේ කොහොමද? මගේ හිතේ තිබෙන දේ ඔබවහන්සේ කියන්න කෝ" කියලා.

ඊට පස්සේ ස්වාමීන් වහන්සේ කියනවා, "ඔබ හිතා ගෙන ඉන්නේ, ඔය බාල්දියේ අඩිය තිබෙනවා කියලා. එහෙම නේද ඔබ හිතා ගෙන ඉන්නේ?" කියලා. ඔහු බලන කොට, බාල්දියේ අඩිය නැහැ. අඩිය නැති බාල්දියකින් තමයි නිරුවත වහ ගෙන ඉන්නේ. අන්න ඒ වාගේ තමයි මේ ඒකාබද්ධ විපක්ෂයත්. තමන්ගේ නිරුවත වහගෙන ඉන්නේ අඩියක් නැති බාල්දියකින්. එම බාල්දිය කොහොම ඇල්ලුවත්, මේ රටේ බුද්ධියක් තිබෙන මිනිසුන්ට ඒකාබද්ධ විපක්ෂයේ නිරුවත හොඳටම පෙනෙනවා. වසර දහයක් ඒ මිනිසුන් නියෝජනය නොකරපු නිසා තමයි මේ රටේ තිබුණු ඒකාධිපති බලය වෙනස් කරන්නට ජනතාව තමන්ගේ ඡන්ද බලය පාවිච්චි කළේ. අපි ජනතාවගේ අයිතිය ලබා දුන්නා. ඒ ලබා දුන් අයිතිය ආරක්ෂා කරන්නට අපට වග කීමක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමන්ලා කරපු පච, වංචා, ගත්ත අමානුෂික පියවර කියන නිරුවත ලේසියෙන් වසා ගන්න බැහැ.

මගේ මිත්‍ර රෝහිත අබේගුණවර්ධන හිටපු ඇමතිතුමා නියමිත වේලාවට මේ ගරු සභාවට ඇවිල්ලා ඉන්න එක ගැන මට සතුටුයි. මා දැක්කා, ඊයේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු ජනප්‍රිය සිල්ලර දේශපාලනයේ කරන ප්‍රකාශයන් මාධ්‍යයට ප්‍රකාශ කරනවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කියනවා, "මේ අය වැයෙන් වැඩක් නැහැ"යි කියලා. මේ අය වැයෙන් මිනිසුන්ට කොපමණ සහන දීලා තිබෙනවාද? ඒවා සියල්ලම වැඩක් නැහැයි කියලා ද කියන්නේ? එහෙම නැත්නම් එතුමා නියෝජනය කරපු වරප්‍රසාදලත් පන්තියට මොනවත් දීලා නැති නිසා ද, "මේ අය වැය වැඩක් නැහැ"යි කියලා කියන්නේ? වසර දහයක් එතුමා නියෝජනය කරපු එතනෝල්කාරයන්ට, ජාවාරම්කාරයන්ට මේ අය වැයෙන් වරප්‍රසාද ලැබී නැති නිසා ද, "මේ අය වැයෙන් වැඩක් නැහැ"යි කියලා කියන්නේ? අය වැයක් ඉදිරිපත් කළාම එය කියවලා, එහි තිබෙන හොඳ හෝ නරක බලලා, ධනාත්මකව හෝ ඍණාත්මකව විවේචන කරන එක සාධාරණයි. රෝහිත අබේගුණවර්ධන හිටපු ඇමතිතුමා කියනවා, "මේ අය වැයෙන් බදු අය කරලා තිබෙනවා. මේ අය වැය වැඩක් නැහැ. මෙය බදු පිට බදු අය කරපු අය වැයක්" කියලා. මා මතක් කරන්න කැමැතියි, වීදුරු ගෙවල්වල ඉන්න අය ගල් ගහන එක භයානකයි කියලා.

රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇමතිවරයෙක් හැටියට ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට එවකට මුදල් ඇමතිවරයා වශයෙන් සිටි හිටපු ජනාධිපතිවරයා 2014 ඉදිරිපත් කළ අය වැයේ දී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය කීපයකට විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් පැනෙව්වා.

උම්බලකඩ කිලෝවකට රුපියල් 300ක්, හාල්මැස්සන් කිලෝවකට රුපියල් 26ක්, කරවල කිලෝවකට රුපියල් 102ක්,

සුදු ලූනු කිලෝවකට රුපියල් 40ක්, පරිප්පු කිලෝවකට රුපියල් 22ක්, සැමන් ටින් එකකට රුපියල් 102ක්, සීනි කිලෝවකට රුපියල් 30ක් වශයෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් පැනෙව්වා. ඒ ගොල්ලෝ කථා කරන්නේ බදු අය කළේ නැහැ වාගෙයි. බදු අය කරන්න සිද්ධ වෙනවා. අපි නැහැයි කියන්නේ නැහැ. ඒ තීරණ නිවැරදිව ගන්න ඕනෑ. ඒ අය කරන බදුවලින් කරන කටයුතු නිවැරදිව කරනවා , ඒ මුදල් නිවැරදිව ආයෝජනය කරනවා කියන එක ගැන තමයි කල්පනා කරන්න ඕනෑ.

එදා උම්බලකඩවලට, සීනිවලට, පරිප්පුවලට බදු අය කරපු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවෙන්, 2014 අය වැයෙන් බදු අඩු කිරීමකුත් කළා. මා නැහැයි කියන්නේ නැහැ. බදු අඩු කළේ මොනවාටද? බලු කෑමවලටයි බදු අඩු කළේ. බල්ලන් වෙනුවෙන් පිට රටින් ගෙනෙන කෑමවලට ඒ අය වැයෙන් බදු අඩු කළා. පරිප්පුවලට, සීනිවලට බදු වැඩි කරලා, බලු කෑමවලට බදු අඩු කළා. ඒ ඇයි? ඊයේ internet එක බලන කොට මා දැක්කා, හිටපු අගමැති දි.මු. ජයරත්න මැතිතුමාගෙන් මාධ්‍යවේදියෙක් අහනවා, "ඔබතුමන්ලාගේ අය වැයෙන් බලු කෑමවල බදු අඩු කළා, ඒ බදු අඩු කළේ ඇයි?" කියලා. එතුමා හිනාවෙලා කියනවා, "එහෙම එකක් මා දන්නේ නැහැ නේ. බල්ලන්ගේ කෑමවල බදු අඩු කරලාද? කමක් නැහැ. අපේ ගෙවල්වල බල්ලන් නේ අපව ආරක්ෂා කරන්නේ" කියලා. ඒ කථාව හරියට හරි. ඒ දවස්වල බලු කෑමවල බද්ද අඩු කරලා තමන්ව ආරක්ෂා කරන්න ගෙවල්වල බල්ලන් තියාගත්තා. රජ මාලිගාවල රජ සැප විඳපු බල්ලන්ගේ කෑමවල බදු අඩු කළා.

මිනිස්සුන් පරිභෝජනය කරන පරිප්පුවලට, සීනිවලට බදු වැඩි කළා. රෝහිත අබේගුණවර්ධන හිටපු ඇමතිතුමා ඊයේ කියනවා, "මේ අය වැයේ බදු විතරයි තිබුණේ" කියලා. මේවා කියන කොට හිතලා කියන්න, රු හිටපු ඇමතිතුමනි. අපි මිනිසුන් ගැන හිතලායි කථා කරන්නේ. නමුත් ඔබතුමන්ලා වග කීමකින් තොරවයි කථා කරන්නේ.

මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ජනප්‍රවාදය කුමක්ද? What is the legend he left behind? අපි දේශපාලන පැත්ත අමතක කරමු. මේ රටේ පොහොසත්ම සියයට 20 ජාතික ආදායමෙන් සියයට 53ක් උපයනවා. මේ රටේ දුප්පත්ම සියයට 20 උපයන්නේ ජාතික ආදායමෙන් සියයට 4.5යි. ඒක තමයි ඔබතුමන්ලා අපට උරුම කර දුන් ආර්ථිකය. ඒක තමයි අපි කරගහන්නේ. ඒක තමයි පසු ගිය අවුරුදු එකහමාර තුළ ගරු අගමැතිතුමාට තිබුණු අභියෝගය. මේවා අපි නිර්මාණය කරපු ප්‍රශ්න නොවෙයි; ඔබතුමන්ලා නිර්මාණය කරපු ප්‍රශ්නයි.

ඔබතුමන්ලාට මේ කාරණයත් කියන්න මා කැමැතියි. ඒ කාලයේ සමහර අයට රන් ආලේපිත යුගයක් තිබුණා. සමහර අයට වර්ග අඩි 25,000ක ගෙවල් හදන්න පසු බිමක් හැදිලා තිබුණා. අපි "මන්දිර බද්ද" -Mansion Tax- පනවන්නේ ඒ මිනිස්සුන්ටයි. ඒ නිසාද මහින්ද රාජපක්ෂ මහත්මයා කියන්නේ මේ අය වැයෙන් වැඩක් නැහැ කියලා? ඒ දවස්වල පැල්පත්වාසීන්ගේ ගෙවල් ඩෝසර් කරලා, කඩලා වීසි කරලා ඒ මිනිස්සු පාරට ඇදලා දැම්මා. ඒ ක්‍රමය වෙනස් කිරීම තමයි මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ. ඒක වැරදිද? මම අහන්නේ ඒකයි.

ඔබතුමන්ලා ඒ දවස්වල රුපියල් 250ක් වියදම් කරලා ආප්පයක් කන සමාජයක් නිර්මාණය කළා. පාන් ගෙඩියක් රුපියල් 300ට විකුණන කඩ සාප්පු හැදුවා. නමුත් පුංචි මිනිහා වෙනුවෙන් ඔබතුමන්ලාගේ අය වැයෙන් යම් කිසි දෙයක් දුන්නේ නැහැ කියන එක අපට කියන්න පුළුවන්.

ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා කළ කථාව මම අහගෙන සිටියා. සමාජ අසමානත්වය වෙනස් කිරීමට තමයි අපි ඉලක්ක කරන්නේ. අපි ඉලක්ක කරන්නේ සමාජ වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයයි. ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විවෘත ආර්ථික වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය ගෙනාවා. එයින් අවුරුදු තිස් ගණනකට පස්සේ මේ රටේ අලුත් ආර්ථික වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. ඔබතුමන්ලා කට වචනයට විතරක් සීමා කළාට, "මහින්ද චින්තනය" යටතේත් ගෙන ගියේ විවෘත වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයමයි. සමාජ අසමානත්වය තවත් වර්ධනය වුණේ ඒ නිසායි. අපි ඒක වෙනස් කරන්නට අද කටයුතු කරලා තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා නම් මේ අය වැයේ බදු විතරයි තිබෙන්නේ කියලා, මම තවත් කියන්නම්. මම දැන් කිව්වා , "බලු කෑම" ගැන. මේ අය වැයෙන් මිනිසුන්ට සහන නැහැ කියා ඔබතුමා කියනවාද? [බාධා කිරීම්] අහගෙන ඉන්න. ඔබතුමා එසේ කිව්වත්, අපි පළමුවැනි වතාවට මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ගෙනෙනවා. මේ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා අපි බිලියන 2.7ක මුදලක් වැය කරනවා. මේ රටේ ලක්ෂ 45ක් වන ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සියලු දෙනාටම අපි මේ රක්ෂණය ලබා දෙනවා. ඒ නිසා සෑම පාසල් ශිෂ්‍ය-ශිෂ්‍යාවෙකුටම ලෙඩක්, දුකක් වුණු අවස්ථාවක OPD එකට ගිහිල්ලා ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් රුපියල් 10,000ක රක්ෂණයක් ලැබෙනවා. ඒ වාගේම රෝහල්ගත වෙන දරුවාට රුපියල් ලක්ෂ දෙකක් වෙනකම් රක්ෂණාවරණයක් ලබා දෙනවා. ලක්ෂ 45ක් වෙන ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට මෙහෙම දුන්නේ කොයි කාලයේද? අපි එවැනි රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා.

ඊළඟට, අපි නිවාස ලක්ෂ පහක් හදා දෙනවා. මේ රටේ මධ්‍යම පන්තියේ අයට වාගේම සාමාන්‍ය පන්තියේ අයටත් - [බාධා කිරීම්] ඒ විතරක් නොවෙයි, ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 50,000ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ක්‍රමවේදයක් අපි යෝජනා තිබෙන බවත් මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි. දැනට තිබෙන්නේ විශ්වවිද්‍යාලවලට දරුවන් 25,000ක් ඇතුළත් කර ගන්නා ක්‍රමවේදයක්. නමුත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 50,000ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ක්‍රමවේදයක් අපි යෝජනා කර තිබෙනවා. ඒ අනුව 2020 වෙනකොට ළමයින් 50,000ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන වැඩ පිළිවෙළ අපි හදනවා. ඔබතුමන්ලාට පුළුවන් වුණාද ඒක කරන්න? මම තමුන්නාන්සේලාටයි කියන්නේ. විශ්වවිද්‍යාලයකට යන්න බැරි වෙන ළමයින්ටත් වෙනත් වැඩ පිළිවෙළක් හදනවා. අපි ආණ්ඩුවෙන් ණය ක්‍රමයක් හදලා ඒ ළමයින්ට එම පහසුකම ලබා දෙනවා. ළමයින් 50,000ක් විශ්වවිද්‍යාලවලට යනකොට ලක්ෂයක් ඉතුරු වෙනවා. ගරු විමල් රාජපක්ෂ මැතිතුමනි, අපි ඒ ලක්ෂයටත් ණය ක්‍රමයක් හදා දෙනවා. ඒ අනුව NSBM එකට, NIBM එකට හෝ SAITM එකට වුණත් ඇතුළු වෙලා උපාධියක් ගන්න පුළුවන් ක්‍රමයක් අපි ඒ ළමයින්ට හදනවා. ඒ මදිද?

මම තමුන්නාන්සේලාට කියනවා, 1944 දී මේ රටට නිදහස් අධ්‍යාපනය උරුම කිරීමට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පළමුවෙන්ම කථා කළේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බව. ඉන් පසුව සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා පළමුවැනි අධ්‍යාපන ඇමතිවරයා වුණා. අපේ කාලයේදීයි අප නිදහස් අධ්‍යාපනය ආරම්භ කළේ. ඒ විතරක් නොවෙයි. ඊ.ඒ. නුගවෙල ඇමතිතුමා, ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කැබිනට් ඇමතිවරයකු හැටියට පළමුවැනි කැබිනට් එකේදි මධ්‍ය මහා විද්‍යාල සංකල්පය ඉදිරිපත් කරන්නේත්, එය ලංකාවට හඳුන්වා දෙන්නේත් එක්සත් ජාතික පක්ෂයේ රජයක් යටතේම බව මතක තියාගන්න. ඒ විතරක් නොවෙයි. 1977න් පසුව පාසල් දරුවන්ට නොමිලයේ පොත්, නිල ඇඳුම් සහ දිවා ආහාරය ලබා දෙන්නේත් එක්සත් ජාතික පක්ෂයයි. ඒ අනුව පොදු ජනතාවට සැලකීම අපි හරියාකාරව කර තිබෙනවා. ඒ පසු බිමත් එක්ක තමයි අප අද මේ අය වැය ඉදිරිපත් කරන්නේ.

[ගරු කබීර් හාෂීම් මහතා]

මා තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, අප මේ අය වැය මඟින් කෘෂිකර්මයට -ගොවිතැනට- මුල් තැන දෙන බව. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ගොවිතැන ගැන කථා කළා; ගොවීන් ගැන කථා කළා; නියර දිගේ ඇවිදින කොට photographs ගැහුවා. මා අහන්නේ මේ කාරණයයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගොවිතැනට කළේ මොකක්ද? කෘෂිකර්මයට කළේ මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2004 වර්ෂයේදී කෘෂි කර්මාන්තයේ දායකත්වය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 18ක්. නමුත් 2014 වන කොට -මහින්ද මහත්මයාගේ පාලනය ඉවරවන කොට- කෘෂි කර්මාන්තයේ දායකත්වය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 10.1 දක්වා අඩු වනවා. ඒක තමයි කෘෂිකර්මාන්තයට කරලා තිබුණේ. [බාධා කිරීමක්] ඔව්, නියර උඩින් ඇවිත් ඒකත් කෑවා. පොහොර සහනාධාරය පිළිබඳව ජනතාවට කිව්ව මුසාවාදය ගැන මා තමුන්නාන්සේලාට කියන්නම්. "අපි පොහොර දුන්නා" කියලා මහා ලොකුවට කිව්වා. අපි 2016 දී පොහොර සහනාධාරය ලෙස රුපියල් මිලියන 37,500ක මුදලක් සෘජුවම ගොවීන්ට ලබා දුන්නා. අපි එසේ සෘජුවම මුදල් ලබා දුන්නේ ඇයි? අපි ඒ හරහා අතර මැදියන්ට කොමිස් ගහන්න දුන්නේ නැහැ. තමුන්නාන්සේලා පොහොර දුන්නා. හැබැයි පොහොර දුන්නේ ගොවීන්ට නොවෙයි. අතර මැදියන් කොමිස් ගහගෙන ඒකෙන් හම්බ කළා. නමුත් අපි ඒක කරන්න දුන්නේ නැහැ. ඔබතුමන්ලා කරපු දෙයින් ලැබුණු ප්‍රතිඵලය මොකක්ද? ඔබතුමන්ලාගේ කාලයේ 2014 වන කොට වී වගා කර තිබුණේ හෙක්ටෙයාර 964,000යි. වී නිෂ්පාදනය වශයෙන් තිබුණේ මෙට්‍රික්ටොන් 33,81,000යි. අපි 2015 වර්ෂය වන කොට වී වගා කළ බිම් හෙක්ටෙයාර ලක්ෂ 12කින් වර්ධනය කරමින් වී නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 48,00,000 දක්වා වැඩි කිරීමට කටයුතු කළා. අපි වී නිෂ්පාදනය 2014 වර්ෂයේ පැවැති ප්‍රමාණයට වඩා වැඩි කළා; වී වගා කරන හෙක්ටෙයාර ප්‍රමාණයත් වැඩි කළා. ඔබතුමන්ලාගේ කෘෂිකර්ම උපක්‍රම සාර්ථක වුණා නම් මේ සංඛ්‍යා ලේඛන නිවැරදි වන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 වර්ෂයේදී වී වගා කළ බිම් ප්‍රමාණය වැඩි වුණා. ඒ විතරක් නොවෙයි, 2014 වර්ෂයේදී පිට රටින් සහල් ආනයනය කිරීම සඳහා රුපියල් මිලියන 36,795ක් වෙන් කර තිබුණා. නමුත් අපි ආනයන වියදම් අඩු කළා, රුපියල් මිලියන 17,956 දක්වා. අපි මේ රට ස්වයංපෝෂිත කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කළා. මා කෘෂිකර්මය ගැන කියන විට ඔබතුමන්ලාට පොඩි හිනාවක් ගියා. ඒත් කුරක්කන් ටිකවත් හරියට නිෂ්පාදනය කරගන්න ඔබතුමන්ලාට බැරි වුණා. අපේ කාලයේ -2004 වර්ෂයේදී- නිෂ්පාදනය කළ කුරක්කන් ප්‍රමාණය මෙට්‍රික්ටොන් 6,500යි. ආනයනය කළේ මෙට්‍රික්ටොන් 1,200යි. 2011 වනකොට -යුද්ධය ඉවර වෙලාත්- මෙට්‍රික්ටොන් 6,500ට තිබුණු කුරක්කන් නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 5,400 දක්වා අඩු වනවා. කුරක්කන් ආනයනය මෙට්‍රික්ටොන් 3,600 දක්වා වැඩි වනවා. මෙන්න මේක තමයි ප්‍රශ්නය. මොකක්ද ඒකට හේතුව? ඔබතුමන්ලා විධිමත්ව, ක්‍රමවත්ව ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළේ නැහැ. මා ඔබතුමන්ලාට කියන්නේ එය ඔබතුමන්ලා නිර්මාණය කළ ප්‍රශ්නයක් බවයි. ඒක කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ ඔබතුමන්ලා හදාපු ප්‍රශ්නයක් බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අගමැතිවරයා හැටියට ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා -අපි- 2020 වන විට ප්‍රධාන ආර්ථික ඉලක්ක 5ක් ඉදිරිපත් කර තිබෙනවා. කරුණු 5ක් එතුමා ඉලක්ක කර තිබෙනවා. අපේ ආර්ථික වැඩ පිළිවෙළ ගැන මේ ගරු සභාවේ දීර්ඝ වශයෙන් කියන්න කාලය මදි. නමුත් ප්‍රධාන ආර්ථික ඉලක්ක 5 මොනවාද කියා අපි බලමු.

පළමුවැනි එක, රට තුළ රැකියා ලක්ෂ 10ක් නිර්මාණය කිරීම. අප එය දිගින් දිගටම කියන දෙයක්. සෑම පවුලකම ආදායම ඉහළ නැංවීම අපේ තවත් ඉලක්කයක්. තුන්වන එක, ප්‍රාදේශීය සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම. හතරවන එක, ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කර දීම. පස්වන එක ශක්තිමත් හා පුළුල් මධ්‍යම පන්තියක් මේ රටේ බිහි කිරීම. මේ අය වැය අප හදා තිබෙන්නේ මෙන්න මේ අරමුණු, ඉලක්ක පහ වෙත යෑම සඳහා අපේ ගමන ආරම්භ කිරීමටයි.

ඒ විතරක් නොවෙයි. අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, 2017 වර්ෂය "දරිද්‍රතාව පිටුදැකීමේ වර්ෂය" කියලා. අපි ඒකත් අපේ ඉලක්කවලට ඇතුළත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මැතිවරණයේදී පොරොන්දු වුණා රැකියා ලක්ෂ දහයක් දෙනවාය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය කරන්න පුළුවන් වෙන්නේ මේ රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීම හරහා පමණයි. ඒ නිසා නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීම අවශ්‍යයි. රාජපක්ෂ රෙජිමය කාලයේ රැකියා බලාපොරොත්තු වුණු සියලුම අපේක්ෂකයන්ට රාජ්‍ය සේවයේ රස්සාවක් දෙනවාය කියලා බලාපොරොත්තු ඇති කළා. කොටසක් රාජ්‍ය සේවය තුළට එවුවා. ඒ තුළින් රාජ්‍ය සේවයේ තිබුණු ඵලදායිතාවත් අඩු කළා; අඩපණ කළා; රැකියා ප්‍රශ්නය විසඳුවේත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එසේ වුණේ නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීමට තිබූ නොහැකියාව නිසා වෙන්න පුළුවන්. රාජ්‍ය සේවයට අවිධිමත් විධියට රැකියා අපේක්ෂිත අය තල්ලු කරලා රාජ්‍ය සේවයත් විනාශ කළා; රස්සා ප්‍රශ්නය විසඳුවේත් නැහැ. ඒ කාලයේ උපාධිධාරීන්ට සොච්චම් වැටුපකට පත්වීම් ලබා දුන්නා. ඒ අයට සේවය කරන්න ස්ථානයක් නැතුව ගස් යට, ගල් උඩ හිටියා. ඒ අය අතරමං වුණා. ඒ වාගේම ස්වාමීන් වහන්සේලාට ධීවර සංස්ථාවේ පත්වීම් ලබා දුන්නා. ඒ පත්වීම් විධිමත්ව දුන්නේ නැහැ. ස්වාමීන් වහන්සේ නමකට ධීවර සංස්ථාවේ පත්වීමක් දීලා තිබෙනවා. එදා ඒ වාගේ දේවල් තමයි කළේ. ඒ සියලු දෙයින් සිදු වුණේ සේවා නියුක්තියක් නොවෙයි, ඌන සේවා වියුක්තියක්. ඔබතුමන්ලා කරපු දෙයින් සේවා නියුක්තියක් සිදු වුණේ නැහැ, ඌන සේවා වියුක්තියක් තමයි සිදු වුණේ. ඒ සඳහා ඔබතුමන්ලාට වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ කටයුතු විධිමත් කරන්න අපි ක්‍රමවේදයක් හදන්න ඕනෑ. රාජපක්ෂ රෙජිමය යටතේ 2010 වසර වන විට ලංකාවේ රැකියා වියුක්තිය ශ්‍රම බළකායෙන් සියයට 4.9යි කියලා හැම වෙලාවේම ප්‍රකාශ කළා. 2014 වසර වන විට සේවා වියුක්තිය සියයට 4.3ට අඩු කළා කියලා කිව්වා. ඒකත් මුසාවාදයක්. ඒකත් බොරුවක්. ඇත්ත තත්ත්වය අනුව වයස අවුරුදු 15-29 අතර සේවා වියුක්තිය සියයට 35යි. අවුරුදු 15-29 අතර තරුණ තරුණියන් ගත්තොත් අද සේවා වියුක්තිය සියයට 35යි. මේ ප්‍රශ්නය අපි විසඳිය යුතුයි. ජනප්‍රිය, සිල්ලර දේශපාලන පොරොන්දුවලින් ඒක කරන්න බැහැ. ඒ සඳහා දේශපාලන නිහතමානීභාවයක් තිබෙන්න ඕනෑ; වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒ සඳහා ප්‍රතිපත්තියක් තිබෙන, මතවාදයක් තිබෙන පක්ෂයක වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අපි උත්සාහ දරන්නේ රැකියා දෙන ආර්ථිකයක් හදන්න නොවෙයි. අපට ඇත්තටම අවශ්‍ය වන්නේ රැකියා උත්පාදනය වන ආර්ථිකයක් හදන්නයි. රැකියා උත්පාදනය වන ආර්ථිකයක් නිර්මාණය කිරීමට තමයි අපේ ගරු අග්‍රාමාත්‍යතුමා අද ප්‍රතිපත්ති සකස් කරලා තිබෙන්නේ. එතුමාගේ 2020 වර්ෂය ඉලක්ක කරගත් වැඩ පිළිවෙළේ ඒ රැකියා උත්පාදනය කිරීමේ වැඩ පිළිවෙළ අන්තර්ගත වෙලා තිබෙනවා. ඒකට තමයි අපි ඒ වැඩ පිළිවෙළ හදන්නේ. ඒ නිසා තමයි කුසලතාවලට විශාල ආයෝජනයක් ලබා දෙන බව අපි ඊයේ අය වැය යෝජනාවලදී කිව්වේ; තරුණ තරුණියන්ට ඉහළම තැනට යන්න අවශ්‍ය කරන පරිගණක දැනුම ලබා දෙන්න අපි උත්සාහ කරන්නේ.

ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේදී අධ්‍යාපනයට මොකක්ද කළේ? අ.පො.ස. සාමාන්‍ය පෙළ - GCE (Ordinary Level) - විභාගයේදී සියයට 47ක් ගණිතය ෆේල්. ඒ වාගේම සියයට 53ක් ඉංග්‍රීසි ෆේල්. ඒක තමයි ඔබතුමන්ලා අපට ලබා දුන් උරුමය. අපි ඒ තත්ත්වය වෙනස් කරන්න බලාපොරොත්තු වෙනවා. ගොඩනැඟිලි හදලා, ඒවායින් කොමිස් අරගෙන අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කරන්න බැහැ. අද අපේ මේ අය වැය තුළ ඒ සඳහා අවශ්‍ය සම්පත් ලබා දීමට යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම රැකියා උත්පාදනය වන ආර්ථිකයක් සකස් කිරීමට අපි වැඩ පිළිවෙළක් හදනවා. ඒ සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණයේ තරුණ ව්‍යවසායකයන් ශක්තිමත් කළ යුතුයි. ලංකාවේ රැකියා සොයන තරුණ තරුණියන් අතරින් ස්වයං රැකියාවක් කරන්න, ව්‍යවසායකයන් බවට පත් වෙන්න කැමැත්ත තිබෙන තරුණ තරුණියන් සියයට 25ක් ඉන්නවා. ලක්ෂ 10ක් රැකියා සොයනවා නම්, ව්‍යවසායකයන් වෙන්න කැමැත්ත පළ කරන තරුණ තරුණියන් 250,000ක් අද මේ රටේ ඉන්නවා. ඒ නිෂ්පාදන ආර්ථිකය නිර්මාණය කිරීම සඳහා අපි මෙවර අය වැයෙන් විශාල ඉඩකඩක් හදා දීලා තිබෙනවා. විශේෂයෙන්ම අපි ඒක තමයි ජයග්‍රහණයක් හැටියට දකින්නේ.

විශේෂයෙන්ම කුඩා සහ මධ්‍යම පරිමාණ ක්ෂේත්‍රය රටක සමස්ත උපාය මාර්ග සැලසුම්වලට ඇතුළත් විය යුතුයි. පසු ගිය රජයට මේ ගැන අවබෝධයක්, සැලැස්මක් තිබුණේ නැහැ. වියට්නාමය ගත්තොත්, එහි කුඩා සහ මධ්‍යම පරිමාණයේ ආයතන තුළ රැකියා ලබා දී තිබෙන ප්‍රතිශතය සියයට 64යි. ඒ වාගේම දළ දේශීය නිෂ්පාදනයට දෙන දායකත්වය සියයට 60යි. ලංකාවේ කුඩා සහ මධ්‍යම පරිමාණයේ ආයතනවල රැකියා කරන අය පසු ගිය අවුරුදු දහය තුළ සියයට 27ට සීමා වෙලා තිබෙනවා. ඒ වාගේම දළ දේශීය නිෂ්පාදනයට දෙන දායකත්වය සියයට 18කට සීමා වෙලා තිබෙනවා. එය ඉන්දුනීසියාවේ සියයට 58යි. කලාපීය රටවල් අපට වඩා ඉදිරියෙනුයි ඉන්නේ. මේ කුඩා සහ මධ්‍යම පරිමාණයේ දේශීය නිෂ්පාදනයට රුකුලක් වෙන පද්ධතියට පසු ගිය රාජපක්ෂ රෙජීමය කිසිම අවස්ථාවක් ලබා දුන්නේ නැති බව මෙයින් සහතික වෙනවා. සම ආර්ථික සංවර්ධනය, දරිද්‍රතාව පිටු දැකීම, ආදායම් විෂමතා සම කිරීම, කලාපීය හා ග්‍රාමීය සංවර්ධනය කඩිනම් කිරීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ සංවර්ධනය හරහා ඉලක්ක කරන එක ඉතා වැදගත් බව හඳුනාගෙන, අපි මේ අය වැයෙන් එය ඉලක්ක කර ගෙනයි මේ යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ. එම නිසා කෘෂිකර්මය, අධ්‍යාපනය, කුඩා සහ මධ්‍යම පරිමාණ ක්ෂේත්‍ර ගැන අපි කල්පනා කර තිබෙනවා.

විශේෂයෙන්ම රටේ සංවර්ධනයේ දී තුලිත සංවර්ධනයක් අපි සකස් කළ යුතුයි. පළාත් අතර තුලිත සංවර්ධනයක් නැහැ. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ බස්නාහිර පළාතෙන් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය සියයට 44යි. ගරු චමල් රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමා ඒ දවස්වල නිතරම හම්බන්තොට ගැන කථා කළා. දකුණු පළාතෙන් දළ දේශීය නිෂ්පාදනයට දෙන දායකත්වය සියයට 10ක් පමණයි. පසු ගිය අවුරුදු දහය තුළ වරායවල් හැදුවා; ගුවන් තොටුපළවල් හැදුවා. නමුත් දළ දේශීය නිෂ්පාදනයට දෙන දායකත්වය සියයට 10ක් පමණයි. එම නිසා මා කියන්නේ, මහින්ද රාජපක්ෂ මහත්මයා දකුණු පළාත හැර වයඹ පළාතට ගිය එක පුදුමයක් නොවෙයි කියන එකයි. එතුමා ජනාධිපතිවරයා හැටියට සිටි අවුරුදු දහයක කාලය තුළවත් එතුමාගේ පළාතට -දකුණු පළාතට - උදවු කරන්න එතුමාට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා එතුමා දකුණු පළාත අත්හැරලා වයඹ පළාතට ගිය එක සාධාරණයි කියලා මා හිතනවා. ඊළඟ ඡන්දයේ දී එතුමා වයඹ පළාතෙන් කොහේ යාවිද කියලා මම දන්නේ නැහැ. දැන් ඒක ලොකු ප්‍රශ්නයක්. මම කියන්නේ, සියලුම බලතල තියාගෙන; ජනාධිපති බලතල තියාගෙන තමන් නියෝජනය කළ පළාතට සේවාවක් කරන්නට එතුමාට බැරි වෙලා තිබෙන එක පුදුමයක් කියලායි. එහෙම නම් කොහොමද අනෙක් පළාත්වලට උදවු කරන්නේ? [බාධා කිරීම්] ලජ්ජයි. [බාධා කිරීම්] ලජ්ජා තමයි.

ඔබතුමන්ලා GSP plus එක අහිමි කළා. ඔබතුමන්ලා ETCA ගිවිසුම ගැන එක එක මුසාවාද කියාගෙන යනවා. GSP plus එකවත් ආරක්ෂා කර ගන්න බැරි වුණා. [බාධා කිරීමක්] GSP plus එක නැති වීමෙන් මේ රටට ඇති වූ පාඩුව ගැන මා ඔබතුමන්ලාට කියන්නට කැමැතියි. යුරෝපා සංගමය තුළ තිබෙන්නේ යුරෝ බිලියන 4000ක ආර්ථිකයක්. යුරෝ බිලියන 4000ක ආර්ථිකයක් පමණක් නොවෙයි, මිලියන 500ක ජනගහනයක් ජීවත්වෙන ප්‍රදේශයක්. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු කබීර් හෂීම් ඇමතිතුමාගේ කථාව කර ගෙන යන්න ඉඩ දෙන්න.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුරෝපා සංගමය ගත්තාම යුරෝ බිලියන 4000ක් තිබෙන ආර්ථිකයක්. මිලියන 500ක ජනගහනයක් ඉන්නවා. නමුත් GSP plus එක නැති කර ගත්තා. එයින් ඇති වුණු පාඩුව හරහා ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදනයන් සහ අපනයනයන්වල සියයට 42ක කඩා වැටීමක් සිද්ධ වුණා. එපමණක් නොවෙයි. රටට ඩොලර් මිලියන 782ක පාඩුවක් සිද්ධ වුණා. තමුන්නාන්සේලා ඉන්න තාක් කල් මෙය විසඳන්නට බැරි වුණා. ගරු අග්‍රාමාත්‍යතුමාට එය නැවත ලබා ගැනීමට හැකියාව ලැබිලා තිබෙනවා. එතුමා ගිය මාසයේ ගිහින් මේ ගැන කථා කළා. අපි දන ගහගෙන ගියේ නැහැ. එතුමා ගිහින් කථා කළාට පසුව නැවතත් GSP plus එක අපට ලබා ගැනීමට හැකියාව ලැබිලා තිබෙනවා. මෙය ලොකුම ජයග්‍රහණයක් බව මා තමුන්නාන්සේලාට කියන්නට කැමැතියි.

පසු ගිය අය වැයෙන් අපි සියලුම රාජ්‍ය සේවකයන්ට රුපියල් දහ දාහක වැටුප් වැඩි වීමක් ලබා දුන්නා. රුපියල් දහ දාහක වැටුප් වැඩි කිරීමක් විතරක් නොවෙයි, එයින් රුපියල් 2500ක් බැගින් ඒ අයගේ මූලික වැටුපට එකතු කරන්නටත් කටයුතු කළා. විශ්‍රාම යන අයටත් ඒක අයත් වෙනවා. අවුරුදු දහයක් ආණ්ඩු කළ තමුන්නාන්සේලාට මේ රජයේ සේවකයන්ට නිසි වටිනාකම, ගෞරවය හිමි කර දෙන්නට බැරි වුණා. ඔබතුමන්ලා ඒ ටික හරියට කළේ නැහැ. ඒක අපි ලබා දුන්නා.

ඒ විතරක් නොවෙයි, පෞද්ගලික අංශයටත් වැටුප් වර්ධක ලබා දෙන්නට කියලා අපි යෝජනා කරලා, එයත් සම්මත කර දුන්නා. මේ තුළින් අපි මොකක්ද කර තිබෙන්නේ? මේ වසර එකහමාර තුළ මධ්‍යම පන්තියේ ආදායම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නට අපට පුළුවන් වෙලා තිබෙනවා.

මේ අය වැයෙන් අපි කරන යෝජනා තුළින් මධ්‍යම පන්තිය තවත් ශක්තිමත් කිරීමට හැකි වෙනවා. ඒ සඳහා යෝජනා විශාල ප්‍රමාණයක් මෙයට ඇතුළත් කර තිබෙනවා. මධ්‍යම පන්තිය පුළුල් කිරීමට නම් කරන්න තවත් වැඩක් තිබෙනවා. අපි මධ්‍යම පන්තිය පුළුල් කරනවා. නමුත් ඊට වඩා ඊට පහළින් ඇති සමාජ පන්තියේ ආර්ථිකය අපි ශක්තිමත් කළ යුතුයි. ඒ කියන්නේ අපි දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා තමයි අතිගරු

[ගරු කබීර් හාෂිම් මහතා]

ජනාධිපතිතුමා විසින් 2017 දරිද්‍රතාව පිටුදැකීමේ වර්ෂය හැටියට ප්‍රකාශ කර තිබෙන්නේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන ඉලක්ක මුල් කර ගෙන මේ රටේ දරිද්‍රතාව නැති කිරීමට වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ පිළිබඳව එක්සත් ජාතික පක්ෂයට හොඳ අත්දැකීම් තිබෙනවා.

මේ රටේ පළමුවෙන්ම "ජනසවිය" වැඩසටහන ආරම්භ කළේ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේයි. ඒ වාගේම ජනවාරි 08වැනි දා අපි බලයට ආපු ගමන්ම සමෘද්ධි දීමනාව සියයට 200කින් වැඩි කළා. එහෙම වැඩි කළේ දරිද්‍රතාවෙන් පෙළෙන අයගේ ජීවන මට්ටම වැඩි දියුණු කිරීමටයි. අපි අය කරන සෑම ශතයක්ම ආයෝජනය කරන්නේ මේ රටේ පොදු ජනයා වෙනුවෙන්ය කියන එක මෙයින් සහතික වෙනවා.

පසු ගිය කාලයේ ඉලක්කම් විජ්ජා ගොඩක් කෙරුණු බව අපට මතකයි. රැකියා වියුක්තිය වාගේම දුප්පත්කම ගැනත් විවිධ දේවල් කිව්වා. එදා කිව්වා, දුප්පත්කම සියයට 15 සිට සියයට 7 දක්වා අඩු වෙලා තිබෙනවාය කියලා. මම නම් දන්නේ නැහැ, එහෙම අඩු වුණාද කියලා. දුප්පත්කම සියයට 7ක් දක්වා අඩු වෙලා තිබෙනවාය කියන්නේ, එක ඩොලරයකින් දවසක් ජීවත් වන අයටත් පහළ සිටින අය තමයි දරිද්‍රතාවයෙන් පෙළෙන අය හැටියට හඳුනා ගෙන තිබුණේ. ඩොලරයක් කියන්නේ රුපියල් 145යි. ඒ කියන්නේ හතර දෙනකුගෙන් යුත් පවුලක් නම් දවසකට රුපියල් 500කින් පමණ ජීවත් වන පවුලක්. ඒ කියන්නේ සාමාන්‍යයෙන් මාසයක වියදම රුපියල් 15,000යි. බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමාගේ න්‍යාය අනුව නම් ඒ මුදලින් ජීවත් වෙන්න පුළුවන්. බන්දුල ගුරින්ගේ න්‍යාය අනුව නම් පුළුවන්. [බාධා කිරීම්] රුපියල් 15,000කින් මාසයක් ජීවත් වන පවුලක් හොඳට ජීවත් වනවා කියලා හිතනවා නම් ඒක වැරදියි. අපි හිතනවා ඒ අයගේ ජීවන මට්ටම ඊට වඩා වැඩි විය යුතුයි කියලා. ඒ නිසා අද මේ රටේ දුප්පත්කම හරියට හඳුනා ගන්නවා නම්, දිනකට ඩොලර් දෙකක් උපයන කෙනෙක්, ඒ කියන්නේ දවසකට රුපියල් 300ක් පමණ උපයන කෙනෙක් දරිද්‍රතාවයෙන් පෙළෙන කෙනෙක් හැටියට තමයි අපි හඳුනා ගන්න ඕනෑ. ඒ වාගේ අය මේ රටේ ජනගහනයෙන් සියයට 40ක් ජීවත් වෙනවා. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මධ්‍යම පන්තියට උදවු කරන අතර සාමාන්‍ය දරිද්‍රතාවයෙන් පෙළෙන සමාජ පන්තියට උදවු කිරීම වගකීමක් හැටියට සලකා ඒ වාගේ සහනාධාර වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට මේ රජය යෝජනා කර තිබෙනවා. ඒ පිළිබඳව විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ.

ඒකාබද්ධ විපක්ෂයේ අය හිතනවා ඇති අපි මේ ආණ්ඩුව ගත්තේ සුමනදාස මහත්තයා හරහායි කියලා. සුමනදාස මහත්තයා නොවෙයි අපට ආණ්ඩුව දුන්නේ. සුමනදාස මහත්තයා කොතැනකින් හරි දායක වෙලා ඇති. නමුත් එයා නොවෙයි ආණ්ඩුව දුන්නේ. සුමනේ මොකක්ද කළේ? එයා උපදෙස් දුන්නා විතරයි නේ.

මහින්ද රාජපක්ෂ මහත්මයා ඊට වඩා හොඳට කල්පනා කළා. 2014 වන විට මහින්ද රාජපක්ෂ මහත්මයා දැන ගෙන හිටියා ඉස්සරහට යන්න බැහැයි කියලා. ආණ්ඩුව බංකොලොත්, රට බංකොලොත්, ඒ අයට මුදල් නැහැ, ඒ නිසා ඉස්සරහට යන්න විධියක් නැහැ, මුළු ලෝකයටම කොටු වෙලා. ඒ වෙලාවේ විදුලි පුටුව ගැනයි හිතා ගෙන හිටියේ. අද ඒ බිය සැක මොකුත් නැහැ. එතුමාට නිදහසේ ජීවත් වෙන්න පුළුවන්. තුන් බිය දුරු වෙලායි තිබෙන්නේ. නමුත් ඒ වෙලාවේ වෙනත් විකල්පයක් නැති නිසා සුමනේගේ ඔළුව උඩ ඒක දමලා ඡන්දයකට ගියා. සුමනේටත් ස්තුතියි. කෙසේ වෙතත් අපි ඒ ආණ්ඩුව ගත්තේ හරි විධියටයි. එදා තවදුරටත් යන්න බැරි ආර්ථිකයක් තිබුණේ. නැත්නම්, තමන්ට තුන්වැනිවරටත් ජනාධිපති වෙන්න පුළුවන් වන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරගෙන, අනෙක් පක්ෂවල අයත් අර ගෙන ඇමතිකම් දීලා, ඇමතිවරු එකසිය ගණනක් හදා ගෙන, පාර්ලිමේන්තුව තුළ හයෙන් පහක බලයක් හදා ගෙන, ඒ වාගේ තැනකට ගිය කෙනෙක් අපට නිකම්ම ආණ්ඩුවක් දෙයිද? වෙන විකල්පයක් නැති වෙන කොට එහෙම ගිහිල්ලා හිර වෙලා කෙළගත්තා. ඒ වෙලාවේ දී මේ රටේ ජනතාවට තමන් ගැන හිතන්න අවශ්‍යතාවක් තිබුණා. අපි භාර ගත්තේ කඩා වැටුණු ආර්ථිකයක් තිබුණු රටක් කියන එක කාටවත් නැහැයි කියන්න බැහැ. අපි ගත්තේ ඔබතුමන්ලා නිර්මාණය කළ ප්‍රශ්නත් එක්ක තිබුණු ආර්ථිකයක් සහ රටක්. ඒ ප්‍රශ්න තමයි අද අපේ අගමැතිතුමා කර ගහගෙන ඉන්නේ. මේක ලෙහෙසි කර්තව්‍යයක් නොවෙයි. දැන් අපට ඇඟිල්ල දික් කළාට මේ අපි භාර ගත්තු හැම ප්‍රශ්නයක්ම ඔබතුමන්ලා හරහා නිර්මාණය වුණු ප්‍රශ්නය කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදී ආර්ථිකය තුළ, සමාජය තුළ නිර්මාණය වුණු ප්‍රශ්න නිහතමානීව, උපක්‍රමශීලීව විසඳන්නට ඔහු යොමු වුණේ නැහැ. රට ගැන හිතුවේ නැහැ. තමන්ගේ බලය රැක ගන්නයි වැඩ කළේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have only one more minute.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, please give me two more minutes.

එදා ඒ ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ නැතිව ඒ ප්‍රශ්න ඔක්කොම යට ගැහුවේ ජාති වාදය, ආගම් වාදය, ජාත්‍යාලය බොරුවට පෙන්නලයි. එදා රාජපක්ෂ ආණ්ඩුව නියපොත්තෙන් කඩන්න තිබුණු ප්‍රශ්නවලට එදා ඒ වෙලාවේ විසඳුම් දුන්නේ නැති නිසා ඒ ප්‍රශ්න උග්‍ර වුණා, වර්ධනය වුණා. දැන් ඒ ප්‍රශ්න පොරොවෙන් කපන මට්ටමට වර්ධනය වෙලයි තිබෙන්නේ. එදා නියපොත්තෙන් කඩන්න පුළුවන් තරමේ පුංචි අවස්ථාවක තිබුණු ප්‍රශ්න අද මහා ප්‍රශ්න බවට නිර්මාණය වෙලා තිබෙනවා. නියපොත්තෙන් කඩන්න පුළුවන් පුංචි පැළයක් නොවෙයි, මහා වෘක්ෂයක් කියන්නේ. පොරොවෙන් කපන්න පුළුවන් තරමට වර්ධනය වුණාම පොරොවෙන් පහර ගහන්න ඉස්සෙල්ලා තව හුඟාක් දේවල් හිතන්න තිබෙනවා. පොරොවෙන් පහර ගහනකොට ඒ අසල තිබෙන පුංචි සරු පැළ මතට ඒ ගහ වැටෙයිද, දේපළ, ජීවිත විනාශ වෙයිද කියා තව හුඟාක් දේවල් හිතන්න තිබෙනවා. අපි ඒ ප්‍රශ්න විසඳනකොට ඒ ගැන කල්පනා කරලා තමයි තීන්දු, තීරණ ගන්න ඕනෑ. ඒ නිසා අපි ඒ ගැන හිතලා තමයි අවුරුද්දක්, එක හමාරක් ඒ ප්‍රශ්න කර ගහගෙන ගියේ. එක පාරටම ප්‍රශ්න විසඳන්න බැහැ. ප්‍රශ්න නිර්මාණය වෙනකොටම ඒවා විසඳන්න ඔබතුමන්ලාට ඒ අවස්ථාව තිබුණා. ආර්ථිකමය, සමාජමය, ජනවාර්ගික ආදී වශයෙන් එදා නිර්මාණය වුණු ඒ ප්‍රශ්නවලට නිසි වෙලාවට ඔබතුමන්ලා විසඳුම් දුන්නේ නැති නිසා අද ඒ ප්‍රශ්න මහා වෘක්ෂයන් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ අවට සිටින අනික් අයටත් කරදරයක් වෙයිද කියා කල්පනා කරලා බලලයි අද අපට ඒ ප්‍රශ්න ගැන තීන්දු, තීරණ ගන්න වෙලා තිබෙන්නේ. අපි මේ බලය ගත්තු එක ගැන, limited overs match එකක් ගහන්න ආවාය කියා ඔබතුමන්ලා හිතනවා නම් ඒක වැරදියි. අපි ආවේ test match එකක් ගහන්නයි.

අපි ඒ test match එක හරියට ගහනවා. අපි මේ රට වෙනුවෙන් කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන වැඩ පිළිවෙළක් හදනවා. අපි මේ රට ගොඩ ගන්නට වැඩ කරනවා. ඒ නිසා මම අවසාන වශයෙන් කියනවා, ඇමෙරිකාවේ හිටපු ජනාධිපති කෙනෙක් වුණු ජෝන් එෆ්. කෙනඩි 1962 පෙබරවාරි 26 වැනි දා ඇමෙරිකාවේ ජනතාවට කථාවක් කරලා මේ විධියට කියා තිබෙනවා. මම ඒක සිංහල භාෂාවට පරිවර්තනය කර කියන්නම්.

"අමිහිරි කරුණු, විදේශීය අදහස්, අන්‍ය දර්ශනවාදයන් සහ තරගකාරී අගයයන්, ඇමෙරිකානු ජනතාව වෙත පැවරීමට අපි බිය නොවෙමු. විවෘත වෙළෙඳ පොළක් තුළ සත්‍ය සහ අසත්‍යය නිශ්චය කිරීමට ප්‍රිය දේශයක් තම ප්‍රජාවට ප්‍රිය දේශයකි."

එනිසා මම තමුන්නාන්සේලාට කියනවා, මිනිස්සුන්ට ඇත්ත කථා කරන්න හයිය තිබෙන, හෘද සාක්ෂියක් තිබෙන පක්ෂයක්, ආණ්ඩුවක් හැටියට අපි මේ රට ගැන හිතා වැඩ කරනවාය කියන එක. බලය ගැන හිතා නොවෙයි අපි වැඩ කරන්නේ. අමාරු තැන්වලදී අමාරු තීරණ ගන්නවා. සිල්ලර ජනප්‍රිය දේශපාලනය වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. මුනිදාස කුමාරණතුංග ශූරීන්ගේ මෙවැනි කියමනක් තිබෙනවා. "අලුත් අලුත් දැ නොතකන ජාතිය ලොව නොනගී." ඒක මතක තියා ගන්න. අපි වෙනස් විය යුතුයි.

ඒකාබද්ධ විපක්ෂයේ ඔබතුමන්ලා අවුරුදු 10ක් ආණ්ඩු පක්ෂයේ ඉඳලත් තවම වෙනස් වෙලා නැත්නම් ඒක කනගාටුවට කරුණක්ය කියන එක මම මතක් කරන්න කැමැතියි. අගමැතිවරයා හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ජාතික ආර්ථිකයේ නිම් වළලු පුළුල් කිරීම සඳහා ආර්ථිකයට විශාල දායකත්වයක් ගමේ ආර්ථිකය හරහා ලබා ගන්න පුළුවන් ආකාරයට ජාතික ආර්ථික ප්‍රතිපත්තිය සකස් කර තිබෙනවා. කුඩා සහ මධ්‍යම පරිමාණයේ නිෂ්පාදනය ගෝලීය වටිනාකම් දාමයට සම්බන්ධ කිරීමට සහ අපනයන ක්ෂේත්‍රයට එකතු කරන්නට ඉලක්ක කරමින් ඒ හරහා තමයි එතුමාගේ ආර්ථික වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්නේ. ඒ ආර්ථික වැඩ පිළිවෙළ අනුව තමයි අපි අපේ අයවැය සකස් කරන්නේ. අපි ඒ වෙනුවෙන් කැප වෙලා සිටිනවා. ස්තුතියි.

[අ.භා. 12.03]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද දිනයේ ආරම්භ කරන අය වැය විවාදයේදී මූලික වශයෙන්ම කරුණු කිහිපයක් මතු කර ගන්න අවශ්‍යයි. මොකද, අය වැය ඉදිරිපත් කරන්න කලින් රවි කරුණානායක මුදල් අමාත්‍යතුමා කිව්වා, මේ ඉදිරිපත් කරන අය වැය විපක්ෂය හොල්මන් වන අය වැයක්ය කියලා. ඒ වාගේම අපේ ගරු කබීර් හාෂිම් ඇමතිතුමා කිව්වා, මේක ජනතාවගේ ජයග්‍රහණයක්ය කියලා. එතකොට ඇත්තෙන්ම මේ අය වැය තුළ ජනතාවගේ ජයග්‍රහණ අඩංගු වෙලා තිබෙනවාද, එහෙම නැත්නම් මේක විපක්ෂය හොල්මන් වෙන තරමට ආණ්ඩුව ජයග්‍රහණ ලබා ගත්ත අය වැයක්ද, මේ යෝජනා තුළ ඒ අන්තර්ගතය තිබෙනවාද කියලා අපි මුලින්ම බලන්න ඕනෑ. හැබැයි ඊයේ දවස අවසාන වන විට, මේ අය වැය කථාව ඉවර වෙන විට ජනතාවට ලැබුණු දේ මොකක්ද? ජනතාව හොල්මන් වුණු මට්ටමක තමයි ඉන්නේ. මොකද, රවි කරුණානායක මුදල් ඇමතිතුමා සිංහල භාෂාවෙන් සහන පොඩ්ඩක් පෙන්වලා, ඉංග්‍රීසි භාෂාවෙන් බදු ගොඩාක් පැටෙව්වා, ජනතාවට බදු ගොඩාක් යෝජනා කළා. ඒවා ක්‍රියාත්මක වන විට ජනතාව තව හොල්මන් වෙනවා.

මේ අය වැය තුළ නම් ඔබතුමන්ලාගේ දැක්මක් පෙනෙන්නේ නැහැ. ආර්ථික සැලැස්මක්, ඉදිරි ගමනක්, මේ රට වෙනුවෙන් යෝජනා කරන අලුත් වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ තිබෙනවාද කියලා මුලින්ම බලන්නට ඕනෑ. මොකද ඒකට හේතුව, මගේ ළඟ තිබෙනවා ඔබතුමන්ලා 2016 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැය. ඔබතුමන්ලා කියන්නේ 2016 අය වැය නවෝත්පාදන වෙළෙඳ පොළ සමාජ ආර්ථිකයක් කරා යන ගමනක් සඳහා ඉදිරිපත් කරන අය වැයක් කියලා. නවෝත්පාදන සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් කරා යන ඒ ගමනට එදා ඒ අය වැයට ඔබතුමන්ලා අලුත් යෝජනා හැටියට යෝජනා 114ක් ඇතුළු කළා. ඒ යෝජනා 114 මොනවාද කියලා 2016 අය වැය වාර්තාවේ 112 පිටුවේ සඳහන් කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 253ක ප්‍රතිපාදන වෙන් කළා, රුපියල් බිලියන 253ක්. 2017 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැය අරගෙන බලන විට පේනවා එය "සැමට ප්‍රතිලාභ හිමිවන වේගවත් වර්ධනයක් කරා" කියන තේමාව පදනම් කරගෙන සකස් වූවක් කියලා. ඒ තව තේමාවක්. කලින් අය වැයෙන් 2016 දී නවෝත්පාදන සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් ඇති කිරීමට බලාපොරොත්තු වුණා. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 253ක් සඳහා යෝජනා තිබුණා. දැන් මේ අය වැයේ "සැමට ප්‍රතිලාභ හිමිවෙන වේගවත් වර්ධනයක් කරා" කියන තේමාව මුදුන් පමුණුවා ගැනීම සඳහා රුපියල් බිලියන 130ක, රුපියල් මිලියන 130,000ක යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

මේ පාර්ලිමේන්තුවේ මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා මේ යෝජනා දෙක, -ගිය අවුරුද්දේ අය වැය යෝජනාත්, මේ අවුරුද්දේ අය වැය යෝජනාත්- සංසන්දනය කර බලන්න කියලා, මේවා තුළ කොපමණ අලුත් යෝජනා තිබෙනවාද කියලා. මොකද, එදා රුපියල් බිලියන 253ක ප්‍රතිපාදන වෙන් කළ යෝජනා 2017 අවුරුද්දේ නැවත පුනරුච්චාරණය කරනවා. නැවත නැවතත් කියන යෝජනා එහෙම්මම තිබෙනවා. EXIM බැංකු කථාව, smart classroom කථාව ආදී බොහෝ දේවල්, බොහෝ කාරණා කරුණු තිබෙනවා.

අපි මුලින්ම සොයන්නට ඕනෑ, 2016 අය වැයෙන් වෙන් කළ මුදල්වලට මොකද වුණේ කියලා. මොකද, අපි දන්නවා මේ පාර්ලිමේන්තුවේ ගිය අවුරුද්දේ අය වැය විවාදයේ ලොකුම තර්කයක් වුණේ, ලොකුම විවාදයක් වුණේ අධ්‍යාපනයට මුදල් වෙන් කිරීම ගැන. එදා පෙළපාළි ගිහිල්ලා, උද්ඝෝෂණය කරලා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සහ සමාජයේ ඉල්ලීම වුණේ අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක ප්‍රමාණයක් වෙන් කරන්න කියන එකයි. ඔබතුමන්ලා එදා දිගින් දිගටම තර්ක කළා, ඒ සියයට 6 ඒ අය වැයෙන් වෙන් කළා කියලා. නමුත් අද ඔබතුමන්ලා ආපස්සට පාපොච්චාරණයක් කරනවා අපි වෙන් කළ මුදල් යොදවාගෙන නැහැ, ක්‍රියාත්මක වුණේ නැහැ, ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා කියලා. අධ්‍යාපනය විතරක් නොවෙයි, ඔබතුමන්ලාගේ 2016 අය වැයේ තිබෙන යෝජනා 114න් මේ සමාජයට, ජනතාවට දැනෙන්න, ඔය සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය ක්‍රියාත්මක වන්නට, අඩු තරමින් ඒක පටන් ගන්නට, -නවෝත්පාදන ආර්ථිකයකට යන්න පටන් ගන්න- මොනවාද ක්‍රියාත්මක වුණේ? මොනවාද ක්‍රියාත්මක කරන්නට පුළුවන් වුණේ? එහෙම දෙයක් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා තමයි අද ඔබතුමන්ලාට සිද්ධ වෙලා තිබෙන්නේ ඒ යෝජනාම ආයේ ආලේප කරලා, ආයේ හැඩ කරලා, වෙනත් වචන යොදලා වෙනත් ආකාරයකින් ගේන්නට. එතකොට ඔබතුමන්ලා මේ අය වැයෙන් අලුතෙන් යෝජනා කරන්නේ මොනවාද? 2017 පටන් ගත්ත තැන ඉඳන් සැමට ප්‍රතිලාභ ලැබෙන්නට, ආර්ථිකයේ වේගවත් වර්ධනයක් කරා යන්නට ඔබතුමන්ලා මොනවාද අලුතෙන් යෝජනා කරලා තිබෙන්නේ? සැමට ප්‍රතිලාභ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ලැබෙන්න නොවෙයි යෝජනා ගෙනත් තිබෙන්නේ. මේ අය වැයේ යෝජනා කරලා තිබෙන්නේ තමුන්නාන්සේලා මේ මොහොතේ මුහුණ දෙන, මේ ආණ්ඩුව මේ මොහොතේ මුහුණ දෙන ඇත්ත ආර්ථික අර්බුදය ප්‍රකාශයට පත් කිරීම. ඒ ඇත්ත ආර්ථික අර්බුදයෙන් ගැලවෙන්න, -ගිනි කන්දක් උඩ තිබෙන මේ ආර්ථිකයෙන්- මේ ආණ්ඩුවේ ඉදිරි පැවැත්ම මේ ආර්ථික අර්බුදයත් සමඟ තීරණය වෙනවා. මේ ආර්ථික අර්බුදයත් සමඟ තීරණය වෙලා තිබෙන ආණ්ඩුවේ ඉදිරි පැවැත්ම ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන අභියෝගයට උත්තර සෙවීමක් තමයි මේ අය වැයෙන් කරලා තිබෙන්නේ.

මෙවර අය වැය සඳහා මහ ජනතාවගෙන් අදහස් විමසනවා කියලා වරින් වර දැන්වීම් පළ කළා. රූපවාහිනීවල දැන්වීම් පළ කළා, ගුවන් විදුලියේ දැන්වීම් ප්‍රචාරය කළා. මට ඇහුණා ඊයේ අය වැය ඉදිරිපත් කරන්න නියමිතව තිබියදී පෙරේදා රූ වන තුරුත් මහ ජනතාවගේ අදහස් ඉල්ලා දැන්වීම් ප්‍රචාරය කරනවා. ඒ, අර කලින් ප්‍රචාරය කරන්න භාර දීපු දැන්වීම එහෙමම ප්‍රචාරය කරනවා වෙන්න ඇති. ඒ අදහස් ගන්නේ නැහැ. ඉතින්, මහ ජනතාව කිව්වේ මොනවාද? මහ ජනතාවගේ අදහස් මෙවර අය වැය ලේඛනය තුළ තිබෙනවාද? එහෙම නම්, මහ ජනතාව කියපු අදහස් මෙවර අය වැය ලේඛනය ඇතුළේ පෙනෙන්න ඕනෑ. එතකොට පුදුම ප්‍රශ්නයක් තිබෙන්නේ. මහ ජනතාව කියා තිබෙනවා, "VAT එක ගහලා, දවස් 10කින් ගෙනෙන අය වැයෙන් අපට තව බදු පනවන්න, තිබෙන බදු මදියි" කියා. එහෙමද, ජනතාව කියා තිබෙන්නේ? අය වැය ඉතා පැහැදිලි ලෙසම ඔබතුමන්ලාගේ ආර්ථික අර්බුදයේ ප්‍රකාශනයක්. ඒකට හේතුව අපට ඉතා පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. VAT එක ගහලා, දින 10කින් තමයි අය වැය ඉදිරිපත් කළේ. ඔබතුමන්ලාට අවශ්‍ය නම් ඒක මේ අය වැයේ යෝජනාවක් කරන්න තිබුණා. හැබැයි, ඔබතුමන්ලා කල්පනා කළේ බදු පිට බදු - tax on tax - පනවන්න පුළුවන් ක්‍රමයක් ගැනයි. VAT එක ගහලා එන භාණ්ඩයට තමයි ඔබතුමන්ලා ඊළඟට බදු පනවන්නේ. බදු පිට බදු ප්‍රතිපත්තිය තමයි අය වැයෙන් ක්‍රියාත්මක කරන්න හදන්නේ. නව බදු දිහා බැලුවාම එය ඉතා පැහැදිලියි.

මොනවාද මේ පනවලා තිබෙන බදු? මම කියන්නේ මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "බදු නැතිව ආණ්ඩුවක් ගෙන යන්න බැහැ. ආදායම උපයන්න තිබෙන ක්‍රමය බදුයි" කියා ඔබතුමන්ලා තර්ක කරනවා. හැබැයි, මේ කියන්නේ නිෂ්පාදන බද්ද, "වැට්" එක, ජාතිය ගොඩනැඟීමේ බද්ද, රඳවා ගැනීමේ බද්ද ආදී වශයෙන් සාමාන්‍යයෙන් දැනට තිබෙන බදු ක්‍රියාවලිය නොවෙයි. දැනට තිබෙන බදු ක්‍රියාවලියට අමතරව, 2017දී සැමට ප්‍රතිලාභ හිමිවන ක්‍රමයක් ගැනයි ඔබතුමන්ලා මේ කියන්නේ. ඇත්තටම "සැමට ප්‍රතිලාභ" නොවෙයි, සැමට බදු පටවන අය වැය ලේඛනයක් මේක. මධ්‍යම පන්තියටත්, තැළෙන පෑගෙන පන්තියටත්, අනිකුත් හැම පන්තියකටමත් බදු පටවන ක්‍රමයක් මේ ගෙනැත් තිබෙන්නේ. "සැමට ප්‍රතිලාභ හිමිවන, වේගවත් වර්ධනයක් කරා...." කියායි මෙම අය වැය ලේඛනයේ පිට කවරයේ සඳහන් වන්නේ. ඒ වේගවත් වර්ධනය වෙන මොකක්වත් නොවෙයි. ගාටා ගෙන යන, ඉස්සරහට යන්න බැරි අර්බුදයක තිබෙන ආර්ථිකයට, ඔබතුමන්ලාගේ අර්බුදයට බදුවලින් උත්තරයක් සෙවීමයි මේ කර තිබෙන්නේ. සැමට බදු, වේගවත් බදු වැඩි කිරීමක්! මේක තමයි තිබෙන්නේ.

තව මොනවාද අය වැය ලේඛනයේ තිබෙන්නේ? මාර්ග නීති කඩ කරන අයටත් බද්දක් පනවා තිබෙනවා. ඔබතුමන්ලා අතින් මාර්ග නීතියක් කඩ වුණොත් අය කළ දඩය දැන් වැඩි කර තිබෙනවා. ඊළඟට කාබන් බද්ද පනවා තිබෙනවා. වායු විමෝචන පරීක්ෂණ ගාස්තු එකතු කරලාම කාබන් බද්ද ගහනවා. ඊළඟට උසාවි නඩු බද්දක් පනවා තිබෙනවා. නඩුවක් කියන්න පැමිණිල්ලක් ගොනු කරන්න යන එක්කෙනා යන්නේ නීතියේ පිළිසරණ පතාගෙනයි. දැන් ඔබතුමන්ලා කල්පනා කරන්නේ මොකක්ද? නීතියේ පිළිසරණ පතාගෙන එන එක්කෙනාගෙනුත් උසාවි නඩු බද්දක් අය කරන්නයි.

ඊළඟට තිබෙනවා, අන්තර්ජාල බද්ද. ඔබතුමන්ලා e-banking ගැන, පන්ති කාමරවලට -classroomsවලට- අන්තර්ජාලය ගෙන යෑම ගැන බොහොම විග්‍රහාත්මකව කථා කරනවා; ළමයින්ට Tabs දෙන්න කථා කරනවා. මේවා ආසාවෙන් අහගෙන ඉන්න සමාජය ඒ දේවල් බලනවා. මෙන්න සියයට 25ක් අන්තර්ජාල බදු. ඊළඟට Facebook යනවා; internet යනවා. Smartphones පාවිච්චි කරන තරුණ තරුණියන් ඉන්නවා. ඒ තරුණ තරුණියන්ගෙන් තමයි ඔබතුමන්ලාගේ අර්බුදය පියවා ගන්න උත්සාහ කරන්නේ. තරුණ තරුණියන් දිරිගන්වන්න නොවෙයි, ඒ අයට නවෝත්පාදනය දෙන්න නොවෙයි, ඒ අය පාවිච්චි කරන අන්තර්ජාල පහසුකමින් තමුන්නාන්සේලාගේ අර්බුදය පියවා ගන්නයි අන්තර්ජාල බද්ද පැනවීම තුළින් උත්සාහ කරන්නේ.

ඊළඟට, මූල්‍ය ගනු-දෙනුවලටත් බද්දක් පනවා තිබෙනවා. ඒ යටතේ බැංකු සහ අනිකුත් මූල්‍ය සමාගම් මඟින් සිදු කෙරෙන easy cash ඇතුළු මුදල් ගනු-දෙනු සඳහා බද්දක් පනවා තිබෙනවා. මේ බද්ද ATM cardsවලට පනවා තිබෙනවා. එහෙම නම් ඒ සේවාවන් දියුණු කරන්න ඕනෑ; වර්ධනය කරන්න ඕනෑ. ඔබතුමන්ලා ඒවාට පහසුකම් දෙන්න ඕනෑ. ඔබතුමන්ලා කල්පනා කරන්නේ මොකක්ද? වැඩිදෙනාට -සැමට- බදු. වැඩිදෙනා පාවිච්චි කරන්නේ මොනවාද? වැඩිදෙනා handphone එක පාවිච්චි කරනවා නම්, වැඩිදෙනා තාක්ෂණය පාවිච්චි කරනවා නම්, ඒ වැඩිදෙනා භුක්ති විඳින දෙයට බදු ගහලා ඔබතුමන්ලා සැමට බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා. "සැමට ප්‍රතිලාභ" ප්‍රතිපත්තිය නොවෙයි, මේ අය වැයේ තිබෙන්නේ. අය වැය ලේඛනයේ පිට කවරයේ සඳහන් වන වාක්‍යය ඔබතුමන්ලා වෙනස් කරන්න. "සැමට ප්‍රතිලාභ" නොවෙයි මේ අය වැයේ තිබෙන්නේ. සැමට බදුයි තිබෙන්නේ. ඇති නැති භේදයෙන්, දුප්පත් පොහොසත් භේදයෙන් තොරව සැමට බදු පනවලා, ඔබතුමන්ලාගේ අර්බුදයට උත්තර සෙවීමක් මෙවර අය වැය ලේඛනය තුළ තිබෙන්නේ.

ඊළඟට, ටෙලි බද්ද පනවා තිබෙනවා. මේක අපට තේරෙනවා. ඔබතුමන්ලාට ඒවායේ වෙන විග්‍රහයන් තිබෙනවා. "ආනයනය කරන ටෙලි නාට්‍යවලින් අපේ රටේ සංස්කෘතිය විනාශ වෙනවා, අරවා, මේවා වෙනවා" කියා ඔබතුමන්ලා ටෙලි නාට්‍ය සඳහා බද්දක් පනවා තිබෙනවා. ඊළඟට, SIM cards සඳහාත් බද්දක් පනවා තිබෙනවා. මේ බද්ද පනවන්නේ මොකටද? ඔබතුමන්ලාට තාක්ෂණය වර්ධනය කරන්න ඕනෑ නම්, නවෝත්පාදන ක්‍රම දියුණු කරන්න ඕනෑ නම්, ඒවා වැඩිපුර පරිහරණය කරන සමාජයක් ගැන හිතනවා නම්, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය ඒවාට ඉඩ දෙන එක නම්, ඒවා දියුණු කරන එක නම්, ඔබතුමන්ලාට කරන්න තිබෙන්නේ මොකක්ද? දැන් බලන්න, අළෙවි ප්‍රවර්ධන කටයුත්තක් හැටියට ජංගම දුරකථන පහසුකම් සපයන වෙළෙඳ ආයතනයෙන් සිම් කාඩ් එක නොමිලේ දෙනවා. ඔබතුමන්ලා ඒකට බද්දක් ගහනවා. සිම් කාඩ් බද්ද. ඔන්න, බදු ටික.

ඊට අමතරව, මොකද කරන්නේ? තව ඒවාට "බදු" කියන වචනය පාවිච්චි කරන්න තමුන්නාන්සේලා භයයි. ඒ නිසා කියනවා, ජාතිය ගොඩනැඟීමේ බද්ද තාර්කිකරණය කිරීමට යෝජනා කරනවා කියලා. මොකක්ද, ඒකේ තේරුම? 2017 අය වැය කථාවේ 1 කොටසේ 77වැනි පිටුවේ අංක 462 බලන්න. ඔබතුමන්ලා කියා තිබෙනවා, ජාතිය ගොඩනැඟීමේ බද්ද

තාර්කීකරණය කිරීම සම්බන්ධව. සාමාන්‍ය ජනතාවට තාර්කීකරණය වෙන්න නම් බද්ද අඩු වෙන්න ඕනෑ. ඒකෙන් ආණ්ඩුවට පාඩුවක්, අවාසියක් වෙන්න ඕනෑ. හැබැයි, මේ කියන විධියට ජාතිය ගොඩනැඟීමේ බද්ද තාර්කීකරණය කිරීමෙන් රුපියල් මිලියන 7,200ක ආදායමක් රජය බලාපොරොත්තු වෙනවා. ඒක අපට හඳුන්වන්න පුළුවන්, තාර්කීකරණ බද්ද කියලා.

ඊළඟට, ඔබතුමන්ලා රුපියල් මිලියන 32,000ක් වූ වැඩිම ආදායමක් බලාපොරොත්තු වන්නේ සංස්ථාපිත බද්දෙනුයි; Corporate Tax එකෙනුයි. ඒක ඇතුළේ ඔබතුමන්ලා තව වාක්‍යයක් කියනවා, "...කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර තාර්කික පදනමක් මත...." කියලා. ඒ කියන්නේ, අර ජාතිය ගොඩනැඟීමේ බද්ද වාගේම කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලටත් තාර්කීකරණ බද්ද ගෙනෙනවා. මොකද, මේ තාර්කීකරණ බදු තමයි මේ අය වැය විවාදයෙන් පස්සේ තමුන්නාන්සේලා වෙන වෙනම සංශෝධන හැටියට ගෙනෙන්නේ. ඊට පස්සේ ජාතිය ගොඩනැඟීමේ බද්ද තාර්කීකරණය කිරීමේ ප්‍රතිශත ටික ගෙනෙනවා. ඒ නිසා ජාතිය ගොඩනැඟීමේ බද්ද තාර්කීකරණය කරලා තිබෙන්නේ කොහොමද?

මෙතෙක් සමුපකාර සමිතිවලටයි, ලක් සතොසටයි ජාතිය ගොඩනැඟීමේ බදු නිදහසක්; බදු සහනයක් තිබුණා. අන්න, ඒ බදු සහනය දැන් තමුන්නාන්සේලා ඉවත් කරලා තිබෙනවා. දැන් සමුපකාර සමිති භාණ්ඩවලට, ලක් සතොසේ විකිණීමට තිබෙන භාණ්ඩවලට තමුන්නාන්සේලා ජාතිය ගොඩනැඟීමේ බද්ද තාර්කීකරණය කර තිබෙනවා. තාර්කීකරණයෙනුත් වෙන්නේ මොකක්ද? අහිංසක මිනිස්සුන්ට බදු වැඩි වෙනවා; මිල වැඩි වෙනවා; විකුණන භාණ්ඩවල මිල වැඩි වෙනවා.

මේ ඔක්කෝම කරලා ඊළඟට මොකද කරන්නේ? තමුන්නාන්සේලා රබර් කිලෝවකට රුපියල් 15ක සෙස් බද්දක් පනවනවා. සෙස් බද්ද පනවන්නේ මොකටද? රබර් කර්මාන්තය ආරක්ෂා කරන්නයි. රබර් කර්මාන්තය කඩා වැටිලා තිබෙනවා. ඒක දියුණු කරන්න ඕනෑ, නඟා සිටුවන්න ඕනෑයි කියලා රුපියල් 15ක සෙස් බද්දක් පනවනවා. හැබැයි, ඊළඟට මොකක්ද කියන්නේ?

අය වැය කථාවේ 1 කොටසේ 63 වැනි පිටුවේ 366 ඡේදයෙන් තමුන්නාන්සේලා කියනවා, විශ්‍රාම අරමුදල් හැර අනෙකුත් අරමුදල් සියල්ල වහාම භාණ්ඩාගාරයට ලබා ගන්න ඕනෑයි කියලා. මොකක්ද ඒකේ තේරුම? විශ්‍රාම අරමුදල හැර රජයේ දෙපාර්තමේන්තු, ආයතන, සංස්ථා යටතේ තිබෙන අනෙකුත් සියලුම අරමුදල් වහා ක්‍රියාත්මක වන පරිදි, භාණ්ඩාගාරයට ලබා ගන්න ඕනෑයි කියනවා. අර තමුන්නාන්සේලා දෙනවායි කියන සහනවල "වහා ක්‍රියාත්මක" කියන එක නැහැ. "වහා ක්‍රියාත්මක වන පරිදි" කියලා කිව්වාම මා දන්නේ නැහැ, ලේකම්තුමා කවදාද මේකේ චක්‍රලේඛ නිකුත් කරන්නේ කියලා. අද මධ්‍යම රාත්‍රී 12.00 ඉඳලා අදාළ වෙච්ච දන්නේ නැහැ. ඊළඟට SMS එක ඒවිද දන්නේ නැහැ, "වහා ක්‍රියාත්මක වන පරිදි, සියලුම සෙස් අරමුදල් භාණ්ඩාගාරයට ලබා ගන්නවායි කියලා.

සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල තිබෙනවා. විදේශ සේවා නියුක්තිකයින්ගේ අරමුදල තිබෙනවා. ඊළඟට තේ කර්මාන්තය වෙනුවෙන් තිබෙන සෙස් අරමුදල තිබෙනවා. මොකද, අපි දන්නවා, මෙවර අය වැයට කලින් තමුන්නාන්සේලා අය වැය හිඟය පියවන්න ගරු නවීන් දිසානායක ඇමතිතුමාගෙන් රුපියල් බිලියන 4ක් ඉල්ලපු බව. ඒ මුදල් ඉල්ලුවේ තේ කර්මාන්තය සඳහා තිබෙන සෙස් අරමුදලිනුයි. ගරු නවීන් දිසානායක ඇමතිතුමාට ධෛර්යයක් තිබුණා, "මේ සෙස් අරමුදලේ තිබෙන මුදල් භාණ්ඩාගාරයට ගත්තොත් මා ඉල්ලා අස් වෙනවා" කියලා කියන්න. එතුමා එහෙම කියලායි ඒක බේරා ගත්තේ. හැබැයි, දැන් තමුන්නාන්සේලා මොකද කර තිබෙන්නේ? ගරු නවීන් දිසානායක ඇමතිතුමාගෙන් ඒක ඒ විධියට ගත්තේ නැහැ. දැන් ඒක අය වැයෙන් නීතියක් බවට පත් කරලා ගෙනෙන්න හදනවා. මේකේ තේරුම මොකක්ද? මේ තර්කය මොකක්ද? ඊට පස්සේ තව වාක්‍යයක් ඇතුළත් කරනවා, මේක සාධාරණීකරණය කරන්න. ඒ මොකක්ද? ඉල්ලූ අවස්ථාවක භාණ්ඩාගාරයෙන් ආපසු ලබා දෙනවායි කියනවා. ලබා දෙයි තමයි. ඉල්ලූ අවස්ථාවක දෙයි. හරි පුදුම කථාවක්. දැන් ඔක්කෝම ටික භාණ්ඩාගාරයට දෙන්න කියනවා. ඉල්ලුවාම භාණ්ඩාගාරයෙන් ආපසු දෙන්නම් කියනවා. ඒ කියන්නේ, භාණ්ඩාගාරයෙන් අරගන්නේ පරිස්සමට තියා ගන්නයි. භාණ්ඩාගාරයෙන් ඉල්ලනවා, විශ්‍රාම අරමුදල හැර අනෙකුත් අරමුදල් සියල්ල පරිස්සම් කරලා තියා ගන්න දෙන්න කියලා. මොකටද ඒ? දැන් තිබෙන විධියට තිබුණාම ඒ මුදල් පරිස්සම් වෙන්නේ නැද්ද? දැන් තිබෙන විධියට ඒ මුදල් පරිස්සම් වෙන්නේ නැත්නම් ඒ ගැන හොයා බැලීම රජයේ කටයුත්තක්.

තේ 'සෙස්' අරමුදලේ අඩු පාඩුවක් වනවා නම්, වෙන අමාත්‍යාංශයක තිබෙන අරමුදල්වල අඩු පාඩුවක් වනවා නම්, ඒ අඩු පාඩුව සොයා බැලීමේ වගකීම තිබෙන්නේ විෂය භාර ඇමතිවරයාට. හැබැයි, දැන් මේ ඔක්කෝම අරමුදල් පරිස්සම් කර ගන්න ගෙන යන්නේ කොහේටද? භාණ්ඩාගාරයට. එතකොට මේ සමස්තයේ හරය මොකක්ද? මේ සමස්තයේ හරය වෙන මොකක්වත් නොවෙයි. තමුන්නාන්සේලා රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට මේ වෙලාවේ මුහුණ දෙන ආර්ථික අර්බුදය, අය වැය හිඟය පියවා ගන්න බැරි අර්බුදය, ණය ගෙවා ගන්න බැරි අර්බුදයයි, ඒ. ඒක ඇත්ත. මේ අර්බුදවලට මේ දෙගොල්ලන්ම වග කියන්න ඕනෑ බව ඇත්ත.

කබීර් හාෂිම් ඇමතිතුමා කියනවා, "අපි නොවෙයි, ඔයගොල්ලන් වග කියන්න ඕනෑ"ය කියලා. මේගොල්ලන් කියනවා, "නැහැ, ඔයගොල්ලන් වග කියන්න ඕනෑ"ය කියලා. නැහැ, මේ අර්බුදවලට මේ දෙ ගොල්ලන්ම වග කියන්න ඕනෑ. කොළ පාටින් ණය ගත්තත්, නිල් පාටින් ණය ගත්තත්, කොළ පාටින් රට දූෂපත් කළත්, නිල් පාටින් රට දූෂපත් කළත්, මේ රටේ ජනතාව භුක්ති විඳින්නේ එකම ප්‍රතිඵලයක්. අවසානයේ මේකට වග කිව යුත්තන් වන්නේ ජනතාව. ඇයි, දැන් තමුන්නාන්සේලා මේ සියලු දේවල වගකීම පටවා තිබෙන්නේ ජනතාවට. දැන් ජනතාව තමයි ණය අරගෙන තිබෙන්නේ. ජනතාව තමයි මුදල් නාස්ති කරලා තිබෙන්නේ. ජනතාව තමයි මේ අරමුදල් හදා ගෙන තිබෙන්නේ. ජනතාව තමයි මේ අරමුදල් විනාශ කරලා තිබෙන්නේ. ජනතාවගෙන් දැන් අහනවා, "අපි පඩි ගෙවන්නේ කොහොමද? අපි පොලී ගෙවන්නේ කොහොමද? අපි විශ්‍රාම වැටුප ගෙවන්නේ කොහොමද?" කියලා. දැන් කාගෙන්ද මේ දේවල් අහන්නේ? ජනතාවගෙන්. නමුත්, ඇත්ත කාරණාව මොකක්ද? මේ රට ණය කළේ ජනතාව නොවෙයි. මේ වැරදි දේශපාලන තීරණ ගත්තේ ජනතාව නොවෙයි. මේ නාස්තිකාර වියදම්වලට ව්‍යාපෘති හදා ගත්තේ ජනතාව නොවෙයි. හරියට කළමනාකරණය කරන්නේ නැතිව ඒවා පාඩු කළේ ජනතාව නොවෙයි. ඒක නිසා සැමට ප්‍රතිලාභ මුවාවෙන් තමුන්නාන්සේලාගේ සැමට බදු පනවන ප්‍රතිපත්තියට අපි එකඟ නැහැ; මේ රටේ ජනතාවත් එකඟ නැහැ. ඒක වැරදියි.

ඊළඟට, තවත් කාරණාවක් තිබෙනවා. තමුන්නාන්සේලා යහපත් රාජ්‍ය සේවය ගැන මේ අය වැයේ කථා කරනවා. මෙවර අය වැයෙන් වැටුප් වැඩි කිරීම් කරලා නැහැ. හැබැයි, තමුන්නාන්සේලා යහපත් රාජ්‍ය සේවය ගැන කථා කර ගෙන ඇවිල්ලා එක පාරටම යෝජනාවක් කරනවා. ඒ මොකක්ද?

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

තමුන්නාන්සේලා එක පාරටම "ණය අර්බුදය" ගැන කියනවා, අය වැය කථාවේ 63වන පිටුවේ. හේතුව මොකක්ද? සේවකයින්ගේ අරමුදල්, ප්‍රතිලාභ අරමුදල් කියන සියලුම අරමුදල් ටික භාණ්ඩාගාරයට පැහැර ගැනීමේ වුවමනාව. ඒ අරමුදල් ටික පැහැර ගැනීමේ වුවමනාව වෙනුවෙන් තමයි ණය අර්බුදය සම්බන්ධයෙන් මෙතැනදී කියන්නේ. ඒක තමයි මේ ඉෂ්ට කරලා තිබෙන්නේ.

ඊළඟට, තමුන්නාන්සේලා සැමට ප්‍රතිලාභ දෙන එකේ පොඩි මිනිස්සුන්ට ප්‍රතිලාභ දීලා තිබෙන්නේ කොහොමද? පොඩි මිනිසුන්ට, බැරි මිනිසුන්ට, සාමාන්‍ය මිනිසුන්ට, මේ ආර්ථිකයට යමක් එකතු කරන මිනිසුන්ට, වැඩ කරන මිනිසුන්ට, ඒ වාගේම විදේශගතවන මිනිසුන්ට තමුන්නාන්සේලා දෙන ප්‍රතිලාභය මොකක්ද? ඔබතුමන්ලා මේ අය වැයෙන් ඒ අයට ප්‍රතිලාභ දීලා නැහැ. යූඑන්පී චේවා, ශ්‍රීනිප චේවා, ජේවීපී චේවා, ටීඑන්ඒ චේවා, සිංහල චේවා, දෙමළ චේවා, මුස්ලිම් චේවා, බර්ගර් චේවා, මැලේ චේවා, කුමන ආගමක, කුමන ජාතියක කෙනෙකු වුණත්, මේ අය වැය හදලා තිබෙන්නේ සාමාන්‍ය ජනතාව ගැන හිතලා නොවෙයි. මේ අය වැය කථාවේ ඒ සඳහා හොඳම උදාහරණ තිබෙනවා, බලන්න.

මීට කලින් ඉන්ධන ධාරිතාව අනුව මෝටර් බයිසිකල්වලට නිෂ්පාදන බදු පැනෙව්වේ නැහැ. මෙවර මෝටර් බයිසිකලයටත් නිෂ්පාදන බදු පනවා තිබෙනවා නේ? මේ රටේ විශාල ඉන්ධන ධාරිතාවක් තිබෙන මෝටර් බයිසිකල් පාවිච්චි කරන්නේ කවුද? මොකද, අපේ රටේ සාමාන්‍ය ජනතාව මෝටර් බයිසිකල් "රේස්" යනවාද, ඒවායින්? දැන් මේ මොකක්ද කරන්නේ? එහෙම "රේස්" පැදපු කට්ටිය ඉන්නවා. දැන් ඉන්ධන ධාරිතාවේ ප්‍රමාණය අනුව, CC එක අනුව, තමුන්නාන්සේලා මෝටර් බයිසිකලයට බදු ගහන්නේ ඇයි? කල්පනා කරලා බලන්න. ඒකෙන් සැමට ලැබෙන ප්‍රතිලාභය මොකක්ද? ඒකෙන් තමුන්නාන්සේලා ප්‍රතිලාභ දෙන්න යන්නේ කාටද? මේ රටේ කාර් පාවිච්චි කරන්න බැරි මිනිසුන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඈත ගම් පළාත්වලට යනකොට පෙනෙනවා, ඉස්කෝලයට යන්නේ, රැකියාවට යන්නේ, කුඹුරට යන්නේ, කර්මාන්තයට යන්නේ, ගොවිතැනට යන්නේ මෝටර් බයිසිකලයෙන් කියලා. දැන් ඔබතුමන්ලා ඉන්ධන ධාරිතාව අනුව මෝටර් බයිසිකල්වලට බදු පැනවීම ගේනවා.

ඊළඟට, ගුවන්ගතවනකොට / නැව්ගතවනකොට කියලා ගාස්තුවක් පනවා තිබෙනවා. නැව්ගතවන මගීන්ට සහ ගුවන්ගතවන මගීන්ට ඇමෙරිකානු ඩොලර් 50ක ගාස්තුවක් පනවා තිබෙනවා. අපේ රටේ සිටින නැව්ගතවන මගියෝ කවුද? අපේ රටේ නැව්ගතවන මගීන් ඉන්නවාද? නැව්වලට වැඩට යන අය නම් ඉන්නවා. හැබැයි, ගුවන්ගතවන මගීන් ඉන්නවා. එතකොට ඇමෙරිකානු ඩොලර් 50ක් ඒ අයගෙන් අය කරනවා.

ඊළඟට, තමුන්නාන්සේලා කියනවා, "සමාජ සංවර්ධන දායකත්වය වෙනුවෙන්" කියලා. මේ වචන හරි සුන්දර වචන. සමාජ සංවර්ධන දායකත්වය වෙනුවෙන් හැම රුපියල් 10,000කම ගනු-දෙනුවක් කරන කෙනෙකුගෙන් රුපියල් පහක් කපා ගන්නවා. එතකොට බැංකු ක්‍රියාවලිය ශක්තිමත් කරන ආර්ථිකයක්ද, මේ? එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් බලයට පත් වුණොත් ආර්ථිකය ශක්තිමත් වනවා; බැංකු ශක්තිමත් වනවා; ව්‍යාපාර ශක්තිමත් කරනවා කියන මිථ්‍යාවක් සමාජය තුළ තිබෙනවා. එහෙම එකක් තිබුණා. හැබැයි, දැන් ඒවා තමුන්නාන්සේලාගේම ප්‍රතිපත්තිවලින් සුන්නද්දූලි කරලා අවසන්. රුපියල් 10,000ක ගනු-දෙනුවක් කරන කොට තමුන්නාන්සේලා රුපියල් පහක් කපා ගන්නවා; පික්පොකට් ගහනවා.

කෝ! සැමට ප්‍රතිලාභය? එතකොට කාටද ප්‍රතිලාභ ලැබෙන්නේ? ඔබතුමන්ලාට මෙවර අය වැය ලේඛනයේ මුල පිටුව වෙනස් කරන්න වෙන්නේ ඒක නිසායි. මේ අය වැය ලේඛනයේ මුල පිටුවේ, "සැමට ප්‍රතිලාභ...." කියලා කියනවා. ඒ වාගේම, සමාජ සංවර්ධන දායකත්වය කියලා කියනවා. කොහොමද දන්නේ නැහැ, බෙදන්නේ? රුපියල් පහ ගණනේ අය කර ගෙන, කොහොමද සමාජ සංවර්ධන දායකත්වය බෙදන්නේ? මොකක්ද ඒකට තිබෙන යෝජනාව? සෑම ගනු-දෙනුවකින්ම, සෑම ගනු-දෙනුවක් කරන කෙනෙකුගේ රුපියල් 10,000කින් රුපියල් 5ක් අය කර ගන්න තිබෙන යුක්තිය මොකක්ද? ඒක කල්පනා කරලා බලන්න.

තමුන්නාන්සේලා සේවක අර්ථ සාධක අරමුදල ගැන කියනවා. නමුත්, සේවක අර්ථ සාධක අරමුදල ගැන අය වැය කථාවේදී කිව්වේ නැහැ; පැනලා ගියා. මෙපමණ කාලයක් සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභීන්ට අයිතියක් තිබුණා, තමන්ට තිබෙන සේවක අර්ථ සාධක අරමුදල ඇපයට තියලා නිවාස ණයක් ගන්න. තමුන්නාන්සේලා ඒක ඉවත් කරනවා. මොකක්ද ඒකට හේතුව? කවුද ඒක ඉවත් කරන්න කිව්වේ? මහජන අදහස් දැක්වූ ජනතාව කිව්වාද? රජයේ සේවකයෝ කිව්වාද, "අපට මේ සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභයක් හැටියට තිබෙන නිවාස ණය එපා" කියලා. ඒකට යෝජනාවක් ගෙනෙන්නේ "වෙනත් නිවාස ණය යෝජනා ක්‍රම තිබෙනවා" කියලායි. හැබැයි ඉතින්, දැනට තිබෙන ක්‍රමය නැති කරන්නේ ඇයි? තමුන්නාන්සේලා සේවක අර්ථ සාධක අරමුදල පාවිච්චි කළා, බැඳුම්කර මගඩි ගැන හෙව්වේ නැහැ, ඒවායින් වංචා කරන හොරු ගැන හෙව්වේ නැහැ. එතකොට මේ කැක්කුම තිබුණේ නැහැ. හැබැයි, දැන් අර අහිංසක මිනිස්සුන්ට, තමන්ගේ ප්‍රතිලාභය තියා ගෙන, සේවක අර්ථ සාධක අරමුදල ඇපයට තියලා නිවාස ණයක් ගන්න තිබෙන අයිතිවාසිකම තමුන්නාන්සේලා මේ අය වැයෙන් උදුරා ගන්නවා. කොහොමද, ඒක යුක්ති සහගත කරන්නේ? කොහොමද, ඒක සාධාරණීකරණය කරන්නේ? මොන මහජන අදහස්වලින්ද මේ අය වැය හදලා තිබෙන්නේ? ඒ ගැන කල්පනා කරලා බලන්න.

තමුන්නාන්සේලා පසු ගිය අය වැයේදීත් "දායක විශ්‍රාම වැටුප් ක්‍රමය" ගැන කථා කළා. මේ අය වැයේදී ඒක ස්ථිර කරලා තිබෙනවා. දැන් තිබෙන ක්‍රමය වෙනස් කරලා, දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙනෙන්න ඕනෑ නම්, මුලින්ම මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරන්නට ඕනෑ. ඒ ක්‍රමය මන්ත්‍රීවරුන්ගේ වැටුප සම්බන්ධයෙන් මුලින් ගෙනෙන්නට ඕනෑ. මන්ත්‍රීවරු වන අපි, මහජන නියෝජිතයින් හැටියට වැටුපක් නොවෙයි දීමනාවකුයි ලබන්නේ. හැබැයි, වැටුපක් හැටියට හිතා ගෙන, මන්ත්‍රීවරුන්ට තිබෙන විශ්‍රාම වැටුප් ක්‍රමය එහෙමම තියා ගෙන, තමුන්නාන්සේලා විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරලා, සාමාන්‍ය රජයේ සේවකයා වෙනුවෙන් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් අලුතින් හඳුන්න යෝජනා ගෙනෙනවා. එතකොට ඒවා කොහොමද, 'සැමට ප්‍රතිලාභ' වෙන්නේ? කොහොමද ඒක සාධාරණීකරණය වෙන්නේ ? කොහොමද ඒක යුක්ති සහගත වෙන්නේ? කල්පනා කරලා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්‍රාම වැටුප් ක්‍රමය ගැන ඔබතුමන්ලා කියන වාක්‍ය ගැන මේ රටේ ජනතාව, රජයේ සේවකයෝ අවුරුදු හැටක් පනින කල්, විශ්‍රාම යන කල් රාජ්‍ය සේවය කරපු අය කල්පනා කරන්න ඕනෑ. මම හිතන හැටියට අද රජයේ නිලධාරින්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් මෙතැන රජයේ නිලධාරින්ගේ කුටියේ ඉන්නවා. තමුන්නාන්සේලාත් මේ රාජකාරිය කළාට පස්සේ විශ්‍රාම යනවා. තමුන්නාන්සේලාත් දෙපාර්තමේන්තුවල සේවය කළ අය විධියට ඊළඟට විශ්‍රාම

වැටුපක් ලබනවා. "මේ තිබෙන විශ්‍රාම වැටුප් ක්‍රමය කාලබෝම්බයක්" කියන මෙවැනි වාක්‍යයක් යෙදුවේ ඇයි? මෙහෙම වාක්‍යයක් යොදන කොට මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට හිතුණේ නැතිද, මේක තමන්ටත් අදාළයි කියලා. ඇයි මේ, 'කාලබෝම්බයක්' කියලා කිව්වේ? විශ්‍රාම වැටුප් ක්‍රමය කියන එක කාලබෝම්බයක් නම්, මේ පාර්ලිමේන්තුවේ 225දෙනා ලබන එක "පරමාණු බෝම්බයක්". මොකක්ද, 'කාලබෝම්බය' කියන එකේ තේරුම? විශ්‍රාම වැටුපක් ලබන කෙනා සමාජයට, රටට, ජනතාවට, ජාතියට යම් සේවයක් කරලායි ඒක ලබන්නේ.

විශ්‍රාමිකයෝ කියන්නේ හිඟන්නෝ නොවෙයි; හිඟමන් ලබනවා නොවෙයි; යදින මිනිස්සු නොවෙයි. ඒ, ඒ මිනිසුන් සමාජයට, රටට කරපු සේවය වෙනුවෙන් ලබන ප්‍රතිලාභයක්. ඒ අයගේ වැටුපෙන් ඒ මුදල අය කර ගන්නවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පඩියෙනුත් අය කර ගන්නවා. එහෙමනම් ඇයි ඒකට 'කාලබෝම්බයක්' කියන්නේ? කොහේද පුපුරන්නේ? මේ රටේ ඊට වඩා පුපුරන ඒවා නැතිද? මේ රටේ වංචා කරන ඒවා, හොරකම් කරන ඒවා, රුපියල් කෝටි ගණන් කොමිස් ගහන ඒවා, ටෙන්ඩර් මගඩි ගහන ඒවා, විදේශ ව්‍යාපෘතිවලින් හොරකම් කරන ඒවා, තමන්ගේ ගජ මිතුරන් අතරේ බෙදා ගන්න ඒවා කාලබෝම්බ නොවෙයිද? තමුන්නාන්සේලා ඒවා ගැන වචනයක්වත් සඳහන් කරන්නේ නැතිව, රටට සේවය කරපු අහිංසක විශ්‍රාමික ජනතාවගේ විශ්‍රාම වැටුප කාලබෝම්බයක් කියනවා. එහෙමනම්, මේ මන්ත්‍රීවරු 225දෙනා අවුරුදු පහක් ඉඳලා, ඉන් පසුව මැරෙන කල් ලැබෙන විශ්‍රාම වැටුප මොකක්ද? ඒක කොහොමද සාධාරණීකරණය කරන්නේ? ඒක පරමාණු බෝම්බයක්! ඒ කාරණයත් මෙහි ලියන්නට ඕනෑ. රජයේ සේවකයින් හැටියට අමාත්‍යාංශ ලේකම්තුමන්ලා මෙවැනි වාක්‍ය අය වැය යෝජනාවකට ඇතුළු කිරීම පිළිබඳව අප කනගාටු වනවා.

දේශපාලනඥයින්ට දේශපාලන වුවමනාවන් තිබෙන්න පුළුවන්. ආණ්ඩුවකට ආණ්ඩුවේ වුවමනාවන් තිබෙන්න පුළුවන්. හැබැයි රජයේ සේවකයින්ට පිට කොන්දක් තිබෙන්න ඕනෑ, මීට වඩා ආත්ම ගෞරවයක් ඇතිව තමන්ගේ රාජ්‍ය සේවය පිළිබඳව ඒ කරුණු සඳහන් කරන්න. කනගාටුවෙන් වුණත් මා ඒ කාරණය කියන්න ඕනෑ.

ඊළඟට, ඔබතුමන්ලා අපූරු යෝජනාවක් ඉදිරිපත් කරනවා, රජයේ රෝහල්වල ගෙවන වාට්ටු ඇති කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ කථාව මා අවසන් කරන්නම්.

රජයේ රෝහල්වල ගෙවන වාට්ටු ඇති කරනවාය කියනවා. ගෙවන වාට්ටු කොහේද ඇති කරන්නේ? දැන් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ගෙවන වාට්ටු තිබෙනවා. අපි ඒ රෝහලේ නිලධාරීන් COPE එකට ගෙන්වා අහනවා, රජයේ රෝහල්වලින් සාමාන්‍ය ජනතාවට ලැබෙන ප්‍රතිලාභ මොනවාද කියලා. දැන් මේ ගෙවන වාට්ටු ඇති කරනවාය කියන්නේ කුමන රජයේ රෝහල්වලද? අනුරාධපුරය රෝහලේ, පේරාදෙණිය රෝහලේ, කුරුණෑගල රෝහලේ, මාතර මහ රෝහලේ, ගාල්ල කරාපිටිය රෝහලේ දැන් ලෙඩ්ඩු පිරිලා ඉන්නවා. OPD එක ඉඩ නැහැ. රෝහල්වල හැම තැනම ඉඩ නැහැ. මෙහෙම තිබියදී තමුන්නාන්සේලා යෝජනා කරනවා, මේ රජයේ රෝහල්වලම ගෙවන වාට්ටු ඇති කරන්න. එතකොට සැමට ප්‍රතිලාභ ලැබෙනවාද? ඒකටද, ඔය රාජ්‍ය සහ පෞද්ගලික අංශ ඒකාබද්ධ කිරීම කරන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නමුත් TNA එකේ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ කාලයෙන් මට විනාඩි 23ක් ලැබුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපි දැන් දිවා ආහාරය සඳහා ගරු සභාවේ කටයුතු අත් හිටුවනවා. සභානායකතුමනි, විනාඩි තුනක, විනාඩි හතරක කාලයක් තමයි තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමානි, මට ලැබී ඇති විනාඩි 32ට අමතරව දෙමළ ජාතික සන්ධානයේ ඉතුරු වේලාවත් අපට දෙනවාය කිව්වා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම නම් දිවා ආහාරය සඳහා ගරු සභාවේ වැඩ කටයුතු නවත්වලා, ආපසු පටන් ගන්න වෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාවේ වැඩ කටයුතු නවත්වලා ආපසු පටන් ගනිමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා තව කොපමණ වේලාවක් කථා කරන්න බලාපොරොත්තු වනවාද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මට ලැබී තිබෙන වේලාව අවශ්‍යයි. මා හිතන හැටියට මට තව විනාඩි 23ක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම නම් දිවා ආහාරයෙන් පසුව කථා කරමු.

මේ අවස්ථාවේදී දිවා ආහාරය සඳහා පස් වරු 1.30 දක්වා මෙම ගරු සභාවේ කටයුතු අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා)ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன் ] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Sunil Handunnetti, continue, please.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මතු කරමින් හිටියේ රජයේ රෝහල්වල සෞඛ්‍ය සේවය පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ කරලා ගෙවන වාට්ටු ඇති කළාට පස්සේ, නිදහස් සෞඛ්‍ය සේවයට ඇති වෙන්න පුළුවන් ඉරණම මොකක්ද කියන කාරණය. දැන් මේ කොළ පාට, නිල් පාට ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල කෙළවර ඇවිල්ලා තිබෙන්නේ "නිදහස් අධ්‍යාපනය" කියන එක සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්තයාගේ නම සමරන තත්ත්වයකට විතරයි. මේ විධියට ගියොත් සෞඛ්‍ය සේවයට වෙන්න යන්නේත් ඒකම තමයි. නිදහස් අධ්‍යාපනයට වෙන දේ පිළිබඳව ඔබතුමන්ලාගේ අය වැය කථාවේ 23 වැනි පිටුවේ හරි පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපේ රටේ විශ්වවිද්‍යාලවල ඉන්න උගතුන්, බුද්ධිමතුන්, ආචාර්යවරුන්, ශිෂ්‍යයන් සහ දෙමව්පියන් අවධානය යොමු කරන්න ඕනෑ කියලායි මම විශ්වාස කරන්නේ. අය වැය කථාවේ 23 වැනි පිටුවේ ඉතා පැහැදිලිව මෙහෙම කියනවා.

"විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපන පහසුකම් ඇති කරලීමට නම් අප ප්‍රායෝගික විය යුතුයි. රජයට පමණක් මෙම අභියෝගය ජය ගත නොහැකියි. පෞද්ගලික අංශය ද ඒ සඳහා දායක විය යුතුයි. එබැවින් රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතන රට තුළ ඇති කිරීමට අවශ්‍ය පහසුකම් සැලසිය යුතු වෙනවා."

එතකොට, ඔබතුමන්ලාගේ මේ "සැමට ප්‍රතිලාභ" අය වැයේ ප්‍රතිපත්තිය තමයි, පෞද්ගලික අංශය ඒකාබද්ධ කරලා රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතන දිරිමත් කිරීම. ඒකට තමයි විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුට රුපියල් ලක්ෂ අටක ණය දෙන්නත් ඔබතුමන්ලා යෝජනා කරන්නේ. මේ අනුව දැන් නිදහස් අධ්‍යාපනය කියන එක "මුදලට අධ්‍යාපනය" දක්වා යන ගමන මේ අය වැයෙන් තව තීව්‍ර කරලා තිබෙනවා; වර්ධනය කරලා තිබෙනවා. අපට ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී තව සාකච්ඡා කරන්න පුළුවන්. ජාතික අධ්‍යාපන පද්ධතියට, පාසල් පද්ධතියට අවශ්‍ය සේවා, විදුලි බිල ආදී සියල්ල කප්පාදු කරලා - ඒ ප්‍රතිපාදන කපලා - ඔබතුමන්ලා මේ කරන්න යන්නේ මොකක්ද කියලා ඉදිරියේදී විවාදයට එකතු වන අනිකුත් ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරාවි.

ඊළඟට, පෞද්ගලීකරණය පිළිබඳව කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ මේ අය වැයේ තිබෙන්නේ සැමට ප්‍රතිලාභ වෙනුවට සැමට බදු, වේගවත් ආර්ථික වර්ධනයක් වෙනුවට වේගවත් බදු වර්ධනයක්. ඒක තමයි මේ අය වැයේ ප්‍රතිපත්තිය. සැමට බදු ප්‍රතිලාභ දෙන, වේගවත් බදු වර්ධනයක් ඇති කරන මේ අය වැය කථාවේ 38වැනි පිටුවේ, 203 වගන්තියේ ඔබතුමන්ලා හරි පැහැදිලිව උපාය මාර්ගික නොවන ව්‍යාපාර ලැයිස්තුගත කිරීම ගැන සඳහන් කරලා තිබෙනවා. මේ කාරණය 2016 අය වැය කථාවේත් 71වැනි පිටුවේ ඒ ආකාරයෙන්ම සඳහන් කරලා තිබෙනවා. ඒ ලැයිස්තුවමයි මේ තිබෙන්නේ. මෙවර අය වැය කථාවේ 38වැනි පිටුවේ ඒ ලැයිස්තුවම ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා: Waters Edge, Grand Oriental Hotel, Hyatt, Hilton, Manthai Salt, Hambanthota Salt.

2016 අය වැයෙන් 2017 අය වැයට එන විට ඒ ලැයිස්තුවෙන් හළලා තිබෙන්නේ, Lanka Hospitals -ඇපලෝ රෝහල- විතරයි. ඔබතුමන්ලා ඒ ආයතන "ලැයිස්තුගත කරනවා" කියලා බර වචන දාලා කියන්නේ පෞද්ගලීකරණය කිරීම තමයි. ඒ කියන්නේ විකිණීමට ඉදිරිපත් කිරීම. ඊළඟට, තවත් වැදගත් දෙයක් කියනවා. නමුත් ඒක අපට, රටට, රටේ ජනතාවට වැදගත් නැහැ. ඒක තමුන්නාන්සේලාට වැදගත් නිසා මෙන්න මෙහෙම කියනවා.

"2017 වර්ෂය තුළ සිදු වන අනෙකුත් ලැයිස්තුගත කිරීම් සම්බන්ධව පාර්ලිමේන්තුව දැනුවත් කරනු ඇත"

මේ කියන්නේ මොකක්ද? ආණ්ඩුව දැන් කියන්න, මේ කියන්නේ මොකක්ද කියලා? ඒකෙන් කියන්නේ, අපි Hambanthota Salt එක, Manthai Salt එක, Hyatt එක, Hilton එක 2017දී විකුණනවා, 2017දී විකුණන්න තිබෙන ඉතිරි ටික පස්සේ කියන්නම් කියන එක. මේ කියන්නේ ඒකයි. අනෙකුත් ලැයිස්තුගත කිරීම් කියන්නේ ඒකයි. අනෙකුත් ලැයිස්තුගත කිරීම් කියන්නේ, මේ අය වැයේ තිබෙන ආයතනවල නම් ටිකද, නැත්නම් විකුණන්න තිබෙන ආයතනවල නම් ටිකද? 2017දී විකුණන්න ලෑස්ති කරන ආයතන ප්‍රමාණයද?

2017දී විකුණන්න සූදානම් කරන ආයතන ප්‍රමාණය මෙම අය වැය කථාවෙන් ඉතා පැහැදිලියි. මේ කොළය වහලා රිංගලා යන්නේ කොහාටද? මේ රිංගලා යන්නේ, ලැයිස්තුගත කරන්න යෝජනා කරලා තිබෙන, වෙන්දේසියට ඉදිරිපත් කරලා තිබෙන රාජ්‍ය ව්‍යාපාර ටික විකුණන්නයි. මේ ඉතිරි ලැයිස්තුව තුළ Chilaw Plantations Limited, Elkaduwa Plantations Limited, Kurunegala Plantations Limited, SriLankan Airlines ආදී ආයතන තිබෙන්න පුළුවන්. මේ තුළ දැනටත් ඒකාබද්ධ කරපු මිහින් ලංකා ආයතන තිබෙනවා, ලාබ ලබමින් තිබුණු. ඒ ලැයිස්තුව තමයි මේ ඉදිරිපත් කරන්නේ. තව අපි දන්නේ නැති, ඔබතුමන්ලාගේ හිතේ තිබෙන ආයතන මේ ලැයිස්තුවට ඇතුළු කරගන්න පුළුවන්. ඒක තමයි මේ යෝජනා කරලා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ හිතේ තියෙන ඒ ලැයිස්තුව තමයි අනෙකුත් ලැයිස්තුගත කිරීම් කියලා කියන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලාටත්, රටේ ජනතාවටත් අපි අවධාරණය කරනවා, මේ කියන වේගවත් වර්ධනය ඊළඟට යන්නේ, වේගවත් පෞද්ගලිකකරණ වර්ධනයට සහ වේගවත් විකිණීමේ වර්ධනයටයි කියලා. දැන්, රජය බදු වර්ධනයෙන් එක පැත්තක් සම්පූර්ණ කර ගන්නවා. ඒ, තමන්ගේ ආර්ථික වර්ධනය වෙනුවෙන්. අනෙක් පැත්තෙන් විකිණීමේ වර්ධනය ඇති කර ගන්නවා.

මේ අය වැය යෝජනාවලින් තමුන්නාන්සේලා තවත් අපූරු අදහසක් කියනවා. ගොවියෙකුට අවමය වශයෙන් අක්කර 1000ක භූමි භාගයක් දෙනවා ලු. ඒ කියන්නේ, ගොවියෙකුට වගා කරන්න ඉඩම් අක්කර 1000ට වැඩියෙන් දෙනවා කියන එකනේ. මට ගරු මුදල් ඇමතිතුමාගෙන් දැන ගන්න ඕනෑ, මේ ගොවියා කවුද කියලා. එතුමා මේ පාර්ලිමේන්තුවට ඒක කියන්න ඕනෑ. ඒ අපේ රටේ ගොවියෙක් නම්, ඒ ගොවියාට ඉඩම් අක්කර 1000ක් දෙනවා නම් ඒ ගැන අපි සන්තෝෂයි. හැබැයි, මේ ගොවියා විදේශීය

ගොවි සමාගමක් නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදාට වෙන්නේ අපේ දේශීය ගොවියා ඒ විදේශ ගොවියාගේ කම්කරුවා බවට පත්වෙන එකයි. දැනටත් ඒක වෙලා තිබෙනවා. දැනටත්, ඇඹිලිපිටිය පැත්තේ අපේ දේශීය ගොවියා ඩෝල් සමාගමේ කම්කරුවන් බවට පත් කර ගෙන තිබෙනවා. මොනරාගල පැත්තේ තිබෙන ඇත්ත තත්ත්වයක් ඒකයි. අපි ආණ්ඩුවෙන් අහන්නේ මේකයි. වාණිජ ගොවියා හැටියට තමුන්නාන්සේලා මේ හඳුන්වන්නේ මොන ගොවියාද? ඒ ගොවියා, මේ ශ්‍රී ලංකාවේ පොළොවට ආදරය කරන අපේ තුන්වෙනි පරම්පරාවේ ස්වදේශීය ගොවියාද, එහෙම නැත්නම් ඇමෙරිකාවේ ඩෝල් සමාගමේ හිමිකාරිත්වය තිබෙන විදේශීය ගොවියාද? මේ අවම අක්කර 1000 දෙන්නේ විදේශීය ගොවියාට නම්, අපේ ගොවියාට වෙන්නේ විදේශ සමාගමක කම්කරුවෙකු වෙනවා මිසක ගොවියෙක් වෙන්න නොවෙයි. ඒ නිසා, තමුන්නාන්සේලා හරියට රටට කියන්න ඕනෑ, අවමය ලෙස ඉඩම් අක්කර 1000ක් දෙන ගොවියා දේශීය ගොවියාද, විදේශීය ගොවියාද කියලා. ඒක පැහැදිලි වෙන්න ඕනෑ.

මේ අය වැයේ තවත් එවැනි කාරණා, තවත් අපූරු යෝජනා ගණනාවක් තිබෙනවා. ඒක තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය අනුව නිවැරදියි කියන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තියට එකතු වෙලා ඉන්න ගරු වම්පික රණවක ඇමතිතුමාටත් කියන්න පුළුවන් මේ ප්‍රතිපත්තිය හොඳයි කියලා. ඒ ප්‍රතිපත්තිය නිසා තමයි, විදේශීය ආයෝජකයාටත් අවුරුදු 5කට බහුවිධ වීසා -multiple visa- දෙන්නේ. එහෙම යෝජනා කරන්නේ ආයෝජකයන් මෙරටට කැඳවා ගන්නයි. ආයෝජකයන්ට මේ රටට එන-යන එක කරදරයි. ඒ සඳහා සැරින් සැරේට වීසා ගන්න වෙනවා. ඒ නිසා, අවුරුදු 5කට එකපාර වීසා දෙනවා. හරි. ඒක ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය කියමු කෝ. හැබැයි, මෙහි තව දුරටත් සඳහන් වී තිබෙනවා මෙහෙම.

"...ඒ වාගේම ඒ ආයෝජකයා සමඟ එන විශේෂඥ ශ්‍රමිකයාටද අවුරුදු 5කට වීසා ලබා දෙනු ලැබේ."

එතකොට, මේ යෝජනාව යට අපි මේ දිනවල සාකච්ඡාවට බඳුන් කරමින් යන තවත් කථාවක් තිබෙනවා නේ. ඒක තමයි ETCA ගිවිසුම. තමුන්නාන්සේලා ETCA ගිවිසුමත් අත්සන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ගිවිසුම ඇතුළේ සඳහන් වෙනවා, ඉන්දියාවෙන් එන්න බලාපොරොත්තු වන විදේශීය විශේෂඥ ශ්‍රමිකයා ගැන. මොකටද? තොරතුරු තාක්ෂණ සේවයට. අපට මේ ආණ්ඩුවෙන් දැන ගන්නට ඕනෑ; පැහැදිලි කිරීමක් කර ගන්නට ඕනෑ, මේ ආයෝජකයත් එක්ක එන විදේශීය විශේෂඥ ශ්‍රමිකයා කියන්නේ අන්න අර ETCA ගිවිසුමත් එක්කම ඇදන්න බලාපොරොත්තු වෙන තොරතුරු තාක්ෂණ ශ්‍රමිකයා ද කියලා. මේක වහලා යන්න බැහැ. අපි විවෘතව කථා කරමු. ආයෝජකයා කමක් නැහැ. ආයෝජකයාට අවුරුදු පහක් මේ රටේ ඉන්න වීසා දුන්නා කියලා අපේ රටේ පදිංචි වෙලා ඉන්නේ නැහැ. ඒ ගොල්ලන්ට අන්තර් ජාලය හරහා ඒ කටයුතු කරන්න පුළුවන්. ඒක තර්කානුකූලයි කියමු කෝ.

GATT සම්මුතිය අනුවත් අපේ වෘත්තිකයෙක් ඉන්දියාවට ගියොත් අපේ වෘත්තිකයෙකුට දෙන්නේ උපරිම අවුරුද්දයි. ඊට පස්සේ ඔවුන් කල්පනා කරනවා, මෙයාව තියා ගන්නවාද, මෙයා හොඳද නරකද කියලා. හැබැයි, මේ ක්‍රමය අනුව ලංකාවට ඇවිල්ලා "විදේශීය විශේෂඥ ශ්‍රමිකයා" කියන විරුදාවලිය යටතේ -ඒ නාමාවලිය යටතේ- අවුරුදු පහක් තිස්සේ අපේ තොරතුරු තාක්ෂණ සේවයත්, අනෙකුත් සියලු දේත් ඩැහැ ගැනීමේ ඉඩකඩ හදා දෙනවාද කියන එක පිළිබඳව අපට සාධාරණ සැකයක් තිබෙනවා. ජනතාවටත් ඒ සැකය තිබෙනවා. ඒ නිසා අපට ඒක පැහැදිලි කර ගැනීමේ අයිතියක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා.

තමුන්නාස්සේලාගේ මේ යෝජනා ඇතුළේ තවත් කාරණාවක් තිබෙනවා, විදේශගත ශ්‍රමිකයන් සම්බන්ධයෙන්. අපේ රටේ සිටින, පසු ගිය ආණ්ඩුවෙන් "රට විරුවන්" හැටියට හඳුන්වපු විදේශ ගත ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපිත් ඒ පිළිබඳව අරගළ කළා. සංවිධානයක් හැටියටත් අපි අරගළ කළා, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have three more minutes.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඒකේදී පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. මේ යෝජනාව හොඳයි. විදේශගත ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුපක් දෙන එක හොඳයි. හැබැයි, මෙය අවුරුදු 60න් දෙන්නේ. ඒකට විදේශගත ශ්‍රමිකයාගෙන් දායක මුදලක් ලබා ගන්නවා. හැබැයි, මේකට රජයේ දායකත්වය කීයද කියන එකත් කිව්වා නම් අපූරුයි. විදේශ විනිමය ඇමෙරිකන් ඩොලර් බිලියන 6ක් විතර ලංකාවට එවන මේ අයට ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා. රජයේ රැකියා කරන රජයේ සේවකයාට විශ්‍රාම වැටුපක් තිබෙන . ඒකත් දැන් තමුන්නාන්සේලා දායක කරන්න යනවා. පෞද්ගලික අංශයට අර්ථ සාධක අරමුදල තිබෙනවා. හැබැයි, විදේශගත ශ්‍රමිකයාට එහෙම එකක් නැහැ. ඒක නිසා ඔහු වරින් වර සල්ලි එවලා අවසානයේ ලංකාවට එන කොට බංකොලොත් වෙලායි එන්නේ. ඒක නිසා එවැනි අයට මේ වාගේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදන එක හොඳයි. හැබැයි, තමුන්නාසේලාට ඒ යෝජනාව තවත් අලංකාර කරන්න තිබුණා, එයට විදේශගත ශ්‍රමිකයාගෙන් ලබන ප්‍රමාණය කොපමණද, ඒ වාගේම රජයේ දායකත්වය කොපමණද කියලා. රජයේ කොයි පංගුවක් මේකට දායක කරනවාද කියලාත් මේකේ තිබෙන්න ඕනෑ. ඒක මේ විවාදය යන අතරතුරේදී හරි පැහැදිලි කෙරෙයි කියලා මා විශ්වාස කරනවා.

ඊළඟට, තවත් යෝජනාවක් අපට තිබුණා. දිගටම ඒ යෝජනාව ඉදිරිපත් වුණා, විදේශගත ශ්‍රමිකයන්ගේ පැත්තෙන්. මොකක්ද? තීරුබදු රහිත -duty free- වාහන ලබා දීම. ඒක දැන් අපේ රටේ මෝස්තරයක් වෙලා තිබෙනවා. Unlimited දෙනවා. විකුණා ගන්නවා; හුඟක් දේවල් වෙනවා. හැබැයි විදේශගත ශ්‍රමිකයන්ගෙන් යෝජනාවක් තිබෙනවා. ඔවුන් ඒ රටවල සිටින කොට වාහනයක් පාවිච්චි කරනවා. හැබැයි, ලංකාවට ආවාට පස්සේ ඔවුන්ට ඒ අවස්ථාව නැහැ. ඔවුන් ලංකාවට එවන මුදල්වල ප්‍රමාණයෙන් -ඔවුන් ලංකාවට එවලා තිබෙන විදේශ විනිමය ප්‍රමාණය අනුව- ඔවුන්ගෙන් යම් දායක මුදලක් අරගෙන ඔවුන්ට බදු සහනයක් දෙන්න. එතකොට තව හොඳ දෙයක් සිදු වෙනවා. මොකක්ද? ඔවුන්ගේ මුදල් නීත්‍යානුකූල ක්‍රියාවලිය හරහා -අපේ රටේ බැංකු ක්‍රියාවලිය හරහා- ලංකාවට එන එක විධිමත් වෙනවා. ඔවුන් සැප වාහනයක් ඉල්ලන්නේ නැහැ; ඔවුන් සුපිරි වාහනයක් ඉල්ලන්නේ නැහැ; ඔවුන් කෝටි පහේ, දහයේ වාහනයක් ඉල්ලන්නේ නැහැ. ඔවුන්ට ලැබෙන සහනය අනුව සමහර විට ඔවුන් ඒකෙන් ත්‍රිවිලයක් එහෙම නැත්නම් මෝටර් බයිසිකලයක්, එහෙම නැත්නම් වී මෝලට පාවිච්චි කරන; කෘෂි කර්මාන්තයට පාවිච්චි කරන ට්‍රැක්ටරයක් ලබා ගනීවි. ඒක ඔවුන්ට කැමැති විධියට තීරණය කරන්න පුළුවන්. ඔවුන් ලංකාවට ඇවිල්ලා පටන් ගන්නා කර්මාන්තය, ව්‍යාපාරය, ගොවි තැන අනුව ඔවුන්ට තීරණය කරන්න පුළුවන්, ඔවුන්ට ලැබෙන සහනයේ ප්‍රතිලාභය ඔවුන් භුක්ති විඳින්නේ කොහොමද කියලා. ඒක විදේශගත ශ්‍රමිකයන්ට කරන ගෞරවයක්. විදේශගත ශ්‍රමිකයාගේ වටිනාකම අගය කිරීමක්. ඒක වැදගත් යෝජනාවක් කියලා මා හිතනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ කථාව අවසන් කරන්න මට මිනිත්තුවක් දෙන්න.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමන්ලාගේ බදු ගැහිල්ලේ තේරුම 2016 නොවැම්බර් මාසයේ නිකුත් කළ "මැත කාලීන ආර්ථික ප්‍රවණතා" කියන මහ බැංකු වාර්තාවේ 93 පිටුවෙහි ඉතා පැහැදිලිව කියනවා. ඒකේ කියන්නේ මොකක්ද? ඔබතුමන්ලා 2015 ඉඳලා 2016 ජූලි මාසය වෙන කොට රුපියල් බිලියන 9,382ක් දක්වා අලුතෙන් රුපියල් බිලියන 878ක ණය වැඩි කරගෙන තිබෙන බවයි. ඒ විතරක් නොවෙයි. ඒ වාර්තාවේ වැදගත් දෙයක් කියනවා. මගේ කථාව අවසන් කරන්න කලින් මා මේ කාරණයත් කියන්න ඕනෑ. එම මහ බැංකු වාර්තාවේ 93වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

> "තවද, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රජයේ සුරැකුම්පත් අධි මිලට නිකුත් කිරීම හේතුවෙන් ඇති වන වට්ටම් සාධකය (භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතූන් හා පරිණතවීම්වල මුහුණත් අගය හා පොත් අගය අතර ශුද්ධ වෙනස) සමස්ත ණය ප්‍රමාණය බිලියන 70.1කින් වැඩි වීමට දායක විය."

ඒ කියන්නේ මොකක්ද? අපි මෙතෙක් සාකච්ඡා කළ ප්‍රශ්නය; බැඳුම්කර පිළිබඳ ප්‍රශ්නය. බැඳුම්කර වට්ටම් කිරීමෙන් රජයට වෙච්ච පාඩුව කෝටි 7,000යි. කෝටි 7,000ක් බව මේ අවුරුද්දේ මහ බැංකුවම පිළිගෙන තිබෙනවා. මහ බැංකුව පිළිගෙන තිබෙනවා, වට්ටම් ක්‍රියාවලිය ඇතුළේ මහ බැංකුව පැත්තෙන් බැඳුම්කරවලින් වෙච්ච පාඩුව කෝටි 7,000ක් කියලා. එතකොට මේ රටේ ණය බරට රටේ ජනතාව දායක වෙලා නැහැ. ඒකට තමුන්නාන්සේලා එකතු කර ගත් මේ ගජ මිතුරන් ටික දායක කර ගෙන තිබෙනවා. ඒ ණය බරට අපේ රටේ වැඩ කරන ගොවි ජනතාව, ධීවරයා, කම්කරුවා, ශිෂ්‍යයා, තරුණයා, කාන්තාව හා රජයේ සේවකයා දායක කරන්න එපා. ඒ නිසා අපි කියනවා, "සැමට ප්‍රතිලාභ" කියලා ඔබතුමන්ලා මේ බෙදන්න යන්නේ, සැමට බදු. වේගවත් වර්ධනය කියලා වැඩි කරන්න යන්නේ, බදු. බදු ආර්ථිකයකින් රටේ ජනතාව පීඩාවට පත් කරන මේ අය වැයට අපේ විරෝධය පළ කරමින්, මගේ කථාව අවසන් කරන්න මට වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

[අ.භා. 1.45]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2017 අය වැය සම්බන්ධයෙන් අපගේ අදහස් පළ කිරීමට ලැබුණු මේ අවස්ථාව පිළිබඳව අප ස්තුතිවන්ත වනවා.

අය වැය කියන්නේ, රාජ්‍ය මූල්‍ය පාලනය කිරීම සඳහා පාර්ලිමේන්තුවට ලැබිලා තිබෙන ප්‍රධානතම අවස්ථාවක්. ඒ නිසා සමස්තයක් හැටියට අය වැය පිළිබඳව වාද කරන මේ අවස්ථාවේදී රාජ්‍ය මූල්‍යයේ මූලික ප්‍රශ්න මෙම අය වැය මඟින් විසඳන්න මාර්ගයක් හදලා තිබෙනවාද, නැද්ද කියන එක පිළිබඳව අප පළමුව සාකච්ඡා කරන්න ඕනෑ. අපේ ගරු මුදල් ඇමතිතුමාට අනුව 2017 අපේ ආදායම රුපියල් බිලියන 2,049යි. එමඟින් බලාපොරොත්තු වන බදු ආදායම, රුපියල් බිලියන 1,821යි. අපේ සමස්ත වියදම -ණය වාරික හා ණය පොලියත් එක්ක- රුපියල් බිලියන 3,469යි. මේකෙන් ණය පොලිය වශයෙන් ගෙවන්න තිබෙනවා, රුපියල් බිලියන 680ක්. ණය වාරිකය වශයෙන් ගෙවන්න තිබෙනවා, රුපියල් බිලියන 800ක්. ඒ දෙකේ එකතුව ගත්තාම රුපියල් බිලියන 1,480යි. ඒ අනුව ලබන වසර සඳහා විදේශ ණය ගෙවන්න ආසන්න වශයෙන් ඩොලර් බිලියන 4ක් හෝ 4.5ක් පමණ අපට අවශ්‍ය වනවා. ඊළඟට, සංවර්ධනය සඳහා රුපියල් බිලියන 704ක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව ණය බර පාලනය කර ගන්න මොනවාද කරන්න පුළුවන්; ආදායම වැඩි කරන්න මොනවාද කරන්න පුළුවන්; වියදම පාලනය කරන්නේ කොහොමද සහ ඒ අතරේ සංවර්ධනය ගෙන යන්නේ කොහොමද කියන මූලික ගැටලු අප ඉදිරියේ තිබෙනවා. මේ සමතුලිතභාවය ඇති කර ගැනීමට තමයි මේ අය වැයෙන් උත්සාහ කර තිබෙන්නේ.

මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, මීට ප්‍රථම ගරු අගමැතිතුමා රජය වෙනුවෙන් කළ ප්‍රකාශය. ඊළඟ මධ්‍ය කාලීන අවදියේදී ආර්ථික ප්‍රතිපත්තිය කුමක්ද, මූල්‍ය ප්‍රතිපත්තිය කුමක්ද, රාජ්‍ය මූල්‍ය පිළිබඳ කරුණු කාරණා කෙසේ වෙන්න ඕනෑද කියලා. එතැනදී ප්‍රධාන උපාය මාර්ග ගණනාවක් පිළිබඳව සඳහන් වුණා. ඉන් ප්‍රධානම උපාය මාර්ගය වුණේ, දැනුම පිළිබඳ ආර්ථිකයක්, ඒ වාගේම නවෝත්පාදනය පදනම් කරගත් උපාය මාර්ගයක් මඟින් ආර්ථිකයට පිම්මක් ලබා ගැනීමයි. රජයට අයිති ආයතන සම්බන්ධයෙන් කාර්යක්ෂමතා කඩඉම් හඳුන්වා දීලා, ඒ කාර්යක්ෂමතා කඩඉම් හරහා රාජ්‍ය අංශය කාර්යක්ෂම කිරීම, ඒ වාගේම පෞද්ගලික අංශය ශක්තිමත් කර ගැනීමට අවශ්‍ය කරන වට පිටාව තනා ගැනීම, ඒ සඳහා බාධා කරන යම් යම් ක්‍රියාදාමයන් ඉවත් කිරීම, විශේෂයෙන්ම ව්‍යාපාරික ක්ෂේත්‍රයේ දැනට අපි ඉන්න Doing Business Index එක 2018දී සියයට 70 දක්වා වැඩි කර ගැනීම තමයි අපේ අරමුණු. ඒ වාගේම අපනයනය වර්ධනය කර ගැනීමට අපගේ BOI ආයතනය නැවත ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වන අනෙකුත් පහසුකම් සපයන්නට අපි කටයුතු කරනවා කියන එකත්, ද්විපාර්ශ්වික වෙළෙඳ එකඟතාවලට ගමන් කරනවා කියන ඒ කරුණු ටිකත් මෙයට පදනම් වෙලා තිබෙනවා.

ඊළඟට, විශේෂයෙන්ම ප්‍රාග්ධන වෙළෙඳ පොළේ, මූල්‍ය වෙළෙඳ පොළේ ඇති කරන්න ඕනෑ වෙනස්කම් සහ සුවිශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ගමන් මඟ පිළිබඳව.

විශේෂයෙන්ම මේ ණය බර පිළිබඳ ගැටලුව කළමනාකරණය කිරීම සඳහා ණය කළමනාකරණ ආයතනයක් පිහිටුවීම කියන කාරණය ගැනත් මතක් කරන්න ඕනෑ. මෙන්න මේ රාජ්‍ය ප්‍රතිපත්තිය තමයි මේ අය වැයට පදනම වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරණා අරගෙන බැලුවාට පස්සේ අපට පෙනී යනවා, රාජ්‍ය මූල්‍ය පරතරය, එහෙම නැත්නම් අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 4.7ට ගේන්න බලාපෙරොත්තු වන බව. මේක 2015දී 7.4ට තිබුණේ. මේක විශාල ඉලක්කයක්. ආදායම වැඩි කරගෙන, වියදම පාලනය කරගෙන, ප්‍රාග්ධන අවශ්‍යතාත් ඉටු කරගෙන මේ හිඟය මෙතැනට පත් කර ගැනීම සැලකිය යුතු ජයග්‍රහණයක් හැටියට අපි සලකන්න ඕනෑ. මේක අපි ඉදිරියට රැගෙන යා යුතු ප්‍රවණතාවක් වෙනවා.

මේ බදු ප්‍රතිපත්තිය පිළිබඳව අපි ප්‍රකාශ කළා. ඉතාම සරල බදු පිළිබඳව ජනතාවට යම් යම් අදහස් පළ කරමින් අර බද්ද වැඩි වුණා, මේ බද්ද වැඩි වුණා යනාදී වශයෙන් කිව්වාට, රජයේ

ක්‍රියාදාමයට බදු අවශ්‍යයි. ඒ බදු පිළිබඳ ක්‍රියාදාමයේදී රජයේ ප්‍රතිපත්තිය වෙන්නේ සෘජු බදු ප්‍රමාණය සියයට 40 දක්වාත්, වක්‍ර බදු ප්‍රමාණය සියයට 60 දක්වාත් වන ආකාරයට මේක ක්‍රමානුකූලව සකස් කරන්නයි. නමුත් මේ අය වැයෙනුත් අපිට ඒ සඳහා මූලික පියවරක් විතරයි තබන්න පුළුවන් වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම පෞද්ගලික ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන බදු හඳුන්වාදීම මඟින් සෘජු බදු ප්‍රමාණය වැඩි කර ගන්න යම් මූලික පියවරක් තබා තිබෙනවා. නමුත්, තවමත් සෘජු බදු සහ වක්‍ර බදු අතර අනුපාතය සියයට 18ත්, 82ත් අතර තිබෙන්නේ. ඒ නිසා සැලකිය යුතු අභියෝගයක් මධ්‍ය කාලීනව එනවා, මේක සියයට 60යි, සියයට 40යි තත්ත්වයට ගෙන එන්න.

සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රය වර්ධනය කර ගැනීම සඳහා ඒ ක්ෂේත්‍රයට ලබා දීපු ව්‍යාපාර මත අය කරන බද්ද, -corporate income tax එක- තුන් ආකාරයකට ව්‍යුහගත කරලා තිබෙනවා. සියයට 14, සියයට 28 හා සියයට 40ක් වශයෙන්. ඒක අපි කවුරුත් දන්නා කාරණයක්. එතැනදී මේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට ශක්තිය දෙන ආකාරයට එම ව්‍යාපාරික බදු ප්‍රමාණය වෙනස් කිරීම සුභවාදී දර්ශනයක් හැටියට අපට දැකගන්න පුළුවන්. ඒ වාගේම පුද්ගලික ආදායම් බදු -private income tax- වෙනස්කමක් කරලා තිබෙනවා. දැන් මාසයකට රුපියල් ලක්ෂයකට වඩා වැඩියෙන් උපයන අයට පමණයි ඒක අය වෙන්නේ. කෙසේ වෙතත්, ඒ සම්බන්ධයෙන් අනාගතයේදී යම් ආකාරයක වෙනස්කමක් සිදු කළ යුතුව තිබෙනවා. මොකද, බදු ප්‍රතිපත්තිය පිළිබඳ මූලික වශයෙන් වෙච්ච ප්‍රතිපත්තිමය තීන්දුවක් ඉදිරියට ගන්නට තිබෙන නිසා. ඒ වාගේම ඇතැම් භාණ්ඩ සඳහා VAT එකෙන් දී තිබුණු සහන,- විශේෂයෙන්ම රත්රන්, ආභරණ සහ වෙනත් දී තිබෙන සහන ඉවත් කිරීම සුභවාදී පැත්තකට ගමන් කිරීමක්. මොකද, මේ VAT එක අය කර ගන්නා ග්‍රාහකයින්ගේ ප්‍රමාණය පුළුල් කිරීමට වඩා ඒ හරහා අපට හැකියාව ලැබෙනවා VAT එකෙන් ලැබෙන ආදායම වැඩි කර ගැනීමට. ඒ වාගේම NBT එක පිළිබඳව, විශේෂයෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිබිච්ච බදු ප්‍රමාණය ඉවත් කිරීමට තීරණය කිරීම වැදගත් කාරණයක් හැටියට අපි සලකන්න ඕනෑ.

මෙතැනදී මම කැමැතියි, ප්‍රතිපත්තිමය කාරණා කිහිපයක් ගැන කථා කරන්න. ණය බර පාලනය ගැන කථා කළොත් අපි දන්නවා, 2004 - 2014 පසු ගිය දශකයේ අපේ ණය සංයුතියේ බරපතළ වෙනසක් සිද්ධ වුණු බව. වාණිජ ණය ප්‍රතිශතය ඉහළ ගියා සියයට 1 සිට සියයට 52 දක්වා. ඒ වාගේම පොලී අනුපාතය ඉහළ ගියා. සක්‍රිය පොලී අනුපාතය රුපියලේ අව ප්‍රමාණයත් එක්ක සියයට 8 දක්වා ප්‍රමාණයකට වර්ධනය වුණා. ඒ වාගේම ණය නැවත ගෙවීමේ ප්‍රවණතාවේ කාලවකවානුව අවුරුදු 9 දක්වා අඩු වුණා. ඒක ක්‍රම ක්‍රමයෙන් අවුරුදු 7 දක්වා ගමන් කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වයත් එක්ක මේ ණය බර පාලනය කර ගැනීම රටකට ඉතා අත්‍යවශ්‍යයි. මේ ලෝකයේ පසු ගිය කාලය පුරා ඇති වෙච්ච ආර්ථික අර්බුදවලින් පෙනුණේ මොකක්ද, ණය බර නිසියාකාරයෙන් පාලනය කර ගත්තේ නැත්නම්, රටක් ආර්ථික වශයෙන් බංකොලොත්භාවය දක්වා ගමන් කරන්න පුළුවන් කියන එකයි. අපි පසු ගිය කාලයේ දැක්ක අයිස්ලන්තයේ, ග්‍රීසියේ, අත් දුටු සත්‍ය ඒකයි. ඒ වාගේම දියුණු යැයි සම්මත, ප්‍රබල යැයි සම්මත ප්‍රංශයට, ස්පාඤ්ඤයට සහ මහා බ්‍රිතාන්‍යයටත් අද වන විට ඒ ණය බර පාලනය කර ගැනීම කියන ගැටලුව මත දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ හැම රටකටම මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන තත්ත්වයක් තමයි අපටත් තිබෙන්නේ. මෙතැනදී හුඟ දෙනෙක් දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණය බර අඩු වුණා කියලා කිව්වාට, වඩා වැදගත් වෙන්නේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණය බරේ ප්‍රතිශතය නොව, අපේ ආදායමෙන් කොපමණ ප්‍රතිශතයක් ණය හා පොලිය ගෙවන්න වැය වෙනවාද කියන එකයි. එතැනදී පසු ගිය අවුරුදු දහයේ අනුපාතය ගත්තාම, එය සියයට 97ක් වෙනවා. එහි තේරුම, ආණ්ඩුව රුපියල් 100ක ආදායමක් උපයන කොට ණය වාරිකයයි, පොලියයි ගෙවන්න රුපියල් 97ක් වැය වෙනවා කියන එකයි. ඒකයි වඩා වැදගත් කාරණය. උදාහරණයක් හැටියට, ජපානයේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණය බර සියයට 240ක් වෙනවා. නමුත්, එම ණය වාරිකයයි, පොලියයි ගෙවන්න ඒ ආණ්ඩුව වැය කරන්නේ ආණ්ඩුවේ ආදායමෙන් සියයට 15යි. එම නිසා ඒ ආණ්ඩුවට ඒ මහා ණය කන්ද බරක් නොවෙයි. ඒක ගෙවාගත හැකි මට්ටමේයි තිබෙන්නේ. නමුත්, අපි එතැනදී ඉතාම බරපතළ අර්බුදයකට කැට්වෙලා තිබෙනවා. එම නිසා ණය ප්‍රතිව්‍යුහගත කිරීමක්, නිසි මොහොතේදී ණය ප්‍රතිසංවිධානය කිරීමක් අපට අවශ්‍යයි. විශේෂයෙන්ම වාණිජ ආයතනවලින්, වාණිජ බැංකුවලින් ගත් විදේශ ණය, අවුරුදු 5ක්, 6ක් සඳහා ගත් විදේශ ණය 2019, 2020, 2021, 2022 කාලයේදී මහා පරිමාණයෙන් ගෙවන්න සිද්ධ වෙනවා. මේක මුදල් අමාත්‍යාංශයට බරපතළ පීඩනයක් එල්ල කරන තත්ත්වයක්. එම නිසා වහාම එම ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අත්‍යවශ්‍ය පෙළඹවීමක් අද කළ යුතුව තිබෙන බව කියන්න ඕනෑ. ඒ වාගේම ණය ගෙවීම කාර්යක්ෂම කිරීමට අප කටයුතු කළේ නැත්නම්, අලුත් ආදායම් උපදවාගන්න අප කටයුතු කළේ නැත්නම්, විදේශ විනිමය ලැබෙන ආදායම් මාර්ග ඇති කරගන්න අප කටයුතු කළේ නැත්නම්, අනාගතයේදී අපට එම ක්ෂේත්‍රවල බරපතළ ප්‍රශ්න ඇතිවෙනවා නියතයි. අන්න ඒ සඳහා වූ මූලික පියවර ගණනාවක් මෙම අය වැය ලේඛනය තුළින් ලබාගෙන තිබෙන බව අපි ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම ආදායම වැඩිකර ගැනීමේ ක්‍රියාදාමය සිදු කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම ආදායම වැඩිකර ගන්න වෙන්නේ බදුවලින්. අපේ ආදායම රුපියල් බිලියන 2,049ක් වෙනකොට එහි ඇති බදු ආදායම රුපියල් බිලියන 1,821ක් වන බව අපි කවුරුත් දන්නවා. අපේ රටේ ආදායමෙන් සියයට 90ක්, 92ක්ම එන්නේ බදුවලින්. අපි කොහොමද ඒ බදු ආදායම වැඩි කරගන්නේ? එක්කෝ අපි බදු අනුපාත වැඩි කරන්න ඕනෑ. "වැට්" එක සියයට 11 සිට සියයට 15 දක්වා වැඩි කළා. එසේ සියයට 15 දක්වා වැඩි කළත්, එයින් ලැබුණු ප්‍රතිලාභය ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සෘජු ණය ගෙවීමටවත් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. එම නිසා ඒ ක්‍රියාවලිය කළ පුද්ගලයින් නිසා තමයි ඒ බදු අනුපාතයේ ප්‍රශ්න ඇතිවෙලා තිබෙන්නේ. මේ බදු අනුපාතය තවත් වැඩි කළ යුතුයි කියා අපි හිතන්නේ නැහැ.

ඊළඟට, බදු ගෙවන පිරිස වැඩිකර ගැනීම කළ යුතුයි. අපි දන්නවා, බදු ගෙවීමේ හැකියාව තිබෙන, බදු ගෙවීම මඟ හරින විශාල පිරිසක් සිටිනවා. ඒ විශාල පිරිස මේ බදු දැලට හසුකර ගැනීම අත්‍යවශ්‍යයි, ඒ සඳහා පියවර ගැනීම අත්‍යවශ්‍යයි. අපි ඉදිරි කාලයේදී ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. විශේෂයෙන්ම එතැනදී අපි ප්‍රවේශම් වෙන්න ඕනෑ. අපේ රටේ ආර්ථිකයේ කොඳු නාරටිය වුණු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් පීඩාවට පත් නොවන ආකාරයට, රැකියා උත්පාදනය කරන එම ක්ෂේත්‍රය අඩ පණ නොවන ආකාරයට තමයි අප විසින් බදු දැල පුළුල් කරගත යුත්තේ. එතැනදී මතුවන තවත් කාරණයක් තමයි, නව බදු ක්‍රම අනුගමනය කිරීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2006 දී "වැට්" එක හඳුන්වා දුන් පසුව අපට "වැට්" එකෙන් ලැබුණු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5.6යි. ඒ අවස්ථාවේදී කිසිම වෙළෙඳාමක් වෙනුවෙන් -තොග වෙළෙඳාමට හෝ සිල්ලර වෙළෙඳාමට- කිසිම ආකාරයකට "වැට්" එක බලපෑවේ නැහැ. ඒ අවස්ථාවේදී "වැට්" එකේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන්

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

සියයට 5.6යි. අද සිල්ලර හා තොග වෙළෙඳාමටත් වැට් බද්ද ගමන් කළ පසුවත් එම ආදායම සියයට 2.3 දක්වා අඩුවෙලා තිබෙනවා. හරියටම වැට් බදු ආදායම භාගෙට අඩුවෙලා තිබෙනවා. ඇයි? භාණ්ඩ 300කට අධික ප්‍රමාණයක් "වැට්" එකෙන් නිදහස් කළා. යම් යම් පුද්ගලයින් සතුටු කරන්න, යම් යම් පුද්ගලයින්ගේ පෞද්ගලික අවශ්‍යතා ඉටු කිරීම සඳහා විශේෂ සුඛෝපභෝගී භාණ්ඩ 300ක් වැට් බද්දෙන් නිදහස් කළා. සමහර බේබිලාට අවශ්‍ය කරන මෝටර් රථ ගෙන්වා ගන්න, එහෙම නැත්නම් ඒවාට අවශ්‍ය කරන උපකරණ ගෙන්වා ගන්න ආදී වශයෙන් විශාල ලෙස "වැට්" සහන ලබා දුන්නා. එසේ නොවුණා නම් වැට් බදු ආදායම අපට පහසුවෙන්ම දෙගුණ කරගැනීමේ හැකියාව තිබුණා. අද "වැට්" ආදායම ලෙස රුපියල් බිලියන 280ක් පමණ ඉපැයුවත්, ඒ වාගේ දෙගුණයකටත් වැඩි ප්‍රමාණයකට ගමන් කරන්න අපට හැකියාව තිබුණා. බදු ඉවත් කරලා ඒ සහන ලබා දීපු සුඛෝපභෝගී භාණ්ඩ ලැයිස්තුවෙන් ඇතැම් ප්‍රමාණයක් හෝ "වැට්" එකට යටත් කිරීම ගැන මම සතුටු වෙනවා. අපි අද වහාම කළ යුතු වන්නේ මෙම ලැයිස්තුවෙන් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ප්‍රමාණය හඳුනා ගෙන නව ආකාරයකට බදු ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමයි. එහෙම බදු ප්‍රතිසංස්කරණයක් කළොත් අපට විශාල ඉදිරි ගමනක් ළඟා කර ගන්න පුළුවන්.

මම මෙතැනදී විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, අපගේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට. එය යාන්ත්‍රීකරණය කිරීමෙන් -පරිගණකගත කිරීමෙන්, RAMIS එක ගෙන ඒමෙන්- මේ අවුරුද්දේ බදු එකතු කිරීමේ හැකියාව සියයට විස්සකින් පමණ වැඩිදියුණු වෙලා තිබෙන බව අපි දැක්කා. විශේෂයෙන්ම "වැට්" එක මඟින් කරන ලද වංචා බොහොමයක් එමගින් මර්දනය කර ගන්නට හැකියාව ලැබී තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පමණක් නොවෙයි, රේගු දෙපාර්තමේන්තුව ඇතුළු ආදායම් එකතු කරන සෑම ක්ෂේත්‍රයක්ම ස්වයංක්‍රිය පද්ධති වෙත ගමන් කිරීම තුළින් මේ ආදායම් කිහිප ගුණයකින් වැඩි කර ගැනීමේ ඉලක්කයක් අපට -ආණ්ඩුවට- සකසා ගත හැකි වෙනවා. මොකද, මේවා ස්වයංක්‍රීය නොවීම නිසා තමයි අරයාගේ-මෙයාගේ ඉලක්කවලට අවශ්‍ය ආකාරයට කටයුතු කිරීමෙන් රටට මහා පරිමාණයෙන් බදු ආදායම අහිමි වී යන්නේ. ඒකට හොඳම උදාහරණය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ළඟා කර ගත්ත ජයග්‍රහණයයි. එම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමෙන් අපිට බදු ආදායම් එකතු කිරීමේ ක්ෂේත්‍රයෙන් විශාල ජයග්‍රහණයක් ලබා ගැනීමට හැකියාව ලැබෙයි කියා අප විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බදු ප්‍රතිපත්තිය වර්ධනය විය යුත්තේ කෙසේද, බදු ආදායම දෙගුණ කර ගැනීමට අප කටයුතු කළ යුත්තේ කොයි ආකාරයටද කියන එක පිළිබඳව යෝජනා ඇතුළත් මා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව -කැබිනට් මණ්ඩලය සහ අනෙකුත් ඇමතිවරුන් දැනුවත් කිරීම පිණිස- මේ අවස්ථාවේදී හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මම කථා කරන්නේ වියදම් පාලනය ගැනයි. අද අපේ රාජ්‍ය අංශයේ අතිවිශාල පිරිසක් ඉන්නවා. ලක්ෂ පහළොවකට අධික පිරිසක් ඇතුළත් රාජ්‍ය අංශයක් අප සතුයි. නමුත් අපි රාජ්‍ය අංශය තුළ නිසි මූලධර්මයක් අනුව කටයුතු කරලා නැහැ. ඒ නිසා රාජ්‍ය අංශයේ ක්‍රියාවලිය බොහෝ දුරට අකාර්යක්ෂම වෙලා තිබෙනවා. අපි රාජ්‍ය අංශය කාර්යක්ෂම කරන්න නම් අනිවාර්යයෙන්ම කාර්ය සාධනය මැනිය යුතුයි. කුසලතාව අනුව වැටුප් වර්ධක ලැබෙන ක්‍රමවේදයකට අපි ගමන් කළ යුතුයි. දැන් තිබෙන්නේ වයසට යනකොට ඒ වයස අනුව ජ්‍යෙෂ්ඨයන් බවට පත් වී ඉබේම වැටුප් වර්ධක ලැබෙන, ඉබේම උසස්වීම් ලැබෙන ක්‍රමයක්. ඒ වෙනුවට කුසලතාව පදනම් කර ගත් වැටුප් වර්ධක ක්‍රමයක් රාජ්‍ය අංශයට ඉතාම අත්‍යවශ්‍යයි. මම 2007 වසරේ සිට අමාත්‍යාංශ ගණනාවක කටයුතු කළා. ඒ හැම අමාත්‍යාංශයකටම අපි මේ කුසලතා ඇගයීම් ක්‍රමය ඇතුළත් කළා. ඒ තුළින් ඵලදායීතාව ශීඝ්‍රයෙන් ශක්තිමත්ව ඉහළ යවන්න පුළුවන් කියා අපි දැන ගත්තා.

විශේෂයෙන්ම රාජ්‍ය ආයතනවලටත්, ප්‍රධාන වශයෙන්ම උපාය මාර්ග ආයතන වුණු ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වාගේම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වැනි ආයතනවලටත් මේ කුසලතා ඇගයීම ඉතා අත්‍යවශ්‍යයි. ඒ වාගේම සේවකයින් ඇගයීමත් ඉතා අත්‍යවශ්‍යයි. ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට වඩා ඔවුන්ගේ කුසලතාව මත ගමන් කරන රාජ්‍ය අංශයක් ඇති කර ගැනීමට අපි පියවර තැබිය යුතු කාලය ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ සංවර්ධන උපාය මාර්ගය පිළිබඳව බලමු. අපි සංවර්ධනය සඳහා කළ ආයෝජන ගැන සලකා බැලුවොත්, පසු ගිය දශකයක පමණ කාලය තුළ රජය විසින් සිදු කළ ප්‍රාග්ධන ආයෝජනය- මෙවර එය බිලියන 700ක් පමණ වෙනවා.- විස්තර කරලා බැලුවොත්, කවර ක්ෂේත්‍රවලටද රාජ්‍ය ආයෝජනය සිදු වෙලා තිබෙන්නේ කියා මේ රටේ අනාගත උපනතිය ගැන අපට අදහසක් ගන්න පුළුවන්. පසු ගිය දශකය පුරාම සිදු වුණු රාජ්‍ය ආයෝජනයෙන් අධ්‍යාපනයට ගමන් කරලා තිබෙන්නේ, ආසන්නයෙන් සියයට අටත්-නවයත් අතර ප්‍රමාණයක්. පසු ගිය දශකයක රාජ්‍ය ආයෝජනයෙන් සෞඛ්‍යයට ගමන් කරලා තිබෙන්නේ, සියයට හතරකට ආසන්න ප්‍රමාණයක්. ඒ වාගේම සමාජ සුබසාධන කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් සඳහා සියයට හතරත්-හයත් අතර ප්‍රමාණයක් ගමන් කර තිබෙනවා. කෘෂි කර්මාන්තයට සියයට නවයත්-එකොළහත් අතර ප්‍රමාණයක් ගමන් කර තිබෙනවා. බලශක්තිය සහ ජල සැපයීම සඳහා සියයට නවයත්-දහයත් අතර ප්‍රමාණයක් ගමන් කර තිබෙනවා. නිවාස තැනීම සඳහා සියයට එකයි දශම තුනත්-එකයි දශම හයත් අතර ප්‍රමාණයක් ගමන් කර තිබෙනවා. මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක්.

කොළඹ නගරයේ පමණක් පැල්පත්වාසීන් හැත්තෑදහසක් සිටිනවා. කොළඹ හා අවට ප්‍රදේශවල පමණක් එක්ලක්ෂ විසිදහසක් ඉන්නවා. ඒ වාගේම මුළු රට පුරාම ගත්තාම, එය ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයක්. අවශ්‍ය කරන නිවාස ඇතුළු මූලික උපාංග නැතුව පැල්පත්වාසීන් විධියට ඔවුන් ඉන්නවා. ඒ නිසා දැන් මෙම ක්ෂේත්‍රය තුළ රාජ්‍ය ආයෝජනයක් සිදු කළ යුතු අවස්ථාව ඇවිල්ලා තිබෙනවා කියා මා හිතනවා. අපි නොයෙක් ප්‍රදේශවල වාසය කරන ජනතාව ගැන කථා කරනවා. නමුත් නගර ආශ්‍රිතව ජීවත් වන පැල්පත්වාසීන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයෝජනයක අවශ්‍යතාව දැඩිව පැන නැඟී තිබෙන බව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැඩිම ආයෝජනය සිද්ධ වෙලා තිබෙන්නේ මහා මාර්ග ක්ෂේත්‍රයේයි. පසු ගිය දශකයක කාලය තුළ කරන ලද ආයෝජනවලින් සියයට 40ක් අප වැය කර තිබෙන්නේ මහා මාර්ගවලටයි. ඒ මුදල රුපියල් ට්‍රිලියනයකට ආසන්නයි. නමුත් අපේ ගැටලුව මොකක්ද? මාර්ග පද්ධතිය උසස් වුණා. අප ඒක පිළිගත යුතුයි. මාර්ග පද්ධතිය පහසු වුණා. අප ඒකත් පිළිගත යුතුයි. නමුත් අප, අපේ ආර්ථිකය අද පෙළන බරපතළම අර්බුදය තමයි, මාර්ග තදබදය. අද ප්‍රවාහන

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ක්ෂේත්‍රය ආර්ථිකය මත පනවා තිබෙන පීඩනකාරි තත්ත්වය කොතරම්ද කියනවා නම්, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14ක් ප්‍රවාහනය මතයි අද යැපෙන්නේ. සිංගප්පූරුවේ එම අනුපාතය සියයට 5යි. ප්‍රවාහනය සඳහා වූ වැය බර සියයට 20 දක්වා ගමන් කළා කියන්නේ, රට ආර්ථික අර්බුදයකට ගමන් කරනවා කියන එකයි. ඒ නිසා මා මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න ඕනෑ, මාර්ග තදබදය පිළිබඳ කාරණය හුදු සමාජ ප්‍රශ්නයක් නොවන බව; හුදු කාලය නාස්ති කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නොවන බව. මාර්ග තදබදය පිළිබඳ ගැටලුව ආර්ථික අර්බුදයක් කරා ගමන් කරමින් තිබෙනවා. අපේ ප්‍රාග්ධන ආයෝජනයෙන් සියයට 40ක් වැය කරලාත් අපට බැරි වී තිබෙනවා, මේ ප්‍රශ්නය විසඳන්න.

මේ ප්‍රශ්නය එන්න එන්නම උග්‍ර වනවා පමණයි. ඒ නිසා මේ අවස්ථාවේදී අපි යෝජනා කරනවා, පෞද්ගලික ප්‍රවාහනය දුර්වල කරමින් පොදු ප්‍රවාහනය ශක්තිමත් කිරීම සඳහා අප වහාම කටයුතු කළ යුතු වන බව. ඒ සඳහා බස් දහසක් අවශ්‍යයි. මා මුදල් ඇමතිතුමාට දැනුත් යෝජනා කළා, මේ තදබදය පිළිබඳ ගැටලුව අඩුම තරමින් හෝ විසඳාගන්න ජනතාවට ගමන් කරන්න තරම් සුදුසු මට්ටමේ, මධ්‍යම පාන්තික පිරිස්වලට යන්න පුළුවන් මට්ටමේ, පෞද්ගලික මෝටර් රථයෙන් මාරු වන්න පුළුවන් මට්ටමේ නව බස් දහසක් අපට දැන් අවශ්‍යයි කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොගෝටා නගරාධිපතිතුමා මේ ක්ෂේත්‍රයේ විශාල විප්ලවකාරි පරිවර්තනයක් කරපු නගරාධිපතිතුමෙක්. එතුමා ඉතා විශිෂ්ට ප්‍රකාශයක් කළා, 'මාර්ග තදබදය' පිළිබඳව. එතුමා කිව්වේ, 'රටක් දියුණුද නැද්ද කියා මනින්නේ බයිසිකලයෙන් ගිය මිනිහා, පයින් ගිය මිනිහා කාර් එකේ යනවාද කියන එක මත නොව; රටේ ධනය අයිති ඉහළ ගණයේ මිනිසුන් පවා බසය, රේල්ලුව කොතරම් දුරට පාවිච්චි කරනවාද කියන එක මතයි.' කියායි. ඇත්තටම ඒක තමයි අද අපටත් ලබා ගන්න තිබෙන අද්දැකීම වන්නේ. 2015 වර්ෂයේදී අපි තෙල් මිල අඩු කළා; වැටුප් වැඩි කළා. නමුත් ඒ දෙකෙන්ම අපි බලාපොරොත්තු වූ ප්‍රතිඵලය නොවෙයි ලැබුණේ. ඒ අවුරුද්ද ඇතුළත 7,00,000ක් වාහන මේ රටට ඇතුළු වුණා. එමඟින් සෑම නගරයකම මේ ගැටලුව බරපතළ ලෙස පැන නැඟුණා. ඒ නිසා ඉදිරි කාලයේදී ප්‍රවාහන ක්ෂේත්‍රය නංවන්න රාජ්‍ය ආයෝජනය යොදා ගන්න ඕනෑ. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, බස්නාහිර පළාතේ වාගේම මහනුවරත් සැහැල්ලු දුම්රිය සේවාවන් පිළිබඳ වැඩ පිළිවෙළක් දියත් කරන්න; පවතින දුම්රිය පද්ධති වෙනස් කරන්න. ඒ වාගේම නගරය තුළම යන ශීඝ්‍රගාමී බස් සේවාවක් - Bus Rapid Transit - සේවාවක් හඳුන්වා දීම සඳහා අප කටයුතු කරන බව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම සංවර්ධනය පිළිබඳව, අනාගතයේ අපේ ගමන් මඟ පිළිබඳව, අපේ උපාය මාර්ගය කුමක්ද කියන එක පිළිබඳව පැහැදිලි ඉදිරි දැක්මක් ඇතිව අප ගමන් කළ යුතුයි.

අපේ හුඟදෙනෙක් අද කියනවා, "ආයෝජන එන්නේ නැහැ. කම්හල් ඇරෙන්නේ නැහැ. අපේ රටට එනවාට වඩා ආයෝජන මියන්මාරයට ඇදී යනවා" කියා. ඒක ඇත්ත. මේ වසරේ අපේ රටට ආවා වාගේ කීප ගුණයක ආයෝජනයක් මියන්මාරයට ගිහින් තිබෙනවා; වියට්නාමයට ගිහින් තිබෙනවා; බංග්ලා දේශයට ගිහින් තිබෙනවා. ඇයි අපට දැන් ආයෝජන එන්නේ නැත්තේ? කාලයක් අපි කිව්වා, "යුද්ධය නිසා මේ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. ත්‍රස්තවාදි බලපෑම නිසා ආයෝජන එන්නේ නැහැ" කියා. තවත් කාලයක අපි කිව්වා, "අපේ රටේ රාජ්‍ය කොන්දේසි - රජයේ කොන්දේසි-, විවිධ බලපත්‍ර ලබා ගන්න තිබෙන පමා වීම්, දේශපාලන බලපෑම් මෙයට හේතු භූත වුණා" කියා. ඒ ඔක්කෝම ඇත්ත වන්න ඇති. නමුත් බරපතළ හේතුවක් මේ පිටුපස තිබෙනවා. ඒ මොකක්ද? අපේ රටට තවදුරටත් විදේශ ආයෝජකයන් කැඳවාගන්න බැහැ, 'ලාභ ශ්‍රමය ලංකාවේ තිබෙනවා. ලාභ බලශක්තිය ලංකාවේ තිබෙනවා. ලාභ සම්පත් ලංකාවේ තිබෙනවා. ලාභ පරිසරය ලංකාවේ තිබෙනවා" කියා. එසේ කියා අපට විදේශිකයන් ඇදගන්න බැහැ. ආර්ථික විද්‍යාවේදී අප මෙයට කියන්නේ, "නිෂ්පාදන සාධක ලාභ කිරීම මඟින් ආයෝජකයන් ඇඳා ගැනීමේ යුගය" කියායි. එහෙම නැත්නම් අප කියන්නේ, Factor-driven Economy එකක් කියායි. එය, නිෂ්පාදන සාධක ලාභ කිරීම මඟින් ආයෝජකයන් ඇද ගැනීමේ ක්‍රියාවලියයි. එය තවදුරටත් ලංකාවේ වලංගු ක්‍රියාවලියක් නොවෙයි. එය වලංගු වන යම් යම් ස්ථාන ඇති, යම් යම් ක්ෂේත්‍ර ඇති, සංචාරක ව්‍යාපාරය ආදි. නමුත් ඒ ක්‍රමයට කිසිම ආයෝජකයකු කැඳවා ගැනීමට දැන් හැකි වන්නේ නැහැ. එහෙම නම් මොකක්ද ඊළඟ උත්තරය? මෙකී තත්ත්වයට පත් වූ හැම රටක්ම ඊළඟ පියවරකට ගියා.

අද ආයෝජකයන් බංග්ලා දේශයට යන්නේ, අපට වඩා ලාභ ශ්‍රමය එතැන තිබෙන නිසයි; අද මියන්මාරයට යන්නේ අපට වඩා ලාභ බලශක්තිය, අපට වඩා ලාභ පරිසරය එතැන තිබෙන නිසයි. එහෙම නම් අපට අද කරන්න තිබෙන ඊළඟ පියවර තමයි කාර්යක්ෂමතාව නැංවීම. කාර්යක්ෂමතාව නංවන්න නම් ආයෝජන කරන්න ඕනෑ; යාන්ත්‍රීකරණය කරන්න ඕනෑ. කෘෂි කර්මාන්තයේ ඉඳලා අපට ශ්‍රම බලකායේ හිඟයක් ඇති වෙලා තිබෙනවා. ඒ එක්කම විදේශික ශ්‍රමිකයින් ලංකාවට පැමිණීම නිසා ගැටලු මතු වෙලා තිබෙනවා. සංක්‍රමණික ශ්‍රමිකයින් නිසා යුරෝපයේත්, මුළු ලෝකය පුරාමත් බලගතු දේශපාලන ප්‍රශ්න මතු වෙමින් තිබෙන යුගයක් මෙය. අපේ රටෙත් අද දෙලක්ෂයකට අධික සංක්‍රමණික ශ්‍රමිකයින් පිරිසක් ජීවත් වෙනවා. අපි ඒක අමතක කරන්න හොඳ නැහැ. අටලක්ෂයක පමණ ශ්‍රම හිඟයක් මේ රටේ පවතිනවා. ඒ නිසා මේ ක්‍රියාවලියේදී ආයෝජනයක අවශ්‍යතාව තිබෙනවා. කාර්යක්ෂමතාව නැංවීමට යාන්ත්‍රීකරණය කිරීම සඳහා ආයෝජනයක් අවශ්‍ය වෙලා තිබෙනවා.

තුන්වන පියවර මොකක්ද? තුන්වන පියවර තමයි නවෝත්පාදනය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යුගය නවෝත්පාදනයේ යුගයයි. මේ විෂයට අදාළ අපේ ඇමතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයෙන් අපි එදා යම් කිසි සැලැස්මක් ඇති කළා, නවෝත්පාදනයට අපි ආයෝජනය කරනවා නම් ආර්ථිකය වර්ධනය කර ගන්න පුළුවන් මොන ක්ෂේත්‍රවලින්ද කියන කාරණය සම්බන්ධයෙන්. ඒ වාගේම අද අපි පෙළෙන සමාජ ප්‍රශ්න, පරිසර ප්‍රශ්න දිහා බැලුවාම නවෝත්පාදනය අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. අද අපේ රට ගත්තාම එක ප්‍රතිශතයකින් -සියයට 1කින්- ආර්ථික වර්ධනයක් ළඟා කර ගන්න දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 4ක්-4.5ක් පමණ ආයෝජනය කළ යුතුයි. සියයට 4ක්-4.5ක් පමණ ආයෝජනය කළොත් තමයි සියයට 1ක ආර්ථික වර්ධනයක් අපට ළඟා කර ගන්න පුළුවන් වෙන්නේ. නමුත් නවෝත්පාදනයට අපි ආයෝජනය කළොත්, ඒ වාගේ තුන් ගුණයක කාර්යක්ෂමතාවක් ළඟා කර ගන්න පුළුවන් කියලා ඉතාම පැහැදිලිව අපේ රටේම අතීත අත්දැකීම් පෙන්වා දීලා තිබෙනවා. ඒ නිසා තෝරාගත් ක්ෂේත්‍රවල නවෝත්පාදනයට ආයෝජනය කිරීමත්, නවෝත්පාදනය ගොඩ නැංවීමත් සඳහා තමයි තාක්ෂණ නගරයක් අපි යෝජනා කළේ.

තේ, පොල්, රබර් ආර්ථිකය වියෝ වෙලා තිබෙනවා. තේ, පොල්, රබර් ආර්ථිකය මඟින් අපි අපනයන අභිමුඛයට ගියා. 1977 වසරේදී ආර්ථිකය විවෘත කිරීම නිසා අපට යන්න පුළුවන් වුණේ ඇඟලුම් කර්මාන්තය පැත්තට විතරයි. නමුත් අපි දැන් අලුත් යුගයක් ඇති කර ගන්න නම්, නව තාක්ෂණික සේවා කරා ගමන් කිරීම අත්‍යවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම software ව්‍යාපාර වාගේ දැනුම පදනම් කරගත් සේවා අපනයන ආදායම අපි ඩොලර්

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

බිලියනය කරා ළඟා වෙමින් තිබෙන යුගයක් මෙය. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. මේක තමයි අපේ අවස්ථාව. මේක තමයි ආසියාවේ අවස්ථාව. ඒ නිසා ඒ දෙසට නැඹුරු වුණු ආයෝජනයක් රටට ඉතා අත්‍යවශ්‍යයි.

විශේෂයෙන්ම අද අපේ රටේ තිබෙන මිනිරන්, ක්වාට්ස්, ටයිටේනියම් වැනි සුවිශේෂී ඛනිජ ද්‍රව්‍යවල අගය නැනෝ තාක්ෂණය මඟින් ඉතා විශාල ප්‍රමාණයෙන් ඉහළ නැංවීමේ හැකියාව තිබෙනවා. අද ලෝකය ක්‍රම ක්‍රමයෙන් ගමන් කරන විශාලම ක්ෂේත්‍රයක් තමයි, අපේ අය වැයෙනුත් සහන ලබා දුන් ක්ෂේත්‍රයක් තමයි, ස්වයංක්‍රිය වාහන සහ විදුලි වාහන ක්ෂේත්‍රය. ස්වයංක්‍රිය වාහන හා විදුලි වාහනවලට අත්‍යවශ්‍ය අමුද්‍රව්‍යයක් තමයි ග්‍රැෆින්. ඒක නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන විශිෂ්ටම සාධකය තිබෙන්නේ මේ රටේ. එතකොට මේක අපි නිවැරදි ආකාරයට නැනෝ තාක්ෂණයෙන් වැඩිදියුණු කර ගත්තොත්, ඒ තාක්ෂණ ආයතනය පුළුල් කර ගත්තොත් අපට ඒ ඔස්සේ විශාල වාසියක් ලැබෙනවා.

අපේ රට ජෛව විවිධත්වය අතින් ඉතා විශිෂ්ට රටක්. ජෛව විවිධත්වය මත පදනම් කර ගත්ත ජෛව තාක්ෂණය, ආහාර තාක්ෂණය, ඒ වාගේම ජාන තාක්ෂණය සඳහා විධිමත්ව ආයෝජනය කරගැනීම තුළින් ආහාර ක්ෂේත්‍රයේ ඉදිරි පිම්මක් ළඟා කර ගන්න අපට පුළුවන්. ඒ වාගේම අද අපි කනගාටුවෙන් වුණත් පිළිගන්න ඕනෑ කාරණයක් තමයි ජලය පිළිබඳ අර්බුදය. මාස කිහිපයකට කලින් ගංවතුර තත්ත්වයක් ඇති වුණා. මාස කිහිපයකට කලින් නියඟයක් තිබුණා. මාස හතරක් පායනකොට රට නියඟයට ගොදුරු වෙන්නේ ඇයි? අපි අනාගතයේදී අත්‍යවශ්‍යයෙන්ම සිතිය යුතු කාරණයක් තමයි 'ජලය සංරක්ෂණය කර ගැනීම' කියන කාරණය. ජලය පිළිබඳ සැලකිලිමත් වෙමින් ආහාර භෝග සහ අනෙකුත් කාරණා පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මේකට අපට විශාල පර්යේෂණ ක්ෂේත්‍රයක් අවශ්‍යයි.

නළ ජලය ලබා දීම පමණක් නොවෙයි විසඳුම. ඒක තාවකාලික විසඳුමක්. අනාගතය කරා යන්න නම් ජල හිඟයට ඔරොත්තු දෙන භව භෝග ඇති කිරීම, ජල හිඟය පාලනය කළ හැකි වෙනත් උපාය මාර්ග හඳුනා ගැනීම, පස සහ වායුව රැක ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම සහ නව තාක්ෂණය ඇති කර ගැනීම අත්‍යවශ්‍ය වෙනවා. මොකද, අද වන විට රසායනික පොහොර ආදිය භාවිතය නිසා ඇති වෙලා තිබෙන සමාජ, පාරිසරික බලපෑම ඉතා විශාලයි. රටේ ඉතා විශාල ප්‍රදේශයක -විශේෂයෙන්ම උතුරු මැද සහ උතුරු හා නැඟෙනහිර ඇතැම් ප්‍රදේශවල- ගොවි ජනතාව අතිවිශාල ප්‍රමාණයක් වකුගඩු රෝගයට ගොදුරු වෙලා තිබෙන්නේ මේ ආකාරයට අපි අපේ ජල පද්ධතිය වෙනස් කරගත් නිසයි. ඒ නිසා අපි අලුතින් හිතන්න ඕනෑ. අපේ ආයෝජන යොදවන්න ඕනෑ පාරවල් හදන්න, වතුර දෙන්න, ලයිට් දෙන්න විතරක් නොවෙයි. මේ ජල හිඟයට මුහුණ දීම සඳහා, වාගේම ඒකට ඔරොත්තු දෙන භව භෝග ගොඩනඟා ගැනීම සඳහාත්, ජලය නිසා ලෙඩ දුක් ඇතිවන අපේ ජනතාව ගලවා ගැනීම සඳහාත් ඒ ක්ෂේත්‍රයට විශේෂ පර්යේෂණ මෙහෙයුමක් අවශ්‍යයි. ඒ සඳහාත් ආයෝජන යෙදිය යුතු වෙනවා.

ඊළඟට, බලශක්තිය ගැන බලමු. දැන් ඉතාමත් පැහැදිලිව අනතුරු ඇඟවීම් කර තිබෙනවා, 2018දී ලංකාවට විශාල බලශක්ති අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා කියලා. ඒකට ප්‍රධානම හේතුව නැවත නැවතත් අපි පරණ පාරේම ගමන් කිරීමයි. 1988 අපි පළමුවැනි ගල් අඟුරු බලාගාරය හදන්න තිබුණා. අපි ඒක කළේ නැහැ. එහි ප්‍රතිඵලයක් හැටියට රට විශාල බලශක්ති අර්බුදයකට ගියා. පැය හයක්, හතක් විදුලිය කපන්න වුණා. ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් බිලියන සිය ගණනක පාඩුවක් දරන්න සිද්ධ වුණා. විධිමත් ජනන සැලැස්මකට නොගියොත් එක පැත්තකින් නැවතත් අපට එවැනි තත්ත්වයකට ගමන් කරන්න වෙනවා. අනෙක් පැත්තෙන් අද ලෝකය ගමන් කරමින් තිබෙන්නේ හරිත තාක්ෂණයන් කරායි.

විශේෂයෙන්ම සූර්ය බලය, සුළං බලය, ජීව ඉන්ධන වැනි ඒවා හැකිතාක් දුරට අපේ පද්ධතියට එකතු කර ගන්නවා. ඒ වාගේම අනෙක් පැත්ත අපි අමතක කරනවා. ඉල්ලුමට සැපයුම නොවෙයි, අපට ඉල්ලුම පාලනය කරන උපාය මාර්ගවලට ගමන් කරන්න හැකිවීමත් අත්‍යවශ්‍යයි. මොකද, හිටපු විදුලිබල ඇමතිවරයකු හැටියට ඒ පිළිබඳව මට අත්දැකීමක් තිබෙනවා. මම 2010 විදුලිබල අමාත්‍යාංශය භාර ගත් අවස්ථාවේ අපේ ඉංජිනේරු මහත්වරු කිව්වේ ඒ වෙලාවේ ඉහළම විදුලිය ඉල්ලුම මෙගා වොට්ස් 2000යි, 2015දී ඒක මෙගා වොට්ස් 4000 වෙනවාය කියලා. නමුත් අදටත් ඉල්ලුම මෙගා වොට්ස් 2000යි. ඇයි, අපි ඉල්ලුම කළමනාකරණය කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් දියත් කළ නිසා. ඉල්ලුම කළමනාකරණය කිරීමට සුහුරු විද්‍යුත් පද්ධතියක් ගොඩනැඟීම සඳහා විශේෂ ආයෝජනයක් අපට අවශ්‍යයි. මම හිතන විධියට මේ ක්ෂේත්‍රවල පර්යේෂණ, මේ ක්ෂේත්‍රවල ඉදිරි මඟ ඉතා අවශ්‍යයයි.

මම හිතනවා, තාක්ෂණ පර්යේෂණ ක්ෂේත්‍රයට රාජ්‍ය අංශයට වාගේම පෞද්ගලික අංශයට විශාල ආයෝජනයක් කළ යුතු අවස්ථාවකයි අප සිටින්නේ. ඒ අනුව මේ රටේ ආර්ථිකයේ ඉදිරි ගමන අපි පැරණි තාලයට, පැරණි ආකාරයට ගමන් කළ යුතු නැහැ. 1867දී,ජේම්ස් ටේලර් පළමුවැනි තේ පැළය ගම්පොළදී පැළ කළා. ඒ තේ පැළය පැළ කළ අවස්ථාවේදී ඔහු හිතුවේ නැහැ, කිසියම් දවසක මේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන ජනන ක්‍රියාවලිය සිද්ධ වන්නේ තේ ආර්ථිකය හරහාය කියලා. නමුත් ඒක එහෙම වුණා. ඊට පස්සේ රබර්, පොල්, කුරුඳු ආදී අනෙකුත් වාණිජ වැවිලි ක්ෂේත්‍රයෙන් අප ඉදිරියට ගියා.

දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පස්සේ මුදල් ඇමතිතුමාට අය වැය හදනවාය කියන එක ලොකු ප්‍රශ්නයක් වුණේ නැහැ. මොකද, ධනය බෙදා හැරීම විතරයි කරන්න තිබුණේ. තේ,රබර්,පොල් වගාවන්වල තිබුණු ශක්තීන් එක්ක අපට තිබුණේ අය වැය පරතරයක් නොවෙයි, අය වැය අතිරික්තයක්. ඒ තත්ත්වය එක්තරා ආකාරයකට සීමා වුණා, 1978දී. ජයවර්ධන ජනාධිපතිතුමා එදා නිදහස් වෙළෙඳ කලාප සංකල්පය හඳුන්වා දුන්නා. එදා ලංකාවේ නිදහස් වෙළෙඳ කලාප බලන්න ආපු ප්‍රධාන පිරිසක් තමයි චීනයේ දූත පිරිස.

1978 චීනයේ දූත පිරිස ආවේ උපාලි විජයවර්ධන මහත්තයා හම්බ වෙලා ලංකාවේ නිදහස් වෙළෙඳ කලාප ඇති කරලා තිබෙන්නේ කොහොමද කියලා බලන්නයි. අපේ නිදහස් වෙළෙඳ කලාප අද එතැනම තිබුණත්, ලෝකයේ ප්‍රධානතම නිදහස් වෙළෙඳ කලාප ග්වොන්ෂුවල, ෂෙන්සෙන්වල ඇති වුණේ අපේ නිදහස් වෙළෙඳ කලාපයේ ඒ සැලසුම චීනයේ ක්‍රියාත්මක කිරීම නිසායි. පළමුවෙන්ම විදේශ ආයෝජනය සහ විදේශ තාක්ෂණය, දෙවනුව විදේශ ආයෝජන වෙනුවට දේශීය ආයෝජනය සහ දේශීය තාක්ෂණය, තුන්වෙනුව දේශීය තාක්ෂණය සහ දේශීය ආයෝජනය කියන පියවර තුනම පනින්න චීනයට පුළුවන් වුණා. ඒ අනුව නැවත වතාවක් චීනය ලෝකයේ මහා කම්හල බවට පත්වෙමින් ලෝකයේ විශාලතම නිෂ්පාදනාගාරය බවට පරිවර්තනය වුණා. අපට තිබුණු අවස්ථාව අපි නැති කර ගත්තා. ඒ වාගේම අපට තිබුණු මේ විශිෂ්ට භූගෝලීය පිහිටීම අපි නිසියාකාරව පාවිච්චි කළේ නැහැ.

අපට නිදහස ලැබීමෙන් පසු 1950දී ලෝකයේ තිබුණු පළමුවැනි සාර්ථකම වරායන් පහෙන් එකක් තමයි අපේ කොළඹ වරාය. එදා සිංගප්පූරුව හෝ ඩුබායි රටක් තිබුණේ නැහැ. අපේ අවස්ථාව අහිමි කර ගෙන අද අපි 30වැනි තැනට වැටිලා තිබෙනවා. ඒ නිසා අදටත් මේ ක්ෂේත්‍ර දියුණු කර ගෙන විශිෂ්ට මධ්‍යස්ථාන බවට අපි සකසා ගන්න ඕනෑ. ඒ සඳහා නාගරික වැඩ පිළිවෙළක්, නාගරික පරිවර්තනයක් අත්‍යවශ්‍යයි. ජනතාවට ධනය උත්පාදනය කරන්නත්, පාරිසරික ප්‍රශ්න විසඳා ගන්නත්, මේ රට ගෝලීය කේන්ද්‍රයක් බවට පරිවර්තනය කරන්නත් විධිමත් නාගරික සැලැස්මක් එක්ක ගොඩනැඟුණු නාගරික වටපිටාවකුත් අවශ්‍යයි. ඒ සඳහා බලගතු ආයෝජනයක් ඉදිරි කාලවලදී රටට අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, මේ අය වැය මඟින් කිසියම් ආකාරයකට මධ්‍ය කාලීන ආර්ථික ක්‍රියා දාමයක් සඳහා අවශ්‍ය කරන පදනම දමා තිබෙනවාය කියා. විවේචනය කරන්න පුළුවන් තැන් විශාල ප්‍රමාණයක් එහි ඇති.

සමස්තයක් හැටියට අපේ බදු ප්‍රතිපත්තියේ කිසියම් නිශ්චිත විප්ලවකාරී වෙනසකට, ඒ වාගේම ආයෝජන ප්‍රතිපත්තියේ කිසියම් නිශ්චිත විප්ලවකාරී වෙනසකට මේ රට ගමන් කළ යුතු මොහොත, අවස්ථාව දැන් උදා වෙලා තිබෙනවා. ඒ සඳහා පියවර ගත යුතුයි. ඒ සඳහා පක්ෂ, පාට භේදවලින් තොරව මේ පාර්ලිමේන්තුව ක්‍රියාත්මක විය යුතුයි. මේ පාර්ලිමේන්තුව තමයි රාජ්‍ය මූල්‍ය හසුරුවන්නේ. ඒ නිසා සරල ප්‍රශ්න අහලා, ජනතාවට බදු බර පැටෙව්වාය, ජනතාවට බදු පිට බදු ගැහුවාය කියා ජනප්‍රිය සටන් පාඨ කියලා මේ රට ගොඩ ගන්න බැහැ. මේ රටේ වරාය අඩපණ කළේ ජනප්‍රිය සටන් පාඨ තුළිනුයි. ජනප්‍රිය සටන් පාඨකරුවන් "ධනපති හංග වේවා!" කිය-කියා කම්කරුවන් උසි ගැන්වීම් තුළින් තමයි කොළඹ වරාය වැට්ටුවේ. ඒකෙන් තමයි ලී ක්වාන් යූට අවස්ථාවක් ලැබුණේ සිංගප්පූරුව බලගතු ස්ථානයක් බවට පත් කරන්න. "සිංගප්පූරුව ගොඩ නඟන්න කරපු උදව්වට, ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයට ජය වේවා!"යි කියා එතුමාගේ ජීවිත කථාවේදී එතුමා පැහැදිලිව කියා තිබෙනවා.

එදා අපි අපේ අවස්ථාව මඟ හැර ගත්තා. අපට මේ අවස්ථාව නැවත ලැබෙන්නේ නැහැ. ගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් මූලිකත්වයෙන් ඇති වුණු ප්‍රධාන පක්ෂ දෙකේ දේශපාලන සංහිඳියාව පාවිච්චි කරලා, මේ රට මූල්‍යමය වශයෙන්, ආර්ථිකමය වශයෙන් පමණක් නොවෙයි, සමාජමය වශයෙනුත් ශක්තිමත් රටක් බවට පරිවර්තනය කිරීමට පියවර ගත යුතුයි කියා යෝජනා කරමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. A.D. Susil Premajayantha. You have 19 minutes.

[අ.භා. 2.19]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Science, Technology and Research)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2017 අය වැය යෝජනා සම්බන්ධයෙන් සාමාන්‍ය විවාදයට සහභාගි වන මේ අවස්ථාවේදී, විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින්, ප්‍රථමයෙන්ම කථා කිරීමට ලැබීම ගැන මා සතුටු වනවා. මෙවර අය වැය පරතරය රුපියල් බිලියන 635ක් පමණ වනවා. මුළු ඇස්තමේන්තුවත් එක්ක සමස්ත අය වැය පරතරය රුපියල් බිලියන 3,473.3යි.

මෙහි සාරාංශය මා විග්‍රහ කරන්නම්. රුපියල් බිලියන 635ක අය වැය පරතරයක් ඇති වෙලා තිබෙනවා. අපේ රටේ ලක්ෂ 14ක් වන රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා වර්ෂයකට දළ වශයෙන් රුපියල් බිලියන 600 - 650 අතර ප්‍රමාණයක් වැය වනවා. ඒ වාගේම දැනට විශ්‍රාම ගොස් සිටින, විශ්‍රාම වැටුප් ලබන රාජ්‍ය සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට තවත් රුපියල් බිලියන 300 - 350 අතර ප්‍රමාණයක් වැය වනවා. මේ අනුව රාජ්‍ය සේවක වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා පමණක් රුපියල් බිලියන 1,000කට ආසන්න මුදලක් වාර්ෂිකව වෙන් කරන්න සිදු වනවා.

ඊළඟට, ඉතිහාසයේ මේ තාක් ලබා ගෙන තිබෙන ණය සහ මෑත කාලීනව ලබා ගත් ණය සම්බන්ධයෙන් වූ සහන කාල සීමාව අවසන් වන කොට, ණය වාරිකය සහ පොලිය ඇතුළු ඒ සියල්ල ගෙවීම සඳහා 2017 වසරේදී තවත් රුපියල් බිලියන 1,400ක් අවශ්‍ය වනවා. මේ රුපියල් බිලියන 1,400ත්, රාජ්‍ය සේවක වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා අවශ්‍ය වන රුපියල් බිලියන 1,000ත් එකතු කළාම රුපියල් බිලියන 2,400ක් වනවා. නමුත් අපේ ආදායම කොපමණද? අපේ ආදායම ඊට වඩා අඩුයි. ඉතාම සරලව ගත්තොත් රාජ්‍ය සේවක වැටුප් සහ විශ්‍රාම වැටුප් ගෙවීමත්, මෙතෙක් ලබා ගෙන තිබෙන ණය සහ කල් පිරුණු ණය ගෙවීම ආරම්භ කිරීමත් එක්ක 2017 වර්ෂය සඳහා වන වියදම සම්බන්ධයෙන් මෙන්න මේ පින්තූරය තමයි අපට දැක ගන්න පුළුවන් වන්නේ.

ඉතිහාසයේ ඉඳලා ගත්තාම, ඕනෑම රටක, අපේ රටේ වුණත් රාජ්‍ය අය වැය ලේඛනය සම්පාදනය කිරීමේදී, එහි වියදම් පැත්ත - වැටුප් ගෙවීම, හැම අමාත්‍යාංශයකම පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන යෙදවුම්, විශේෂ ව්‍යාපෘති හා මා කලින් කියපු ණය වාරික සියල්ල ගෙවීම- සඳහා මුදල් සොයා ගන්නේ කොහෙන්ද? ඕනෑම රටක් මේ වියදම් සඳහා ආදායම සොයා ගන්නේ බදුවලින් තමයි. එහෙම නැතිව වෙන මොනවායින්ද ආදායම සොයා ගන්නේ? සාම්ප්‍රදායිකව අය වැයක් සකස් කිරීමේදී ඕනෑම රටක, රාජ්‍යයක අනුගමනය කරන ආර්ථික ප්‍රතිපත්තිය මේක තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන් මේ සභාවේ කථා කරනවා මා අහගෙන සිටියා. බදු අය කිරීම ගැන තමයි කථිකයින් කිහිපදෙනෙක්ම කථා කළේ. හැබැයි මෙතැනදී රජයක් විසින් කරන්නේ, බදු දරන්න පුළුවන් පිරිසගෙන් බදු අය කරගෙන, බදු අය කරගත නොහැකි සහ පහළ මට්ටමේ ආදායම් ලබන අයට ඒ සහනය ලබාදීලා, මේ අය වැය කළමනාකරණය කර ගැනීමයි. එහෙම කර ගන්න බැරි වන අවස්ථාවේදී කරන්න වන්නේ නැවත ණය ගැනීමයි. එක්කෝ දේශීය වශයෙන් ණය ගන්න ඕනෑ. එහෙම නැත්නම් විදේශීය වශයෙන් ණය ගන්න ඕනෑ.

මීට දශක එකහමාරකට, දශක දෙකකට පමණ කලින් තිබුණු තත්ත්වය අපට මතකයි. ඒ කාලයේ අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන කොට මුලින්ම කරන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින්, ලෝක බැංකුවෙන්, එහෙම නැත්නම් ආසියානු සංවර්ධන බැංකුවෙන් කොපමණ මුදලක් ලැබෙනවාද, එයින් කොපමණ ප්‍රමාණයක් ප්‍රාග්ධන යෙදවුම්වලට යෙදෙනවාද කියා බලා, ඒ ටික වෙන් කර ගන්න එකයි. ඊට පසුව දේශීය බැංකුවලින් කොපමණ ණය ගන්න පුළුවන්ද කියා බලනවා. බැඳුම්කර නිකුත් කිරීම හා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම තමයි කෙටි කාලීනව ණය ලබාගැනීමට යොදා ගන්නා උපක්‍රම වන්නේ. ඒවා තමයි තිබෙන උපකරණ. ඒවා තමයි මේ යොදා ගන්නේ.

දේශීය වශයෙන් ණය ගන්න කොට මොකද වන්නේ? දේශීය වශයෙන් ණය ගන්න වන්නේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

නිකුත් කරලායි. එහෙම නැත්නම්, දේශීය වශයෙන් තිබෙන වාණිජ බැංකුවලින් සහ ඉතිරි කිරීමේ බැංකුවලින් ණය ලබාගන්න ඕනෑ. කවුරු කොහොම කථා කළත්, අය වැය ලේඛන සකස් කිරීමේදී පසු ගිය දශක දෙකක පමණ කාලයක සිට සෑම රජයක්ම අනුගමනය කළ ප්‍රතිපත්තිය මේකයි. ඊටත් අමතරව යමක් වුණා නම් ඒ මොකක්ද වුණේ? රාජ්‍ය දේපොළ හෝ රාජ්‍ය ව්‍යවසායන් කිහිපයක් විකුණන එකයි. [බාධා කිරීමක්] ඔව්, විකුණුවා. විකුණලා සල්ලි ගත්තා. ඒ සල්ලිත් මේකට දැම්මා.

මේ කාරණය ගැන අපි මෙහෙම හිතමු. පර්චස් 40ක ඉඩමක් තිබුණු කෙනෙක් එයින් පර්චස් 10ක් විකුණනවා කියා අපි හිතමු. එම ඉඩම් කොටස විකුණලා එයා තමන්ගේ අඩු පාඩු, පෞද්ගලික අය වැය හදාගන්නවා. ඔහුට තව සල්ලි ටිකක් මදි වෙනවා. ඒක හොයා ගන්න ඔහු තව ඉඩම් කෑල්ලක් විකුණනවා. එහෙම කරලා-කරලා අන්තිමට ඔහුට විකුණන්න දෙයක් නැති වෙනවා. මෙවැනි බරපතළ තත්ත්වයකට තමයි අද අපටත් මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. කවුරු කොහොම කිව්වත්, කවුරු බලයේ සිටියත් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න ඕනෑ.

අපි සරල උදාහරණයක් ගනිමු. යටිතල පහසුකම් සංවර්ධනය කළාය කියා අපේ පායලී චම්පික රණවක ඇමතිතුමාත් කිව්වා. මාර්ග 168ක් සඳහා වාණිජ බැංකු 5කින් සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රුපියල් බිලියන 150ක් ලබාගත්තා. මේ ණය මුදලේ සහන කාල සීමාව අවුරුදු දෙකහමාරයි. දැන් ඒ අවුරුදු දෙකහමාර අවසානයි. මේ අවුරුද්දේ සිට මේ වාණිජ බැංකු 5ට සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට මෙම රුපියල් බිලියන 150 ගෙවන්න ඕනෑ. අපි මේ උදාහරණය ගනිමු. අපේ බන්දුල ගුණවර්ධන මැතිතුමාත්, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් හොඳට දන්නවා දෙල්කඳ කටු ඇළ ගැන. දෙල්කඳ කටු ඇළේ කට්ටිය හන්දියේ සිට වේරැස් ගඟ දක්වා වූ ව්‍යාපෘතියේ මුළු වටිනාකම කීයද? රුපියල් බිලියන 12යි - රුපියල් මිලියන 12,000යි-. මුලින්ම ඒ මුදල ආසියානු සංවර්ධන බැංකුවෙන් ගන්න හැදුවා. නමුත් ලැබුණේ නැහැ. ඊට පසුව මොකක්ද කළේ?

ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රුපියල් මිලියන 12,000ක් ගත්තා. ඒ ගැන අය වැය ලේඛනයේ සඳහනක් වෙලා තිබුණේ නැහැ. ඒ රුපියල් මිලියන 12,000 අරගෙන දැන් මේ ව්‍යාපෘතිය කරගෙන යනවා. නමුත් මිනිසුන්ට වන්දි ලැබෙන්නේ නැහැ. ගෙවල් කඩා දමලා, මිනිසුන් පාරට දමලා ඇළ හදාගෙන යනවා. දැන් මට කියන්න, මෙහි තිබෙන ERR - Economic Rate of Return - එක මොකක්ද කියලා. හැබැයි මේ රුපියල් බිලියන 150 අපට යොදවන්න පුළුවන් වුණා. මාර්ග හැදෙන්න ඕනෑ, ඒ ඔක්කොම කෙරෙන්න ඕනෑ. නමුත් ඒවා දරන්න පුළුවන් ප්‍රමාණයට සිදු කරමින්, මේ රුපියල් බිලියන 150න් රුපියල් බිලියන 100ක් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට රුපියල් මිලියනය ගණනේ දුන්නා නම්, ව්‍යවසායකයන් ලක්ෂයකට දෙන්න පුළුවන්. එක් ව්‍යවසායකයෙක් එක රැකියාව ගණනේ හැදුවා නම්, රැකියා ලක්ෂයක් නිෂ්පාදනය වෙනවා. ඊළඟ මාසයේ සිට බැංකුවට පොලියයි, ප්‍රාග්ධනයයි දෙකම එනවා. එහෙම වුණේ නැහැ. එහෙම නොවෙන්න හේතුව මොකක්ද? මේ ව්‍යාපෘතීන් පිළිබඳව ඇගැයීමක් කරලා, ඇගැයීම් වාර්තාවක් ලබාගෙන, එහි ඵලදායීතාව පිළිබඳ ගණනය කිරීමක් කරන්නේ නැතිව, ඒ ව්‍යාපෘතිය ආරම්භ කරන්න සිදු වීමයි. බොහෝ විට අද තිබෙන තත්ත්වය එයයි. දැන් මාර්ග සඳහා වියදම් කළ මුදල රුපියල් ට්‍රිලියන තුනක්ය කියා අපේ පායලී චම්පික රණවක ඇමතිතුමා කිව්වා. මෙහිදී මාර්ග සඳහා පමණක් නොවෙයි, දේපොළ අත්පත් කරගැනීම් සඳහා ගෙවපු මුදලකුත් තිබෙනවා. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාට මා විශේෂයෙන්ම යෝජනා කරනවා, මින් ඉදිරියට යම් කිසි මුදලකට එහායින් තිබෙන්නා වූ ව්‍යාපෘති සඳහා - උදාහරණයක් විධියට රුපියල් මිලියන 500කට එහා, නැත්නම් රුපියල් මිලියන 1000කට එහා- මුදල් වෙන් කිරීමට මත්තෙන්, තාක්ෂණ කමිටුවක් මඟින් සහ ඉහළම මට්ටමේ සැලසුම් කමිටුවක් මඟින් ඒ ව්‍යාපෘතිය ඇගැයීමකට ලක් කරලා, එහි ආර්ථික ඵලදායිතාව පිළිබඳව ගණනය කිරීමක් කරලා, ඵලදායි නම් පමණක් ඒ ව්‍යාපෘතියට මුදල් යොදවන්න කියලා. එහෙම නැත්නම්, ඒ වෙනුවට විකල්ප වැඩ පිළිවෙළකට යන්න පුළුවන්කමක් තිබෙන්න ඕනෑ.

මේ මහා පරිමාණයේ සෑම ව්‍යාපෘතියක්ම සැලසුම් කමිටුවක් මඟින් මාසිකව ඇගැයීමකට ලක් කරලා, පරීක්ෂණයකට ලක් කරලා ඒ පිළිබඳව තත්ත්ව වාර්තාවක් ඉදිරිපත් කරන්න ඕනෑ, අනිවාර්යයෙන්ම. අවශ්‍ය නම් එවැනි වාර්තාවක් කාර්තුවකට වතාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන් නම් හොඳයි. මොකද, අවසාන වශයෙන් පාර්ලිමේන්තුව තමයි අය වැය විවාදයේදී විවාද කරලා ඒ ව්‍යාපෘතිවලට මුදල් වෙන් කරන්නේ. එහෙම නැත්නම් ඒවා ගැන සොයන්න COPE එකට, Public Accounts Committee එකට යන කොට අශ්වයා පැනලා ගිහිල්ලා ඉවරයි. ඒ නිසා මෙවැනි වැඩ පිළිවෙළකට යන්නය කියන කාරණය මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වර්තමානයේ තිබෙන අර්බුදය මොකක්ද? මා දැන් කියපු ආකාරයෙන් ගොඩ නැඟිලා ආපු අර්බුදයක් තමයි මේ තිබෙන්නේ. අපි ගත්ත සමහර ණය දැන් කල් පිරෙනවා. ඒ කල් පිරෙනකොට ඒවායේ ණයයි, පොලියයි දෙකම දැන් ගෙවන්න ඕනෑ. [බාධා කිරීමක්] ඔව්. Rs. 1,500 billion අවුරුද්දකට හොයන්න ඕනෑ, ණය වාරික සහ පොලිය ගෙවන්න. ඒ මුදල් ගෙව්වේ නැත්නම් මොකද වෙන්නේ? ගෙව්වේ නැත්නම් මේ රාජ්‍යය අසමත් රාජ්‍යයක් බවට පත් වෙනවා, පළමු වතාවට. මෙතෙක් කල් එහෙම වෙලා නැහැ. ඒ නිසා මේ අභියෝගයට මුහුණ දෙන්න ඕනෑ. මේ අභියෝගයට මුහුණ දෙන්න නම් ජනතාවට වන පීඩනය අවම කර ගනිමින් මේ ආර්ථිකය කළමනාකරණය කරන්න සිදු වෙනවා.

මේ ගැටලුවට ජාත්‍යන්තර තලයේ මතු වෙලා තිබෙන ප්‍රශ්නත් අද අපට බලපානවා. අද මැදපෙරදිගට අපේ තේ ටික යන්නේ නැහැ, යුද්ධය නිසා. අද අපේ රබර් මිල පහළ වැටිලා තිබෙනවා. අද අපේ සාම්ප්‍රදායික අපනයනවල ආදායම ප්‍රමාණවත් නැහැ. මැදපෙරදිග ගිහිල්ලා උපයන ධනයෙන් මේ රටට එවපු ප්‍රේෂණ - remittances - අද සීමා වෙලා තිබෙනවා, බිලියන 7ට. ඒක ඉහළට ඉහළට ගිහිල්ලා ගිය අවුරුද්දේ ඉඳලා බිලියන 7 සීමාවේ ඉන්නවා. ඊට අමතරව සිරියාවේ යුද්ධය, ඉරාකයේ යුද්ධය තිබෙනවා. ඒ රටවල අස්ථාවරතාව, තෙල් මිල පහළ වැටීම කියන මේ සියලු දේ අපේ රටට බලපානවා.

ඊළඟට තිබෙනවා, යුරෝපා සංගමයෙන් බ්‍රිතාන්‍යය ඉවත් වීමේ කාරණයත්. ඒක යුරෝපා සංගමයට බලපානවා. ඇමෙරිකාවේ ජනාධිපතිවරණයේ ප්‍රතිඵල නිකුත් වුණු ගමන් ඩොලරයේ අගය පහළ වැටුණා. දැන් ආයෙත් පොඩ්ඩක් නැඟිටින්න ඇති.

ඊළඟට, මේ ප්‍රශ්නය යුරෝපයට බලපාන්නේ කොහොමද? ඇමෙරිකාව කොයි විධියටද යුරෝපයත් එක්ක ගනු-දෙනු කරන්නේ කියන ප්‍රශ්නයත් බලපානවා. අපට කොයි තරම් ආකාරයට GSP Plus ලැබුණත්, අපේ ඇඟලුම් කර්මාන්තයට ජාත්‍යන්තරයේ තරග කරන්න පුළුවන් මට්ටමට යන්න වෙනවා. අද ඇඟලුම් කර්මාන්තයෙන් බංග්ලාදේශය, වියට්නාමය, මියන්මාරය වැනි රටවල්, අඩු ශ්‍රමයක් තුළ, අඩු විදුලි ඒකක පිරිවැයක් තුළ, අඩු මිලකට ජාත්‍යන්තර වෙළෙඳ පොළේ

තරගකාරිත්වයට ගිහිල්ලා තිබෙනවා. එතකොට දෙවනුවට ආදායම ලැබෙන අපේ ඇඟලුම් කර්මාන්තයට මොකද වෙන්නේ? ඉතින් මේවා ගැන යම් කිසි පුරෝකථනයක් කරන්න ඕනෑ. හරි විධියට නම් සංවර්ධන කටයුතු කරන අමාත්‍යාංශ හැම එකකම Research and Development Unit එකක් තිබෙන්න ඕනෑ. මට කියන්න බලන්න, ඒ වාගේ එකක් අමාත්‍යාංශ කීයක තිබෙනවාද කියලා. අමාත්‍යාංශ කීයක R&D තිබෙනවාද? ඒවා නැහැ. ඒවා පටන් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ පැවැති එක්තරා විවාදයක විවාදකරුවන්ගෙන් ප්‍රශ්නයක් ඇහුවා, ඒකට සවන් දුන් කෙනෙකු. මා අහගෙන හිටියා, ඒ අහපු ප්‍රශ්නය. ඔහු ඇහුවා, අපොස උසස් පෙළ දරුවන් එක්ලක්ෂ හැත්තෑපන්දහසකටයි, ගුරුවරු විසිඅටදහසකටයි tabs දෙනවාට වඩා සපත්තු නැති අයට සපත්තු දෙන එක හොඳ නැද්ද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කනගාටු වෙනවා සාක්ෂරතාව සියයට 98ක් තිබෙනවාය කියන අපේ රටේ මෙවැනි ප්‍රශ්නයක් අහපු එක ගැන. මෙන්න මේක තමයි ඇතැම් අය හිතන ආකාරය. මේක වෙනස් කරන්න ඕනෑ. Tab එකකින් කරන වැඩේයි, කකුලට දමන සපත්තුවකින් කරන වැඩේයි දෙකම එකක් නොවෙයි. සපත්තුවෙන් කරන වැඩ ඉවර වෙලා ගොඩක් කල්. දැන් අපේ සමහර ගරු මන්ත්‍රීවරුන් පවා සපත්තු, සෙරෙප්පු නැතිව පාර්ලිමේන්තුවට එනවා. එහෙම එන මන්ත්‍රීවරුන් ඉන්නවා; කලිනුත් හිටියා. හැබැයි, tab එකකින් තිබෙන ප්‍රයෝජනය මොකක්ද? අපොස උසස් පෙළ පන්තියෙන් පටන් ගත්තාට පස්සේ, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් එහාට අධ්‍යාපනය යන්නේ තනිකරම පරිගණක දැනුමත් එක්ක; ඒ සාක්ෂරතාවත් එක්ක. අද ලෝකයේ වෙනත් රටවල විශ්වවිද්‍යාලවල tutes ලියලා, ඒවා forward කරන්නේ පරිගණකය හරහා email එකෙන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Notes ලියන්නේ නැහැ. පන්ති යන්නේ නැහැ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔව්. පන්ති යන්න අවශ්‍යත් නැහැ. ඉතින් අද අපි එතැනට යන්න ඕනෑ. ඒ සඳහා තාක්ෂණ විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රය ඉතා වැදගත් වෙනවා. මා ස්තුතිවන්ත වෙනවා, ගරු මුදල් ඇමතිතුමාට මේ ක්ෂේත්‍රයේ කටයුතුවලට අවශ්‍ය මුදල් සපයා දීම ගැන. නැනෝ තාක්ෂණය අපි ඉදිරියට ගෙන ගිහිල්ලා තිබෙනවා. අද ආචාර්ය උපාධිධාරින් 20දෙනෙකු ඒ පර්යේෂණවල යෙදිලා ඉන්නවා. නවෝත්පාදන සඳහා අවශ්‍ය වන පර්යේෂණ කෙරෙමින් පවතිනවා.

ඊළඟට, ජීව තාක්ෂණය සඳහා ආයතනයක් පිහිටුවීමට අවශ්‍ය ඉඩම ලබාදීලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන මූල් ප්‍රාග්ධනය යෙදවීම කරලා තිබෙනවා. ලබන අවුරුද්දේ ඉඳලා ඒ ජීව තාක්ෂණික කටයුතු පටන් ගන්නවා. ඒක ක්ෂේත්‍ර තුනකට යනවා, කෘෂිකර්ම ක්ෂේත්‍රය, ඖෂධ නිෂ්පාදනය සහ පිළිකා වැනි රෝග සඳහා නව බෙහෙත්, vaccines නිෂ්පාදනය කිරීම යනාදී වශයෙන්.

ඊළඟට, robotics. ඒ හරහා artificial intelligence කියන ක්ෂේත්‍රය දියුණු කරන්න පුළුවන්කම ලැබෙනවා. මේ ආදී වශයෙන් මේ අය වැයෙන් විවිධ යෝජනා ගෙනැල්ලා තිබෙනවා. ඒ සම්බන්ධව මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ යෝජනා සඳහා අපිත් මූලික බීජය වැපිරුවා.

පාසල් දරුවන් ලක්ෂ 45ක් සඳහා, 1වෙනි ශ්‍රේණියේ සිට 13වෙනි ශ්‍රේණිය දක්වා, -අවුරුදු 19 දක්වා- රුපියල් ලක්ෂ 2ක සෞඛ්‍ය රක්ෂණයක් ලබාදීමට යෝජනා කරලා තිබෙනවා. මෙයින් වන බලපෑම මෙහෙමයි. දරුවෝ ලක්ෂ 45ක් කියන්නේ, අඩුම තරමින් පවුල් ලක්ෂ 35ක්. මුළු රටේම ඉන්නේ පවුල් ලක්ෂ 50යි. පවුල් ලක්ෂ 35කට මේ රක්ෂණය බලපානවා. මොකද, අවුරුදු 5,6,7,8 වාගේ වයසක ළමයෙක් ඉන්නවා නම් අඩුම තරමින් මාසයකට දෙකකට සැරයක් අසනීපයක් හැදෙනවාමයි. ඒ සඳහා බෙහෙත් ගන්න ගියාම රුපියල් 2,000ක්, 3,000ක් යනවාමයි. රුපියල් 10,000ක් බාහිර ප්‍රතිකාර සඳහා රජයෙන් වෙන් කළ විට, මාසික වැටුපෙන් ඒ සඳහා වෙන් කරන මුදල දෙමවුපියන්ට ඉතිරි වෙනවා. ළමයි තුන් දෙනෙක් සිටිනවා නම් ඒ වාගේ තුන් ගුණයක් ලැබෙනවා. මම හිතන විධියට එය ඉතා වැදගත්ම යෝජනාවක්.

රජයේ සේවකයන් විශ්‍රාම ගැන්වීමෙන් පසුවත්, අග්‍රහාර රක්ෂණාවරණය දීර්ඝ කරලා තිබෙනවා, ජීවිත කාලය පුරාවටම. මේකත් ඉතාම වැදගත් වෙනවා. මොකද, අද ඖෂධ සඳහා තමයි වයස්ගත අයට සහ දරුවන්ට වැඩිම වශයෙන් මුදල් වැය කරන්නට සිදු වන්නේ, අනෙක් දේවලට අමතරව. [බාධා කිරීමක්] ඔව්, කණ්ණාඩියක් ගන්නත් සල්ලි නැහැ. ඒ නිසා වැටුප් වැඩි කරනවාට වඩා, දීමනා වැඩි කරනවාට වඩා, -ඒක උද්ධමනයට හේතුවක් වෙන්න පුළුවන්. ඒකත් කළමනාකරණය කර ගනිමින් - මෙවැනි යෝජනා ඉදිරිපත් වීම වඩා වැදගත් කියලා මම හිතනවා.

සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයන් සඳහා ණය සපයා දීම, ඒ තුළින් යම් රැකියා ප්‍රමාණයක් උත්පාදනය කිරීම සහ යම් පිරිවැටුමක් දක්වා වන මුදල් ආයෝජනය කිරීමේදී ඒ සඳහා පොලී සහන ලබාදීම ඉතා වැදගත් වෙනවා.

ඒ එක්කම, "Z " අගය අනුව විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න බැරි ශිෂ්‍යයින් 15,000ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් අනුමත කරන ලද රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතනවල පාඨමාලා හැදෑරීම සඳහා රුපියල් ලක්ෂ 8ක් දක්වා ණය මුදලක් ලබාදීමට යෝජනා කරලා තිබෙනවා. දැන් විශ්වවිද්‍යාලවලට ඇතුළු වන්නට පුළුවන් 27,000කටයි. තව 15,000කට අවස්ථාව ලැබෙනවා කියන්නේ 42,000කට විශ්වවිද්‍යාල අධ්‍යාපන ලබන්න පුළුවන් කියන එකයි. සාමාන්‍යයෙන් රජයේ විශ්වවිද්‍යාලයක කලා උපාධියක් හෝ කළමනාකරණ උපාධියක් සඳහා දැන් රුපියල් ලක්ෂ තුනහමාරක, හතරක වියදමක් යනවා. වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයෙක් සඳහා රුපියල් ලක්ෂ 16 -18ක් පමණ වැය වෙනවා. රුපියල් ලක්ෂ 8ක මුදලක් ණය මුදලක් ලෙස ලබා දෙන විට, ඕනෑ නම් ලක්ෂ ඒ 8ම ගන්නත් පුළුවන්, එහෙම නැත්නම් ලක්ෂ 4ක් ගන්නත්, පුළුවන් ඒ පාඨමාලාවේ හැටියට. මේ ණය මුදල දෙන්නේ නිකම් නොවෙයි, UGC එකෙන් අනුමත කළ උපාධි පිරිනමන්නට පුළුවන් මට්ටමේ තිබෙන ආයතනවලින් පාඨමාලාවක් හදාරනවා නම් පමණයි. ඒ තුළින් අවස්ථාව පුළුල් කරලා දීලා තිබෙනවා, තමන්ට ඕනෑ කරන පාඨමාලාවක් හදාරලා, උසස් අධ්‍යාපනයට අවතීර්ණ වන්නට. ඒ හරහා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ප්‍රමාණය එකවර 15,000කින් වැඩි කිරීමේ වැඩ පිළිවෙළකට යන්න පුළුවන්කම ලැබෙනවා.

හිටපු අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාත් දන්නවා, අපට විද්‍යා, ගණිත, තාක්ෂණ උපාධිධාරින්ගේ විශාල හිඟයක් තිබෙන බව. විශ්වවිද්‍යාලවලින් පිටවන අයගෙන් සියයට 17යි ගුරු වෘත්තියට එන්නට කැමති. ඒ සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේ නැහැ, අපි සංවර්ධනය පිණිස විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය යොදා ගැනීමට බලාපොරොත්තු වෙනවා නම් සහ ග්‍රාමීය ප්‍රදේශවල දක්ෂ දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනය මේ ක්ෂේත්‍රය තුළින් ලබා දෙන්නට බලාපොරොත්තු වෙනවා නම්.

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

අපි විද්‍යාගාර 1,000ක් හැදුවා. තාක්ෂණ පීඨ 200ක් හැදුවා. ඒවා සඳහා අවශ්‍ය වන්නා වූ මානව සම්පත ලබා දෙනවා විතරක් නොවෙයි, දැනුම යාවත්කාලීන කරමින් ඉදිරියට යන්නත් ඕනෑ. ඒ කටයුත්ත කිරීම සඳහා විද්‍යා, ගණිත, තාක්ෂණ උපාධිධාරී ගුරුවරුන් බිහි කරන්න ඕනෑ. එවැනි ගුරුවරුන් 5,000ක් බිහි කර ගැනීම සඳහා ඒ අයට බැංකු මඟින් ණය මුදලක් ලබා දෙනවා, පොලී රහිතව, යම් දිරිගැන්වීමක් වශයෙන්. ඒ පොලිය ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනය අය වැය ලේඛනයෙන් සකස් කරලා දීලා තිබෙනවා. ඒකත් ඉතාම සංවර්ධනාත්මක යෝජනාවක් හැටියට මම දකිනවා.

මේ අය වැය සකස් කිරීමේදී අරමුණු ගණනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එකක් තමයි, අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.7කට අඩුවෙන් පවත්වා ගැනීම. එය 4.6ක පවත්වා ගැනීමට යෝජනා කරලා තිබෙනවා. දේශීය විදේශීය ණය කළමනාකරණය, ජනතාවට පීඩනය අඩු කිරීම, සුබසාධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම, ඒ වාගේම ප්‍රතිපාදන ලබා ගත යුතු ක්ෂේත්‍ර පැහැදිලිව හඳුනාගෙන ලබාදීම, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම, ආයෝජකයන් දිරිගැන්වීම, විදේශ විනිමය වර්ධනය, ප්‍රාග්ධන යෙදවුම් සඳහා ප්‍රතිපාදන වෙන්කර දීම, ආර්ථික කළමනාකරණය සහ ජීවන වියදම් කළමනාකරණය සහ රැකියා නියුක්තිය කියන අනෙකුත් ප්‍රධාන අරමුණු ඔස්සේ තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තමයි අය වැයේ මේ යෝජනා ඉදිරිපත් වී තිබෙන්නේ. මේ යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී දැඩි මූල්‍ය විනයක් පවත්වා ගැනීමට සිදු වෙනවා. මා කියපු විධියට දේශීය හා විදේශීය අනපේක්ෂිත යම් යම් ආර්ථික උපනතීන් ඇතිවීම තුළ අපට යම් පුරෝකථනයක් මුලින්ම ඇති කර ගන්නට සිදුවෙනවා.

පාසල්වලට තවදුරටත් පරිගණක 50 බැගින් ලබා දීම සඳහා, ඒවා කුලී පදනම මත ලබා දීමට මුදල් වෙන් කර තිබෙනවා. දැන් කෙනෙකු අහන්නට පුළුවන්, පරිගණක පනහ ගණනේ පාසල් දහ දාහකට දෙනවා නම් පරිගණක පනහ බැගින් දහ දාහක් දෙන්න වෙනවා, එතකොට මිලියන පන්දහසකින් මේක කරන්නේ කොහොමද කියලා. එහි ඉතා පැහැදිලිව තිබෙනවා, "කුලී පදනම මත" කියලා. Hire purchasing ක්‍රමයට මිලියන 5000ක් ප්‍රමාණවත් වෙන්නට පුළුවන්, පාසල්වලට මේ පරිගණක ප්‍රමාණය ලබා දෙන්න. එයින් අපි කරන්නේ, තාක්ෂණය සහ දියුණු ලෝකය - [බාධා කිරීමක්] යන්න වෙනවා. ඒක අය වැය ලේඛනයේ සඳහන් වෙනවා. නැත්නම් කෙනෙකු තර්ක කරන්නට පුළුවන්, මිලියන 5000න් කොහොමද මෙච්චර පරිගණක ප්‍රමාණයක් දෙන්නේ කියලා. කොහොම වුණත් අපට අවශ්‍ය වන්නේ මෙයයි. කෙනෙකු ඒ වාගේ ප්‍රශ්නයක් අහන්න පුළුවන්. [බාධා කිරීමක්] සපත්තු අරගෙන දෙනතුරු කියලා, අපට පරිගණකය ලබාදෙන එක නවත්වාගෙන ඉන්න බැහැ. කෝටි 110ක ජනගහනයක් සිටින ඉන්දියාවේ සාක්ෂරතාව සියයට 62යි. හැබැයි ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශයකුත්, නාගරික ප්‍රදේශයකුත් ගත්තොත් විශාල පරතරයක් තිබෙනවා. ඒ නාගරික ප්‍රදේශවල සිටින උගත් පිරිස අපේ පරිගණක යෙදවුම් කරන අයට වඩා තව ඉස්සරහින් ඉන්නවා. ඒකට හේතුව මොකක්ද? ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දී තිබීමයි. [බාධා කිරීමක්]

මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දැන් මෙතැනත් කර තිබෙන්නේ අන්න ඒකයි. මම ඒ ගැන විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. නව උත්පාදන දිරිගැන්වීම සඳහා විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය කිරීමටත්, සමස්ත ආර්ථිකය ගැන සලකා බලා රටක් හැටියට ඒ සංවර්ධනය අනාගතයේ ඇති කිරීම සඳහා අවශ්‍ය පදනම සකස් කිරීම සම්බන්ධයෙනුත් මා ස්තුතිවන්ත වෙනවා. අපේ යෝජනා පිළිබඳව දක්වා තිබෙන සැලකිල්ල පිළිබඳවත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 2.40]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින මෙම ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේ ආසනවල කිසිවෙකුත් නැතිව සිටින අවස්ථාවක ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මෙම අය වැය ලේඛනය පිළිබඳව ප්‍රථමයෙන් වචන කිහිපයක් එකතු කරන්නට අවස්ථාව ලබා දීම ගැන මා ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය වෙනුවෙන් කථා කළ ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා ප්‍රාමාණිකව විෂයානුබද්ධ බුද්ධිමතෙක්, උගතෙක් වුණත්, ඉතාම වෛරී සහගත චේතනාවෙන් විවිධ අපහාස උපහාස තුළ පසු ගිය රජයට හා හිටපු ජනාධිපති, මහින්ද රාජපක්ෂ මැතිතුමාට පහර දීම සඳහා තමයි තමන්ගේ කථාව යොදා ගත්තේ. මීට පෙරත් එතුමා "සුනාමි හොරා" කියා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට කියන්නට ගිහින්, ඒ සම්බන්ධයෙන් අධිකරණයට ගිහිල්ලා අධිකරණය විසින් - මගේ දැනීමේ හැටියට ලක්ෂයක - දඩ මුදලක් ගෙවන්නට ඔහුට නියම කළා. එම නිසා එතුමාගේ ප්‍රකාශ පිළිබඳව ඒ තරම් සැලකිල්ලට ගන්නට අවශ්‍ය නැහැ කියලා මා හිතනවා.

සියලු දෙනාටම අමතක වෙලා තිබෙනවා, අපේ රටේ ඉතාම කුඩා රාජ්‍ය පාලන කාලයන් සමඟ මහින්ද රාජපක්ෂ යුගයට පෙර රාජ්‍ය පාලන කාල දහහතරක් තිබුණු බව. මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ සිට රාජ්‍ය පාලන කාල

දහහතරක් තුළදී මේ රටේ සිටි කිසිම රාජ්‍ය නායකයෙකුට ලංකාවේ විවිධ සංවර්ධන උපාය, උපක්‍රම ක්‍රියාත්මක කර, පස් අවුරුදු සැලැස්ම්වල් ක්‍රියාත්මක කර, දස අවුරුදු සැලැස්මවල් ක්‍රියාත්මක කර, විවෘත වෙළෙඳ පොළ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර, ආවෘත වෙළඳ පොළ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර, කිසිම දවසක ජාතියේ නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් බිලියන 25ට වඩා වැඩි කර ගන්නට බැරි වුණා. ඒක අපි සියලු දෙනා විසින්ම පිළිගත යුතු සත්‍යයක්. ලංකාවට නිදහස ලැබුණු දවසේ සිට මහින්ද රාජපක්ෂ යුගය එනතෙක් ඇමෙරිකානු ඩොලර් බිලියන 25ට වඩා වැඩියෙන් නිෂ්පාදනය වැඩි කර ගන්නට බැරි වුණා. 2009 වර්ෂයේ දී යුද්ධය නිම කළා. යුද්ධය නිම කළාට පස්සේ ලංකාව වේගවත් ආර්ථික පිම්මක් පැනලා, මේ රටේ ජාතික නිෂ්පාදනයේ මට්ටම බිලියන 80ට නැංවීමේ කාර්ය භාරය ඉෂ්ට කළ ජාතික නායකයා විධියට තමයි ඉතිහාසයේ මහින්ද රාජපක්ෂ නාමය සටහන් වෙන්නේ කියන එක මා මතක් කරන්නට ඕනෑ.

25ට තව 25ක් එකතු වුණාම තමයි, 50ක් වන්නේ. 50ට තව 25ක් එකතු වුණාම තමයි, 75ක් වන්නේ. 75ටත් වඩා වැඩි වෙලා 80 වෙලා තිබුණා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ 2015 වර්ෂය වනකොට ලංකාවේ ජාතික නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් බිලියන 82යි. ඒ අනුව ඇමෙරිකානු ඩොලර් බිලියන දෙකකින් විතරක් ජාතික නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. නිදහස ලැබුණු දවසේ සිට මේ රටේ ඒකපුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 1,000කට වඩා වැඩි කර ගන්න අපේ රටට අවුරුදු 56ක් ගතවෙලා තිබෙනවා. අපේ රට එවැනි තත්ත්වයක තිබුණු රටක්. 2014 වර්ෂයේ රට භාර දෙනකොට ඒකපුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000ට කිට්ටු කරන්න පුළුවන්කම ඇති කරපු යුගය ඇති කළේත් මහින්ද රාජපක්ෂ මැතිතුමාය කියන එක අපි මතක් කර ගන්න ඕනෑ. අන්තර්ජාතික වර්ගීකරණයේ දී ලංකාව දුප්පත් රටක් ලෙස තිබිලා මැදි ආදායම් ලබන රටක් බවට පත් කළා. 2015 වර්ෂයේදී අපේ ආණ්ඩුව බලයේ සිටියා නම්, මේ වනකොට ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත් වෙනවා. ඒක තමයි ඇත්ත.

ලෝක බැංකුව අග්‍රාමාත්‍යතුමාට පිළිගන්වපු වාර්තාවේ තිබෙනවා, ලංකාවේ දුප්පත්කම හරි අඩකින් අඩු කර ගත් මේ කලාපයේ තිබෙන එකම රට "අපේ රට" කියලා. ඒ අනුව දුප්පත්කම පිටුදැකීමේ කාර්ය භාරය ඉෂ්ට කළේ එම යුගයේදීය කියන එක පිළිබඳවත් එම වාර්තාවේ තිබෙනවා. මා ඉහතින් සඳහන් කළ කරුණු දෙකම පමණක් ඇති, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ නිෂ්පාදනය වැඩි කළා, ආදායම වැඩි කළා, විරැකියාව අඩු කළා, සේවා නියුක්තිය වැඩි කළා, ඉතුරුම් වැඩි කළා, ආයෝජනය වැඩි කළා, දුප්පත්කම අඩු කළා, රුපියලේ අගය ස්ථාවර කළා, විදේශ වත්කම් වැඩි කළා, ගෙවුම් ශේෂ අතිරික්තයක් ඇති කළා කියලා කියන්න. මේ සියල්ල කරලා ලංකා ඉතිහාසයේ තිබෙන ආර්ථික දර්ශක 20කට අනුව නිදහසින් පස්සේ පැවැති වැඩිම සමෘද්ධිමත් යුගය 2009-2014 කියලා මම ආර්ථික විද්‍යානුකූලව ඔප්පු කරලා "ආර්ථික අපගමනය" කියලා පොතක් ලියලා තිබෙනවා. ඒ පොත මම තමුන්නාන්සේලා සහ මේ රටේ ජනතාව වෙනුවෙන් **සභාගත*** කරනවා.

මම අභියෝගයක් කරනවා. මේ ආර්ථික දර්ශක 20 අනුව නිදහසින් පස්සේ ලංකා ඉතිහාසයේ දීප්තිමත්ම, සංවර්ධිතම ස්වර්ණමය යුගය 2009-2014 නොවෙයි කියලා ආර්ථික විද්‍යාමය සංඛ්‍යා දත්ත හා ප්‍රස්තාර ඇතුව ඔප්පු කිරීම සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු හෝ මහාචාර්යවරයෙකු හෝ කවුරු හෝ පොතක් ලිව්වොත්, ඒ ලියන පොත ඒකාබද්ධ විපක්ෂය විසින් අපේ පෞද්ගලික මුදලින් මුද්‍රණය කරලා රට පුරා බෙදා හරිනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඊළඟට, මේ අය වැය ලේඛනයෙන් කර තිබෙන්නේ මොකක්ද? මේ අය වැය ලේඛනයෙන් කර තිබෙන්නේ මේකයි. තමුන්නාන්සේලා රට භාර ගත්තා. අපි ඔප්පු කරලා තිබෙනවා, 2015 වර්ෂයේදී රටේ ආර්ථික වර්ධන වේගය අඩු වුණා, ඒකපුද්ගල ආදායම වැඩි වීමේ වේගය අඩු වුණා, ඉතිරි කිරීම් අඩු වුණා, ආයෝජනය අඩු වුණා, විදේශ ආයෝජන අඩු වුණා, විදේශ සංචිත කඩාගෙන වැටුණා, රුපියල දිගින් දිගටම අවප්‍රමාණය වුණා, ගෙවුම් ශේෂ අර්බුදයක් ඇති වුණා කියලා. ඒ අනුව තමුන්නාන්සේලාට සිද්ධ වුණා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා මේ ගෙවුම් ශේෂ අර්බුදයට මුහුණ දීම සඳහා අවුරුදු 3ක් ඇතුළත වාරික 6කින් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක් ණය වශයෙන් ගන්න.

මුදල් ඇමතිවරයා කවුරු වුණත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ ණය පහසුකම දෙනකොට ප්‍රධාන කොන්දේසි 4ක් නියම කර තිබෙනවා. එම කොන්දේසි 4 තමයි, පළමුවැනි එක, රජයේ ආදායම හැකි තාක් වැඩි කරන්න ඕනෑ කියන එක. රජයේ වියදම් -විශේෂයෙන් පුනරාවර්තන වියදම්- කපන්න ඕනෑ, 2020 වනකොට අය වැය පරතරය සියයට 3ට අඩු කරන්න ඕනෑ, මුදලේ අගය තීරණය වීම නිදහසේ වෙන්න ඉඩ හරින්න ඕනෑ, ඒ සඳහා මැදිහත් නොවිය යුතුයි කියන මේවා තමයි එම කොන්දේසි. මේ කොන්දේසි හතර මුදල් අමාත්‍යවරයා හරියට ඉෂ්ට කර තිබෙනවාද, නැද්ද කියන එක බලන්න, මේ මාසයේ 17වැනි දා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත කණ්ඩායම එනවා. එම නියෝජිත කණ්ඩායමට මේ අය වැය ලේඛනය පෙන්වා මුදල් ඇමතිවරයා කියන්න ඕනෑ, "මෙන්න මෙහෙමයි රජයේ ආදායම වැඩි කළේ, මෙහෙමයි වියදම අඩු කළේ, අය වැය පරතරය අඩු කරන්නේ මෙහෙමයි" කියලා. ඒක එතුමා ඔප්පු කරන්න ඕනෑ. ඒක ඔප්පු කරන්න ඕනෑ නිසා තමයි මේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේදී, ගිය අවුරුද්දේ අධ්‍යාපනයට බිලියන 250ක් වෙන් කළ එක මේ අවුරුද්දේ බිලියන 175කින් - රුපියල් කෝටි 17,500කින් - අඩු කරලා -අධ්‍යාපන වියදම කපලා- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පෙන්වීමට කටයුතු කර තිබෙන්නේ. දරුවන්ට laptops දෙනවා, tabs දෙනවා, ටොෆි දෙනවා, බුල්ටෝ දෙනවා කියන මේ ඔක්කෝම කථා කියන්නේ මේ කාරණය වසාගැනීම සඳහායි. මෙය බොහොම පැහැදිලි සත්‍යයක්. මොකද, ගිය අවුරුද්දේ විසර්ජන පනත් කෙටුම්පතෙන් අධ්‍යාපනයට බිලියන 250ක් වෙන් කරනවා කියලා මේ අවුරුද්දේ ඒ ප්‍රමාණය විශාල වශයෙන් - බිලියන 175කින්- අඩු කළාම ඇතිවන ඒ දෝෂාරෝපණය, ඇති වන ඒ රාජ්‍ය විරෝධය මැඩපැවැත්වීම සඳහා වෙන වචන ටිකක් කියනවා. ගිය අවුරුද්දෙත් එහෙම කිව්වා. ගිය අවුරුද්දේ කිව්වා, digital smart classrooms දහස් ගණනක් ඇති කරනවා කියලා. එහෙම ඇති කරපු classroom එකක්වත් ලංකාවේ නැහැ.

ඊළඟට, තමුන්නාන්සේලා කළේ මොකක්ද? බදු ආදායම වැඩි කරලා තිබෙනවා. 2014 අපේ රජය සමයේ රජයේ ආදායම රුපියල් බිලියන 1,205යි. මේ අවුරුද්දේ එය රුපියල් බිලියන 2,020ට වැඩි කරලා තිබෙනවා. ඒ අනුව සියයට 67.6කින් රජයේ ආදායම වැඩි කරලා තිබෙනවා. රජයේ ආදායම වැඩි කරනකොට ඒ සඳහා බදු තමයි ප්‍රධාන වශයෙන් පාවිච්චි කරන්නේ; විශේෂයෙන් වක්‍ර බදු; "වැට්" එක ඇතුළු අනෙකුත් බදු. මහින්ද රාජපක්ෂ යුගයේ බදු ආදායම රුපියල් බිලියන 1,050යි. දැන් බදු

---

** **ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ආදායම රුපියල් බිලියන 1,821යි. මේ අය වැය ලේඛනය එනකොට තමුන්නාන්සේලාගේ රජය යටතේ විතරක් සියයට 73කින් බදු ආදායම වැඩි කරලා තිබෙනවා.

මහින්ද රාජපක්ෂ යුගයේදී ලංකාවේ එක පුද්ගලයෙකු මත බදු බර පැටවිලා තිබුණේ රුපියල් 50,000යි. දැන් වෙනකොට එක පුද්ගලයෙකු මත බදු බර රුපියල් 86,714ක් පැටවිලා තිබෙනවා. ඒ අනුව, මේ කාලපරිච්ඡේදය තුළදී ලාංකීය සෑම පුරවැසියෙක් මතම පැනවෙන බදු ප්‍රමාණය සාමාන්‍යයෙන් රුපියල් 36,714කින් වැඩි කරලා තිබෙනවා.

ඊළඟට, රජයේ වියදම ගත්තොත්, මුළු වියදම රුපියල් බිලියන 1,796 සිට 2,645ට සියයට 47.2කින් වැඩි වෙනවා. පුනරාවර්තන වියදම් 1,323 සිට 1,946ට සියයට 47කින් වැඩි වෙනවා. එතකොට මේ වැඩිවෙලා තිබෙන්නේ එදිනෙදා පවත්වාගෙන යාමේදී දරනු ලබන, දරන වියදමේ ප්‍රතිඵලය වියදම දරන කාලයට පමණක් සීමාවෙන, නැවත නැවතත් දැරිය යුතු ස්වරූපයේ වැටුප් හා වේතන, සුබසාධන වියදම්. ප්‍රාග්ධන වියදම වැඩි වෙලා තිබෙන්නේ දශම දෙකකින් විතරයි. තමුන්නාන්සේලාගේ මුළු කාලපරිච්ඡේදය තුළදී සියයට 47.2කින් මුළු වියදම් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. පුනරාවර්තන වියදම් තමයි සියයට 47කින් වැඩි වෙලා තිබෙන්නේ. නමුත් ලංකාව ඉස්සරහට ගෙනයන්න අවශ්‍ය වන ප්‍රාග්ධන වියදම දශම දෙකකින් තමයි වැඩි වෙලා තිබෙන්නේ. ඉතින් රටක ප්‍රාග්ධන වියදම් වැඩි කරන්නේ නැත්නම් ඒ රට ඉස්සරහට ගෙන යාම සඳහා කරන්න පුළුවන් දෙයක් ආණ්ඩුවට නැහැ. වියදම් ටික බෙදුවොත් අපේ කාලයේදී ඒකපුද්ගල වියදම රුපියල් 63,000යි. තමුන්නාන්සේලාගේ කාලය වෙනකොට ඒකපුද්ගල වියදම රුපියල් 92,666යි. ඒ අනුව, ඒකපුද්ගල වියදම රුපියල් 29,666කින් වැඩිවෙලා තිබෙනවා. දැන් ප්‍රශ්නය මේකයි. එක පුද්ගලයෙකුගේ ආදායම රාජ්‍ය ආදායම තුළ රුපියල් 36,714කින් වැඩි කරගෙන තිබෙනවා. හැබැයි, එක පුද්ගලයෙකු වෙනුවෙන් වියදම් කරලා තිබෙන්නේ රුපියල් 29,666යි. රුපියල් 36,714ක් මිනිසුන්ගෙන් බදු වශයෙන් එකතු කරගෙන ඒ අයට දීලා තිබෙන්නේ රුපියල් 29,666යි. දස දහසක් විතර කොහේ ගියාද කියා දන්නේ නැහැ. මේ නිසා වියදම වැඩිවීමේ වේගයට වඩා පුද්ගලයන්ගේ බදු බර රුපියල් 36,714කින් වැඩි කරලා තිබෙනවා. වියදම වැඩි වෙලා තිබෙන්නේ රුපියල් 29,666කිනුයි.

ඊළඟට, ඉතාම වැදගත් දෙයක් මේ මුදල් ඇමතිතුමා කළා. පළමුවෙනි වතාවට මුදල් අමාත්‍යවරයාට මේ සභාවේදී ඒකාබද්ධ විපක්ෂයට ස්තුතියක් පළ කරන්න ලැබීම ගැන අපි බෙහෙවින් සතුටු වෙනවා. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මක්නිසාද යත් එතුමා පටන් ගත් දවසේ සිට කට ඇරපු හැම මොහොතකම කිව්වේ, "මහින්ද රාජපක්ෂ ණය වෙලා, ණය වෙලා ඒ ණයයි, වාරිකයි ගෙවා ගන්න බැහැ; ඒ ණය නිසා තමයි මේ ඔක්කෝම කරන්නේ" කියලා. "වැට්" එකට එතුමා වෙනම නමක් දැම්මා. මේක "රාජපක්ෂ බද්ද" කියලා. හේතුව තමයි, "රාජපක්ෂ, ණය අරගෙන ගෙවන්න බැරි නිසායි මේ බද්ද පනවන්නේ. අපට මේක ගෙවා ගන්න විධියක් නැත්තටම නැතිවීම නිසායි වෙන්නේ" කියන කොට, මෙවර අය වැය ලේඛනය හඳුන අවස්ථාවේදී මුදල් අමාත්‍යවරයා නිරන්තරයෙන් කියන මේ ප්‍රකාශය අහලා වෙන්න ඇති, මුදල් අමාත්‍යාංශයේ ඉතාම වැදගත්, උගත් නිලධාරි මහත්වරු, තමුන්නාන්සේලා අතට පත් කරලා තිබෙන අය වැය කථාවේ ඉතාම වැදගත් ප්‍රස්තාර කිහිපයක් ඉතා විචිත්‍රවත් ලෙස මුද්‍රණය කරලා තිබෙනවා. එහෙම මුද්‍රණය කරලා මොකක්ද කියන්නේ?

තමුන්නාන්සේලා කිව්වා, "මේ ණය සහ වාරිකයන්ට -ණය සේවාකරණයට- රජයේ ආදායම ප්‍රමාණවත් නැහැ. ඒක නිසා තමයි "වැට්" පනවන්නේ. ඒක නිසා තමයි බදු අය කරන්නේ. මේක රාජපක්ෂ යුගයේ වැඩක්" කියා. මෙවර අය වැය කථාවේ 104වැනි පිටුව පෙරළා බලන්න. එහි බොහොම පැහැදිලිව ප්‍රස්තාරයෙන් කියනවා, ආණ්ඩුවට ආදායමට වඩා වැඩියෙන් ණය වාරිකයි පොලියයි ගෙවන්න වෙලා තිබෙන්නේ 2009, 2010, 2011, 2012, 2013 කියන මහින්ද රාජපක්ෂ යුගවලයි කියා. හැබැයි, "2014, 2015, 2016, 2017 කිසිම ප්‍රශ්නයක් නැතිව රජයේ ආදායම වැඩියි. ගෙවන්න ඕනෑ ණය වාරිකයි, පොලියයි අඩුයි" කියලා පළමුවැනි වතාවට මුදල් අමාත්‍යවරයා මේ ගරු සභාවේදී ප්‍රස්තාර සටහන් සහිතව පිළිගත්තාය කියන එක මේ අවස්ථාවේදී මම මේ ගරු සභාවට දැනුම් දෙනවා.

එහි පිටු අංක 113හි තව ප්‍රස්තාරයක් තිබෙනවා. ඒක පෙරළලා බලන්න. එහි තිබෙනවා, 2009 අය වැය පරතරය සියයට 9.9යි. ජාතියේ ණය බර -ණය අනුපාතය- සියයට 86.2යි කියලා. 2014 මහින්ද රාජපක්ෂ යුගයේ මේ අය වැය පරතරය සියයට 5.7 දක්වා අඩු කර ගන්නවා. එතකොට ජාතියේ ණය බර 71.8යි. 2015දී නැවතත් තමුන්නාන්සේලා සියයට 7.4 දක්වා අය වැය පරතරය වැඩි කරනවා. එහි ප්‍රතිඵලය වෙන්නේ, ජාතියේ ණය බර සියයට 76 දක්වා වැඩිවීම. ණය බර සියයට 71.8 ඉඳලා සියයට 76.8 දක්වා වැඩි කර ගත්තේ තමුන්නාන්සේලාය කියන එක, 113වැනි පිටුවේ ප්‍රස්තාරයෙන් ඔප්පු කරලා පෙන්වනවා.

ඊළඟට, පිටු අංක 114 බලන්න. එහි දැක්වෙනවා, ණය මට්ටමේ වෙනස්වීම. 2014දී, අපේ ආණ්ඩුව යටතේ ණය මට්ටම රුපියල් බිලියන 598යි. 2015දී ණය මට්ටම රුපියල් බිලියන 1,112යි. ප්‍රස්තාරයේ 114වැනි පිටුව අනුව, නිදහසෙන් පස්සේ ලංකා ඉතිහාසයේ ණය මට්ටම දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි කරපු එකම මුදල් ඇමතිවරයා විධියට වාර්තාවක් තියලා තිබෙනවා, රවි කරුණානායක මහත්මයා. ඒක දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් විධියටත් කියනවා. 2001දී දළ දේශීය නිෂ්පාදනයේ ණය මට්ටම සියයට 16.6යි. 2014දී සියයට 5.7 දක්වා ඒ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. 2015දී සියයට 9.9 දක්වා නැවත වැඩි වෙලා තිබෙනවා. එය ප්‍රස්තාරයේ 114වැනි පිටුවේ දැක්වෙනවා.

ඉන් පසුව මම නැවතත් ප්‍රස්තාරයක් කියවනවා. අවුරුදු පහෙන් පහට ලංකාවේ රාජ්‍ය ණය වර්ධනයවීම පිළිබඳ වෙනම දත්ත, ප්‍රස්තාර සටහනක් මෙවර අය වැය ලේඛනයේ 115වැනි පිටුවේ තිබෙනවා. 1950-1955 නිදහස ලැබෙන කාලයේ අපේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ණය වැඩිවීමේ වේගය සියයට 12.6යි. 1977 වර්ෂයේ විවෘත ආර්ථිකය හඳුන්වලා දුන්නා. 1976 ඉඳලා 1980 දක්වා සියයට 29.2කින් ණය වර්ධනය වෙලා තිබෙනවා. 2006 ඉඳලා 2010 දක්වා ණය වර්ධන වේගය සියයට 15.6යි. ඒ කාලයේ යුද්ධය තිබුණා. පසුව යුද්ධය නිම වෙනවා. 2011 ඉඳලා 2015 දක්වා ණය වර්ධන වේගය සියයට 13.2යි. එහෙමනම්, නිදහසෙන් පස්සේ ඉතාම කාර්යක්ෂම ණය පාලනයක් මහින්ද රාජපක්ෂ යුගයේ තිබුණාය කියන කාරණය මේ සංඛ්‍යාවලින් තමුන්නාන්සේලාගේ මුදල් ඇමතිවරයා මේ පාර්ලිමේන්තුවට කියලා තිබෙනවා. මේ ණය කතන්දරය බැලුවාම, දැන් බිල්ලෙක් මවා ගෙන, රාජ්‍ය ආයතන තුන්සිය හැටපස් දවසේම පත්තර පිටු ගණන් දමමින් කිව්වේ, "මේ මහින්ද රාජපක්ෂගේ ණය. මහින්ද රාජපක්ෂ තමයි මේ ණය අර්බුදය ඇති කළේ. ණය උගුල. මේකෙන් ගැලවෙන්න බැහැ" කියා. මේ ප්‍රස්තාර ටික ගහපු, ඒ හොඳ නිලධාරි මහත්වරුන් මට හම්බ වුණා නම්, මේ කරලා තිබෙන සේවයට මම බිත්තියට හේත්තු කරලා උම්මා එකක් දෙනවා. මොකද, මේ උත්තරීතර සභාවට ඉතාම නිවැරැදිව ගලේ කෙටුව අකුරු වාගේ රාජ්‍ය ණය ප්‍රශ්නය පිළිබඳව

සඳහන් කරලා තිබෙන නිසා. "මහින්ද රාජපක්ෂ ඉතාමත් කාර්යක්ෂම ලෙස ජනතාවට හා රටට වාසිදායක ලෙස ණය කළමනාකරණය කළා" කියලා ඔප්පු කරලා ප්‍රස්තාර සටහන් සහිතව මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතිහාසය නිවැරැදි කිරීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ නිලධාරී මහත්වරුන්ට මගේ කෘතඥතාව පුද කරනවා.

2014 වර්ෂයේදී අපේ රටේ ණය තිබුණේ, රුපියල් බිලියන 7,391යි. 2016 වර්ෂයේ එම ණය ප්‍රමාණය, රුපියල් බිලියන 9,923ට වැඩි වෙලා තිබෙනවා. එය සියයට 29ක වැඩි වීමක්. සජිත් ප්‍රේමදාස මහත්තයා හැම වෙලාවේම ඒක පුද්ගල ණය බර ගැන කියනවා. ඒක පුද්ගල ණය බර ප්‍රමාණය අපේ කාලයේ තිබිලා තිබෙන්නේ, රුපියල් 351,952යි. දැන් එය රුපියල් 453,476යි. මේ යහපාලනය යටතේ ලංකාවේ සෑම පුරවැසියෙකුගේම ඒක පුද්ගල ණය බර ප්‍රමාණය රුපියල් 101,524කින් වැඩි කරලා තිබෙනවා. ඒ, මේ පොඩි කාලයට විතරක්. පොඩි කාලයට විතරක් රුපියල් ලක්ෂයකට වඩා ණය බර වැඩි කරලා තිබෙනවා. හම්බන්තොට පැත්තේ ගිහිල්ලා ඒ ගැනත් කියනවා නම් හොඳයි. "අපි ඇවිල්ලා පුංචිම පුංචි කාලයක් ඇතුළතදී, තමුන්නාන්සේලාට තිබෙන ණය බර ලක්ෂයකින් උස්සලා දීපු එකම කට්ටිය අපි විතරයි" කියන එකත් එතුමාට කියන්න කියලා මා අභියෝග කරනවා. මේ සියල්ල තමුන්නාන්සේලාගේ පොතෙන් තමයි අරගෙන තිබෙන්නේ. මෙච්චර මොකක්ද කළේ? මේ ආදායම වැඩි කරන එක ඕනෑම කුඩා දරුවෙකුට වුණත් කරන්න පුළුවන්. මේ මුදල් ඇමතිතුමා කළේ පුංචි දරුවෙකු බයිසිකලයක් පදිනවා වාගේ එහාටයි මෙහාටයි, කිසිම අරමුණක්, ඉලක්කයක් නැතුව යන තැනකට ගියාදෙන් කියලා පැද්දි පැද්දී හිටපු එකයි.

සේවක අර්ථ සාධක අරමුදලේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ආදායම සහ ලාභ මත මෙච්චර කල් අය කරපු බද්ද සියයට 10යි. සේවකයන් සතුව තිබෙන සම්පතක් වන සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල මත මෙච්චර කල් අය කරපු බද්ද වන සියයට 10 සියයට 14 දක්වා වැඩි කරලා තිබෙනවා. ලංකාවේ අසරණ මිනිස්සුන්ගේ ස්වශක්තිය මත ගොඩ නැඟුණු ස්වේච්ඡා සංවිධානයක් වුණු සමුපකාර ව්‍යාපාරයෙන් කවදාවත් බදු අය කළේ නැහැ. මහින්ද රාජපක්ෂ යුගයේ ණය කැපුවා. Co-op cities දහස් ගණනක් හැදුවා. Mini Co-op Cities දහස් ගණනක් හැදුවා. හැම අය වැය ලේඛනයකින්ම සමුපකාර ව්‍යාපාරයට විශාලම මුදලක් වෙන් කරපු එකම ආණ්ඩුව මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විතරයි. තමුන්නාන්සේලා කළේ මොකක්ද? සමුපකාරයෙන් ජාතිය ගොඩ නැඟීමේ බද්ද නිදහස් කිරීම ඉවත් කළා. ඒ විතරක් නොවෙයි.

මේ රටේ සතොස කියන කොට ප්‍රසිද්ධ label එකක් තිබෙනවා. සතොස කැවේ කවුද කියලා පොඩි ළමයෙකුගෙන් ඇහුවාම උත්තරයක් තිබෙනවා. මම වෙළෙඳ ඇමති වෙන කොට එහෙම කාලා තිබුණු සතොසට අයිතිව ලක් සතොස 20ක් තිබුණා. මම ඒක 200ට වැඩි කළා. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා ඒක ඊට වඩා තව වැඩි කළා. මේ වැඩි කරපු සතොස ගැන වෙනම විස්තරයක් ගහලා බඩු ඔක්කෝම අඩු මිලට දෙන්නේ "ලක් සතොස" කියලා වෙනම පිටුවක් අච්චු ගහලා ප්‍රචාරය කළා. ඊට අතිරේකව මෙතෙක් කල් හැම දාම ලක් සතොස ජාතිය ගොඩ නැඟීමේ බදුවලින් නිදහස් කරලා තිබුණා. මේ වතාවේ සිට සතොසත් බද්දට යටත් කරලා තිබෙනවා. ආණ්ඩුවේ ලක් සතොසත් යටත් කරලා තිබෙනවා. සමුපකාරයත් යටත් කරලා තිබෙනවා. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමේ සහෝදර මන්ත්‍රීවරුන්ට කියනවා, එතුමන්ලා මේ අය වැය හදන්න හවුල් වුණා කියලා කියන නිසා මේක වහාම ඉවත් කර ගන්න කියලා.

සීනි මිල අඩු කරලා තිබෙනවා. සීනි කිලෝවක බද්ද රුපියල් 7ට වැඩි කරලා තිබෙනවා. කලින් තිබුණු බද්ද ශත 25ට අඩු කළා. ඒ විධියට බදු ගහලා ගෙන්වපු සීනි තව අවුරුදු දෙකකට විතර ගොඩ ගහලා තිබෙනවා. එහෙම ගොඩ ගහලා තිබෙන කොට සීනි බද්ද වැඩි කරනවා, රුපියල් 7කින්. මේ අය වැය පහු වෙන කල් විතරයි, මේ මිල හදලා තිබෙන්නේ. සීනි මිල රුපියල් දෙකකින් අඩු කළා කියලා කියනවා. ඒක පුදුම වැඩක්. බද්ද හතකින් වැඩි කරලා, සීනි මිල අඩු වෙනවා. එහෙම නම්, ඕනෑ තරම් බදු දාන්න පුළුවන්. ගිය මාසයේ ලෝක වෙළෙඳ පොළේ ගෑස් -මෙට්‍රික් ටොන් එකක- මිල ඩොලර් 64කින් වැඩි වුණා.

ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල ඩොලර් 64කින් වැඩි වන කොට ලංකාවේ ගෑස් මිල රුපියල් 25කින් අඩු කරනවා. එතකොට ගෑස් ගෙනෙන්නේ කවුද? ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල ඩොලර් 64කින් වැඩි වුණාම මෙහේ ගෑස් මිල රුපියල් 25කින් අඩු වෙනවා. එහෙනම් අනික් ඒවායේත් මිල ඒ විධියට අඩු වෙන්න ඕනෑ. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අසාමාන්‍ය ලෙස අඩු වෙලා; යකඩ මිල අසාමාන්‍ය ලෙස අඩුවෙලා; සිමෙන්ති මිල අසාමාන්‍ය ලෙස අඩුවෙලා; ඇලුමිනියම් මිල අඩු වෙලා; සියලුම ආහාර ද්‍රව්‍යවල වාගේම සියලුම වෙළෙඳ ද්‍රව්‍යවල මිල අඩුවෙලා. සංවර්ධිත රටවල මේ දවස්වල උද්ධමන අනුපාතය අඩුයි. මේ වාගේ වාසිදායක තත්ත්වයක් ලංකා ඉතිහාසයේ කිසිම ආණ්ඩුවකට තිබිලා නැහැ. තෙල් ගෙන්වන්න විතරක් ගිය මුදල් දිහා බැලුවාම පෙනෙනවා, මේ අවුරුදු දෙකට විතරක් බිලියන හතරකට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් අපේ රටේ ඉතුරු වෙලා තිබෙන බව. අපි IMF එකෙන් අවුරුදු තුනකට ණය ගන්නේ දහසක් කොන්දේසි යටතේ බිලියන 1.5යි. ඕනෑම ආණ්ඩුවකට තෙල් ගෙන්වන්න රටින් පිටට ගිය මුදල් වශයෙන් බිලියන 4කට වඩා වැඩි ප්‍රමාණයක් රට ඇතුළේ ඉතුරුවෙලා තිබෙනවා. මෙච්චර තෙල් මිල අඩුවෙලා තිබියදී ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ පාඩුව අපේ කාලයට වඩා වැඩිවෙලා තිබෙනවා. දැන් තෙල් මිල අඩුවෙලා, සල්ලි ඉතුරුවෙලා, පාඩුව විතරක් වැඩිවෙලා. මොකද එහෙම වුණේ කියන එක ගැන අපේ පැත්තෙන් ගිය මහත්තයා පැහැදිලි කරාවි කියලා මම හිතනවා.

ඊළඟට, කාබන් බද්දක් එනවා. ඔක්කොම ඩිජිටල් කරනවා කියලා කිව්වා. Wi-Fi දෙනවාය කියලා කිව්වා. අන්තර්ජාලය සඳහා සියයට 25ක බද්දක් පනවනවා. විදුලි සංදේශ බද්දට අතිරේකව "වැට්" එකක් පනවලා SIM card එකක් සක්‍රියකරණය කරන්න රුපියල් 200ක බද්දක් ගන්නවා. මේ අය කරන බදු අනුව මිනිසුන්ට දුරකථන විසි කරන්න සිදු වෙනවා. අසරණ මනුස්සයෙක් සිහින ලෝකයේ ප්‍රාර්ථනා සහිතව ලොතරැයි ටිකට් පතක් මිලදී ගන්නකොට ආණ්ඩුව ඒකට රුපියල් පහක බද්දක් අය කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මම විනාඩි තුනකින් මගේ කථාව අවසන් කරනවා. [බාධා කිරීමක්] ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමාට ලැබී තිබෙන විනාඩි ප්‍රමාණය මට ගලපලා ලබා දෙන්න.

වතුර බෝතලයකට අසාමාන්‍ය බද්දක් අය කරලා, පිට රටින් ගෙන්වන beer can එකකට රුපියල් 10ක බද්දක් අය කරනවා. "මතට තිත". දැන් මුදල් අමාත්‍යවරයාට විරුද්ධව නඩු දාලා තිබෙනවා. ඊට හේතුව මෙයයි. බියගම පිහිටලා තිබෙන

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

යාළුවන්ගේ බියර් සමාගම ගංවතුරට යට වුණා කියලා බදු සහන අසාමාන්‍ය ප්‍රමාණයක් සහිතව, නොයෙල් සෙල්වනායගම්ලාගේ සමාගමට -යාළුවන්ගේ සමාගමට- beer cans තොග වශයෙන් ගෙන්වන්න ඉඩ දීලා තිබෙනවා. රාජ්‍ය අය භාරයට කෝටි 600කට වඩා පාඩු වුණා කියලා මේ මුදල් අමාත්‍යවරයාට විරුද්ධව මේ රටේ බදු ගෙවන ජනතාව අධිකරණයේ නඩු පවරලා තිබෙනවා. Beer cans ගංවතුරට අහුවෙලා. ආයුධ ඉවත් කරන්න ගිහිල්ලා සාලාව යුද හමුදා කඳවුරේ බෝම්බ පිපිරීමක් සිදු වුණා. තවම ඒ සාලාව යුද හමුදා කඳවුර ගොඩ නඟන්න බැරි වුණා. කැලණි මිටියාවතේ ගංවතුරට අහු වුණු මිනිසුන්ට ආධාර ටික දෙන්න බැරි වුණා. හැබැයි, beer company එකට කෝටි 600ක් පාඩු විඳගෙන නොයෙල් සෙල්වනායගම්ලාට beer ගෙන්වන්න ඉඩ දෙන්න පුළුවන්කම තිබෙනවා. [බාධා කිරීමක්] උසාවියෙන්ද?

**ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)
කැබිනට් එකෙන් දුන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කවදා ඉඳලාද?

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
දැන් සති දෙකක් වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගණන හොයලා ඉවරයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
උසාවියේ නඩු අහනකොට ගණන හොයලා ඉවරයි. Beer can එකකට රුපියල් 10යි. වතුරවලට අය කරන බද්ද ඊට වඩා වැඩියි. දැන් යම්කිසි කරදරයක් වුණොත් යුක්තිය පසිඳලීම සඳහා උසාවියකට යන්නත් බැහැ. නඩු ගොනු කිරීම සඳහා වන බදුවලින් බිලියන 7.5ක ආදායමක් ලබා ගන්න බලාපොරොත්තු වනවා. ගුවන් තොටු පොළෙන්, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමාගේ වේලාවෙන් කොච්චර ඕනෑද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
විනාඩි 20යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට විනාඩි 18ක් ලැබී තිබෙනවා. ඔබතුමාට ඒ විනාඩි 18ම ලබා දෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ජීවත් වීම සඳහා ජීවිතයත් සමඟ අරගළයක යෙදෙන හැම කෙනෙකුම මැද පෙරදිග ඇතුළු විදේශ රටවල රක්ෂා සොයාගෙන තමන්ගේ රටින් පිටට යනකොට ගෙවන ප්‍රමාණයට ඩොලර් 50ක් - රුපියල් 7,500ක් - දක්වා බද්ද වැඩි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භාණ්ඩාගාර බිල්පත් බැඳුම්කරවලට "මතිමාත්‍ර බදු" නමින් අමුතුම බද්දක් ගෙනැල්ලා තිබෙනවා. මම මෙය ඇහුවෙත් පළමුවෙනි වතාවටයි. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළේ ගනු-දෙනු කරන අයටත්, රජයට ණය සපයන කොටත් මතිමාත්‍ර බදු වැඩි කරලා තිබෙනවා. ආර්ථික සේවා ගාස්තු අය කරන ප්‍රමාණය කාර්තුවකට රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 12.5 දක්වා මේ බදු ප්‍රමාණය අඩු කරලා තිබෙනවා.

තමුන්නාසේලාගේ කාලයේ ප්‍රධාන වශයෙන් මේ පොලියේ ඇති වන වෙනසත් සමඟ රටට වුණු විනාශය හා විපත සමස්ත ලාංකීය ජනතාවගේ බොක්කට පමණක් නොව, ඊට වඩා පහළින් තිබෙන උණ්ඩුකපුච්චයටත් දැනෙනවා. මොකද, කනකර උකස් තියන මනුෂ්‍යයෙක්, ගෙයක් හදා ගන්න ණය ගන්න කෙනෙක්, එදිනෙදා අතමාරුවක් කර ගන්න කෙනෙක් පොලියට ණය ගන්නවා. මේ පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරලායි තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙම අවස්ථාවේදී රාජ්‍ය මූල්‍ය කළමනාකර වාර්තාවෙන් කොටසක් කියවන්න කැමැතියි. දින 364ක භාණ්ඩාගාර බිල්පත්වල පොලී අනුපාතය 2014 වසරේදී සියයට 6.05යි; දැන්, සියයට 10.24යි. අවුරුදු 5ක භාණ්ඩාගාර බැඳුම්කරවල පොලී අනුපාතය සියයට 8යි; දැන්, සියයට 12.7යි. සමස්ත පොලිය සියයට 50යි, සියයට 66යි අතර ප්‍රමාණයකින් වැඩි වුණා. හේතුව නම්, මහ දවල් මහ බැංකුවේ මහා මුදල් මංකොල්ලය අවස්ථාවේදී සියයට 8ට, සියයට 9ට තිබුණ පොලී අනුපාතය බැඳුම්කර වංචාවෙන් පසු සියයට 10 තෙක් ඉහළ ගියා. මේ අලාභය තක්සේරු කරන්න බැරි තරම් විශාල අලාභයක්. සමස්ත මූල්‍ය ක්‍රමයේ මුදුන් මල් කඩ වන ශ්‍රී ලංකා මහ බැංකුවට බෝම්බ ගැහුවාට පසුව, ගොඩගන්න බැරි විධියට සිදු වුණු දරුණුම බෝම්බ ප්‍රහාරය තමයි මේ එල්ල කළේ.

2013 වසරේදී, අර්ජුන මහේන්ද්‍රන්ගේ බෑනනුවන්ගේ සමාගම පටන් ගත්තේ රුපියල් මිලියන 300කින්. 2014 වර්ෂයේදී, කොටස් වෙළෙඳ පොළෙහි ආයෝජනය කරලා තිබෙන්නේ සියයට 1යි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තරයෙන් හොයපු වාර්තාවට අනුව, ආණ්ඩුවට අවුරුදු 30කට ණය දුන්නේ, රුපියල් කෝටි 1,000යි. මාස 14ට ලබපු ලාභය පමණක් රුපියල් කෝටි 1,000ට වඩා වැඩියි. මෙවැනි දෙයක් සිදු වුණා කියලා මුළු ලෝකයටම තේරෙනවා; මුළු ලෝකයම දන්නවා. කවුරු මේක නොදන්නවා වුණත් 'කෝප්' වාර්තාව කියන්න කලින්, වෙනත් වාර්තා කියන්න කලින් මුළු ලංකාවේම, ජාත්‍යන්තරයේ ඉන්නා සියලුම ගනු-දෙනුකරුවන් -කොටස් වෙළෙඳ පොළේ, මුදල් වෙළෙඳ පොළේ, ප්‍රාග්ධන වෙළෙඳ පොළේ සියලුම ගනු-දෙනුකරුවන්- දන්නවා, system එකක් හැටියටම මෙහි පොලී අනුපාතය හදිසියේ ඉහළ ගියා කියලා. ප්‍රතිඵලය මොකක්ද? ලංකාවේ රජයේ සුරැකුම්පත්වල හා භාණ්ඩාගාර බිල්පත්වල විදේශිකයන් යොදවලා තිබුණ මුදල් ඇමෙරිකානු ඩොලර් බිලියන 2කට වඩා වැඩියෙන් පිට රටට අරගෙන ගියා. ඇමෙරිකානු ඩොලර් බිලියන 2කටත් වැඩිය! කල්පනා කරලා බලන්න. IMF එකෙන් මේ කොන්දේසි යටතේ ණය ගන්නේ සියයට 1.5කටයි. ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත්වල දාලා තිබෙන මුදල් රුපියල්

බිලියන 2කට වඩා වැඩියෙන් නැවත අරගෙන ගියා. මේ මුදල් ගෙන ගියේ මෙම වෙළෙඳ පොළේ හොරකම මුළු ලෝකයට හෙළිදරවු වීම නිසායි. Central Bank Report එක කියවන්න. ලංකාවේ කොටස් වෙළෙඳ පොළ කඩා වැටිලා. කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරපු විදේශ ආයෝජකයන් රටින් පිටට අරගෙන ගිය මුදල් ප්‍රමාණය, ශුද්ධ විදේශ ගලා යාම ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේවා හංගන්න බැහැ.

අද මේ සමාගම කෝටි 1,000ක ලාභයෙන් බැංකු තුනක් අරගන්නවා. දැන්, අපේ එක්සත් ජාතික පක්ෂයේ භාණ්ඩාගාරිකතුමා මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. අපි ගරු කරන ව්‍යාපාරික දයා ගමගේ මහත්මයාට දන්නා සාස්තර ඔක්කෝම පාවිච්චි කරලා වුවත්, මාස 14කින් රුපියල් කෝටි 1,000ක ලාභයක් ලබන්න පුළුවන්ද? බැහැ. එක්සත් ජාතික පක්ෂයේ භාණ්ඩාගාරිකතුමාත් දන්නවා, "මම භාණ්ඩාගාරික වුණත් අයථා ක්‍රමයක් නැත්නම් රුපියල් කෝටි 17ක් ලාභ ලබන්න බැහැ" කියලා. දැන්, මලික් සමරවික්‍රම ශූරින්ට ව්‍යාපාරිකයෙක් ලෙස මොන ඇඟලුම් රෙදි අරගෙන ගිහිල්ලා මැහුවත් මේ ක්‍රමයට මාස 14ක් ඇතුළත රුපියල් කෝටි 1,000ක් හොයන්න බැහැ. ඒවාට විරුද්ධව කථා කරන අය සල්ලිවලට ගන්න බැරි නම්, එළවා එළවා පහර දෙන්න දැන් පුවත් පතක් පටන් ගන්න යනවා; ඊළඟට, නාළිකාවක් හොයන්න යනවා. දැන්, ඒකට නමක් ද හොයනවා. ඒ පුවත් පතට නමක් යෝජනා වෙලා තිබෙනවා, 'බැඳුම්කර' කියලා. නාළිකාවටත් නම 'බැඳුම්කර'. සමහර මාධ්‍යවේදීන් දැනටම සේවයට-

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
මලික් සමරවික්‍රම මහත්තයාට මුකුත් කියන්න එපා. එතුමා නුවර කෙනෙක්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නුවර නිසා මුකුත් කියන්නේ නැහැ. බැඳුම්කර සිද්ධියේදී එතුමාගේ නමත් සඳහන් වෙලා තිබෙනවා, "රජයට මෙතරම් මුදල් අවශ්‍යය" කියන අභ්‍යන්තර තොරතුරු එළියට යෑම සම්බන්ධයෙන්. පෙබරවාරි 27 -බැඳුම්කර වංචාවට කලින් දවසේ- මෙතුමාත් ඇතුළුව සාකච්ඡාවට ගිය කට්ටිය පිළිබඳව සඳහන් වෙලා තිබෙනවා. මම දන්නවා, මලික් සමරවික්‍රම ඇමතිතුමා එහෙම කරන්නේ නැහැ කියලා. කවුරු හෝ තොරතුරු එළියට යැවුවා. එතකොට පොලී අනුපාතය ඉහළට ගියා. පොලී අනුපාතය ඉහළට ගියාට පස්සේ, දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් රටේ අනුගමනය කළා.

ගරු දයා ගමගේ ඇමතිතුමනි, තමුන්නාන්සේ ව්‍යාපාරිකයෙක් විධියට පිළිගන්නවා ඇති, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ අනුව දැනට සියලුම බැංකු ණය, බැංකු අයිරා දීම බරපතළ ලෙස සීමා කර තිබෙන බව. ඒ මේ අස්සේ මේ අය වැය ලේඛනයෙන් කියනවා, "easy cashවලට විතරක් නොවෙයි, රුපියල් 10,000ට වැඩි සියලුම ගනු-දෙනුවලට සියයට 0.05ක බද්දක් අය කරනවා" කියලා. එතකොට බැංකු, මූල්‍ය සමාගම් සහ වෙනත් මූල්‍ය ආයතනවල ගනුදෙනු කරන සියලුමදෙනා ගනු-දෙනුව අනුව සියයට 0.05ක බද්දක් ගෙවන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, credit cardsවලටත් බද්දක් අය කරනවා. දැන් කවුරුත් පාවිච්චි කරන්නේ credit cards නේ. Credit card එක දේශීයව පාවිච්චි කළොත් මුද්දර ගාස්තුව සියයට 1.5යි; පිට රට ගිහින් පාවිච්චි කළොත් 2.5යි.

සාමාන්‍ය මිනිසුන් ඉතුරු කළාම, ඉතිරි කිරීමේ ගිණුම්වල මුදල රුපියල් 5,000ක් වන තෙක් බද්දෙන් නිදහස්ව තිබුණා. ඒ රුපියල් 5,000 දක්වා තිබුණු බදු නිදහස මෙවර අය වැය යෝජනා මඟින් සම්පූර්ණයෙන් අහෝසි කළා. ඒ විතරක් නොවෙයි. පොලී මත රඳවා ගැනීම කියලා සියයට 5ක බද්දක් අය කරනවා. දැන් පොලිය එක අතකින් නග්ගලා; ඊට පස්සේ ඒ හම්බ වන සොච්චම් පොලියටත් බදු ගහලා, තිබුණු බදු නිදහසත් අයින් කරලා. දැන් පොලී වෙළෙඳ පොළ, මුදල් වෙළෙඳ පොළ කොහේ ගෙනියලාද කියලා කවුරුත් දන්නේ නැහැ.

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
බදු ගහලා නැත්තේ මළ මිනියට විතරයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අපේ රත්වත්තේ මන්ත්‍රීතුමා කියනවා, "බදු ගහලා නැත්තේ මළ මිනියට විතරයි" කියලා. නමුත්, මිනී පෙට්ටියටයි, ඇඳුම්වලටයි, ඉසින scentsවලටයි බදු අය කර තිබෙනවා. ඒක නිසා බොහෝ මළ ගෙවල්වල ලියලා තිබෙනවා, "මරණය දුකක් වන්නේ මිය ගිය අයට නොව, ජීවත් වන අපටය" කියලා. මොකද, බිල් ගෙවන්න වෙලා තිබෙන්නේ අපට වන නිසා.

කෙසේ නමුත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට විශාල ලෙස බදු අඩු කරලා එයට සියයට 14ක බද්දක් අය කරනවා කියා කියලා, ඊට පස්සේ "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරය" නිර්වචනය කරනවා.

අපි දන්නා විධියට අත්යන්ත්‍ර කර්මාන්තයේ යෙදෙන, එහෙම නැත්නම් කැටයමක් කපන, එහෙමත් නැත්නම් ගඩොල් ටිකක් හදන, දෙදෙනෙකු හෝ තුන්දෙනෙකු එක්ක මේ වාගේ සුළු පරිමාණ කර්මාන්ත කරන ව්‍යවසායකයෝ මේ රටේ සියයට 50ක් ඉන්නවා. ඒ අයට ආදායම් බදු සියයට 14යි කියලා ලොකුවට කියනවා. එහෙම කියලා, "සුළු පරිමාණ ව්‍යාපාරය" නිර්වචනය කරන්නේ, "වර්ෂයක පිරිවැටුම මිලියන 500ට වැඩි නම් සුළු පරිමාණ" කියලායි. මිලියන 500කට වැඩි නම් කියන්නේ, මාසයකට මිලියන 41ක් තිබෙනවා නම් ඒ ව්‍යාපාරය සුළු පරිමාණ. දවසකට ලක්ෂ 137ක් තිබෙනවා නම් තමයි සුළු පරිමාණ ව්‍යාපාරයක් වන්නේ. දවසකට ලක්ෂ 137ක් තිබෙන සුළු පරිමාණ ව්‍යාපාරවලට තමයි මේ සහන දෙන්නේ. ඒක නිසා සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට ඒකෙන් සහනයක් ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අය වැය කෘතියේ තව හොඳ දෙයක් කියනවා. ඒ තමයි, මේ රටට තිබෙන මහා විශාලම බර මොනවාද කියලා. පිටු අංක 110 බලන්න. එහි මේ විස්තර සඳහන් වෙනවා. හම්බන්තොට වරාය, වියදම රුපියල් බිලියන 175යි. මත්තල ගුවන් තොටුපොළ, වියදම රුපියල් බිලියන 27.5යි. අකුරේගොඩ ආරක්ෂක සංකීර්ණය ඉදිකරන්න ගිය වියදම, රුපියල් බිලියන 19යි. නෙළුම් කුලුනට වියදම, රුපියල් බිලියන 9.7යි. හම්බන්තොට සම්මන්ත්‍රණශාලාවට වියදම, රුපියල් බිලියන 3.4යි. මිහින් ලංකා ගුවන් සේවයට, රුපියල් බිලියන 14.5යි. සූරියවැව තොරතුරු තාක්ෂණ කලාපයට රුපියල් බිලියන 0.5යි. මේ ව්‍යාපෘති හතේම වියදමේ එකතුව රුපියල් බිලියන 248යි. ඔබතුමන්ලා කියන විධියට මේක තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා රටට කරලා තිබෙන ලොකුම විනාශය. එය රුපියල් බිලියන 248ක විනාශයක්. රුපියල බාල්දුවීම නිසා එක අවුරුද්දක් තුළදී ජාතියේ ණය බර රුපියල් බිලියන 285කින් වැඩිවෙලා තිබෙනවා. රුපියල බාල්දුවීම නිසා සියලුම මිනිසුන් විසින් ගෙවිය යුතු විධියට 2015 වර්ෂයේදී රුපියල් බිලියන 285කින් ජාතියේ ණය බර වැඩි කරලා තිබෙනවා.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ශ්‍රී ලංකා මහ බැංකුවේ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා පොතේ 93වැනි පිටුවේ ඒ බව සඳහන්ව තිබෙනවා. දැන් ප්‍රශ්නය ඉතා පැහැදිලියි නේ. මේ කියන්නේ, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටට කරපු මහා විපත හම්බන්තොට වරාය කියලායි. ඒ විපතේ අගය රුපියල් බිලියන 175යි. මත්තල ගුවන් තොටුපොළ සඳහා රුපියල් බිලියන 27.5ක් වියදම් කරලා තිබෙනවා. අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානය සඳහා රුපියල් බිලියන 19ක් වියදම් කරලා තිබෙනවා. නෙළුම් කුලුන සඳහා රුපියල් බිලියන 9.7ක් වියදම් කරලා තිබෙනවා. හම්බන්තොට සම්මන්ත්‍රණ ශාලාව සඳහා රුපියල් බිලියන 3.4ක් වියදම් කරලා තිබෙනවා. මිහින් ලංකා ගුවන් සේවය සඳහා රුපියල් බිලියන 14.5ක් වියදම් කරලා තිබෙනවා. සූරියවැව තොරතුරු තාක්ෂණ කලාපය සඳහා රුපියල් බිලියන 0.5ක් වියදම් කරලා තිබෙනවා. මේ සියල්ලටම වියදම් වෙලා තිබෙන්නේ රුපියල් බිලියන 248යි. මතක තියාගන්න පුළුවන් නේ, මේ සම්පූර්ණ විපත ආසන්න වශයෙන් රුපියල් බිලියනවලින් 250යි කියලා. රුපියල මස්ත බාල්දුවීම නිසා එක අවුරුද්දකදී රටේ ණය ප්‍රමාණය වැඩි වීමෙන් කර තිබෙන අලාභය රුපියල් බිලියන 285යි. එතකොට මේ විපත කරලා තිබෙන්නේ අපිද, මහින්ද රාජපක්ෂ මැතිතුමාද, එක අවුරුද්දක් තුළ තමුන්නාන්සේලාද?

ගරු දයා ගමගේ මැතිතුමනි, මතක තියාගන්න, රුපියල කඩාගෙන වැටෙන එක නතර කරන්න 2015 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් බිලියන 3.2ක් වෙළෙඳ පොළට දැම්මාය කියන එක. එපා කියද්දීත් ඔක්තෝබර් මාසයේදී හා නොවැම්බර් මාසයේදී යූඑස් ඩොලර් මිලියන 165ක් දැම්මා, ඩොලරයේ අගය රුපියල් 151 ඉක්මවා යන එක නතර කරන්න. තමුන්නාන්සේලාට කවදාකවත් බැහැ, ලබන වර්ෂය වන විට ඩොලරයේ අගය රුපියල් 160ට වඩා වැඩි වන එක නවත්වන්න. ඩොලරයේ අගය රුපියල් 160ට වඩා වැඩි වනකොට රටින් ගෙන්වන පරිප්පු, අල, උම්බලකඩ යන සියලුම දේවල්වලට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය වැඩි වනවා; පරිභෝජන භාණ්ඩ මිල වැඩි වනවා; පොහොර, රසායනික ද්‍රව්‍ය වැනි අන්තර් භාණ්ඩවල මිල වැඩි වනවා; යන්ත්‍රසූත්‍ර, උපකරණ, ගොඩනැඟිලි ද්‍රව්‍ය වැනි ප්‍රාග්ධන භාණ්ඩවල රුපියල් මිල වැඩි වනවා. රබර් බෝලයක් වතුර යට ඔබාගෙන ඉන්නවා වාගේ මේ මිල පීඩනයට ප්‍රතිකර්මයක් නැහැ.

ඊළඟට, තමුන්නාන්සේලා කියනවා, මෙයට කරන්න ඕනෑ එකම උත්තරය ආයෝජනය වැඩි කරන එක විතරයි කියලා. එයට පෞද්ගලික අංශයට ආයෝජනය සඳහා සහන දෙනවාය කියනවා. දේශීය හා විදේශීය වශයෙන් පෞද්ගලික අංශයට ආරාධනා කරනවා. තමුන්නාන්සේලාව විශ්වාස කරන පෞද්ගලික අංශයක් මේ රටේ තිබෙනවාද? මා අහන ප්‍රශ්න කිහිපයක් තිබෙනවා.

ගිය අවුරුද්දේ ලංකාවේ විශාල පරිමාණයේ සමාගම් සියල්ලට "හොරුන්ගේ සමාගම්"ය කිව්වා. ඒ සමාගම් ශුද්ධ ලාභ ලබලා, රජයට ආදායම් බදු ගෙවලා, ලාභාංශ ගෙව්වාට පස්සේ සුපිරි වාසි බද්ද - Super Gain Tax - කියලා බද්දක් පනවලා රුපියල් බිලියන 50ක් ආණ්ඩුවට ගත්තා. ඒ රුපියල් බිලියන 50, ඒ සමාගම් විසින් ආයෝජනය කරන්න තිබුණු සල්ලි; රක්ෂා හදන්න තිබුණු සල්ලි. ඒ සල්ලි ආණ්ඩුවේ අය වැය පියවන්න ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුද්දේ අලුතින්ම සියයට 10ක ප්‍රාග්ධන බද්දක් පනවනවා. නිශ්චල දේපළ හුවමාරුවේදී අය කරන ප්‍රාග්ධන බද්ද සියයට 10යි. එය අය කරන්නේ, වියදමට, පිරිවැටුමට නොවෙයි, ශුද්ධ ලාභයටයි. උදාහරණයක් වශයෙන්, නිවාස සංකීර්ණයක නිවාසයක් රුපියල් මිලියන 300කට අරගෙන රුපියල් මිලියන 350කට විකුණුවා නම්, ලැබෙන ශුද්ධ ලාභය රුපියල් මිලියන 50යි. එයටයි, ප්‍රාග්ධන ලාභය - captial gain එක- කියන්නේ. ඒ රුපියල් මිලියන 50න් තමයි සියයට 10ක් ගෙවන්න වන්නේ. එය තමයි ප්‍රාග්ධන ලාභයට අය කරන බද්ද. එතකොට නිශ්චල දේපොළ සංවර්ධනය කරන්න සමාගම් එනවාද? ඊට පස්සේ ක්ෂයවීම තිබුණා. ක්ෂයවීම තිබුණේ, සියයට තිස්තුනයි තුනෙන් එකයි, සියයට පනහයි, සියයට සියයයි. අවුරුදු 3න් ක්ෂය වෙලා ඉවර වෙනවා. දැන් එහෙම නොවෙයි. සියයට විස්සයි, සියයට විස්සයි, සියයට විස්සයි, සියයට විස්සයි, සියයට විස්සයි කියලා ක්ෂයවීම අවුරුදු 5කට දිග හැරියා.

ඒ විතරක් නොවෙයි. කොටස් වෙළෙඳ පොළ පිළිබඳ න්‍යායාත්මක අවබෝධයක් තිබෙන නීතිඥයකු තමයි කොටස් වෙළෙඳ පොළේ විමර්ශනය කරන්න ඕනෑ. කොටස් වෙළෙඳ පොළට ගෙනැවිත් දැම්මා, රහස් පොලීසියේ හිටපු -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි දෙකහමාරකින් අවසන් කරනවා. ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමාගේ කාලයත් මට එකතු කළා ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, එකතු කළා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
විනාඩි දෙකහමාරකින් අවසන් කරනවා.

ග්‍රීසියේ වාගේ අද අපේ මූල්‍ය වෙළෙඳ පොළ කඩා වැටිලා. ලංකාව ඉතාම අවදානම් රටක් කියලා Fitch Ratings ආයතනය විසින් කියන කොට ආයෝජකයෝ මේ රටට එනවාද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව මූල්‍ය අපරාධ කොට්ඨාසය පිහිටුවා, ලංකාවේ සුපිරි සමාගම් සියල්ලේම, මහා පරිමාණ සහ හොඳම සමාගම් විස්සේ සිටින සියලුම සභාපතිවරුන් මූල්‍ය අපරාධ කොට්ඨාසයට කැඳවලා බංකුවේ වාඩිකරවලා තියනවා. මේ වනකොට ලංකාවේ ව්‍යාපාරිකයෝ 996දෙනෙක් මූල්‍ය අපරාධ කොට්ඨාසයට කැඳවා තිබෙනවා; ප්‍රශ්න කරලා තිබෙනවා. සමහරුන්ට ඇප නොදී රිමාන්ඩ් භාරයේ රඳවා තිබෙනවා. මේ රට පොලිස් රාජ්‍යයක්ය කියලා අද ව්‍යාපාරිකයෝ ලංකාවට එන්නේ නැහැ. බංග්ලා දේශයේවත් මේ විදියට මිනිස්සුන්ව අත් අඩංගුවට ගන්නේ නැහැ. රජයට ව්‍යාපාර පවරාගන්නවා. ඇවන්ට් ගාර්ඩ් ආයතනය රජයට පවරාගෙන තිබෙන්නේ කිසිම උසාවි නියෝගයක් නැතුවයි. සීඑස්එන් ආයතනය පවරාගත්තා. ආණ්ඩුව හිතෙන හිතෙන වෙලාවට ව්‍යාපාර පවරාගන්න කොට පෞද්ගලික ආයෝජකයන් ලංකාවට එනවාද? ලෝකයේ අපි විතරද ඉන්නේ? වියට්නාමය නැද්ද? බුරුමය නැද්ද? මේ විදියට ව්‍යාපාර පවරා ගන්න කොට ආයෝජකයෝ එනවාද? ව්‍යාපාරිකයෝ එනවාද? ව්‍යාපාරිකයෝ සියලුදෙනාම කොපමණ භයෙන් ඉන්නවාද කියනවා නම්, වැට් එකට විරුද්ධව උද්ඝෝෂණය කරලා වසා දැමූ ව්‍යාපාර -වසා දැමූ කඩ- ශ්‍රී ලංකා

රේගුවෙන් ගිහිල්ලා සීල් කළා. මේ ආණ්ඩුව තිබෙන කල් කිසිම ව්‍යාපාරිකයෙකුට මේ රටේ ව්‍යාපාර කරන්න පුළුවන් පරිසරයක් නැහැයි කියලා දේශීය ව්‍යාපාරිකයෝ සියලුදෙනාම තීන්දුවක් ගෙන ඔවුන් මේ රටින් යන්න පටන් ගන්නවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරණයෙන් ඩොනල්ඩ් ට්‍රම්ප් දිනුවේ කොහොමද? එතුමා කිව්වා, "අපේ රටේ තිබෙන ව්‍යාපාර සියල්ලම චීනයට යනවා, සිංගප්පූරුවට යනවා, වියට්නාමයට යනවා. ඇමෙරිකාව තුළ කිසිම ව්‍යාපාරයක් ඉතිරි වන්නේ නැහැ. ඒ නිසා මා බදු අඩු කරනවා"යි කියලා. එතුමා එහෙම කියන කොට අපේ මුදල් ඇමතිවරයා එළවලු වෙළෙන්දෝ වාගේ ලෝකයේ ඉන්න ලොකුම ආයෝජකයා වන චීනයට කථා කරනවා. "ඔහොම කරන්න පුළුවන්ද, එනවා ගහගන්න" කියලා චීන තානාපතිතුමාට කථා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

වග කීමෙන් තොර මුදල් අමාත්‍යවරයෙක් ඉන්නේ. ලෝකයේ ඉන්න ලොකුම ආයෝජකයා පාකිස්තානයට බිලියන 46ක් දුන්නා; බංග්ලා දේශයට බිලියන 26ක් දුන්නා; ඉන්දියාවට බිලියන 10ක් දුන්නා; එංගලන්තයටත් දුන්නා; අප්‍රිකානු රටවල්වලට දෙනවා; මුළු ලෝකෙටම දෙනවා. එහෙම දෙන චීනයෙන් අපට බිලියන 6ක්වත් ගන්න බැරුව ඉන්න කොට අපේ මුදල් ඇමතිවරයා චණ්ඩියෙක් වගේ හැසිරෙනවා. ලෝකයේ මිනිස්සු කියනවා, "චණ්ඩි මුදල් ඇමති කෙනෙක් මෙහේ ඉන්නේ. චීනාටත් ගහන එකේ අපට නොගහ ඉඳියිද" කියලා. එහෙම කියලා මේ රටට එන ආයෝජකයෝ දුවනවා. ඒ නිසා විදේශ ආයෝජන සොයන්න අමුතු ක්‍රමයක් හදාගන්න වෙනවා. මේ මුදල් ඇමතිතුමා ඉන්න කල් ඒක කරන්න හම්බවෙන්නේ නැහැ. මා නම් මුදල් ඇමතිතුමාට ඒ තරම් දොස් කියන්නේ නැහැ. ජොකියා මාරු කරලා වැඩක් නැහැ. ජොකියයි, අශ්වයායි දෙදෙනාම මාරු කරන තත්ත්වයට මේ අය වැය ලේඛනයට විරුද්ධව අපි ඡන්දය දෙනවා කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 3.26]

**ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම ජනතාවට විශාල සහනයක් ලබාදෙන අය වැය ලේඛනයක් සකස් කර ඉදිරිපත් කිරීම ගැන මුදල් ඇමති රවි කරුණානායක මැතිතුමාටත්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, මුදල් අමාත්‍යාංශයේ සියලුම නිලධාරි මහත්වරුන්ටත් විශේෂයෙන්ම මාගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා.

ගරු බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා කිව්වා, කබීර් හාෂිම් මැතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමාට "සුනාමි හොරා"යි කියා කිව්වාය කියලා. මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම කියනවා, එදා ඒ නඩුවෙන් නිදහස් කරපු අග්‍ර විනිශ්චයකාරතුමා තමයි ඒ ගැන කථා කළේ කියලා. ඒ නිසා මා ඒ ගැන තවදුරටත් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ වාගේම ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා අය වැය කතාවේ සඳහන් ප්‍රස්තාර පෙන්වා කිව්වා, වැඩියෙන්ම ණය වෙලා තිබෙන්නේ මේ අපේ පාලන කාලයේ කියලා. මාත් ඒ ප්‍රස්තාර බැලුවා. එතුමා ඒ ප්‍රස්තාර විකෘති කරලා තමයි කථා කළේ.

2006 වසරේ සිට 2011 වසර වෙනකොට සියයට 99කින් ණය බර වැඩිවෙලා තිබෙනවා. 2011 වසරේ සිට 2015 වසර වෙනකොට ණය බර වැඩිවෙලා තිබෙන්නේ සියයට 65කින්. අපි බලාපොරොත්තු වෙන්නේ, 2020 වසර වෙනකොට ණය බර වැඩිවීම සියයට 38ක් දක්වා අඩුකර ගන්නයි. අපි මේ අවුරුද්දේ ලබා ගන්නා ණයවලින් රාජපක්ෂ ආණ්ඩුව ගත් ණය බිලියන 800ක් ගෙවන බව මෙම අය වැය ප්‍රකාශයේ සඳහන් කරලා තිබෙනවා. මේ ණය ගන්නේ, රාජපක්ෂ ආණ්ඩුව ගත්ත ණය ගෙවන්නය කියන එක එහි පැහැදිලිව තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා ආර්ථික විද්‍යා ගුරුවරයකු හැටියට කළ ඒ කථාව ගැන මම කනගාටු වෙනවා. එතුමා දක්ෂ ලෙස රටට, ජනතාවට කිව්වා, ඒක පුද්ගල ආදායම හැටියට ඩොලර් දහසක් තිබුණා, රාජපක්ෂ ආණ්ඩුව එය ඩොලර් හාරදහසක් දක්වා වැඩි කළා කියලා. 2011 වසර වෙන තුරු ඩොලර් එක රුපියල් 110ට තියා ගෙන සිටියා. ඩොලර්වලින් ණය අරගෙන, මුදල් market එකට දමලා ඩොලර් එක ඒ ආකාරයට දිගටම පවත්වා ගෙන ගියා. එතුමාම බොහොම පැහැදිලිව කිව්වා, ඩොලර් එකේ අගය වැඩි වෙනකොට, රුපියලේ අගය අඩු වෙනකොට අය වැය පරතරය විශාල වශයෙන් වැඩි වෙනවා කියලා. ඒ කියන්නේ, මෙච්චර කල් කළේ ආර්ථික වර්ධන විජ්ජාවක්. ඒ නිසා තමයි අපි බලයට ආවාට පස්සේ ඒවා හරියාකාරව සකස් කළේ. ඒ නිසා තමයි රටට තේරුණේ, රාජපක්ෂ ආණ්ඩුව කරලා තිබෙන්නේ ලොකු විජ්ජාවක් කියලා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, මේ ණය කාල බෝම්බයක් නොවෙයි, පරමාණු බෝම්බයක් කියලා. මේ රජය භාර ගන්නකොට අපිත් හිතුවේ, මේ ණය කාල බෝම්බයක් කියලා තමයි. එදා රාජපක්ෂ ආණ්ඩුව ගත්ත ණයවලින් බිලියන 1,300ක් පොත් පත්වලට එකතු කරලා නැහැ. ඒ බිලියන 1,300 එකතු කළාම අපිටත් පරමාණු බෝම්බයක් තමයි කර තියා ගෙන යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඇත්ත වශයෙන්ම අපි පරමාණු බෝම්බයකුත් කර තියාගෙන තමයි මේ ගමන යන්නේ කියන එක විශේෂයෙන්ම කියන්න ඕනෑ. අද එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, දෙමළ ජාතික සන්ධානය, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අද "පොහොට්ටු" පක්ෂයට බැඳෙන්න ඉන්නා කණ්ඩායම කියන මේ හැම කෙනෙකුගේම වගකීම තමයි, අද මේ රට වැටී තිබෙන තත්ත්වයෙන් මුදා ගැනීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී පොඩි කථාවක් කියන්න කැමැතියි. එක මනුස්සයෙක් මාළු අල්ලන්න යනවා. ඔහු බිලී පිත්ත ගහට දමලා ගල උඩ වාඩිවෙලා මාළු අල්ලනකොට තව මනුස්සයෙක් ගල උඩ වාඩිවෙලා බලාගෙන ඉන්නවා. මාළු අල්ලපු මනුස්සයා බාල්දියත් අරගෙන ගෙදර යනකොට අනෙක් මනුස්සයා ඇවිල්ලා, "මට මාළුවෙක් දෙන්න" කියලා ඉල්ලනවා. මාළු අල්ලපු මනුස්සයා එයාට මනුස්සයා මාළුවෙක් දෙනවා. ඊළඟ දවසේත් මේ මනුස්සයා මාළු අල්ලන්න එනවා. අනෙක් මනුස්සයා ගල උඩ වාඩිවෙලා ඉන්නවා. අර මනුස්සයා මාළු අල්ලාගෙන ගෙදර යන කොට මේ මනුස්සයා ඇවිල්ලා කලින් දවසේ වාගේම, මාළුවෙක් ඉල්ලනවා. අර මනුස්සයාත් මාළුවෙක් දෙනවා. තුන්වන දවසේ අර මනුස්සයා මාළු අල්ලන්න යන්න බිලී පිත්ත ගන්න කොට හිතනවා, 'අරූ අදත් ගල උඩ වාඩි වෙලා ඉන්නවා ද දන්නේ නැහැ' කියලා. ඔහු තවත් බිලී පිත්තකුයි, තවත් බාල්දියකුයි ගන්නවා. ඒවාත් අරගෙන එනකොට, හිතුවා වාගේම අර මනුස්සයා ගල උඩ වාඩි වෙලා බලාගෙන ඉන්නවා මෙයා එන කල්. අර මනුස්සයා මේ මනුස්සයාට කථා කරලා, බාල්දියකුයි, බිලී පිත්තකුයි දීලා මාළු අල්ලන විධිය කියලා දෙනවා. ඔහු මනුස්සයා, බිලී පිත්ත දමනවා; මාළුවෙකු අහු වෙනවා; බාල්දියට දමාගන්නවා. ඔහු ආයෙත් බිලී

[ගරු දයා ගමගේ මහතා]

පිත්ත දමනවා; මාළුවෙකු අහු වෙනවා; බාල්දියට දමාගන්නවා. ආයෙත් බිලී පිත්ත දමනවා; මාළුවෙකු අහු වෙනවා; බාල්දියට දමාගන්නවා. දැන් මේ මනුස්සයාගේ බාල්දිය පිරෙන්න මාළු ඉන්නවා. හවස් වෙන්නත් කලින් මේ මනුස්සයා මාළු අල්ලා ඉවරයි. ඒත් හැම දාම මාළු අල්ලන මනුස්සයාට එක මාළුවෙකුවත් අහු වුණේ නැහැ. ඒ මනුස්සයා බාල්දියත් අරගෙන හිස් අතින් යන යන ගමන් කියනවා, "උඹ බොහොම දක්ෂ මිනිහෙක්. මම අද උඹට මාළු අල්ලන්න කියා දුන්නා විතරයි. උඹ ඉතාම දක්ෂ ලෙස මාළු ඇල්ලුවා. ඒ වාගේම උඹ හරිම වාසනාවන්තයි" කියලා. මේ මනුස්සයා තම මාළු බාල්දියෙන් භාගයක්ම දමනවා අර මනුස්සයාගේ බාල්දියට. ඒවාට සල්ලි දෙන්න හදන කොට මේ මනුස්සයා කියනවා, "මට උඹෙන් සල්ලි එපා. උඹ මට අද රැකියාවක් කියලා දුන්නා. අද ඉඳන් මම කාටවත් අත පාන්නේ නැහැ. අද ඉඳන් මේ රැකියාව කරලා මගේ පවුලට කන්න දෙන්න පුළුවන්" කියලා.

ඒ දේ කරන්න තමයි අපේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට, අපේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට, ඒ වාගේම අපේ ඇමතිවරුන්ට අවශ්‍ය කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පසු ගිය කාලයේ රාජපක්ෂ ආණ්ඩුව කළේ මැතිවරණයක් එන කොට මොනවා හරි ගෙන ගිහින් මිනිසුන්ට බෙදා දුන් එකයි. මට මතකයි එදා බැසිල් රාජපක්ෂ මැතිතුමා අම්පාරට ගිහිල්ලා "ගංවතුර ආධාර බෙදනවා" කියලා අපට කච්චේරියට යන්න දෙන්නේත් නැතිව කරපු වැඩේ. මායි අනෝමා ගමගේ මන්ත්‍රීතුමියයි එතැනට යන විට පොලීසියෙන් කිව්වා, "ඇතුළට යන්න බැහැ" කියලා. අපි කිව්වා, "බැසිල් රාජපක්ෂ ආවොත්, අපි බැසිල් රාජපක්ෂට අම්පාරෙන් යන්න දෙන්නේ නැහැ" කියලා. බැසිල් රාජපක්ෂ පැය දෙකහමාරක් පරක්කු වෙලා තමයි කොළඹින් ගියේ. 5,000ක් අරගෙන එනවා කියලා අපි කිව්වාට, අප දෙදෙනා විතරයි ගියේ. අන්තිමට කච්චේරිය ඉස්සරහට එන විට බැසිල් රාජපක්ෂ මැතිතුමා පිළිගන්න සිටියේ අප දෙදෙනා විතරයි. බැසිල් රාජපක්ෂ අපිත් එක්ක යන විට කච්චේරිය ඇතුළේ තිබෙන රැස්වීමට ඔක්කෝම ඇවිත් සිටියා, කච්චේරියේ පිටුපස දොරෙන්. ඒ රැස්වීමට ගියාම තමයි අපි දැනගත්තේ, ඇවිත් තිබෙන්නේ ගංවතුර ආධාර බෙදන්න නොවෙයි කියලා. රුපියල් මිලියන 525ක් වෙන් කර තිබුණා, 2012 වර්ෂයේ පළාත් පාලන මැතිවරණය කාලයේදී රුපියල් 10,000 ගණනේ මිනිසුන්ට බෙදන්න. එදා හිටපු දිසාපති ඒ සල්ලි ටික ඔක්කෝම බෙදුවා. එදා පළාත් පාලන මැතිවරණය ජය ගත්තේ එහෙමයි. UNPකාරයෝත් ඒ සල්ලි අරගෙන තිබුණා. මෙන්න මේ ආකාරයට මිනිසුන්ට මොනවා හෝ දීලා ඡන්ද දිනන වැඩ පිළිවෙළ තමයි එදා ක්‍රියාත්මක කළේ. ඒක තමයි සංවර්ධනය කියලා රටට පෙන්නුවේ.

එදා සමහර මිනිස්සු තමාට ලැබුණු බීජ ඇට ටික ඉස්සා; ඒවා පැළ වුණා. සමහරුන්ට දීපු ඇට පැළ වුණේ නැහැ. නගරවල හිටපු සමහර මිනිස්සු පැළවලට ටැප් වතුර දැම්මා. එළවලු ටික බොහොම හොඳින් හදාගෙන කෑවා. නමුත් අන්තිමේදී වතුර බිල ගෙවන කොට තමයි මතක් වුණේ, 'එළවලුවලට වඩා වැඩි ගණනක් අපි වියදම් කර තිබෙනවා' කියලා. එදා දඹුල්ලේ ගොවීන්ගේ එළවලු විකුණාගන්න බැරිව වීසි කළා. ඒක තමයි එදා ආර්ථික සංවර්ධන ඇමතිවරයා හැටියට එතුමා ආර්ථිකය හසුරුවපු විධිය. ඒ ගැන අද අපට කථා කරන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි හොඳ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. 2016-2018 ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන තුළ අල, ලොකු ලූනු, රතු ලූනු, මිරිස්, සෝයා සහ බඩ ඉරිඟුවලින් අපි ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කරන්න බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 වර්ෂයට සාපේක්ෂව බලනකොට 2016 අවුරුද්ද තුළ ආනයනය සඳහා වැය වූ මුදලෙන් ඩොලර් මිලියන 150ක් -රුපියල් බිලියන 22ක්- ඉතුරු කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

මෙවර අය වැයෙන් කෘෂිකර්මයට විශාල සහනයක් ලබා දෙනවා කියලා ප්‍රකාශ කළ විධියටම පොහොර සහනාධාරයට අමතරව අපි කෘෂිකර්මය වෙනුවෙන් රුපියල් බිලියන 6,400ක් වෙන් කරලා තිබෙනවා. වැවිලි කර්මාන්තය, කිරි නිෂ්පාදනය, මත්ස්‍ය නිෂ්පාදනය, විසිතුරු මල් නිෂ්පාදනය වාගේම වාරිමාර්ග වැඩිදියුණුව කෙරෙහිත් අවධානය යොමු කර තිබෙනවා. අද අපේ රටේ නිෂ්පාදනය කරන එළවලුවලින් සියයට 40ක් ගොවිපොළවල ඉඳලා පාරිභෝගිකයා අතට යන විට සම්පූර්ණයෙන්ම විනාශ වෙලා යනවා. අපි අපේ ගොවි මහත්වරුන්ට එල නෙළන විධිය කියා දෙන්න ඕනෑ. ඒ වාගේම ඒවා ප්‍රවාහනය කරන විධිය කියා දෙන්න ඕනෑ. ඒ වාගේම අපි ශීතාගාර හදන්න ඕනෑ; ගබඩා හදන්න ඕනෑ; නෙළන අස්වැන්න මිල දී ගැනීමට ව්‍යාපාරිකයන්, වෙළෙන්දන් ඇති කරන්න ඕනෑ. මෙවර අය වැය තුළින් අපි ඒ වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අපි වෙන වෙන ක්‍රමවලින් එම අගයදාමය වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අලිපේර, රඹුටන්, බෙල් පෙපර්, ගල් සියඹලා සඳහා අගය එකතු කළ නිෂ්පාදන හදන්වා දීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම පාරම්පරික ඖෂධ ටොන් 2,500ක් - අපේ රටේ පැළ වෙන බෙහෙත් වර්ග - අපි ඉන්දියාවෙන් ගෙන්වනවා. මෙන්න මේවා සිටුවන්න විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශය තුළින් විශේෂ වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබෙනවා. ඒ වාගේම හරිතාගාර - greenhouses- සම්බන්ධයෙන් අපි ඊශ්‍රායලයෙන්, ඒ වාගේම චීනයෙන් අවශ්‍ය තාක්ෂණය, දැනුම ලබා ගෙන 2017 අවුරුද්දේදී ඒ වැඩ කටයුතු කරන්න සැලසුම් කරලා තිබෙනවා.

තේ, පොල් හා රබර් කර්මාන්ත පිළිබඳව මා දැන් කථා කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එංගලන්තයට ගිය අවස්ථාවක බ්‍රිතාන්‍ය ජාතිකයන් -තේ වවපු මිනිස්සු- කිව්වේ, ලෝකයෙන්ම හොඳ තේ අපේ රටේ තේ කියලායි. නමුත් අද බ්‍රිතාන්‍යය අපේ රටෙන් සියයට 1ක්වත් තේ ආනයනය කරන්නේ නැහැ. බ්‍රිතාන්‍යයේ අද “Ceylon Tea” සම්පූර්ණයෙන්ම නැති වෙලායි තිබෙන්නේ. පසු ගිය අවුරුදු 10 ඇතුළත රාජපක්ෂ ආණ්ඩුව ඒ brand name එක නැති කරගෙන තිබෙනවා. එදා ජනාධිපතිතුමා විදේශගත වනකොට එතුමාත් එක්ක අර ගොල්ලෝ, මේ ගොල්ලෝ කියලා විශාල පිරිසක් යනවා. අද ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයකු අහපු ප්‍රශ්නයකට හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දුන්නා, ව්‍යාපාරිකයන් 300ක් විතර ගිහිල්ලා තිබෙනවා කියලා. මොනවාට ගියාද කියලා මට තේරෙන්නේ නැහැ. නමුත් අද වන විට සියයට 1යි යුරෝපය අපෙන් තේ මිලදී ගන්නේ. අපි “Ceylon Tea” නැවතත් brand කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඒ සඳහා අපි මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අපි තේවල අගයදාමය වැඩි කරන්න ඕනෑ. තේවලට කුරුඳු මිශ්‍ර කරලා අගයදාමය වැඩි කරලා ඒක market කරන්න ඕනෑ. අපේ රටේ කුරුඳු තමයි ලෝකයේ තිබෙන හොඳම කුරුඳු. අපේ රටේ තේ තමයි ලෝකයේ තිබෙන හොඳම තේ. නමුත් අපි ඒ වෙළෙඳ නාමය market කරලා නැහැ. අපි ඒවා කරන්න අවශ්‍යයි.

සීනි කර්මාන්තය ගත්තොත් එහෙම සෙවණගල සීනි කර්මාන්තශාලාව අයිතිව තිබුණේ මට. දැනටත් සෙවණගල සීනි කර්මාන්තශාලාවේ අයිතිය තිබෙන්නේ මට. නමුත් එදා "The Revival of Underperforming Enterprises and Underutilized Assets Act" කියලා එකක් ගෙනැල්ලා, මේ පාර්ලිමේන්තුවේ

මන්ත්‍රීවරු ඔක්කෝම අත උස්සලා, එදා අපේ සීනි කර්මාන්ත ආයතනය පවරා ගත්තා. මම ඒක ගන්නකොට රුපියල් මිලියන 145ක් පාඩුවටයි තිබුණේ. අපි එහි නිෂ්පාදනය තුන් ගුණයකින් වැඩි කළා. එය පවරා ගත් අවුරුද්දේ අපි රුපියල් මිලියන 450ක් ලාභ ලැබුවා. ඊට පස්සේ රාජපක්ෂ ආණ්ඩුව පැල්වත්ත හා සෙවණගල සීනි කර්මාන්තශාලාවලට භාණ්ඩාගාරයෙන් - මහජනතාවගේ මුදල්වලින්- රුපියල් මිලියන 4,030ක් දීලා තිබෙනවා. ඒ වාගේ අපරාධයක් කරපු සීනි නිෂ්පාදන ආයතන නැවත ගොඩ නඟන්න අපි කල්පනා කරලා තිබෙනවා. සීනි කර්මාන්තශාලා හතරක් අලුතෙන් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අම්පාර, වවුනියාව, මඩකළපුව හා කිලිනොච්චිය යන ප්‍රදේශ දැනටමත් අපි තෝරාගෙනයි තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

කිරි කර්මාන්තය සඳහා කිරි ගවයින් 15,000ක් ගෙන්වන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි කිරි ගොවීන්ට කිරි එළදෙනුන් දෙන්න බලාපොරොත්තු වන්නේ, අර බැසිල් රාජපක්ෂ මැතිතුමා එක කාන්තාවකට කිරි හරකෙකු දුන්න විධියට නොවෙයි. අඩුම වශයෙන් එක කිරි ගොවියෙකුට කිරි එළදෙනුන් දහයක් දෙන්න ඕනෑ. එහෙම දීලා ඒක ව්‍යාපාරයක් හැටියට කරගෙන යන්න කටයුතු කරනවා. එක්කෙනෙකුට රුපියල් හැත්තෑපන් දහසක, ලක්ෂයක ආදායමක් ලබා ගන්න පුළුවන් වන ආකාරයේ වැඩ පිළිවෙළක් අපි දැනටමත් සැලසුම් කර තිබෙනවා. ඒ වගේම ආනයනික කිරි පිටි මෙට්‍රික් ටොන් 81,000කට විශාල විදේශ විනිමයක් - බිලියන 30ක් විතර - අපි දැන් වියදම් කරනවා. මේ මුදල් අපිට ඉතිරි කරන්නට පුළුවන්.

විසිතුරු මසුන් ඇති කිරීම ගැනත් කියන්න ඕනෑ. මම ඉරාකට ගියා; තුර්කියට ගියා. ඉරාකයේ සිටින ව්‍යාපාරිකයන් පිරිසක් කිව්වා, අපේ ලංකාවෙන් විසිතුරු මසුන් ඔවුන්ට ලබා ගන්න පුළුවන් කියලා. ඒ ගොල්ලන් ලංකාවත් එක්ක ඒකාබද්ධ වෙලා අපට විසිතුරු මසුන් ඇති කිරීමේ තාක්ෂණය ලබා දීලා, ඒ විසිතුරු මසුන් ඇති කිරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කරන හැටි ගැන මාත් එක්ක කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මා තුර්කියටත් ගියා. මා හිතන විධියට යුරෝපයේ ඇඟලුම් සඳහා වැඩිම වෙළඳ පොළක් තිබෙන්නේ තුර්කියටයි. ලංකාවට ඇවිත් ඇඟලුම් කර්මාන්තය කරන්න තුර්කිය කැමැතියි. එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා ඇඟලුම් ව්‍යාපාරය පටන් ගන්නකොට එතුමාට බැන්නා. එදා විරුද්ධ පක්ෂයේ හිටපු උදවිය අපට කිව්වේ, අපි කාන්තාවන්ට යට ඇඳුම් මහනවාය කියලායි. එදා කළේ මොකක්ද? ඒ ඇඟලුම් සේවිකාවන්ගේ අභිමානය නැති කරපු එකයි. නමුත් අද ඩොලර් මිලියන 4800ක්, ඒ කියන්නේ සියයට 43ක් අපේ රටේ අපනයන ආදායම අපි ලබාගන්නේ ඇඟලුම්වලින්. මේ කර්මාන්තයේ දී අපි පිටරටින් රෙදි මිලියන 2200ක් විතර ගෙනෙනවා. GSP බදු සහනය අපට සම්පූර්ණයෙන්ම නැති වුණා. එදා අපට තිබුණු යුරෝපීය වෙළෙඳ පොළ රාජපක්ෂ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම නැති කර දැම්මා. දැන් නැවත එය ලබාගන්න රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට පුළුවන්වෙලා තිබෙනවා.

මාළු අපනයනය අපට සම්පූර්ණයෙන්ම තහනම් වුණා. යුරෝපයට මාළු යවන්න දැන් අපට පුළුවන් වෙලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා මෙවර යුරෝපයට ගිය අවස්ථාවේ දී GSP plus සහනය ගැන ඔවුන් එක්ක කථා කළා. ලබන අවුරුද්දේ මාර්තු මාසය වෙනකොට අපිට GSP plus සහනය ලැබේවි කියලා එතුමා විශ්වාස කරනවා. මේ තුළින් ඇඟලුම් කර්මාන්තයේ ආදායම ඩොලර් බිලියන අටක් වෙනතුරු වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා. Fabric park එකක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අධිවේගී මාර්ග ගැනත් කියන්න ඕනෑ. රුවන්පුර අධිවේගී මාර්ගය රත්නපුරටත්, දක්ෂිණ අධිවේගී මාර්ගය බදුල්ලටත්, මධ්‍යම අධිවේගී මාර්ගය කටුනායක - පුත්තලම දක්වාත් අපි දීර්ඝ කරනවා. මේ සියල්ලම අපි 2017 අවුරුද්දේ පටන් ගෙන, 2020 අවුරුද්දට පෙර ඒවා නිම කරන බවත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. අවාසනාවකට වාගේ එක්සත් ජාතික පක්ෂයේ නායකයන් මේ රටෙන් නැතිවෙලා ගියේ නැත්නම්, එදා ප්‍රභාකරන් ඒ අයව මැරුවේ නැත්නම්, කාටවත් කොමිස් ගහලා එක අධිවේගී මාර්ගයක්වත් හදන්න අපි ඉතිරි කරන්නේ නැහැ. එහෙම නම් එදා අපි මේ රට වෙනත් ආණ්ඩුවකට භාර දෙනකොට අධිවේගී මාර්ග සියල්ලම හදලා අවසන් කරලයි භාර දෙන්නේ. එදා තිබුණු අපේ ආණ්ඩුව ඒවා ඔක්කොම ටික හදලා අවසාන කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිව්වා හම්බන්තොට වරාය නැව්වලින් පුරවනවා කියලා. අනිවාර්යයෙන්ම අපි ඒක කරනවා. මත්තල ගුවන් තොටුපොළ ගැන කියනවා නම්, අද වෙනකොට මත්තල ගුවන් තොටුපොළට එක ගුවන් යානාවක්වත් එන්නේ නැහැ. මොකද, මත්තල ගුවන් තොටුපොළට ගුවන් යානා එන කොට මොණරු හැපෙන එක සාමාන්‍ය දෙයක් වෙලා තිබෙනවා. නමුත් හම්බන්තොට අක්කර පහළොස්දාහක කර්මාන්ත පුරයක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එදා රාජපක්ෂ ආණ්ඩුව සුදු අලියෙක් බවට පරිවර්තනය කළ හම්බන්තොට වරාය අපි නැව්වලින් පුරවනවා. ඒ තුළින් දහස් ගණනක් රැකියා උත්පාදනය කරන්න අපට පුළුවන්. ඒවගේම 300 MW ගෑස් විදුලි බලාගාරයක් හදන්නට දැනටමත් අපි සැලසුම් කර තිබෙනවා.

ඒකාබද්ධ විපක්ෂයේ අපේ හිතවත් මන්ත්‍රීවරුන් මේ කාරණය පිළිබඳව කියන්න මා කැමැතියි. තමුන්නාන්සේලා අතර පළපුරුද්දක් තිබෙන දක්ෂ ඇමතිවරුන් හැටියට කටයුතු කළ මන්ත්‍රීවරුන් සිටිනවා. ගරු අගමැතිතුමා අද Sectoral Oversight Committees පත් කර තිබෙනවා. ඒ Sectoral Oversight Committeesවලට ඇවිල්ලා එතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කරමින් මේ කරගෙන යන සංවර්ධනයට එකතුවෙලා, මේ රට වැටී තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න උදවු කරන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

[பி.ப. 3.48]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2017ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்ட விவாதத்தில் என்னையும் பேச அனுமதித்ததற்கு நன்றி! 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தை முன்மொழிவு செய்த ஒரு வருட நிறைவில் மீண்டும் 2017ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தை இந்த அரசாங்கம் முன்மொழிந்திருக் கின்றது. குறிப்பாக ஒவ்வோர் அமைச்சரும் தன்னை அரசியல்

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

ரீதியாகத் தக்கவைத்துக் கொள்கின்ற, தத்தமது தொகுதியை அபிவிருத்தி செய்கின்ற நோக்கமாகத்தான் இந்த வரவு செலவுத் திட்டம் முன்மொழியப்பட்டிருக்கின்றது. இதில் பாமர மக்களுக்கு - கிராம மக்களுக்கு எந்தவித முன்னேற்றகரமான வேலைத்திட்டமும் முன்மொழியப்படவில்லை என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அதேநேரத்தில் வரவு செலவுத் திட்டத்தின்மூலம் வருடா வருடம் வடக்கு மாகாணத்துக்கு ஒதுக்கப்படுகின்ற பற்றாக் குறையான நிதியின்மூலம் எங்களுடைய பிரதேசங்களை மாகாண சபையால் அபிவிருத்தி செய்ய முடியாமல் இருக்கின்றது. 13வது அரசியலமைப்புத் திருத்தத்தின்படி மாகாண சபைகளுக்கு அதிகாரமளிக்கப்பட்ட மொத்த விற்பனை வரியை, அரசாங்கம் 2011ஆம் ஆண்டிலிருந்து தன்வசப்படுத்தி, 'தேசத்தைக் கட்டியெழுப்பும் வரி' என்ற பெயரில் நடைமுறைப்படுத்தி வருகிறது. அந்தச் செயலானது, ஒருபுறம் மாகாணங்களின் அதிகாரங்களைப் பறித்தெடுப்பதாகவும் இன்னொருபுறம் அந்த வரித்தொகையில் 33.3 வீதம் அல்லது 1/3 பங்கை மட்டுமே அனைத்து மாகாணங்களுக்கும் பகிர்வதாகவும் அமைகிறது. அதேவேளையில் - NBT - என்ற வகையில் அரசாங்கத்தால் அறவிடப்படும் முத்திரைத் தீர்வையையும் உள்ளடக்கி அனைத்து மாகாணங்களுக்கிடையில் வருமானத்தைப் பங்கீடு - revenue sharing - செய்யும்போது வட மாகாணத்திற்கு அநீதி இழைக்கப்படுகின்றது. ஐந்து மாவட்டங்களை உள்ளடக்கிய வட மாகாணத்திற்கு இவ்வருமானத்தில் 5 வீதம் மட்டுமே பங்கீடு செய்யப்படுகின்றமை ஓர் அநீதியானதாகும். மேல் மாகாணத்திற்கு 48 வீதமும் வேறு சில மாகாணங்களுக்கு 9 வீதமும் வழங்கப்படுகின்றது. முப்பது ஆண்டு கால யுத்தத்தால் பல பொருளாதார இழப்புக்களையும் அழிவுகளையும் சந்தித்த மாகாணத்தை மீண்டும் கட்டியழுப்புவதற்கு அரசாங்கத்தால் வழங்கப்படும் இத்தகைய நிதிப் பங்கீடு போதுமானதல்ல. இதற்குத் தீர்வாக ஒன்றில் மொத்தத் தேசத்தைக் கட்டியெழுப்பும் வரி சேகரிப்பில் தற்போதுள்ள 33.3 வீதத்தினை 40 வீதமாக உயர்த்தி அனைத்து மாகாணங்களுக்கும் பங்கீடு செய்ய வேண்டும் அல்லது வட மாகாணத்தினை விசேட தேவையுள்ள மாகாணமாகக் கருதி தற்போதுள்ள 5 வீதத்தினை 7 சதவீதமாகவாவது அதிகரிக்க வேண்டும். ஏனெனில், வட மாகாணத்தில் ஏற்பட்டவை அசாதாரண இழப்புக்கள்! அதாவது 2015ஆம் ஆண்டு வரையில் ஏனைய மாகாணங்கள் வரி அறவீடுகள்மூலம் பெற்ற வருமானத்தைக்கூட வட மாகாணம் பெற்றிருக்கவில்லை என்பதை அனைவரும் அறிவர்.

இலங்கையின் மொத்த உள்நாட்டு உற்பத்திக்கு வடக்கு மாகாணமும் குறைந்தமட்டப் பங்களிப்பினைச் செய்கின்றது என மத்திய வங்கியின் ஆண்டறிக்கையில் தெரிவிக்கப்பட்டுள்ளது. யுத்த காலத்தில் வடக்கின் பொருளாதார நிலைகள் அழிக்கப்பட்டதே இந்தக் குறைந்தமட்டப் பங்களிப்புக்கு பிரதான காரணமாகும். 1983க்கு முன்னர் வடக்கு மாகாணத்தில் பல கைத்தொழில்கள் வளர்ச்சியடைந்திருந்தமையை எவரும் மறக்கமாட்டார்கள். ஆனால், இன்று இம்மாகாணம் கைத்தொழில் முயற்சிகள் எதுவுமற்று அனைத்துப் பொருட்களையும் தெற்கிலிருந்து பெற்று நுகர்வு செய்யும் நிலைக்கு மாறியுள்ளது. ஆதலால் அரசாங்கம், வடக்கின் பொருளாதாரப் பங்களிப்பை உயர்த்துவதற்கு உள்ளார்ந்த வளம் கொண்ட விவசாயம், கால்நடை வளர்ப்பு, பாற்பண்ணை, மீன்பிடி, சிறுகைத்தொழில், தயாரிப்புத் தொழில்கள் ஆகியவற்றில் முதலீடு செய்கின்ற உள்நாட்டு, வெளிநாட்டு முதலீட்டாளர்களுக்குக் குறிப்பிட்ட காலப்பகுதிக்காவது - குறைந்தது 10 வருடங்கள் - வரி விடுதலையையும் வரிச் சலுகைகளையும் வழங்குவதுடன், அதற்கேற்ப உட்கட்டமைப்பு வசதிகளை அபிவிருத்தி செய்வதன்மூலம் இலங்கையின் மொத்த உள்நாட்டு உற்பத்திக்கு இம்மாகாணத்தின் பங்களிப்பையும் அதிகரிக்க முடியும்.

தற்போது காலாண்டுக்கு 3 மில்லியன் அல்லது ஆண்டுக்கு 12 மில்லியனுக்குக் கூடுதலான விற்பனைகள்மீதே - மொத்த, சில்லறை வர்த்தகம்மீது - தேசத்தைக் கட்டியெழுப்பும் வரி, விதிக்கப்படுகின்றது. ஆனால், இதற்குக் குறைவான விற்பனைகளைக் கொண்ட வியாபாரங்கள் சார்பில் எந்தவித வரியும் செலுத்தப்படுவதில்லை. இது வரி விதிப்பிலுள்ள தவறான கொள்கையாகும்.

அதேவேளையில், மாகாண சபைகள் 2010 வரை வியாபார மொத்த விற்பனை வரியை - BTTஐ - அறவிட்டு வந்தன. அதனால், மாகாண சபைகள் கால் ஆண்டுக்கு 03 மில்லியனுக்கு அல்லது ஆண்டுக்கு 12 மில்லியனுக்கு குறைவான விற்பனைகள் மீது இவ்வரியை அறவிட்டு, அவ்வருமானத்தை அம்மாகாணத்தின் அபிவிருத்திக்கு பயன்படுத்துவதற்கு அதிகாரம் அளிக்கப்படவேண்டும் என்று நான் இந்த அரசாங்கத்தை வரவு செலவுத் திட்ட விவாதத்தினூடாக கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேநேரத்தில் இந்த அரசாங்கமானது, 2016ஆம் ஆண்டு வரவு செலவுத் திட்டத்தில் பல முன்மொழிவுகளை முன் மொழிந்திருந்தது. அந்த முன்மொழிவுகளில் ஒருசில குறிப்பிட்ட விடயங்கள் மட்டுமே நடந்தேறியிருக்கின்றன. மற்றைய விடயங்களுக்கு என்ன நடந்தது என்பது எங்களுக்குத் தெரியாது. அந்த வகையில், முதலாவதாக எங்களுடைய மக்கள் அபிவிருத்திக்கு அப்பால் ஓர் இயல்பான வாழ்க்கையை வாழ்வதற்கு ஏற்ற வழிவகைகளை அரசாங்கம் செய்யவேண்டும். அந்த இயல்பான வாழ்க்கையை வாழ்வதற்குத் தடையாகவும் எங்களுடைய மக்களின் மனங்களில் மிகப் பாரமாகவும் இருப்பது தமிழ் அரசியல் கைதிகளின் விடுதலையாகும். இந்த அரசியல் கைதிகளின் விடுதலை தொடர்பாகக் கடந்த வருடத்திலும் இந்த வருடத்திலும் பல உறுதிமொழிகள் வழங்கப்பட்டன. ஆனால், அதில் எந்த உறுதிமொழியும் நிறைவேற்றப்படாமல், அவர்களது விடுதலை தாமதமாகிக் கொண்டிருக்கிறது. கடந்த இரண்டு மாதங்களுக்கு முன்பு சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர் மாண்புமிகு சுவாமிநாதன் அவர்கள் 23 கைதிகளை 6 மாத புனர்வாழ்வுடன் விடுதலை செய்வதாகக் கூறியிருந்தார். அவர்களுடைய பெயர்ப் பட்டியலையும் என்னிடம் தந்தார். அதற்கு நான் அவருக்கு இந்தச் சபையில் நன்றியும் தெரிவித்திருந்தேன். தற்பொழுது, அந்தப் பெயர்ப் பட்டியல் மட்டும்தான் இருக்கிறது; அதற்குரிய எந்த விதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பதை நான் மனவேதனையுடன் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். அண்மையில் அவர் என்னிடம், "இவர்கள் இந்த வாரத்திற்குள் அல்லது பத்து நாட்களுக்குள் 6 மாத புனர்வாழ்வுக்கு உட்படுத்தப்படுவார்கள்; 6 மாதங்களின் முடிவில் இவர்கள் விடுதலை செய்யப்படுவார்கள்; அதன்பின் அவர்கள் தங்களுடைய குடும்பத்துடன் இணைந்து வாழலாம்" என்று உறுதிமொழி வழங்கியிருந்தார். அந்த உறுதிமொழியும் உங்களுடைய அரசாங்கத்தின் வாக்குறுதிகளில் ஒன்றாக இருந்தது. அதுவும் நடைமுறைக்கு வரவில்லை.

அடுத்து, நான் குறிப்பிட விரும்பும் விடயம் வீட்டுத் திட்டம் சம்பந்தமானது. எங்களுடைய மக்களுக்கு எப்படியான வீடு தேவை என்பதை கௌரவ உறுப்பினர் சுமந்திரன் அவர்கள் இங்கு குறிப்பிட்டார். கடந்த வரவு செலவுத் திட்டத்தின்போது மன்னார் மாவட்டத்துக்கு 10,000 வீடுகளும் முல்லைத்தீவு மாவட்டத்துக்கு 10,000 வீடுகளும் வழங்குவதாக முன்மொழியப்பட்டது. ஆனால், இந்த வருடம் 1,200 வீடுகள்தான் எங்களுடைய மக்களிடம் கையளிக்கப்பட்டிருக்கின்றது என நான் நினைக்கின்றேன். 10,000 வீடுகள் என்று உறுதிமொழி வழங்கிவிட்டு, 1,000 வீடுகள்தான் எங்களுடைய மக்களுக்கு வழங்கப்பட்டிருக்கிறது. இந்த வரவு செலவுத் திட்டத்தில் வடக்கு, கிழக்குக்கு 50,000 வீடுகள் முன்மொழியப்பட்டிருக்கின்றது. அதில் எத்தனை வீடுகளை குறிப்பிட்ட வருடத்துக்குள் மக்களிடம் கையளிக்க முடியுமோ, அவற்றை மட்டும்தான் முன்மொழிய வேண்டும். நீங்கள் 10,000 என்று சொல்லிவிட்டு, 1,200 வீடுகளைத்தான் மன்னார் மாவட்டத்துக்கு வழங்கியிருக்கின்றீர்கள். அதேபோல்தான் வட மாகாணத்திலுள்ள எல்லா மாவட்டங்களுக்கும் 1,200 வீடுகள் வீதம்தான் வழங்கப்பட்டிருக்கிறது. ஆகவே, 2017ஆம் ஆண்டில் இந்த அரசாங்கத்தால் எவ்வளவு வீடுகளை எங்களுடைய மக்களுக்கு வழங்கமுடியுமோ, அதை மட்டும்தான் முன்மொழியவேண்டும். அதைவிடுத்து, 50,000 வீடுகள் என்று நீங்கள் பொய் வாக்குறுதிகளை வழங்க வேண்டாம். நீங்கள் 2017ஆம் ஆண்டில் 50,000 வீடுகளைக் கட்டி மக்களுக்கு கொடுப்பீர்களா? அல்லது எத்தனை வீடுகளை 2017ஆம் ஆண்டில் உங்களால் கட்டிக்கொடுக்க முடியும்? என்பதை நான் இந்த அரசாங்கத்திடம் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

அதேநேரத்தில், கடந்த வருடம் முன்மொழியப்பட்ட 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் வடக்கில் 03 மீன்பிடித் துறைமுகங்கள் - அதில் ஒன்று மன்னார் மாவட்டத்தில் பேசாலையிலும் மற்றையவை யாழ்ப்பாண மாவட்டத்தில் பருத்தித்துறையிலும் குருநகரிலும் - அமைக்கப்படும் என்று குறிப்பிடப்பட்டிருந்தது. ஆனால், அந்த மூன்றில் ஒரு மீன்பிடித் துறைமுகத்திற்காவது இன்னமும் அடிக்கல்கூட வைக்கவில்லை. அதாவது, இந்த 3 மீன்பிடித் துறைமுகங்களில் ஒரு துறைமுகத்தின் வேலைகூட இந்த வருடத்தில் இன்னமும் ஆரம்பிக்கப்படவில்லை என்பதை நான் மிகவும் மனவேதனையுடன் தெரிவிக்கின்றேன். 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் இருந்த இந்த முன்மொழிவுகளுக்கு எந்தவிதமான நடவடிக்கைகளும் எடுக்கப்படவில்லை என்பதை இந்த அரசாங்கத்திற்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அதேநேரத்தில், கௌரவ விளையாட்டுத்துறை அமைச்சர் அவர்கள் இங்கிருக்கின்றார். எங்களுடைய மன்னார் மாவட்டத்திற்கு நறுவிலிக்குளத்தில் District Sports Complex அமைப்பதாகத் தீர்மானிக்கப்பட்டது. அதைவிட இன்னுமொரு விளையாட்டு மைதானத்தை எமில்நகரில் வழங்குவதாகவும் இந்த மைதானங்கள் மிக விரைவில் அமைக்கப்படும் என்றும் கௌரவ விளையாட்டுத்துறை அமைச்சர் அவர்கள் ஏற்கெனவே இந்தப் பாராளுமன்றத்தில் உறுதியளித்திருந்தார். ஆனால், இந்த வருடத்தில் குறிப்பிட்ட இரண்டு மைதானங்களுக்குமுரிய ஆரம்ப வேலைகள்கூட இன்னமும் ஆரம்பிக்கப்படவில்லை என்பதை நான் மனவேதனையுடன் தெரிவித்துக்கொள்கின்றேன்.

**ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

ඒකට දැන් මුදල් වෙන් කරලායි තිබෙන්නේ. ඔබතුමන්ලාට දැන් වැඩේ පටන් ගන්නයි තිබෙන්නේ. අපි දැන් කොන්ත්‍රාත්කරුවෙකුත් ගෙනැල්ලා තිබෙනවා. එකම කොන්ත්‍රාත්කරුවෙක් තමයි ඉල්ලා තිබුණේ. ඔබතුමා මේවා ගැන පොඩ්ඩක් සොයලා බලන්න ඕනෑ. දැන් contract එක award කරන්නයි තිබෙන්නේ. Tenders call කළාම එක ටෙන්ඩර්කරුවයි ආවේ. අපි ඔහුට එය භාර දෙන්න කටයුතු කරනවා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

දැන් අවුරුද්දක් ඉවරයි. තවම පටන් ගත්තේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ. Rs. 59 million තිබෙනවා. බය වෙන්න එපා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

"Zero-based Budget" කියලා ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් තමයි කිව්වේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මොකක්ද?

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

"Zero-based Budget" කියලා ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් කිව්වා නේ. මේ අවුරුද්ද ඉවර වෙන්න ඉස්සරවෙලා වැඩේ පටන් ගත්තේ නැත්නම් සල්ලි ආයෙත් දෙන්නේ නැහැයි කියලා කියනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ. මම ඒක අර ගෙන දෙන්නම්. බය වෙන්න එපා. ඔබතුමා දන්නවා නේ, මොකක්ද වුණේ කියලා. ඔබතුමන්ලාගේ ඇතුළේම ප්‍රශ්න. ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කයේ ප්‍රශ්න. දිස්ත්‍රික්කයේ ක්‍රීඩාංගණය හදන්න සල්ලිත් වෙන් කරලා තිබෙද්දී ඔබතුමන්ලාගේ ඇතුළේ සණ්ඩුව නිසා මේක ප්‍රශ්නයක් වුණා. පොඩ්ඩක් ඉන්න මම කියලා දෙන්නම්. ඊට පස්සේ ඔබතුමන්ලා අපට කිව්වා, "ඉස්සරවෙලා මේ ක්‍රීඩාංගණය හදලා දෙන්න." කියලා. දැන් නරුවිලිකුලම් එකට සල්ලි දමලා තිබෙනවා. දැන් ඒක පටන් ගන්න පුළුවන්. කිසි ගැටලුවක් නැහැ. ඔබතුමන්ලා දින දෙන තෙක් අපි බලා ගෙන ඉන්නවා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ඒක කවදා විතර කරන්න පුළුවන්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඕනෑ දවසක. දිනය දෙන්න. අපි ගිහිල්ලා පටන් ගනිමු. ඒ වාගේම එම්ල් නගර් එකටත් Rs. 59 million දීලා තිබෙනවා. සල්ලි දීලායි තිබෙන්නේ. ඒ නිසා බය වෙන්න එපා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ඒ වැඩ දෙකම කරන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කනගාටු වෙන්න එපා, ඔබතුමන්ලා වෙනුවෙන් වැඩේ කරනවා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Christmas එකට ඉස්සරවෙලා පටන් ගත්තොත් හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලාගේ සණ්ඩුව බේරා ගෙන අපට කියන්න.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
අපේ සණ්ඩු මොකුත් නැහැ. ඇමතිතුමා තමයි සණ්ඩු වෙන්නේ.

நன்றி, விளையாட்டுத்துறை அமைச்சர் அவர்களே!

அதேநேரத்தில், எங்களுடைய பிரதேசங்களில் யுத்தத்திற்கு முன்பு பல தொழிற்சாலைகள் இயங்கிவந்தன. குறிப்பாக, காங்கேசன்துறையில் சீமெந்துத் தொழிற்சாலை, ஒட்டுசுட்டானில் ஓட்டுத் தொழிற்சாலை போன்ற பல தொழிற்சாலைகள் இயங்கிவந்தன. கடந்த வரவு செலவுத்திட்டத்தில், வடக்கில் முன்பிருந்த தொழிற்சாலைகள் மீள ஆரம்பிக்கப்படுமென உறுதிமொழிகள் வழங்கப்பட்டன. அது தொடர்பில் பத்திரிகைகளில் விளம்பரங்கள் செய்யப் பட்டிருந்தன. அமைச்சர்கள் சென்று அந்தத் தொழிற் சாலைகளைப் பார்வையிட்டிருந்தார்கள். ஆனால், அதற்குரிய நடவடிக்கைகள் எதுவும் மேற்கொள்ளப்படவில்லை. அப்படியாயின் அவர்கள் சர்வதேசத்திற்குக் காட்டுவதற் குத்தான் அவ்வாறு செய்ததாக நான் கருதுகின்றேன். உண்மையில் அப்படியான ஒரு முன்மொழிவு இருந்திருந்தால், இந்த வரவு செலவுத் திட்டத்தில் அந்தத் தொழிற்சாலைகளின் புனரமைப்பைச் செய்வதற்கு நிதிகள் ஒதுக்கப்பட்டிருக்கும். எனவே, அதனையிட்டு கண்துடைப்பான ஒரு நாடகத்தைத்தான் அரசாங்கம் நடத்தியிருக்கிறது என்பதை நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

மன்னார், கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா ஆகிய மாவட்டங்களில் விவசாயிகளின் பெரிய எதிர்பார்ப்பாக இருப்பது நீர் வளம். அந்த நீர் வளத்தைச் சேமித்துக் கொள்வதற்கு ஏற்றவாறு அங்குள்ள குளங்கள் புனரமைப்புச் செய்யப்படாதிருக்கின்றன. குறிப்பாக மன்னார் கட்டுக்கரைக் குளத்திற்குக் கீழ் 162 சிறிய குளங்கள் இருக்கின்றன. அந்தச் சிறிய குளங்களில் 40 க்கும் மேற்பட்ட குளங்கள் தொடர்பான தரவுகள் என்னிடம் இருக்கின்றன. நான் நீர்ப்பாசன அமைச்சர் அவர்களிடம் ஏற்கெனவே அவற்றைக் கையளித்திருக் கின்றேன். இந்த 40 இற்கு மேற்பட்ட குளங்கள் 30 வருட காலமாகச் சிறிய திருத்த வேலைகள்கூடச் செய்யப்படாமல் இருக்கின்றன. அவற்றில் ஒரு குளத்தின் திருத்த வேலைக்கு கிட்டத்தட்ட 3 மில்லியன் ரூபாய் தேவை; 40 குளங்களுக்கும் திருத்த வேலை செய்யவேண்டும்; அதற்காக 120 மில்லியன் ரூபாய் நிதி இந்த வரவு செலவுத் திட்டத்தில் உள்ளடக்கப்பட வேண்டுமென்று நான் நீர்ப்பாசன அமைச்சரிடம் கேட்டிருந்தேன். ஆனால், அதற்கான முன்மொழிவுகள் எதுவும் இதில் உள்ளடக்கப்படவில்லை. அதேநேரத்தில், மிகவும் வேடிக்கையான ஒரு விடயம் என்னவென்றால், எந்தவிதமான விவசாயத் தேவைக்கும் பயன்படுத்தப்படாத மன்னார் தாராபுரத்தில் உள்ள ஒரு குளத்தைப் புனரமைப்பதற்கு முன்மொழியப்பட்டிருக்கின்றது. அந்தக் குளத்தின் கீழ் எவ்வளவு விவசாய நிலங்கள் இருக்கின்றன? எவ்வளவு விவசாயிகள் அந்த நிலங்களைப் பயன்படுத்துகின்றார்கள்? என்று நான் நிதி அமைச்சரிடமும் இந்த அரசிடமும் கேட்க விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Sir, please give me three more minutes.

தாராபுரம் என்பது இங்கிருக்கின்ற ஓர் அமைச்சருடைய சொந்த ஊராகும். தாராபுரத்திலுள்ள குளத்தைப் புனரமைப்புச் செய்வதன்மூலம், அவர்மீது வெறுப்பைக் காட்டும் அந்த ஊர் மக்களுடைய ஆதரவைச் சம்பாதிக்க அவர் யோசித்திருக்கிறார் என்று நான் நினைக்கின்றேன்.

மேலும், நேற்றைய வரவு செலவுத் திட்ட உரையில், பல்கலைக்கழகம் செல்லாத மாணவர்களுக்கும் பட்டப் படிப்புக்கு முன்மொழியப்பட்டிருந்தது; அது உண்மையில் வரவேற்கத்தக்க விடயம். ஆனால், பல்கலைக்கழகப் பட்டம் பெற்ற மாணவர்கள் எத்தனை பேருக்கு வேலைவாய்ப்பு வழங்கப்பட்டிருக்கின்றது? 2012 மார்ச் 31ஆம் திகதிக்கு முன்னர் பட்டம் பெற்றவர்களுக்கு மட்டுமே நியமனங்கள் வழங்கப்பட்டுள்ளன. அதற்குப் பிறகு, அதாவது, ஏப்பிரல் மாதம் 2ஆம் திகதி பட்டம் பெற்றவர்களுக்குக்கூட நியமனம் வழங்கப்படவில்லை. இப்பொழுது 2016ஆம் ஆண்டு நவம்பர் மாதமும் வந்துவிட்டது. 4 வருடங்களுக்கு மேலாக வேலைவாய்ப்பற்றிருக்கும் பட்டம்பெற்ற இளைஞர், யுவதிகள் தொடர்பாக இந்த வரவு செலவுத் திட்ட முன்மொழிவில் ஏதாவது குறிப்பிடப்பட்டிருக்கின்றதா? அவர்களுக்கு எப்போது வேலைவாய்ப்பை வழங்கப்போகிறீர்கள்? படித்துப் பட்டம்பெற்ற பல்கலைக்கழக மாணவர்களுக்கு இன்னமும் வேலைவாய்ப்பு வழங்காமல், அதற்கொரு திட்டமிடல் இல்லாமல், நீங்கள் சாதாரணமாக முன்மொழிவுகளை மட்டும் செய்துவிட்டு இருக்கிறீர்கள்! இன்னும் 2 வருடங்கள் சென்றால், "உங்களுக்கு 35 வயதாகிவிட்டது, அரச நியமனம் வழங்க முடியாது" என்று பல்கலைக்கழகப் பட்டம் பெற்ற அந்த மாணவர்களுக்குச் சொல்வீர்கள். இப்படியாக மக்களை ஏமாற்றுகின்ற ஒரு வரவு செலவுத் திட்டமாகத்தான் நான் இதனைப் பார்க்கின்றேன். உண்மையில் இந்த

வேலைவாய்ப்பு விடயத்தில் எங்களுடைய இளைஞர், யுவதிகளுக்கு அவர்கள் பெற்ற பட்டங்களுக்குத் தகுந்த வேலைவாய்ப்பை நீங்கள் உறுதிசெய்ய வேண்டும். கடைசி ஆண்டுவரை பட்டம் பெற்றவர்களுக்கும் நீங்கள் வேலைவாய்ப்பை வழங்க வேண்டும். உங்களுடைய தொகுதிகளில் உங்களுடைய இளைஞர், யுவதிகளுக்கு உங்களுடைய அமைச்சுகளின் அதிகாரத்தின்மூலம் வேலைவாய்ப்புகளை வழங்குகிறீர்கள். ஆனால், எங்களுடைய பிரதேசங்களில் அரசியல் ரீதியாக, அமைச்சு ரீதியாக ஆதரவு இல்லாததால் அவர்கள் இன்றும் வேலைவாய்ப்பைப் பெற்றுக்கொள்ள முடியாமல் இருக்கிறார்கள் என்பதைத் தெரிவித்துக்கொள்வதோடு, எனக்கு 2 நிமிடங்கள் அதிகமாகத் தந்ததற்காக கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்து, விடைபெறுகின்றேன்.

[අ.භා. 4.07]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**

(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)

(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන්ම ශ්‍රී ලංකාව ගෝලීය ආර්ථිකයේ ඇති වන නව වෙනස්කම් පාදක කර ගෙන ඒ මත රැඳෙමින් ඒ පුරෝකථන ලබාගනිමින් 2017 අය වැය ඉදිරිපත් කිරීමට ගන්නා උත්සාහය පිළිබඳ අපි කථා කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් ඕනෑම රජයක් තමන්ගේ අවුරුද්දේ අය වැය ඉදිරිපත් කරනකොට කරුණු කිහිපයක් ගැන තමන්ගේ අවධානය යොමු කරනවා. එකක් තමයි රාජ්‍ය ණය බර අඩු කිරීම. එනම් දළ වශයෙන් අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5කට වඩා අඩුවෙන් තබා ගැනීම සහ දිගු කාලීන වශයෙන් සියයට 3ක් දක්වා අඩු කිරීම. ආදායම් බෙදී යාමේ විසමතාව හැකිතාක් දුරට අඩු කිරීම. ඒකෙන් අදහස් කරන්නේ ඕනෑම රටක එක්තරා පන්තියක් මූල්‍ය ක්‍රමයේ විශාල ප්‍රමාණයක් ඔවුන්ටත්, ඉතාම අඩු ප්‍රමාණයක් රටේ අනිකුත් ජනතාවටත් ලබා දෙන විසමතාව අඩු කිරීමට ධනවාදී හෝ සමාජවාදී සෑම රටක්ම උත්සාහ කරනවා කියන එකයි. ඊළඟට යැපුම් මට්ටමෙන් අඩු ජනතාවට සහනාධාර ක්‍රම පවත්වාගෙන යාම, අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යාම. ලංකාවේ බොහෝ දුරට නිදහස් අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යන නිසා රජය ඒ පිළිබඳ වැය බර දරන නිසා රජයට අනිවාර්යයෙන්ම ඒ සඳහා විශාල වියදමක් දරන්නට සිදු වෙනවා. තුන් වන කාරණය තමයි යටිතල පහසුකම් පවත්වාගෙන යාම. පාරවල්, වරායයන් ආදී මේ සියල්ලම සංවර්ධනය කිරීම රටක ආණ්ඩුවකට තිබෙන ප්‍රධාන වගකීමක්. ඔවුන් එය ඉටු කරන්නට ඕනෑ. ඊට අතිරේක වශයෙන් රැකී රක්ෂා ඇති කරන්න ඕනෑ. මේ කරුණු තමයි අය වැයකදී ප්‍රධාන වශයෙන් බලන්නේ.

පසුගිය කාලය තුළ අපි දැකපු දෙයක් තමයි සෑම ආණ්ඩුවක්ම මේ මූලික කරුණු පහ මත රැඳෙමින් විශාල වශයෙන් ඒවා දියුණු කිරීමට ක්‍රියා කර තිබෙනවා කියන එක. අද පවතින අර්ථ ක්‍රමය අනුව යම් රටකට තමන්ගේම ආර්ථිකය මත, ඒ කියන්නේ ආදායම සහ වියදම සමාන වෙන අය වැයක් ඉදිරිපත් කරන්න බැහැ. මම හිතන්නේ නැහැ, ලෝකයේ කිසිම රටකට අය වැය සමාන වෙන තත්ත්වයක් ඇති කරන්න පුළුවන්ය කියා. හැම විටම අය වැය හිඟයක් තිබෙනවා. ඒ හිඟතාවය දේශීය හෝ විදේශීය ණය ලබා ගැනීමෙන් පුරවා ගන්නවා. ඒ පුරවා ගැනීම හරහා මම කියපු ඒ කරුණුවලට අවශ්‍ය කරන මුදල් වියදම් කරනවා. ඒක තමයි සාමාන්‍ය සිරිත වන්නේ. ණය ගැනීම පිළිබඳ ප්‍රධානම තර්කය තමයි ණය ගැනීමත් ආර්ථිකයට ඉසිලිය හැකි මට්ටමෙන් කළ යුතුයි කියන එක. එහෙම නොකළොත් ණය ගැනීම පිළිබඳ ප්‍රශ්න ඇති වෙනවා. එහෙම වුණාම අපි ණය ගෙවීමට නොහැකි රටක් බවට පත් වෙනවා. එතකොට අපි ලෝක ආර්ථිකය නොපිළිගන්නා රටක් බවට පත් වෙනවා. ඒ අනුව අපට ග්‍රීසිය වැනි සම්පූර්ණයෙන්ම ණය ගැනීම පිළිබඳ කාරණය මත බංකොලොත්, බුන්වත් රටක් බවට පත් වීම තමයි සිදු විය හැකිව තිබෙන්නේ. බොහෝ විට අද මතයක් තිබෙනවා, බදු අය කිරීම නොකළ යුතුයි කියා. මම දන්නේ නැහැ, ඒ මතය කොතැනින් ආවාද කියා. බදු අය කරන්නේ නැතිව, ආදායම වැඩි කර ගන්නේ නැතිව වියදම කරන්නේ කොහොමද කියන ගැන අපි තර්ක කරන්න ඕනෑ. එක කාරණයක් පිළිබඳව මම මේ රජයට ප්‍රශංසා කරන්න කැමැතියි. ඒ කියන්නේ රජය මේ ක්‍රමය තුළ ඉතා හොඳ වැඩක් කර තිබෙනවා. රුපියල් ලක්ෂය දක්වා ආදායම ලබන රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සේවකයෙක් අද උපයන විට ගෙවීමට අහු වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් ලක්ෂය තමයි අද තිබෙන සීමාව වන්නේ. ඒ කියන්නේ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ කවුරු හරි මාසයකට රුපියල් ලක්ෂයක් හම්බ කරනවා නම් ඒ අය මොන යම් හෝ බදු ක්‍රමයකට අහු වෙන්නේ නැහැ. ඒ අය ඒකට අයිති වෙන්නේ මාසික ආදායම රුපියල් ලක්ෂයට වැඩි වෙනවා නම් විතරයි. ඒක ඉතාමත්ම හොඳ ප්‍රවණතාවක්. ඒ බදු සහනය ලබා දීම ඉතා වැදගත් ක්‍රියාවක් හැටියට තමයි මම සලකන්නේ. ඒ හරහා අපේ සාමාන්‍ය සේවක පන්තියේ සෑහෙන ස්ථාවරභාවයක් ඇති කරන්න අපට පුළුවන් වෙනවා. තමන්ගේ ආදායම රුපියල් ලක්ෂ හයට වැඩි නම් ඒ ආදායමට අය බදු අය කිරීම දැන් කාලයක සිට කර ගෙන යනවා. ඒ අය බදු අය කිරීමේ සීමාවන් එලෙසම පවත්වා ගැනීමත් ඉතා වැදගත්. මොකද, අය බදු අය කිරීම රටක ආර්ථිකයට ඉතා වැදගත් වෙනවා.

විශේෂයෙන්ම අපි දන්නවා, පසු ගිය රජය කාලයේ, එවකට විරුද්ධ පක්ෂය කළ ප්‍රධාන චෝදනාවක් වුණේ අපි බදු අය කරනවාය කියන එකයි. බදු අය නොකර රජයකට තමන්ගේ වියදම පවත්වා ගෙන යා හැකිය කියලා මම කල්පනා කරන්නේ නැහැ. ප්‍රධානම හේතුව තමයි අපි ලෝකයේ වෙනත් කවර රටකටත් වඩා අධ්‍යාපනය, සෞඛ්‍යය, සමෘද්ධි සහනාධාර, පොහොර සහනාධාර, අධ්‍යාපන අංශයට කරන වෙනත් වියදම් විශාල වශයෙන් කරන්නේ රජයේ වියදමින්. රජයේ මුදල් විශාල වශයෙන් වැය කරන්නේ මේ කාරණා වෙනුවෙනුයි. ඒ නිසා බදු අදායමේ වර්ධනයක් ඇති කර ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර දහයකට ආසන්න කාලයක් මේ පාර්ලිමේන්තුවේ හිටපු අමාත්‍ය ඩිව් ගුණසේකර මැතිතුමා අය වැය විවාදවල කළ කථා හැම අවස්ථාවකම මම අහ ගෙන හිටියා. එතුමාගේ ප්‍රධාන තර්කය වුණේ පසු ගිය වසර 10 ඇතුළත අපේ රටේ බදු ආදායම පහත වැටීම නිසා ජාතික ආදායම පිළිබඳ විශාල ප්‍රශ්නයකට අපි මුහුණ පෑවා කියන එකයි. ඒ නිසා ජාතික ආදායමේ ප්‍රතිශතයක් හැටියට බදු ආදායම ඉහළ නංවා ගැනීම අවශ්‍යයෙන්ම අපි කළ යුතුයි. එසේ කර ගැනීම සඳහා ක්‍රියා කිරීමෙන් පමණයි අපි දෙන සහනාධාර ක්‍රමයන් තවදුරටත් ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා බදු ලබා ගැනීම සඳහා ගෙන එන ක්‍රියා මාර්ග පිළිබඳව සමහර තැන්වල සමහර විවේචන තිබුණත් හුඟක් දුරට ඒවා අත්‍යවශ්‍ය කරුණු හැටියට මා කල්පනා කරනවා.

අද අපේ අපනයන සෑහෙන පමණ පහත වැටෙමින් තිබෙනවා. සම්ප්‍රදායික අපනයනත් පහත වැටෙමින් තිබෙනවා, කාර්මික අපනයනත් පහත වැටෙමින් තිබෙනවා. මම හිතන්නේ නැහැ, ආයෝජන නැතිව කිසිම රටක ආර්ථිකයක් පවත්වා ගෙන යන්න පුළුවන් කියලා. පසු ගිය අවුරුදු දහය තුළ ආයෝජන ක්ෂේත්‍රය අර

[ගරු අනුර ප්‍රියදර්ශන යාප මහතා]

ගෙන බැලුවොත් හැමදාම අපට ලැබී තිබෙන්නේ ඩොලර් බිලියන එකකට අඩු ආයෝජනයි කියලා පෙනෙනවා. ඒ කියන්නේ ඩොලර් මිලියන 650යි, මිලියන 750යි, මිලියන 850යි. ඒ විධියට ඩොලර් බිලියන එකකට අඩුවෙන් තමයි ලැබී තිබෙන්නේ. මෙවැනි තත්ත්වයක් කවදාවත් රටක ඒකපුද්ගල ආදායම වැඩි කිරීමට හෝ රටේ සංවර්ධන වේගය වැඩි කිරීමට හේතු වන්නේ නැහැ. ඒ නිසා කාලයක ඉඳලා අපට සිද්ධ වෙලා තිබෙනවා, අපේ රටේ ඩොලරය පාවීම වැළැක්වීමට මහ බැංකුව සහ රජයේ බැංකු මඟින් වෙළෙඳ පොළට ඩොලර් නිකුත් කිරීමට. මේක තමයි අපි හැමදාම කළේ. ඒ හරහා තමයි යම් යම් ප්‍රමාණවලින් ඩොලරය තබා ගත්තේ. ඩොලරය පාවෙන්න නොදී තබා ගැනීම සඳහා මහ බැංකුවටත් රජයේ අනෙකුත් වාණිජ බැංකුවලටත් ඩොලර් අරගෙන විකුණන්න සිද්ධ වුණා. ඒ නිසා පසු ගිය කාලය තුළම ලංකාවේ ඩොලරයේ අගය එක්තරා විධියට පහළ මට්ටමක තිබුණත්, ඒ තත්ත්වය ඇති කර ගැනීම සඳහා අනෙක් පැත්තෙන් ඩොලර් විකිණීමේ කාර්යයේ අපි යෙදී සිටියා. එහි ප්‍රතිඵලයක් හැටියටයි, අද වන විට ඩොලරයට සාපේක්ෂව රුපියල ඉහළ යන්නේ. ඒ නිසා මේකට තිබෙන උත්තරය මොකක්ද? බොහෝ දෙනෙක් නොයෙකුත් උත්තර ගැන කථා කරනවා. මට හිතෙන හැටියට අපි කළ යුත්තේ ඩොලර් බිලියනයකට ආසන්න ආයෝජන සංඛ්‍යාව අඩු වශයෙන් ඩොලර් බිලියන 2 1/2 දක්වා වහාම ඉහළ දමා ගැනීමයි. එය කිරීමෙන් පමණයි අපට පුළුවන් වෙන්නේ ඩොලරයට සාපේක්ෂව අපේ රුපියලේ අගය අඩුවෙන් තබා ගන්නට. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඩුවෙන් තබා ගැනීමෙන් අපට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මොකද, අපේ අපනයනවලට වඩා තිබෙන්නේ ආනයන. අපි විශාල වශයෙන් ආනයනය කරනවා. අද අපේ රටේ ආනයනය නොකරන දෙයක් නැති තරමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ හොඳම මිනිරන් තිබෙනවා කිව්වාට අපට පැන්සලක්වත් හදා ගන්නට බැහැ. අපේ රටේ හොඳම රබර් තිබෙනවා කිව්වාට අපට මකන කැල්ලක්වත් හදා ගන්නට බැහැ. ඒ අනුව, අපි පසු ගිය කාලය පුරා කොතරම් දුර්වල මට්ටමකට පැමිණිලා තිබෙනවාද? මම රාජ්‍යයන්ට, පුද්ගලයන්ට දොස් කියන්නට යන්නේ නැහැ. නමුත් අපට පුළුවන්කමක් ඇතිවෙලා තිබුණේ නැහැ, අපේ නිෂ්පාදනවලට සාධාරණ වෙළෙඳ පොළක් ලබාදීමට ක්‍රියා කරන්නට. ඊට වඩා අඩු මිලට පිට රටින් එන භාණ්ඩවලට වෙළෙඳ පොළ අසීමිතව විවෘත කිරීමෙන් අපි අපේ දේශීය නිෂ්පාදන පන්තිය අනිවාර්යයෙන් බිමට හෙළනු ලැබුවා. මේක මම දිගින් දිගටම තර්ක කළ කාරණයක්.

මට මතකයි, 1977ට පෙර උපාලි විජේවර්ධන මහතා ලංකාවේ වාහන වර්ග දෙකක් එකලස් කෙරුවා කියලා. "උපාලි ෆියට්" කියලා වාහනයක් සහ "මැස්ඩා" කියලා වාහනයක් එකලස් කළා. නමුත් 1977 රජය පැමිණි ගමන්ම ආනයන විවෘත කිරීම හරහා ඒ එකලස් කිරීමේ කර්මාන්තය වැහිලා ගියා. ඒ වන විට ඉන්දියාවවත් එකලස් කිරීම පටන් අරගෙන තිබුණේ නැහැ. ඒක ඉදිරියට ගෙන ගියා නම් අද වන විට අපිට ආසියාවට වාහන අපනයනය කරන තත්ත්වයකට අපට පත්වන්නට ඉඩ තිබුණා. ආර්ථිකය විවෘත කිරීම නිසා අපේ ආනයන, අපනයන මාර්ග ගණනාවක් වැහිලා ගියා. ඒ නිසා මම හිතනවා, අද අපි උදවු කරන්නට ඕනෑ අපේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට කියලා. පැහැදිලි ලෙසම අපේ අපනයන වැඩි කර ගැනීම සඳහා නිෂ්පාදන දිරි ගැන්වීමක් අපි කළ යුතුව තිබෙනවා.

මම හිතනවා, මේ අය වැයෙන් ඒ සඳහා උත්සාහයක් කරලා තිබෙනවා කියලා. ඒ උත්සාහය කොහොමද කෙරෙන්නේ කියන එක අධීක්ෂණය කරන්නට මුදල් අමාත්‍යාංශය තුළ වෙනම ඒකකයක් තිබිය යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඒ ඒකකය නිරන්තරයෙන්ම තමන් දෙන බදු සහන ක්‍රියාත්මක වෙනවාද කියලා බලන්නට ඕනෑ. මට මතකයි, එක සැරයක් ශීතකරණ සහිත රථ ගෙන්වීම සඳහා බදු සහන දුන්නා. ඒවාගේ ශීතකරණ සහිත රථ ලංකාවට ගෙනාවා. ලංකාවට ගෙනාවාට පසු ශීතකරණය ගලවලා විසි කරලා රථය පදවනු ලැබුවා. ඒ නිසා අපි අදහස් කරන්නේ කුමක්ද, ඒ අදහස් කරන කාරණය නිසි ලෙස ඉටු වෙනවාද කියලා යම් ආකාරයකින් බලන්නට අපි වැඩ කටයුතු කළ යුතුයි කියලා මම කල්පනා කරනවා. එම නිසා මගේ ඉතාම වැදගත් යෝජනාවක් ලෙස මම සලකනවා, අපි දෙන බදු සහන ක්‍රියාත්මකවීමේදී කොපමණ දුරට ඒ අරමුණු ඉටු වෙනවාදැයි බලන්නට ඕනෑ. ඒ අරමුණු ඉටු නොවෙනවා නම් අපි වහාම වෙනත් පියවරකට යා යුතුයි කියලා මම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවෙනි කාරණය තමයි අපේ රටේ ආයෝජන සඳහා ඉඩම් ලබාදීම. ඔබතුමාත් දන්නවා, කොයි තරම් වෙහෙසකාරී ක්‍රියාවක්ද කියලා ඒක. ආයෝජකයෙක් පැමිණියාම ලංකාවේ ආයෝජනයක් ආරම්භ කිරීමට අවුරුද්දක් විතර එහේ මෙහේ ඇවිද ඇවිද ඉන්න ඕනෑ. BOI කියලා එකක් තිබෙනවා. නමුත් ඒකට ගියා කියලා ආයෝජකයාට සියල්ල ලැබෙන්නේ නැහැ. ඒ ආයෝජකයා විවිධ ආයතන සහ විවිධ පුද්ගලයෝ කරා යා යුතුව තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ රටේ තිබෙන්නේ ආයෝජකයා පිළිබඳව විශාල වැරදි අදහසක්. ආයෝජකයා එන්නේ අපේ ඉඩම් ගන්න, ආයෝජකයා එන්නේ අපේ අනෙක් දේවල් ගන්න කියන වැරදි ආකල්පයක් අපේ සමාජය තුළ ඇති වෙලා තිබෙනවා. එම නිසා ඉඩමක් ලබාදීමේදී අපි දහසක් කොන්දේසි ඔවුන්ට යොමු කරනවා. ඒ නිසා අපේ රටේ ආයෝජනය කරනවා වෙනුවට ඔවුන් වහාම වෙනත් රටවලට යනවා. අපිට පස්සේ ආයෝජන අවස්ථා උදා කළ බුරුමය වාගේ රටවල අයෝජන සංඛ්‍යාව සහ අද අපේ රටේ ආයෝජන සංඛ්‍යාව අරගෙන බලන විට අපිට වඩා සිය ගුණයකින් ඒ අවස්ථා වැඩි කර ගැනීමට ඔවුන්ට පුළුවන්වෙලා තිබෙනවා.

1977දී අපි විවෘත ආර්ථික ක්‍රමයක් ගෙනාවා වුණත් ඊට පසුව විවෘත ආර්ථික ප්‍රතිපත්ති ආරම්භ කළ මැලේසියාව සහ වියට්නාමය වාගේ රටවල් අද දැවැන්ත විදේශ ආයෝජන ලබා ගනිමින් සිටිනවා. ඒ නිසා මෙතැන හේතුව වී තිබෙන්නේ ආර්ථික ක්‍රමවේදය නොවෙයි. ආර්ථික ක්‍රමවේදය මෙහෙයවීම සමාජවාදීද, ආර්ථික ක්‍රමවේදය මෙහෙයවීම ධනවාදීද කියන කාරණාව නොවෙයි අද අවශ්‍ය වෙන්නේ. අපේ ආයෝජකයන්ට ඉක්මනින් ආයෝජන ආරම්භ කිරීමට අවස්ථාව ලබාදෙන ක්‍රමවේදය මොකක්ද කියන එකයි අපි කල්පනා කරන්නට ඕනෑ. ඒ මත විතරයි අපට පුළුවන් වෙන්නේ ආයෝජන අවස්ථා නිර්මාණය කරන්නට. එම නිසා අපේ ආයෝජන මීට වඩා සාධාරණ තැනකට, තුළනාත්මක තැනකට ගෙනියන්න, ආදායම් වැඩි කර ගන්න, රැකී රක්ෂා උත්පාදනය කරන්න නම් අපි කළ යුතු දෙය තමයි අපේ අයෝජකයන්ට දෙන අවස්ථාව වැඩි කර දීම. අපේ සිරිතක් තිබෙනවා, අපේ ඉඩම් ගමරාළගේ ඉඩම් වාගේ පාලනය කරන්න කල්පනා කරන එක. ඉඩමට අප ආදරය කරනවා. නමුත්, ඉඩම දියුණු කිරීම ගැන කල්පනා කරන්නේ නැහැ. එම නිසා ඉඩම දියුණු කිරීම පිළිබඳව අපේ තිබෙන හැඟීම වර්ධනය කර ගැනීමෙන් පමණයි මේ වැදගත් කටයුත්ත අපට කරන්න පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවනුව මා මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. අපේ රට පිහිටා තිබෙන්නේ ආසියාවේ ඉතා වැදගත් මං සන්ධියකයි. අපේ රට යටත් විජිතයක් බවට පත් කරගත් ප්‍රධාන රාජ්‍යයන් තුනම අපේ රට යටත් කර ගත්තේ, අපට තිබෙන ආර්ථික හැකියාව අනුව නොවෙයි; අපේ රටේ පිහිටීමේ

තිබෙන වැදගත්කම නිසායි. අපට මතකයි, දෙවැනි ලෝක යුද්ධයේදී ජපානය දකුණු ආසියාවේ සියලු රටවල් අත්පත් කර ගනිද්දි, අවසානයේදී එංගලන්ත නාවික හමුදාවට රක්ෂාවරණය සලස්වන්න ඉඩ තිබුණේ ත්‍රිකුණාමලය වරායේ පමණක් බව. ත්‍රිකුණාමලය වරායේ යුද නැව් 162ක් නවත්වා තිබුණු බව ඉතිහාස කථාවලින් අප අහලා තිබෙනවා. එයින් අදහස් කරන්නේ මොකක්ද? අපේ රට පිහිටා තිබෙන්නේ ප්‍රධාන මං සන්ධියකයි. මේ තත්ත්වය අපේ ආර්ථිකය වර්ධනය කර ගැනීමට උපයෝගි කර ගන්න ඕනෑ.

විශේෂයෙන්ම අපේ ප්‍රධාන අසල්වැසියා වන ඉන්දියාව දැවැන්ත වෙළෙඳ පොළක්. අඩු වශයෙන් අප යම් භාණ්ඩයක් නිෂ්පාදනය කරලා ඒ දැවැන්ත වෙළෙඳ පොළට අපනයනය කරන්නේ කොහොමද කියා කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේම චීනයත් අද ආයෝජනය කරන්න බොහොම මහන්සි වන රටක්. එම රටවලට අපේ ආයෝජන අවස්ථා ලබාදෙන්නේ කොහොමද, රටේ අනන්‍යතාව ආරක්ෂා කරගනිමින්, රටේ තිබෙන දේශපාලන ඒකමුතුභාවය ආරක්ෂා කරගනිමින් එම ආයෝජන කරන්නේ කොහොමද, අපේ උදවියගේ රක්ෂා ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්නේ කොහොමද කියා අප කල්පනා කරන්න ඕනෑ.

මා දන්නවා, අපේ රටේ නව නිෂ්පාදන වෙනුවෙන් අපි කවදාවත් යම් මුදලක් වෙන් කළේ නැති බව. පර්යේෂණය සහ සංවර්ධනය - research and development - කියන අංශය වෙනුවෙන් අප බොහෝ විට මුදල් වෙන් කරන්නේ නැහැ. මගේ අදහසේ හැටියට රටක් වශයෙන් අප දියුණු වෙන්න නම් ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයෙන් අඩු ගණනේ සියයට එකක්වත් මේ පර්යේෂණ අංශයටත්, ඒ වාගේම පර්යේෂණය ඔස්සේ කරන නව නිපැයුම්වලටත් අප වෙන් කරන්න ඕනෑ. ඒ සඳහා මේ අය වැයෙන් උත්සාහයක් දරා තිබෙනවා. එය ඉතාම හොඳ උත්සාහයක්. විශේෂයෙන්ම විශ්වවිද්‍යාලවලට, අනිකුත් පර්යේෂණ ආයතනවලට මේ කටයුතු කරන්න ඉඩකඩ සලස්වමින් යම් ප්‍රමාණයකට මුදල් ලබාදී තිබෙනවා. එය ප්‍රමාණවත් යයි මා කියන්නේ නැහැ. නමුත්, පර්යේෂණ අංශය ගැන වැඩි අවධානයක් යොමු කරන්න ආරම්භයක් හැටියට යම් මුදලක් ලබාදී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට මතකයි, නැනෝ තාක්ෂණ විද්‍යාලය ආරම්භ කරන අවස්ථාවේදීත් මේ කාරණය සැලකිල්ලට ගෙන තිබුණු බව.

ඒ විතරක් නොවෙයි. අපේ රටේ ජනගහනයෙන් සියයට 20කගේ පමණ ආදායම අදටත් දිනකට ඩොලර් දෙකකට -රුපියල් 300කට- වඩා අඩුයි. එම නිසා මේ යැපුම් මට්ටමට වඩා අඩු ආදායම් ලබන ජනතාව රැකබලා ගත යුතුයි. ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. සමෘද්ධිය වැනි වැඩ පිළිවෙළවල්වල ගෙවීම් පසු ගිය කාලයේ දෙගුණය කළත්, මා හිතන විධියට තවදුරටත් එයට ඇතුළත් වීමට විශාල පිරිසක් බලාගෙන ඉන්නවා. එම නිසා ඒ පිළිබඳව අප වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ග්‍රාමීය ජනතාව ණය බරකින් පෙළෙනවා. විශේෂයෙන්ම ඔවුන්ට සාධාරණ පොලියකට ණය ලබා ගැනීමේ ක්‍රමවේද නිර්මාණය කරන්න සමෘද්ධි බැංකු වැනි ආයතන පාවිච්චි කරන්න ඕනෑ. ඒ සඳහා අප උදවු කරන්න ඕනෑ. Microfinance පහසුකම් සපයලා අප ඒ අයට උදවු කරන්න ඕනෑ.

අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න කැමැතියි. විවිධ ක්ෂේත්‍රවල තිබෙන යම් යම් අංශ දියුණු කරන්න මෙම අය වැය මඟින් සැහෙන උත්සාහයක් දරා තිබෙනවා. එම උත්සාහයන් එලෙසම සාර්ථක වුණොත්, අපේ රටේ නිෂ්පාදන අංශයේ යම්කිසි ආකාරයක දියුණුවක් ඇති වෙලා, රටේ ආර්ථිකය මීට වඩා හොඳ තත්ත්වයකට ගෙන යන්න අපට පුළුවන් වෙයි කියා විශ්වාස කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මීළඟට, ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා.

ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர )
(The Hon. Dayasiri Jayasekara )
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு,* மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் *தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

[අ.භා. 4.25]

**ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

මේ අවස්ථාව අප පුල-පුලා බලා සිටි අවස්ථාවක්. අද දින විවාදයේදී අපේ ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා කථා කරද්දී, නිදහස් වෙළෙඳ කලාප සම්බන්ධයෙන්, උපාලි විජේවර්ධන මහත්මයා වැනි අපේ නායකයන් ගැන කථා කළා. උපාලි ෆියට්, මැස්ඩා වැනි කාර් මේ රටට හඳුන්වා දුන්නා. "ඩෙල්ටා" ටොෆි,

[ගරු සුජීව සේනසිංහ මහතා]

"කැන්ඩොස්" චොක්ලට් වැනි ව්‍යාපාර මේ රටේ ආරම්භ කළා. [බාධා කිරීමක්] ෆොක්ස්වාගන් වාහනත් ගෙනෙනවා, බලාගෙන ඉන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියල්ල එක්සත් ජාතික පක්ෂයේ දක්ෂ නායකවරු මේ රටට හඳුන්වා දුන්නා. මේ සියල්ල 1977දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් අපට ලැබුණු දායාදයන්. ආර්. ප්‍රේමදාස මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා, රන්ජන් විජේරත්න මැතිතුමා, ඔසී අබේගුණසේකර මැතිතුමා, වීරසිංහ මල්ලිමාරච්චි මැතිතුමා, ගාමිණී අතුකෝරල මැතිතුමා වැනි නායකයින් මේ රට වෙනුවෙන්, රටේ අනාගතය වෙනුවෙන් ජනසවිය, ගම් උදාව වැනි වැඩසටහන් හා ඇඟලුම් කර්මාන්තය ඇතුළුව කර්මාන්ත විශාල ප්‍රමාණයක් ඇති කළා. නමුත් අපේ අවාසනාවට, මේ රටේ අවාසනාවට එල්ටීටීඊ සංවිධානය ඒ සංවර්ධනය දැකලා අපේ නායකයින් විශාල ප්‍රමාණයක් ඝාතනය කළා. ඉතිරි වුණේ අපේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පමණයි. අපි බොහෝ කාලයක් පුල-පුලා බලා ඉඳලා මේ ආර්ථිකය ගොඩ නඟන්න අවස්ථාවක් ඉල්ලුවා. ඒ අවස්ථාව- [බාධා කිරීමක්] ගරු ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා. ඔබතුමාට මේ දවස්වල වැඩ රාශියක් තිබෙනවා. ඒ නිසා මේ දවස්වල පොඩ්ඩක් විවේක ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පුල-පුලා බලා සිටි ඒ අවස්ථාව අපට හම්බ වුණා. ඊට පස්සේ අපට හරියාකාරව අය වැයක් ඉදිරිපත් කර ගන්න ලැබුණු අවස්ථාව තමයි, මේ අවස්ථාව. ගරු බන්දුල ගුණවර්ධන ශූරීන් මේ ගරු සභාවේ සිටියා නම් හොඳයි. එතුමා, වයිමාවත් නිර්වස්ත්‍ර කළ අපේ හොඳ, දක්ෂ මන්ත්‍රීවරයෙක්. එතුමා මගේ මිත්‍රයා. එතුමා තමන්ට ඕනෑ වෙලාවට වයිමා බහිරවයා කරනවා, බහිරවයා වයිමා කරනවා. එතුමා දක්ෂයෙක්. ඕනෑ කථාවක් ඕනෑ පැත්තකට හරවන්න පුළුවන් දිවක් එතුමාට තිබෙනවා. හැබැයි, එතුමා හොඳ දේශපාලනඥයෙක්. අපි එතුමාට ආදරය කරනවා. එතුමා අපව විවේචනය කරන්න ඕනෑ. මොකද, එතුමා ඉන්නේ විරුද්ධ පක්ෂයේ. හැබැයි එතුමා අද අමූලික ව්‍යාජ දත්ත මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එතුමා මේ ගරු සභාවෙන් යනකොටත් මා කිව්වා, "පොඩ්ඩක් අහගෙන ඉඳලා යන්න. පුළුවන් නම් උත්තරයක් දෙන්න"යි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ඉදිරිපත් කරන්න කලින් මේ රටේ තිබුණු ණය සම්බන්ධයෙන් ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. අපේ නායකයින් ඝාතනය වුණු කාලයක, අපි මේ රට දියුණු කරලා, 1994දී භාර දෙන කොට තිබුණු ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 0.55යි. ඒ 1994දීයි. 2005දී මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රට භාර ගත්තා. එතකොට තිබුණු ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 2.2යි. ඊට පස්සේ 2015 වන කොට රුපියල් ට්‍රිලියන 8.503ක වාර්තාගත ණය ප්‍රමාණයක් මේ රටට ඉතිරි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා කිව්වා, 2015 ණය ප්‍රමාණයට වඩා 2016 ණය ප්‍රමාණය වැඩියි, ඊට වැඩි ණය ප්‍රමාණයක් 2017 වර්ෂයට එයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට පොඩ්ඩක් අමතක වුණා, මේ ණය අරගෙන තිබෙන්නේ ඩොලර්වලින් සියයට 6.9ක සාමාන්‍ය පොලී අනුපාතයකට බව. ඔබතුමන්ලා දන්නවා, එය රුපියල්වලට හැරෙව්වොත් අඩුම ගණනේ සියයට 25කට ආසන්න පොලී අනුපාතයක් වන බව. සියයට 25ක පොලී අනුපාතයක් කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගත්ත ණය ප්‍රමාණය හැම අවුරුද්දකම සියයට 25කින් වැඩි වනවාය කියන එකයි. ගිය අවුරුද්දේ රුපියල් ට්‍රිලියන නවයයි, මේ අවුරුද්දේ රුපියල් ට්‍රිලියන දහයයි. මේ ආණ්ඩුව කිසි විටෙක මුදල් අපතේ යවන්න කටයුතු කරලා නැහැ. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගම, CHOGM එක වැනි විනාශකාරී දේවල්වලට අපි මුදල් වෙන් කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම රජයේ වියදම් සම්බන්ධයෙන් එතුමා සඳහන් කළා. ඒ අවස්ථාවේදී එතුමා ව්‍යාජ දත්ත ඉදිරිපත් කළා. රජයේ වියදම් සම්බන්ධයෙන් එතුමා ඉදිරිපත් කළ දත්තවලට පිළිතුරු වශයෙන් මා මේ දත්ත ඉදිරිපත් කරන්න කැමැතියි. 2013දී Recurrent Expenditure 1205යි, Capital Expenditure - ප්‍රාග්ධන වියදම්- 481යි. 2014දී පුනරාවර්තන වියදම් 1323යි, ප්‍රාග්ධන වියදම් 486යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් 708යි. ඒ කියන්නේ, දෙගුණයක් වෙලා. හැබැයි, එතුමා කරුණු වසන් කළා. 2015දී ප්‍රාග්ධන වියදම් 603යි. මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් 2017 වනකොට ප්‍රාග්ධන වියදම් සඳහා 708ක් අපි වෙන් කරනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අධ්‍යාපනය සම්බන්ධයෙනුත් එතුමා අමූලික ව්‍යාජ දත්ත මේ ගරු සභාවට ඉදිරිපත් කළා. අධ්‍යාපනය සඳහා 2014 වර්ෂයේදී රුපියල් බිලියන 187යි වෙන් කළේ. නමුත් 2017 වර්ෂය සඳහා රුපියල් බිලියන 260ක් අපි වෙන් කරනවා. අවුරුදු දෙකක් තුළ අපේ ආණ්ඩුව රුපියල් බිලියන 260ක් අධ්‍යාපනයට වෙන් කරනවා. ඒ කරුණු වැරදිසහගත ලෙස බන්දුල ගුණවර්ධන මැතිතුමා ඉදිරිපත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක්", එහෙම නැත්නම් "සැමට ප්‍රතිලාභ" කියන සංකල්පය යටතේ තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරන්නේ. මේ අය වැයේ වැදගත්ම අංගයක් තිබෙනවා. මේ අය වැයේ ප්‍රතිලාභ කොළඹට, නුවරට, අනුරාධපුරයට, පොළොන්නරුවට පමණක් නොවෙයි, වව්නියාවට, යාපනයට, ත්‍රිකුණාමලයට ආදී රටේ සෑම කොනකටම බෙදිලා යනවා. ඒ ආකාරයේ ආර්ථිකයක් තමයි අපි මේ අය වැය මඟින් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානයට මා ආයෝජන පිළිබඳ කරුණු ඉදිරිපත් කරනවා. කලින් රජය කරපු බොහෝ ආයෝජන රජයේ ආයෝජන බවට පත් කළා. ඒවාට ටෙන්ඩර් කැඳෙව්වේ නැහැ. ඒවායෙන් සියයට 20ක්, සියයට 30ක් කොමිස් ගැහුවා. හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ, නෙළුම් පොකුණ වැනි ව්‍යාපෘති විශාල පාඩු ලබන ව්‍යාපෘති බවට පත් කළා. හැබැයි, ආයෝජන සඳහා විශාල ප්‍රමාණයක් වෙන් කරනවාය කියන එක දත්තවලින් පෙන්නුම් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ මුදල් වෙන් කරලා අපට ආයෝජන පෙන්වන්න පුළුවන්. අපේ ආණ්ඩුවේ සංකල්පය ඒක නොවෙයි. අපේ ආණ්ඩුවේ සංකල්පය වන්නේ ආයෝජනය රජයෙන් කරන ගමන්ම දේශීය සහ විදේශීය වශයෙන් පෞද්ගලික අංශයේ දායකත්වයත් ආයෝජනවලට ඇතුළු කරලා ඒ දායකත්වය ලබා ගන්න පෞද්ගලික අංශය උනන්දු කරවීමයි. එතකොට ආණ්ඩුවේ බර සැහැල්ලු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපනයන වර්ධනය කිරීම සඳහා හැම දිස්ත්‍රික්කයකම incubation centre එකක් ඇති කරලා, වසර 2018 වෙද්දී දේශීය ආයෝජකයන් දිරිමත් කරන්නත්, ඒ මඟින් නවක ආයෝජකයන්, ඒ වාගේම අපනයනකරුවන් 2,500ක් බිහි කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජපානය, කොරියාව වාගේ රටවල් දියුණු වෙලා තිබෙන්නේ අලුතින් නිෂ්පාදන හෝ ව්‍යාපෘති ඒ රටට එකතු කරලායි. හොන්ඩා, යමහා, නිසාන්, මිට්ෂුබිෂි වැනි ආයතන තුළින් තමයි ජපානය දියුණු වුණේ. පාරම්පරික ආයතන දියුණු කරන ගමන් අලුත් ආයතනවලටත් ජපානය නැඹුරු වුණා. ඒ වාගේම තමයි කොරියාවත්. පසු ගිය අවුරුදු 20 තුළ සැම්සුන්, එල්ජී, කියා, හුන්ඩායි වැනි ආයතන අලුතින් නිෂ්පාදනයට එකතු වෙලා තමයි කොරියාව දියුණු වුණේ. අපි විපක්ෂයේ ඉන්න කාලයේ දිගින් දිගටම සඳහන් කළා, අඩුම ගණනේ අපි මේ රටේ හිරමණයක්වත් නිෂ්පාදනය කරලා නැහැ කියන එක. අපි අවුරුදු 20ක් යන තෙක් වෙළෙඳ කලාප ගැන කථා කළා. ඒ වාගේම උපාලි විජේවර්ධන මැතිතුමාගේ ඒ සංකල්පය ගැන කථා කළා. ඇඟලුම් කර්මාන්තයට පස්සේ අපට කිසිම කර්මාන්තයක් මේ රටට හඳුන්වා දෙන්න බැරි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතය සම්බන්ධයෙන් අපි දැනුවත් වනකොට, අධ්‍යයනයක් ලබන කොට, ඉලෙක්ට්‍රොනික වන්න පුළුවන්, කාර්මික අපනයන වන්න පුළුවන් ඒවා සඳහා වාණිජ සහයෝගය ලබා දීලා අපේ අපනයනකරුවන්, ආයෝජකයන් දිරි ගන්වන්න ඕනෑ. ඒ හරහා අලුත් නිර්මාණ බිහි කිරීම තමයි ඉදිරි අනාගතයේදී මේ ආණ්ඩුවේ බලාපොරොත්තුව වන්නේ.

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
ජය වේවා!

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි.

ඒ වාගේමයි, කුඩා සහ මධ්‍යම පරිමාණයේ කර්මාන්තත්. ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමනි, නීත්‍යානුකූල කර්මාන්තවල යෙදෙනවා නම්, ඔබතුමාටත් මේවාට ඇතුළු වන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ වෙළෙඳ පොළ සම්බන්ධයෙන් දැනුම ලබා දෙනකොට, තාක්ෂණ දැනුම ලබා දෙනකොට අලුත් නිර්මාණ බිහි වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශය තුළින් විදේශ වෙළෙඳ පොළ හඳුන්වා දීලා ඒ තුළින් බලාපොරොත්තු වන්නේ මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාව, චීනය, සිංගප්පූරුව මැලේසියාව, තායිලන්තය වැනි රටවල් සමඟ වෙළෙඳ ගිවිසුම් ඇති කරගෙන ලංකාවට විදේශ වෙළෙඳ පොළ ගෙන ඒමයි අපි බලාපොරොත්තු වන්නේ. හම්බන්තොට වරාය, ත්‍රිකුණාමලය වරාය හදලා මොනවාද කළේ? මේ සඳහා බිලියන 250කට අධික මුදලක් වියදම් කළා. ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරායේ අවුරුද්දකට පාඩුව විතරක් මිලියන 1,000යි. ආදායම මිලියන 75යි. ඒ අනුව මිලියන 925ක් විනාශ වනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විකුණා දමන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
විකුණා දමන්න පුළුවන් නම්, විකුණා දමනවා. හැබැයි, විකුණා දමන්න බැහැ. [බාධා කිරීමක්] විකුණන්න පුළුවන්, ගත්ත කොමිස්වලට මොකද කරන්නේ? ඒ කොමිස් විකුණන්න පුළුවන්ද? ඒ කොමිස් එක්කම විකුණන්න පුළුවන් නම්, විකුණන්න පුළුවන්. හම්බන්තොට වරාය වෙනුවෙන් ගත්ත මුදල කීයද? මේ සඳහා බිලියන 250ක් වියදම් වෙලා තිබෙනවා කියලා මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් කියද්දී, චීනයෙන් කියනවා, ඒකට අරගෙන තිබෙන්නේ බිලියන 150යි කියලා. ඒ අනුව හම්බන්තොට වරායට ගත්ත බිලියන 100ක් ගිල්ල එකෙක් නැහැ. මේවා ඔබතුමන්ලා පරීක්ෂා කරලා බලන්න.

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
තව 'වී' ටිකක් දමන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
'වී' නොවෙයි, 'පස්' පවා දමන්න වනවා. ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමනි, කරපු විනාශය බේරුවේ නැත්නම් 'වී' නොවෙයි, 'පස්' ගොඩ ගහන්න වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරායටත්, මත්තල ගුවන් තොටුපොළටත් සියයට 60ක් වියදම් වුණා නම්, සියයට 40ක් කොමිස් ගැහුවා නම්, අඩුම ගණනේ ඒ සියයට 60ට අගයක් දෙන්න. පෞද්ගලික සමාගම් සහ- [බාධා කිරීම්] මට බාධා කරන්න එපා. අපි ඔබතුමන්ලාට බාධා කරලා නැහැ. ඒ හින්දා- [බාධා කිරීම්] වල් වැදුණාට බාධා කරන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාර්ය භාරය ගැන මම කථා කරන්නේ නැහැ නේ? ඒ හින්දා ඔබතුමා මට බාධා කරන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙන විවාදවලට පැටලෙන්න වෙලාව නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම "Ceylon" කියන නාමය -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩි 15ක කාලයක් තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Thank you, Sir.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "Ceylon" නාමය ලෝකය පුරා ප්‍රසිද්ධ වෙලා තිබුණා. හැබැයි, පසු ගිය කාලය තුළ "ශ්‍රී ලංකා" කියන නාමය, "Ceylon" කියන නාමය තරම් ප්‍රසිද්ධ කරන්න අපට හැකියාවක් ලැබිලා නැහැ. ඒ නිසා සංචාරක ව්‍යාපාරය මඟින් සහ අනෙකුත් ව්‍යාපාර මඟින් ඉදිරියේදී "ශ්‍රී ලංකාව" කියන නාමය ලෝකය පුරා ප්‍රසිද්ධ කරන්න අපි බලාපොරොත්තු

[ගරු සුජීව සේනසිංහ මහතා]

වෙනවා. ලෝකයේ සියලු දෙනාගේම අවධානය අප රට කෙරෙහි යොමු කරවා ගැනීම සඳහා වූ පරිශ්‍රමයක අපි මේ අවස්ථාවේ යෙදී සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම යටිතල පහසුකම් දියුණු කිරීම තුළින් එය කරන්න අපි බලාපොරොත්තු වනවා. අවුරුදු 3ක් තුළ මහනුවරට අධිවේගී මාර්ගයක්, ත්‍රිකුණාමලයට අධිවේගී මාර්ගයක්, යාපනයට අධිවේගී මාර්ගයක්, කොළඹ, මට්ටක්කුලිය, බොරැල්ල, කඩුවෙල ආදී වශයෙන් මුළු කොළඹම යා කරන සැහැල්లු දුම්රිය සේවයක්, කටුනායක අධිවේගී මාර්ගයේ සිට කොළඹ මැදට අහස උඩින් එන පාරක්, බොරැල්ලේ සිට කඩුවෙලට යන තව පාරක් හදන්න අපි කටයුතු කරනවා. මේ විධියට අවුරුදු 3ක් තුළ යටිතල පහසුකම් දියුණු වෙනකොට, අපට ලංකාව නම් කරන්න පුළුවන්, "A country with four seasons in one day!" කියලා. මේ විධියට යටිතල පහසුකම් දියුණු වෙනකොට අපේ ලංකාවේ කලාප 4ක් - seasons - ආවරණය කරන්න පුළුවන්, පැය තුනක් ඇතුළ. ඒක තමයි අපේ ඉදිරි අනාගතය. ඒ අනුව, 2017-2018 වෙද්දී සංචාරක ව්‍යාපාරය දෙගුණ තෙගුණ කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධනය වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් ලෙස යටිතල පහසුකම්වලට පමණක් රුපියල් බිලියන 450ක් අපි වියදම් කරනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම්, සංවර්ධනය සඳහා කරන වියදම්වල සියලු එකතුව රුපියල් බිලියන 750ක්. ඒ මම පෙර සඳහන් කරන ලද සංවර්ධන ව්‍යාපෘති සඳහා වන යටිතල පහසුකම් සඳහායි.

ඒ වාගේම, අපනයන නිෂ්පාදන කෙරෙහි අපේ අවධානය යොමු කරන ගමන්ම, අපි රටේ යටිතල පහසුකම් සංවර්ධනය කරනවා. පොඩි පාරවල් ගැන නොවෙයි, මහාමාර්ග ගැනයි මා කථා කළේ. අවුරුදු තුනක් යනකොට මේ රටේ හතර කොන යා කරන මහාමාර්ග පද්ධතියක් අපි නිර්මාණය කරනවා. [බාධා කිරීමක්] බොහොම ස්තුතියි. ඔබතුමාට පාර්ලිමේන්තුවේ ඉඳලා පැයෙන් නුවරට යන්න පුළුවන්. ඒ වාගේම අපේ දිළුම් අමුණුගම මැතුමාටත් යන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගැලරියට ඇවිල්ලා හිටියා වයස අවුරුදු 10යේ පමණ දරුවන් විශාල පිරිසක්. ඇත්තටම මේ සියලු දරුවන් වෙනුවෙන් යෝජනා කරන ලද රක්ෂණ ක්‍රමය පිළිබඳ අපට සන්තෝෂයක් දැනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට ඔබතුමා වුණත් ඒ ගැන සන්තෝෂ වෙයි. ගොඩක් වෙලාවට ඔබතුමා සහ ඔබතුමාගේ පක්ෂය අපේ අදහස් විවේචනය කරනවා. ඔබතුමන්ලාට අප ගැන යම් යම් විවේචන ඇති. ඒ විවේචනවලට අපි ඇහුම්කන් දෙනවා. අපි ඒ විවේචන බාරගන්නත් සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ශිෂ්‍යයන්ට ලබා දෙන මේ රක්ෂණ ක්‍රමය ඔබතුමා වුණත් අගය කරයි. ඒ හරහා එක පවුලකට ලැබෙන ශක්තිය බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපට රක්ෂණයක් ලැබෙනකොට එයින් විශාල ශක්තියක් අපට ලැබෙනවා. අපට ලෙඩක් හැදුණාම බය නැතිව ඉස්පිරිතාලයකට යන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගෙවන මුදලට වැඩිය අපට අපි ගැන ශක්තියක්, ආත්ම විශ්වාසයක් ඇති වෙනවා. ඒ විශ්වාසය මේ දරුවන්ටත් දෙන්න පුළුවන් වීම ගැන ගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත්, ගරු මුදල් ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. අපේ දරුවන්ට රක්ෂණ ක්‍රමයක් ලබා දීම ගරු අගමැතිතුමා සෞඛ්‍ය හා අධ්‍යාපනය ගැන විශේෂ අවධානය යොමු කරපු අවස්ථාවක කරන ලද විශාලම කාර්යයක්.

පවුලක දරුවන් තුන්දෙනෙක් ඉන්නවා නම් ලක්ෂ 6ක රක්ෂණ ආවරණයක් ඒ පවුලට ලැබෙනවා. ඒ වාගේම දරුවෙකුට රුපියල් 10,000ක බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණයක් ලැබෙනවා. රෝහල්වල සියලුම බෙහෙත් අංග සම්පූර්ණව පැවතිය යුතුයි කියලා ගරු රාජිත සේනාරත්න මැතිතුමා අනිවාර්යය කළා. අපි ඒ කාර්යභාරය මේ අවුරුදු කිහිපය තුළ ඉටු කරලා තිබෙනවා. රෝහලකට යන්න බැරි නම්, ඒ දරුවාට මේ රක්ෂණය හරහා පෞද්ගලික වෛද්‍යවරයෙකුගෙන් සේවය ලබා ගන්න පුළුවන්. ඒ අනුව, අසනීපයක් හැදුණ අවස්ථාවක ඒ දරුවාට, ඒ පවුලට ශක්තියක් ලැබෙනවා. මොකද, ඒ වියදම් ගෙවීමේ ක්‍රමයක් ඒ පවුලට තිබෙන නිසා. ඒ නිසා ඒ පවුල්වලට මේ රක්ෂණය විශාල ශක්තියක්. ඒ තුළින් ආත්ම ගරුත්වයක්, ඒ වාගේම ආත්ම ධෛර්යයක් දරුවාට සහ ඒ පවුලට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්මය දියුණු කිරීම සඳහා වාරිමාර්ග ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් බිලියන 30ක් වෙන් කිරීමට මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා. කුඹුක්කන් ඔය, පහළ මල්වතු ඔය වාරි ව්‍යාපෘතිය, කිතුල් වැව, රුගම් වැව, තාරාපුරම් වැව, යාන් ඔය ව්‍යාපාරය, මොරගහකන්ද, උමා ඔය වාගේ ව්‍යාපෘති සඳහා විශාල මුදලක් වෙන් කිරීමෙන් කෘෂිකර්මය ගොඩ නඟන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්මයේ යෙදී සිටින ශ්‍රම බලකාය අඩු කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 12ක් වැනි ප්‍රමාණයකුයි කෘෂිකර්මයෙන් අපට ආදායම වශයෙන් ලැබෙන්නේ. නමුත්, සියයට 45කට වැඩි ප්‍රමාණයක් කෘෂිකර්මයේ නියුතු වෙලා ඉන්නවා. අප ලබා දෙන අධ්‍යාපනය තුළින්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළින්, ඒ වාගේම වෘත්තීය පුහුණු පාඨමාලා නොමිලේ ලබාදීම තුළින් පිටරට යන ප්‍රමාණය අඩු කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. කෘෂිකර්මයේ යෙදෙන ප්‍රමාණය අඩු කරලා, දළ ජාතික නිෂ්පාදනයට ගැළපෙන ප්‍රමාණයක් කෘෂිකර්මයට යොදවලා, ඉතිරි පිරිස ඉදිරි අනාගතයේදී රුපියල් 70,000ක්, රුපියල් 80,000ක් ආදායම් ගන්න පුළුවන් තරුණයන් බවට පත් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන ප්‍රමාණය 26,000ක් පමණ වෙනවා. 2020 වන විට දේශීය වශයෙන් රජයේ විශ්වවිද්‍යාලවලට පමණක් 50,000ක පිරිසක් අනිවාර්යෙන්ම ඇතුළත් කර ගන්න ඕනෑය කියලා ගරු අග්‍රාමාත්‍යතුමා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් සුළු පෞද්ගලික විශ්වවිද්‍යාල ප්‍රමාණයකුයි මේ රටේ තිබෙන්නේ. ඒ පෞද්ගලික විශ්වවිද්‍යාල ප්‍රමාණය ආණ්ඩුවේ විශ්වවිද්‍යාල ප්‍රමාණයට වඩා දෙගුණයක් දක්වා වැඩි කර ගන්නට බලාපොරොත්තු වෙනවා. එහෙම වැඩි කළාම 150,000ක් වැනි ප්‍රමාණයක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළින් රටේ ඉදිරි අනාගතයට එකතු කරන්නට අපට පුළුවන්. ඒ විතරක් නොවෙයි. 2022, 2023 වන විට රජයේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගැනීම සඳහා ලක්ෂයක පමණ පිරිසකට සුදුසුකම් ලබා දෙන්නට අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට ලක්ෂ දෙකක් වැනි සිසුන් ප්‍රමාණයක් ඉදිරිපත් වෙනවා. ඒ සියලු දෙනාට, තමන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු කිරීම සඳහා පොලී රහිතව රුපියල් ලක්ෂ අටක ණය මුදලක් ලබා දෙන්නට අප බලාපොරොත්තු වෙනවා. පොලී රහිතව එම ණය ප්‍රමාණය ලබා දෙන්න සූදානම් කර තිබෙනවා.

විශේෂයෙන්ම, Aquinas University College, NSBM, Kotelawala Defence University යන ඕනෑම පෞද්ගලික

විශ්වවිද්‍යාලයකින් මේ මුදල් වියදම් කරලා අධ්‍යාපනය ලබා ගන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, තවත් 15,000කට ඉංග්‍රීසි, ගණිතය, IT, විද්‍යාව යන විෂයන් සම්බන්ධයෙන් සම්පූර්ණ ශිෂ්‍යත්වයක් - scholarship එකක්- ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ ශිෂ්‍යත්ව ලබා දීමේදී, තමන්ගේ ගමේ පාසලේ අවුරුදු තුනක් අනිවාර්යෙන්ම ඒ තරුණයා හෝ තරුණිය ඉගැන්විය යුතුයි. ඒ ආකාරයට අවුරුදු තුනක් හිටියේ නැත්නම්, අවුරුදු තුනට පෙර අයින් වෙනවා නම්, ඒ ලබාගත් මුදල් ප්‍රමාණය නැවත ගෙවිය යුතුයි. අවුරුදු තුන සම්පූර්ණ කළොත්, තමන්ට වෙනත් පාසලකට ස්ථාන මාරුවක් ලබා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිය, Accountancy, වෛද්‍ය විද්‍යාව, විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව සම්බන්ධයෙන් හැම විෂයකටම විශිෂ්ට සාමර්ථ ලබන තුන්දෙනෙකුට සම්පූර්ණ ශිෂ්‍යත්වයක් -scholarship එකක්- MIT, හාවඩ්, කේම්බ්‍රිජ් වැනි විශ්වවිද්‍යාලවලට ලබා දෙන්නට අප බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අනුව විද්‍යා අංශයට තුනයි, ගණිත අංශයට තුනයි, accountancyවලට තුනයි, ඉංජිනේරු විද්‍යාවට තුනයි, ආදී වශයෙන් මේ සෑම අංශයකටම ඒ අවස්ථාවක් ලැබෙනවා. ඒ අනුව, MIT, හාවඩ්, කේම්බ්‍රිජ්, යේල්, ප්‍රින්ස්ටන් වැනි විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන්නට 30දෙනෙක් වැනි පිරිසකට අවස්ථාව ලැබෙනවා. විශාල මුදල් ප්‍රමාණයක් වියදම් වෙන අධ්‍යාපන කටයුත්තක් මේක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනටමත් අපි එම විශ්වවිද්‍යාල වෙත අපේ ලංකාවේ පිරිසක් යවා තිබෙනවා. අපට කරන සේවයක් වශයෙන් ලංකාවේ අපේ දරුවන් නිකම් එම විශ්වවිද්‍යාලවලට අරගෙන තිබෙනවා අපේ පාර්ලිමේන්තුවේ වැඩ කරන සාමාජිකයකුගේ දරුවෙක් වන්නට පුළුවන්, එහෙම නැත්නම් වෙනත් කාගේ හරි දරුවෙක් වෙන්න පුළුවන්, ඒ අවස්ථාව ඔවුන්ට ලැබෙනවා. ඒ අවස්ථාව ලැබුණු දරුවාට පුළුවන්, ඒ ලබන අධ්‍යාපනය තුළින් තමන්ගේ ගමට ඇවිල්ලා ගම දියුණු කරන්න, ව්‍යාපාරයක් පටන් ගන්න, නැත්නම් වෙනත් කටයුත්තක් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විශ්‍රාම වැටුප ගැන කථා කරනවා නම්, අපි සඳහන් කළා "කාලබෝම්බයක්" කියලා. අපි විශ්‍රාම වැටුප් ගෙවන්න මුදල් වෙන් කරන්නේ අය වැයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ බර වැටෙන්නේ කාටද? ඒක ගෙවන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ බැංකු ගිණුමෙන්වත්, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ බැංකු ගිණුමෙන්වත්, එහෙම නැත්නම් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ බැංකු ගිණුමෙන්වත්, එහෙමත් නැත්නම් රවි කරුණානායක මහත්මයාගේ බැංකු ගිණුමෙන්වත්, අපේ බැංකු ගිණුම්වලින්වත් නොවෙයි. අපි මේවා ගෙවන්නේ අපේ රටේ දුප්පත් ජනතාවගේ බදුවලින්. සීනි ඇටයෙන්, හාල් ඇටයෙන් මේ සියල්ලෙන් බදු ගහලා තමයි අපි ඒ විශ්‍රාම වැටුප ගෙවන්නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහගෙන ඉන්න. කෑ ගැහුවාට වැඩක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මේවා අපි රටේ ජනතාව වෙනුවෙන් කරන්න ඕනෑ දේවල්. කෑ ගහන්න පුළුවන්. අපි මේ මුදල ගෙවන්නේ අහිංසක, දුප්පත් ජනතාව වෙනුවෙන්. ජනතාව මහන්සි වෙලා අපව මේ පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ ඒ අය වෙනුවෙන් කථා කරන්නයි. කෑ ගහන්න, විවේචනය කරන්න, හිනා වෙන්න නොවෙයි. ඒ නිසා සාධනීය විවේචනයක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. අපි මේ බර දෙන්නේ, අපේ දුප්පත් ජනතාවට. අපි මේ බර දෙන්නේ, අපේ පාර්ලිමේන්තුවේ වැඩ කරන කම්කරුවෙකුට; එහෙම නැත්නම් වෙනත් ස්ථානයක වැඩ කරන කම්කරුවෙකුට. අපි කියන්නේ, ඒ විශ්‍රාම වැටුපට ඉදිරි අනාගතයේදී තමනුත් දායක විය යුතුයි කියලායි. නැත්නම්, එහි බර පැටවෙන්නේ තමන්ගේ දරුවන්ටයි. එම විශ්‍රාම වැටුප තවත් කෙනෙකුට ගෙවන්න අනිවාර්යයෙන්ම රටේ දුප්පත් ජනතාවගේ සාක්කුවට විදින්න සිදු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතය වෙනුවෙන් මේ බර අයින් කරලා සේවකයාගෙනුත් දායකත්වයක් ලබා ගෙන, රජයෙනුත් යම් දායකත්වයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ පුද්ගලයාත් විශ්‍රාම වැටුප සඳහා යම් දායකත්වයක් ලබා දෙනවා; රජයත් යම් දායකත්වයක් ලබා දෙනවා. තමන් විශ්‍රාම ලබන කොට තමන්ගේ දායකත්වයත්, රජයේ දායකත්වයත් ඇතුව රටට බරක් නොවී, දුප්පත් ජනතාවට බරක් නොවී විශ්‍රාම වැටුපක් ලබා ගන්නා ක්‍රමවේදයක් අපි ඉදිරි අනාගතයේදී සකස් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ආදායම් ගැන කථා කළා. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා දන්නවා, 1993 වර්ෂයේදී රජයේ බදු ආදායම තිබුණේ සියයට 22ක් කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබිලා, ඊට පසුව ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගන්න කොට ඒ ගණන තමයි රජයේ බදු ආදායම ලෙස තිබුණේ. 2014 වර්ෂය වෙන කොට රජයේ බදු ආදායම සියයට 10.5ට අඩු වුණා. සියයට සියයකින් රජයේ ආදායම පහළ දමන්න ඔබතුමන්ලාට අවස්ථාව ලැබුණා. කාටද ඒ පාඩුව විඳින්න සිදු වන්නේ? අපේ රටේ දුප්පත් ජනතාවටයි. 2016දී රජයේ බදු ආදායම සියයට 13.8 - සියයට 14 දක්වා වැඩි කර ගන්න පුළුවන් වුණා, ඒ මේ අවුරුදු දෙකක කාලය තුළදී.

ධනවත් සහ බලවත් පිරිස් බදු ගෙවනවාද? සියයට 11යි අපේ බදු ආදායම. සංයුතිය අනුව, අඩුම ගණනේ බදු ආදායම සියයට 20ක්ව තිබෙන්න ඕනෑ. සියයට 9ක් පමණ බදු ගෙවන්නේ නැහැ. Tax files ලක්ෂයයි තිබෙන්නේ. ඔය කියන ඒකාබද්ධ පිරිස පමණක් tax files ටික විවෘත කළා නම් අපට ඉස්කෝල හයක්, හතක් හදන්න පුළුවන්. ඔවුන්ට තිබෙන ආදායම්, තිබෙන වත්කම් අනුව ඒ tax files විවෘත කළා නම් අඩුම ගණනේ ඉස්කෝල හයක් විවෘත කරන්න පුළුවන්. ලංකාවේ tax files ලක්ෂයයි තිබෙන්නේ. එහෙම නම්, බදු ගෙවිය යුතු ධනවත් පුද්ගලයන්ගෙන් සියයට 9ක වාගේ ප්‍රමාණයකගෙන් අපට ආදායම් එකතු කර ගන්න බැරි වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම ඒ අය බදු ගෙවීම පැහැර හරිනවා. බදු ගෙවන්නේ නැහැ. බදු ගෙවන්නේ දුප්පත් ජනතාවයි. ඒ වක්‍ර බදු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රජයේ බදු ආදායම සියයට 14ක් බවට පත් කර ගත්තා. අපි 2018 වර්ෂය වෙන කොට සියයට 18 දක්වා රජයේ බදු ආදායම වැඩි කරගෙන ජනතාවට ඒ සහන දෙන්න බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයට, සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඒ වාගේම ජීවන තත්ත්වය උසස් කරන්න, ජීවන වියදම අඩු කර ගන්න ඒ ආදායම යොදවන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් චීන රජයත් එක්ක අපි කථා කර ගත්තා. වරාය සහ ගුවන් තොටුපොළට ගත්තු ණය ප්‍රමාණය ට්‍රිලියන 10යි. අවුරුද්දකට ගෙවන ණය ප්‍රමාණය බිලියන 1,500යි. මේක ගෙවන්න පුළුවන් ණය බරක් නොවෙයි. ඊළඟ අවුරුද්ද වෙන කොට සියයට 25ක පොලී අනුපාතයත් සමඟ ඒක බිලියන 1,600 දක්වා ඉහළ යනවා. ඒ ගණන අපට ගෙවා ගන්න බැහැ. මෙහෙම රටවල් නඩත්තු කරන්න බැහැ. මේ දුප්පත් රටවල් ගොඩ නඟන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම් අපි මොකක්ද කළේ? චීනයට කථා කළා. චීනය හදපු හම්බන්තොට වරායත්, මත්තල ගුවන් තොටුපොළත් පිළිබඳව චීනයත් එක්ක සාකච්ඡා කරමින් පවතිනවා. ලංකාවේ ආණ්ඩුවත්, චීන ආණ්ඩුවත් එකතු වෙලා පෞද්ගලික සහ රාජ්‍ය අංශය එකතු කරලා ඒ ආයතනවල කටයුතු කරගෙන යනවා. රාජ්‍ය අංශයට පමණක් තිබුණාමත් පාඩු ලබනවා. මෙච්චර කල් ඒක තමයි වුණේ. වරාය සහ ගුවන්

[ගරු සුජීව සේනසිංහ මහතා]

තොටුපොළ හැදුවාට, මොකක්ද කරන්නේ කියන එක ගැන සැලැස්මක් තිබුණේ නැහැ. ඒ වැඩේ හොඳයි. ඒක අත්‍යවශ්‍ය වැඩක් නොවෙයි. නමුත්, වැඩක් ගන්න තිබුණා. හැබැයි, සැලැස්මක් තිබුණේ නැහැ. ආණ්ඩුවෙන් තමයි ඒක පාලනය කරන්න ඉදිරිපත් වුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Okay, Sir. ආණ්ඩුවට තමයි ඒ පාඩුව විඳින්න සිදු වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි public-private partnership එක තුළින් බලාපොරොත්තු වෙනවා, හම්බන්තොට වරාය සහ මත්තල ගුවන් තොටුපොළ අවුරුදු දෙකක් යන කොට දියුණු port එකක් සහ airport එකක් බවට පත් කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අක්කර 15,000ක කාර්මික වෙළෙඳ කලාපයක් ඇති කරන්න කටයුතු කරනවා. Electric cars, electric three wheelers ඒ වාගේම අනෙකුත් electronic භාණ්ඩ නිෂ්පාදනය කරන්න පුළුවන් කර්මාන්තශාලා ඇති කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක කරන්න බැරි නම් චීනය භාර ගන්නේ නැහැ. චීනය පාඩු ලබනවා නම් මේක භාර ගන්නේ නැහැ. අපට පාඩුවක් නැහැ. ඔවුන් තමයි ඒක හදන්නේ. නමුත් ආදායම ලැබෙන්නේ අපටයි. ජපානය, ඉන්දියාව, ඇමෙරිකාව, චීනය, කොරියාව වැනි රටවල් මේ ප්‍රදේශයේ කර්මාන්ත ආරම්භ කරන්න ඉදිරිපත් වෙලා තිබෙනවා. ඉන්දියාව, චීනය සහ සිංගප්පූරුවේ වෙළෙඳ පොළ අපට විවෘතයි. ලෝකයේ ජනගහනයෙන් භාගයක් විතර ඉන්න රටවල් දෙකේ වෙළෙඳ පොළ අපට විවෘතයි. එහෙම නම් අපට ඒ වෙළෙඳ පොළවලට බඩු අපනයනය කිරීමේ හැකියාව ලැබෙනවා. අපේ අපනයනයන් බිලියන 11යි. අපි මත්ස්‍ය තහනම ඉවත් කර ගත්තා.

උදේ ගාමිණී ලොකුගේ මැතිතුමා ඇහුවා, "GSP සහනය කෝ?" කියලා. ඒවා ගස්වලින් ගෙඩි වැටෙනවා වාගේ ලැබෙන්නේ නැහැ. ජනවාරි මාසය හෝ අප්‍රේල් මාසය අතරතුර අපට GSP සහනය ලැබෙනවා. එහෙම ලැබෙන කොට අපේ අපනයන ආදායම බිලියන 20 දක්වා අවුරුද්දක් යන කොට වැඩි කර ගන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ විතරක් නොවෙයි. 2018 වර්ෂය වනකොට අපේ අපනයන ආදායම රුපියල් බිලියන 25ක්, බිලියන 30ක දක්වා වැඩි කර ගන්න අපට පුළුවන්. ඒ සියලු සහනයන් යන්නේ අපේ දුප්පත් ජනතාවට. සහන බෙදිලා යන විධියටයි අපි වැඩ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ සහන ලබා දෙන්නේ මුළු රටේම ව්‍යාප්ත වෙන විධියටයි. අපි ඒවා ලබා දෙන්නේ, කොළඹට පමණක් නොවෙයි; ධනවතුන්ට පමණක් නොවෙයි; බලවතුන්ට පමණක් නොවෙයි. අපි ඒවා මුළු රටේම ජනතාවට ලබා දෙනවා කියන එකත් ආදරයෙන් මතක් කරනවා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇතුළු අපි කොමිස් ඉල්ලන්නේ නැහැ. අපි පගා ඉල්ලන්නේ නැහැ. විදේශ ආයෝජකයන්ගෙන්, අපේ රටේ ආයෝජකයන්ගෙන් අපි ඉල්ලා සිටින්නේ රැකියා බිහි කරන්න, විදේශ ආයෝජන ගෙනෙන්න, දියුණු තාක්ෂණය ගෙනෙන්න, රටේ නිෂ්පාදන වැඩි කරන්න කියලායි. යම්කිසි දූෂණයක් තිබෙනවා නම්, හොරකමක් තිබෙනවා නම් අපට ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න කියලා අපි විරුද්ධ පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට අභියෝග කරනවා. ඒ වෙනුවෙන් අපි කථා කරනවා. කිසිම දෙයක් අපි හංගන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැහැල්ලු රේල්ලුව සම්බන්ධයෙන් විතරක් කියලා මම මගේ කථාව අවසන් කරන්නම්. බොරැල්ල - බත්තරමුල්ල - මාලබේ යා කරන, කොට්ටාව - මාලබේ යා කරන, මාලබේ - කඩුවෙල යා කරන, පෑලියගොඩ - කඩවත යා කරන, කොටුව - මරදාන - මට්ටක්කුලිය - පෑලියගොඩ යා කරන, දෙමටගොඩ - කිරුළපන - බම්බලපිටිය වාගේම කොටුව - බම්බලපිටිය - බොරැල්ල - මරදාන යා කරන සැහැල්ලු රේල්ලු සේවයක් අවුරුදු තුනක් යනකොට අපි ඇති කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම පසු ගිය ආණ්ඩුවේ ඒකාබද්ධ කල්ලිය සඳහන් කරන ආකාරයට, අවුරුදු විස්සක් තුළ ඒ අය හැදුවේ ගාල්ලට අධිවේගී මාර්ගයක් හා කටුනායකට අධිවේගී මාර්ගයක් පමණයි. හැබැයි, අපි මේ අවුරුදු තුන ඇතුළත ඒ වාගේ පාරවල් 20කට වැඩි ප්‍රමාණයක්,-

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හැදුවේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒවා හදලා පෙන්වනවා විතරක් නොවෙයි, ඒ කටයුතු සිදු කරලත් පෙන්වලායි තිබෙන්නේ. මට තව විනාඩියක් ලබා දෙන්න. අපි ආණ්ඩුව ගන්න කොට අපට කිව්වා, "යහ පාලනය ගෙනෙන්න බැහැ" කියලා. දිනේෂ්ගේ නැට්ට අස්සේ හැංගිලා කෑ ගහනවා. අපි යහ පාලනය ගෙනෙද්දි මොනවාද කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපි කොමිෂන් සභා නවය පිහිටෙව්වා. මහින්ද රාජපක්ෂ මහත්තයාත් එක්ක එකතුවෙලා ඒ මන්ත්‍රීතුමිය මොනවාද කළේ? දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත ඉස්සුවා. කාන්තාවක් හැටියට ලජ්ජයි. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවස්ථාවේදී ඒකාධිපති වියරුවෙන් ක්‍රියා කළ නායකයාට පක්ෂව අත ඉස්සුවා. තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව කටයුතු කිරීමේ හැකියාවක් එතුමියට තිබුණේ නැහැ. ඒ නිසා එතුමිය නීතිඥවරියක් වශයෙන් මෙතැනට ඇවිල්ලා කෑ ගැහුවාට වැඩක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොරු කරලා, හොරුන්ට ආ වඩලා, හොරුන්ව ආරක්ෂා කරලා දැන් එනවා අපට උපදෙස් දෙන්න. දැන් තමුන්නාන්සේලාට නැඟිටින්න අවස්ථාවක් නැහැ. අපට අවුරුදු දෙකක් ලබා දෙන්න. මේ රට අපි සිංගප්පූරුව, මැලේසියාව වාගේ රටවල් තරමටම දියුණු කරලා තමයි පස්ස බලන්නේ කියලා කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට බොහොම ස්තුතියි. The next speaker is the Hon. (Dr.) S. Sivamohan. You have 17 minutes.

[பி.ப. 4.55]

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய இந்த வரவு செலவுத் திட்ட அமர்வில் எனக்கும் உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி. எந்தவிதத்தி லாவது ஓர் அழகிய வரவு செலவுத் திட்டம் கொண்டுவரப் பட்டாலும் இன நல்லிணக்கம் காணாது, தமிழர்கள் இந்த மண்ணில் அனைவருடனும் சம உரிமையுடன் தமது பாதுகாப் பைத் தாமே உறுதிப்படுத்திக்கொண்டு அவர்களின் பூர்வீக பிரதேசமான வடக்கு, கிழக்கில் சுய கௌரவத்துடன் வாழும் ஒரு தீர்வைக் காணாது, பொருளாதார அபிவிருத்தி காண்பது என்பது கானல் நீரே! இன்றுகூட வரவு செலவுத் திட்டத்தில் பாதுகாப்பு அமைச்சுக்கு நீங்கள் ஒதுக்கிய தொகை சுமார் 28,000 கோடி ரூபாய். ஆனால், கல்வி அமைச்சுக்கு ஒதுக்கியதோ சுமார் 7,000 கோடி ரூபாய் மட்டுமே! எப்படி இந்த நாடு உருப்படும்?

கசப்பான உண்மைகளை உணர்ந்துகொள்ள இந்த நாட்டு மக்கள் முன்வரவேண்டும்; கசப்பான உண்மைகளை வெளிப் படுத்த இந்த அரசு முன்வரவேண்டும்; பொறுப்புக்கூறல் பொறி முறைமூலம் புதிய யுகம் படைக்க அனைவரும் முன்வரவேண்டும். அப்போதுதான் உங்களது வரவு செலவுத் திட்டங்கள் வெற்றிபெறும். இந்த நாட்டின் குடிமக்கள் ஒவ்வொருவரதும் தலைமேல் சுமத்தப்பட்ட கடன் சுமைகள் நீங்க, சுகவாழ்வு வாழ வழி பிறக்கும். தமிழனின் தலைமேல் குண்டு போடுவதற்காக சிங்களவர்களின் தலைமேல் கடன் சுமையை ஏற்றியவைதானே மாறிமாறி வந்த இங்கு ஆட்சி செய்த அரசுகள்! எனவே, உண்மைகளை உணர்ந்து நாம் ஒற்றுமையுடன் வாழவேண்டும் என விரும்புகின்றோம். அதற்காக அடிமைகளாக அல்ல! தமிழர்கள் சுய கௌரவத்துடன் வாழ விரும்புகிறார்கள். இனவாதிகள் குழப்புகிறார்கள் என்று இந்த அரசும் குழம்புமாக இருந்தால் இந்த நாடும் குழம்பிவிடும்! எனவே, இது சுயமாகச் சிந்தித்துச் செயற்படும் காலம் எனக் கூறிவைக்க விரும்புகின்றேன்.

இன்று போத்தலில் கள் அடைக்கும் ஒரு சிறிய நிறுவனத்திடமிருந்து அறவிடப்படும் வரி வருடத்திற்கு ஒரு மில்லியன் ரூபாய். உள்ளூர் உற்பத்தியை ஊக்குவிக்க வேண்டுமெனத் தாங்கள் எண்ணினால் இந்த வரி குறைக்கப்பட வேண்டும். வெளிநாட்டிலிருந்து கொண்டுவரப் பட்ட இரசாயனக் கலவைகளையும் மதுசாரத்தையும் கலந்து போத்தல் கள் உற்பத்தி செய்யும் நிறுவனங்களுக்கு இது பொருந்தக்கூடும். ஆனால், தமது ஜீவனோபாயத் தொழிலாகச் செய்யும் பனை, தெங்கு வளத் தொழிலாளிகளை இது பெரிதும் பாதிக்கின்றது என்பதுதான் வெளிப்படையான உண்மை. எமது நாட்டின் உள்ளூர் இயற்கை வளங்களான பனை, தென்னை ஆகியவற்றின்மூலம் அவர்கள் செய்யும் இந்த உற்பத்தித் தொழிலுக்காக நீங்கள் விதிக்கும் வரி மிகவும் கூடியது என்பதை உணர்ந்துகொள்வீர்கள் என்று நினைக் கின்றேன். அதனால் இன்று இங்கு செயற்கையான கலவை களுடன் தயாரிக்கப்படும் உற்பத்திகள் வெளிவந்து கொண்டிருக்கின்றன.

அடுத்ததாக, வீட்டுத் திட்டம் என்ற போர்வையில் 65,000 வீடுகள் கட்டி முடிப்பதாக ஜனவரி 2016க்கு முன்னர் அறிவிக்கப்பட்டிருந்தது. ஆனால், இன்றுவரை எதுவும் நடக்கவில்லை. வீட்டுத் திட்டம் சம்பந்தமான பிரச்சினைகள் ஏதும் இருந்திருப்பின் எமது பாராளுமன்ற உறுப்பினர் களையும் வடக்கு, கிழக்கு மக்கள் பிரதிநிதிகளையும் அழைத்து ஒரு கலந்துரையாடலைச் செய்திருக்கலாம். ஆனால், அப்படி எதுவும் நடைபெறவில்லை. இந்த வீட்டுத் திட்டம் இன்றும் ஓர் இழுபறிநிலையிலேயே இருக்கின்றது. எனவே, வருகிற ஒருசில மாதங்களுக்குள் இது சம்பந்தமான முடிவுகள் எடுக்கப்பட்டு, எமது மக்களுக்குப் பொருத்தமான 65,000 வீடுகளை அமைத்துத்தர இந்த அரசு முயற்சிக்க வேண்டுமென்று இந்த அவையிலே நான் கூறிவைக்க விரும்புகின்றேன்.

மரணித்தவனின் சமாதிகளை அழிப்பவன் கௌரவமான வன் அல்லன். உயிருடன் ஒருவன் உள்ளபோது நேருக்குநேர் நின்று போர் செய்து அவனைக் கொன்றால் அவன் ஒரு வீரன்; மரணித்தவன் மாவீரன். அந்த மாவீரர் சமாதிகளைப் 'புல்டோசர்' கொண்டு அழித்தவர்கள்தான் முன்னைய அரசினரும் அதன் படையினரும். அதன்மூலம் அவர்களின் கோரமுகங்களை அலங்கோலமாக சர்வதேசத் திற்குக் காட்டிநிற்கின்றனர். அதன் விளைவுகளால் அரிய ணையில் இருந்தவர்கள் இன்று 'ஆவா குறூப்' ஆக அலைந்துகொண்டிருக்கிறார்கள்.

கார்த்திகை மாதம் தமிழர்களுக்கு உபவாச காலம்! தமிழர் விடுதலைக்காகத் தன்னுயிர் ஈந்த வீர மறவர்களை நினை வேந்தும் காலம்! மாவீரர் வாரத்தை தமிழர் விளக்கேற்றி நினைவேந்தினால் படையினருக்கு வயிற்றிலே புலி ஊருகிறது. மன்னிக்கவும்! புளி ஊறுகிறது. தமிழர்களுக்கும் சிங்களவர்களுக்குமிடையில் நடைபெற்றதுதான் 30 வருடகால உள்நாட்டு யுத்தம்; இதில் மறைப்பதற்கு எதுவும் இல்லை! 1948இல் இலங்கை சுதந்திரம் பெற்ற காலத்திலிருந்து தமிழர் மீதான அடக்குமுறை தொடர்ந்தது. நான் அறிந்தவரை 242 தடவைகள் தமிழினம் இனப்படுகொலையைத் தாங்கிநின்றது. அவர்கள் வடித்தது இரத்தக் கண்ணீர்! யுத்தத்தில் மரணித்த படையினருக்கு நீங்கள் சமாதிகள் கட்டவில்லையா? வருடா வருடம் அஞ்சலி செலுத்தவில்லையா? உங்களுக்கு அந்த உரிமை உள்ளபோது இந்த நாட்டின் பிரசைகளான எமது தமிழ் உறவுகளுக்காக அஞ்சலி செலுத்துவதில் என்ன தவறுள்ளது? விடுதலைப் புலிகளுடன் சர்வதேச தளங்களில் பல பேச்சுவார்த்தைகளை இந்த நாட்டின் அரசுகள் நடத்தி முடித்தன. அவ்வாறு விடுதலைப் புலிகளுடன் பேச்சு வார்த்தைகளில் ஈடுபட்டதற்கான காரணம், அவர்களைத் தமிழர் பிரதிநிதிகளாக அங்கீகரித்ததுதான். இன்று விடுதலைப் புலிகளின்றி அவர்களது இடம் வெற்றிடமாக உள்ளபோது பழையவற்றை மறந்து செயற்படக்கூடாது. அந்த வகையில், தமிழர் விடுதலைப் போரில் மரணித்த வீர மறவர்களுக்காகவும் தமிழர் இனப்படுகொலைகளில் சிக்கி அநியாயமாகக் காவியமாகிய எமது மக்களுக்காகவும் ஒருகணம் கார்த்திகை மாத வணக்கத்தைத் தெரிவித்து நிற்கின்றேன்.

அடுத்து இன்னுமொரு விடயத்தை இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதாவது, ஒவ்வொரு துறைக்கும் recruitment criteria ஒன்று இருக்கும். அதன்படி, இந்த recruitment criteria ஊடாக சுகாதார அமைச்சில் ஆயுர்வேதத்துக்கு 70 சதவீதமும் சித்த வைத்தியத்திற்கு 20 சதவீதமும் Unani medicine க்கு 10 சதவீதமும் என்று வைத்தியர்கள் ஆட்சேர்க்கப்படும் ஒரு நடைமுறை சட்டரீதியாக இருந்து வந்தது. ஆனால், இந்த நல்லாட்சி

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

அரசின் காலத்தில் எழுத்திலில்லாத நடைமுறையாக இந்நடைமுறை மாற்றப்பட்டுள்ளது. அதாவது, பாராளுமன்றத்தின் அனுமதியோ அல்லது அறிவித்தல்களோ இன்றி, ஆயுர்வேதம் 70 சதவீதமாக இருக்கின்ற அதேநேரம், சித்த வைத்தியம் 10 சதவீதமாகவும் யுனானி வைத்தியம் 20 சதவீதமாகவும் மாற்றப்பட்டுள்ளது. இன்று வட மாகாண சுகாதார அமைச்சர் அவர்கள் எமது தமிழ்க் கிராமங்களில் 20 சித்த மருத்துவர்களுக்கான வெற்றிடம் உள்ளதாக எனக்கு தொலைபேசியினூடாக அறிவித்தார். ஆனால், அதற்காக அறிவிக்கப்பட்ட அறிவித்தல்களில் சித்த, யுனானி என இரண்டையும் ஒன்றாகச் சேர்த்துள்ளார்கள். இந்த சதவீதத்தைக் குறைத்ததன்மூலம் தமிழ் கிராமங்களில் Unani medicine இனை அறிமுகப்படுத்த முயற்சிப்பதாக அறிய வருகின்றது. எனவே, இந்த விடயத்தில் முக்கிய கவனமெடுத்து உரிய முறைப்படி இதைச் செயற்படுத்த வேண்டுமென்ற கோரிக்கையை நான் முன்வைக்கின்றேன்.

தமிழர் இனப்பிரச்சினைக்கு எப்படியாயினும் ஒரு தீர்வு காண்பதுதான் இந்த நாடு முன்னேறுவதற்கு ஒரே வழி என்று நாம் சிந்திக்கின்றோம். எமது தமிழ் மக்களின் பொருளாதார அபிவிருத்திக்கு தங்களது வரவுசெலவுத் திட்டம் உதவுகிறதோ இல்லையோ, இராணுவத்தின் ஆக்கிரமிப்பு எமது பொருளாதாரத்தைச் சீர்குலைத்து வருகின்றதென்பதுதான் உண்மை. எமது முல்லை மாவட்ட மக்களின் காணிகளை இராணுவம் ஆக்கிரமித்துள்ளதென்று எத்தனையோ வருடங்களாக நாங்கள் குரல் கொடுத்துக்கொண்டிருக்கின்றோம். 2009இல் கொடிய உள்நாட்டு யுத்தத்தின் முடிவில் மக்களைச் செட்டிக்குள முள்வேலி முகாம்களுக்குள் விரட்டிவிட்டு, முல்லைத்தீவு மாவட்டத்திலுள்ள எமது மக்களின் காணிகளை ஆக்கிரமித்தவர்கள்தான் இலங்கை இராணுவத்தினர்! எமது குரல்கள் ராஜபக்ஷ தர்பார் கூட்டத்திற்குக் கேட்கவில்லை. இன்று நல்லாட்சி என்று சொல்லி நீங்களும் இரண்டு வருடங்களைக் கடத்திவிட்டீர்கள். இன்னும் ஆக்கிரமிப்புகள் தொடர்ந்துகொண்டுதான் இருக்கின்றது.

வட்டுவாகல் என்பது கிழக்கு முள்ளிவாய்க்காலில் அமைந்துள்ள பிரதேசமாகும். அது எமது மக்களின் வாழ்வியல் பிரதேசம்; பெருங்கடலும் சிறுகடலும் சேர்ந்த பிரதேசம்; எமது மீனவ சமுதாயம் ஜீவனோபாயத்திற்கு நம்பி வாழும் பிரதேசம்; எதிர்காலச் சுற்றுலாத்துறை அபிவிருத்திக்காக முல்லை மக்கள் எதிர்பார்த்து நிற்கும் பிரதேசம்; மீன்பிடித்துறைப் பல்கலைக் கழகம் அமைப்பதற்கென முல்லை மாவட்ட அபிவிருத்தி ஒருங்கிணைப்புக் குழுவால் அடையாளம் காணப்பட்ட பிரதேசம். ஆகவே, இன்று எமது மக்களின் வாழ்வியலை உருக்குலைக்க இந்த அரசு முனையக்கூடாது! நீங்கள் எமது மக்கள் பிரதிநிதிகளின் கருத்துக்களுக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும். எமது மக்கள் மீள்குடியேறி வாழ இடம் கொடுக்க வேண்டும். எமது மீள்குடியேற்றத்தை, எமது ஜீவனோபாயத்தைத் தடுக்கும் நீங்கள் எப்படி இன நல்லிணக்கத்தைக் கொண்டுவரப்போகின்றீர்கள்? படையினர் சொல்லிவிட்டால் அவர்களுக்கு எமது மக்களின் காணிகளைப் பறித்துக் கொடுப்பீர்களா? அதுதான் மக்களாட்சியா? படையினரின் சொல் கேட்டுத்தான் அமைச்சரவைத் தீர்மானங்களை எடுப்பீர்களா? அதுதான் உங்கள் நல்லாட்சியா?

மாவட்ட இணைப்புக்குழுக்கள் - DCC-ஊடாக எடுக்கப்படும் தீர்மானங்களுக்கு இந்த அரசு மதிப்புக் கொடுக்காதா? அப்படியென்றால் ஒன்று செய்யுங்கள்! முல்லைத்தீவு உள்ளிட்ட வன்னிப் பிராந்தியத்தில் மத்திய அரசு நடைமுறைப்படுத்துவது இராணுவ ஆட்சிதான் என்று பிரகடனம் செய்யுங்கள்! அதைவிடுத்து, இரகசியத் தீர்மானங்களை எடுத்து எமது மக்கள்மீது இராணுவ ஆதிக்கங்களை ஏவிவிடாதீர்கள்! எமது மக்களின் காணிகளை இராணுவம் அபகரிக்க முடியுமா? அதற்கு இந்த அரசு துணைபோகுமா? தமிழ் மக்களின் பொருளாதாரம் உருக்குலைக்கப்பட்டு வருவது இராணுவத்தினரின் ஊடுருவலால் தான் என்பதை இந்த வரவு செலவுத்திட்ட உரையிலே நான் கூறிவைக்க விரும்புகின்றேன்.

இராணுவத்தினரின் தேவைக்கு அரச காணிகள் உள்ளன. எமது மக்களின் வாழ்வியலுக்குள் புகுந்து தமிழர்தம் கலாசாரத்தை உருக்குலைக்காதீர்கள்! தேசியப் பாதுகாப்புக்குத் தேவை என்று சொல்லி எமது மக்களின் காணிகளை ஆக்கிரமிக்க இராணுவம் முயலக்கூடாது. தேசிய பாதுகாப் புக்கு மறுபெயர் தமிழர் காணிகளை ஆக்கிரமிப்பதும் தமிழர் வாழ்வியலைக் குலைப்பதும்தான் என்றால் நல்லாட்சி என்பதும் தமிழர்களுக்குப் பொய்யாட்சியே! புதுக்குடியிருப்பு மக்களின் அறுதி உறுதிக் காணிகள் உட்பட 17 ஏக்கர் காணியை இராணுவம் ஆக்கிரமித்துள்ளது! மக்கள் அமைத்த வீடுகளை இராணுவம் ஆக்கிரமித்துச் செயற்பட முடியுமா? இந்த நாட்டில் இருப்பது சிவில் ஆட்சியா? அல்லது இராணுவ ஆட்சியா? என்பதுதான் என்னுடைய கேள்வி.

கேப்பாப்பிலவு என்ற ஒரு கிராமம் ஒட்டுமொத்தமாக இராணுவத்தின் கைகளில் போயிருக்கின்றது. அந்த மக்களின் தென்னந்தோப்புகள், வீடுகள் அனைத்திலும் இராணுவம் ஊடுருவியுள்ளது. ஆனால், அவர்களின் தேவைக்கு அந்த அயலிலேயே உள்ளது அரச காணிகள்! அவர்கள் அங்கிருந்து ஒரு கிலோ மீற்றரோ, அரைக் கிலோ மீற்றரோ தள்ளிச் செல்வார்களானால் அந்த மக்களுக்கு அது பேருதவியாக அமையும். வன்னிப் பிரதேசத்தில் இன்று எமது மக்கள் தினசரி பாதிப்புக்குள்ளாகி வருவதற்குக் காரணம் முதலாவது வனவளத் திணைக்களம் - Forest Department. இரண்டாவது GSMB எனப்படும் புவிச் சரிதவியல், அளவை மற்றும் சுரங்கப் பணியகத்தினர். ஆகவே, இந்த அரசு மனப்பூர்வமாக இன நல்லிணக்கத்தை ஏற்படுத்த விரும்பினால், முல்லை மாவட்டத்தின் சகல காணிகளில் இருந்தும் இராணுவம் வெளியேறிவிட வேண்டும். ஆனால், இது தொடர்பில் ஐ.நா. சபையின் பரிந்துரைகளும் கிடப்பில் போடப்பட்டு வருவது கவலைக்குரிய விடயமாகும்.

இன்று மீள்குடியேறுகின்ற எமது மக்களுக்கு வீடு கட்டுவதற்கு மணல் தேவையாக இருக்கின்றது; வீதிப் புனரமைப்புக்கு 'கிரவல்' தேவையாக இருக்கின்றது. இவற்றைப் பயன்படுத்துவதற்கு மக்கள் அரசாங்கத்தின் - பிரதேசச் செயலரின் அனுமதியை பெற்றிருந்தால்கூட பொலிஸாரைக் கொண்டு அவர்கள்மீது பொய் வழக்குகள் தாக்கல் செய்யப்பட்டு வருகின்றன. மேற்படி விடயம் பற்றி மாவட்ட அபிவிருத்தி இணைக்குழுவில் பூரணமாக விவாதிக்கப்பட்ட பின் எடுக்கப்படுகின்ற தீர்மானங்களைக் கூட சம்பந்தப்பட்டவர்கள் மதிப்பதில்லை. மத்திய அரசின்கீழ் இயங்கும் திணைக்களங்கள் எல்லாம் எமது மக்கள் விரோத நிர்வாகத்தையே நடைமுறைப்படுத்தி வருகின்றன என்பது தான் உண்மை. தென் பகுதிப் பண முதலைகள் முல்லை மாவட்டத்திலிருந்து மணலையும் கிரவலையும் வேறு மாவட்டங்களுக்குத் தாராளமாகக் கடத்துகின்றன. பணம்தான் அவர்களின் நோக்கம். அவர்களுக்கு ஏற்றாற்போல் செயற்படுபவர்களாகவே வனவளத் திணைக்களத்தினரும்

புவிச் சரிதவியல், அளவை மற்றும் சுரங்கப் பணியக - GSMB பிரிவினரும் இருக்கின்றனர். சட்டம் அவர்களின் தேவை களுக்காக வளைக்கப்படுகின்றது. மேற்படி மணல், கிரவல் மற்றும் மர வியாபாரங்களில் ஈடுபடும் மத்திய அரசின் திணைக்களங்களின் எடுபிடிகள் மக்களின் தேவைகளுக்கு மதிப்புக் கொடுப்பதில்லை. அரச திணைக்களங்கள்கூட அவற்றின் வீதி அபிவிருத்தி வேலைத்திட்டங்களை நிறைவு செய்ய முடியாமல் திணறி வருகின்றன.

முப்பந்தைந்து வருடகால கொடிய யுத்தத்தின் பின் எமது மக்கள் மீளக்குடியமர்ந்து வருகிறார்கள். யுத்த காலத்தில் உயிருக்குப் பயந்து ஓடி ஒழிந்தவர்கள் எல்லாம் இன்று வந்து எல்லை போடுகிறார்கள். ஆனால், வனவளப் பிரிவினர் மக்கள் வாழும் கிராமங்களுக்கு நடுவே அதன் எல்லை எனக் குறித்து கல் நாட்டுகிறார்கள். இது நியாயமா? இதற்கு வனவள பிரிவுக்கு உத்தரவிட்டது யார்? எமது தமிழ் மக்களின் வாழ்வியலைக் குலைத்துவிடுவது மட்டுமே இந்த அரசினது அமைப்புக்களின் நோக்கமாக இருக்கிறது. இவை தொடருமாக இருந்தால், மக்கள் இவர்கள்மேல் நம்பிக்கை இழந்து எதிர்க்கும் காலம் உருவாகிவிடும். எறும்புகூட தன்னை நசிப்பவனை தான் சாகும் முன்பே ஒரு தடவை கடிக்க முயற்சிக்கும். இது இயற்கையின் நியதி! தயவுசெய்து மத்திய அரசின் இந்த வனவளப் பிரிவினர் வன்னிப் பிரதேசத்தில் கவனமாக செயற்படவேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன். வன்னி வாழ் எமது தமிழ் மக்களின் வாழ்வியலைக் குலைக்க முயலாதீர்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up.

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
இன நல்லிணக்கம் என பேசிக்கொண்டிருக்கும் இந்த அரசினது எம் மக்கள் மீதான அடக்குமுறைகளைப் பல தடவை நாம் வெளிப்படுத்திவிட்டோம். ஆனால், தீர்வுகள் எதுவுமின்றி எமது மக்களின் வாழ்வியல் உருக்குலைக்கப்பட்டு வருகிறது. எனவே, இவை அனைத்துக்கும் தீர்வாக இந்த மத்திய அரசு உடனடியாக ஆக்கபூர்வமான நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Dayasiri Jayasekara. Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to the Chair?

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education)
I propose that the Hon. (Mrs.) Sriyani Wijewickrama do now take the Chair.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. BIMAL RATHNAYAKE left the Chair, and THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, කථාව කරන්න.

[අ.භා. 5.10]

**ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න ලැබීම ගැන මා ඉතාම සන්තෝෂ වනවා. විශේෂයෙන්ම නීති පීඨයේ අපත් එක්ක එකට ඉගෙන ගත්ත ඔබතුමිය මූලාසනයේ ඉන්න එක ගැන මා බෙහෙවින් සන්තෝෂ වනවා.

2017 අය වැය පිළිබඳව කථා කරද්දී මා මූලික වශයෙන්ම කියන්න කැමැතියි, මෙවර අය වැය 2015 අය වැයට වැඩිය වෙනස් බව. මම එහෙම කියන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් කියන අපි දෙගොල්ලන්ම 2016 වසරේ එකතු වෙලා, අපේ මතවාද එකට එකතු කර ගෙන, යම් යම් කාරණා පිළිබඳව එකඟතාවකට ඇවිල්ලා, අපි මේ අය වැය ගොඩ නඟන්න ගොඩක් මහන්සි වුණා. මෙහි සමහර කාරණා අපි දෙගොල්ලන්ගේම අදහස් උදහස් මත, විශේෂයෙන්ම සාකච්ඡා වාර ගණනාවක් හරහා ක්‍රියාත්මක කරන ලද කාරණා. ඒ නිසා මම පැහැදිලිව කියන්න කැමැතියි, මෙහි තිබෙන හැම කාරණයක් පිළිබඳවම අපට අදහසක් සහ අනුමැතියක් තිබෙන බව. ඒ නිසා ප්‍රථමයෙන්ම මා අතිගරු ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත්, විශේෂයෙන්ම මුදල් ඇමතිතුමාටත් ස්තුතිවන්ත වනවා, මේ සියලු අදහස් සලකා බලලා අපට සාකච්ඡා මාර්ගයෙන් ඉතාම වැදගත් සහ සමබර අය වැයක් මේ රටට ඉදිරිපත් කරන්න ලැබීම ගැන.

දෙවැනි කාරණය තමයි, මෙවර අය වැයේදී කැබිනට් අමාත්‍යවරු විධියට අපට ලොකු බලයක් සහ ශක්තියක් ලැබීම. අය වැය ඉදිරිපත් කිරීමට පෙර අපි මේ සම්බන්ධව සාකච්ඡා වාර ගණනාවක් පැවැත්වූවා. එහි තිබෙන අඩු පාඩු හා දුර්වලතා, කළ යුතු තවත් වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කළා. මම හිතන්නේ මුදල් ඇමතිතුමා සමහර වෙනස්කම් පිළිබඳව එතුමාගේ අදහස් ගෙනැල්ලා, කැබිනට් මණ්ඩලයේ ඒවා සාකච්ඡා කරලා, ක්‍රියාත්මක කරපු අවස්ථාවක් විධියටයි මම මේ අය වැය

[ගරු දයාසිරි ජයසේකර මහතා]

දකින්නේ. ඒ නිසා, මෙය ඓතිහාසික අවස්ථාවක්. මොකද, කැබිනට් මණ්ඩලයට අය වැයක් ඉදිරිපත් කරලා, උදේ වරුවේ එය සාකච්ඡාවට භාජනය කරලා, ඒ ගැන කථා කරලා, විවාදයට ලක් කරලා, වෙනස් කරන්න පුළුවන් අය වැයක් ජීවිතයේ කිසි දවසක අපේ රටේ කැබිනට් මණ්ඩලයක් ඇතුළේ සිද්ධ වෙන්න පුළුවන් කාරණයක් කියලා මම හිතුවේ නැහැ. එහෙම තත්ත්වයක් නොවෙයි අපේ රටේ තිබුණේ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒකට හේතුව, පසු ගිය අවුරුදු විස්සම මේ රටේ ජනාධිපතිවරයෙකු තමයි අඩු වැඩි වශයෙන් මුදල් ඇමතිවරයා විධියට වැඩකටයුතු කළේ. ඒ නිසා මම කියන්න කැමැතියි, මෙවර අය වැයට අපි වැඩ පිළිවෙළ රාශියක් ගොනු කළ බව.

විශේෂයෙන්ම රාජ්‍ය ආදායම සහ වියදම කළමනාකරණය කිරීම, අය වැය හිඟය පියවීම, ණයබර අඩු කර ගැනීම, ආදායම් වැඩි කර ගැනීම, ඒ වාගේම බදුකරණය, වියදම් කළමනාකරණය, රාජ්‍ය ව්‍යාපාර ප්‍රසම්පාදනය, සමාජ හැකියා වර්ධනය හා ප්‍රතිපත්ති සංවර්ධනය කියන මේ කාරණා මත තමයි මේ අය වැය අපි ගොනු කරලා, ශක්තිමත්ව 2017 වර්ෂයට අරගෙන යන්නේ. මේ ක්‍රියාදාමය තුළ ආදායම් පාලන කළමනාකරණ තොරතුරු පද්ධතියක් - RAMIS - ස්ථාපිත කරලා ලංකාවේ තොරතුරු පද්ධතියට digitalization හරහා ගෙනෙන සියලු දත්ත පද්ධති එකතු කළායින් පස්සේ හැම කෙනෙක්ම යම්කිසි විධියකට තමන්ගේ වියදම් හරහා බදු දැලට එකතු කර ගන්න පුළුවන් වාතාවරණයක් සකස් වනවා. ඇත්ත වශයෙන්ම VAT ගහන්න ඕනෑ නැහැ, VATවලටත් වැඩිය ශක්තිමත් වැඩ පිළිවෙළක් සකස් වෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා රේගුව තනි කවුළුව වැඩ පිළිවෙළ - Single Window System- යටතට ගෙනාවාම, ආදායම් මාර්ග වැඩි කර ගැනීමේ හැකියාව අපට ලැබෙනවා. ඒ වාගේම භාණ්ඩාගාරයේ ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය - ITMIS- කියන වැඩ පිළිවෙළ ගෙනාවාම භාණ්ඩාගාරයත්, රේගුවත්, ආදායම් බදු දෙපාර්තමේන්තුවත් ඇතුළු මුළු රටම එකතු වුණු ආදායම් බදු එකතු කිරීමේත්, බදු කළමනාකරණ ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමේත්, එය ක්‍රමානුකූල කිරීමේත් ක්‍රියාදාමයක් විධියට තමයි අපි මෙය දකින්නේ. ඒ අනුව 2015 පළමු මාස නවය තුළ අපි රුපියල් බිලියන 959ක බදු ආදායමක් ලැබුවා. 2016 පළමු මාස නවය තුළදී බදු ආදායම රුපියල් බිලියන 1,179ක් දක්වා වැඩි කර ගන්න - සියයට 23කින් වැඩි කර ගන්න- අපට හැකියාව ලැබුණා. ඒ වාගේම රජයේ බදු ආදායම රුපියල් බිලියන 1,067 දක්වා එනම් සියයට 20.2කින් වැඩි වුණා විතරක් නොවෙයි, 2015 අවුරුද්ද හා සංසන්දනය කරනකොට පසු ගිය මාස නවය තුළ බදු නොවන ආදායම බිලියන 112 දක්වා සියයට 58.6කින් වැඩිවෙලා තිබෙනවා.

අපි ආදරය කරන අපේ බන්දුල ගුණවර්ධන ශූරින් සමඟ අපි ඊයේ රාත්‍රියේත් කාරණා ගණනාවක් සම්බන්ධයෙන් කථා කළා. අධ්‍යාපනයට වෙන් කර තිබෙන මුදල් කපා හැර තිබීම පිළිබඳව එතුමා අප සමඟ කථා කළා. අධ්‍යාපනයට වෙන් කරන මුදල අඩු කර තිබෙනවායි කියන එක සම්පූර්ණයෙන් වැරදි සහගත සහ ජනතාව මුළා කරන විධියේ ක්‍රියාදාමයක් විධියටයි මම දකින්නේ. 2014 අවුරුද්දේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කර තිබුණු මුදල වාගේ තුන් ගුණයක් 2016දී වර්තමාන රජය අධ්‍යාපනය වෙනුවෙන් ලබා දීලා තිබෙනවා.

2016 තුන්වැනි කාර්තුව වනකොට ශුන්‍ය අය වැයක් - ශුන්‍ය මූල්‍ය වැඩ පිළිවෙළක්- තුළ ගමන් කරන ක්‍රියාදාමයක් තමයි තිබෙන්නේ කියලා අපි දන්නවා. තුන්වැනි කාර්තුව වනකොට අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දීලා තිබෙන මුදල් ප්‍රමාණවත් වන්නේ නැහැ. ඇත්තටම මේක ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. අපට තිබෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ටෙන්ඩර් පටිපාටි ක්‍රියාවලිය තුළ වියදම් කරලා තිබුණේ රුපියල් මිලියන 38,850යි. මේ නිසා තමයි අපි 2017 අය වැයෙන් රුපියල් මිලියන 90,000ක් දීලා, ඊට අමතරව තවත් රුපියල් මිලියන 17,480ක් ලබා දීලා තිබෙන්නේ. 2014 අවුරුද්දට සාපේක්ෂව කල්පනා කරනකොට මෙය සියයට 70ක වැඩි වීමක්. අධ්‍යාපනයට වෙන් කර තිබුණු මුදල් ප්‍රමාණය කපා හැර තිබෙනවාය කියලා කියන ඒ බේගලය සම්පූර්ණයෙන් වැරැදි කථාවක් බව මම කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි, කැබිනට් මණ්ඩලයේදී රවි කරුණානායක මැතිතුමා අපට බොහොම පැහැදිලිව කිව්වා, "2017 අවුරුද්දට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය වියදම් කරන්න. තව මුදල් වුවමනා නම් ඕනෑම අවස්ථාවක අතිරේක ප්‍රතිපාදන ලෙස ලබා දෙන්න ලෑස්තියි" කියලා. අපි බලාපොරොත්තු නොවුණු සමහර ව්‍යාපෘති විශාල සංඛ්‍යාවකට ගරු මුදල් ඇමතිතුමා 2016 වර්ෂයේ අතිරේක ප්‍රතිපාදන ලබා දුන්නු බව අපි දන්නවා. සුගතදාස ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා ලබා දුන් රුපියල් මිලියන 660ට අමතරව එතුමා තවත් මුදල් ලබා දීලා තිබෙනවා. ඊට අමතරව හැම අමාත්‍යාංශයකටම -අමාත්‍යාංශ 51ටම- විශාල මුදලක් ලබා දුන්නා. මා ඒ ගැන ගරු මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා. ඒ නිසා, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය සම්පූර්ණ ප්‍රලාපයක් විධියටයි මා දකින්නේ.

ඒ විතරක් නොවෙයි. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සමහර අදහස් ගැන මා කියන්න කැමැතියි. එතුමා "ඒකපුද්ගල බදු බර" ගැන කියනවා. ඒකපුද්ගල බදු බර කියලා ගන්න බැහැ. ඒකපුද්ගල බදු බර කියලා ගන්නේ කොහොමද? බදු ආදායම ජනගහණයෙන් බෙදුවාම ලැබෙන සංඛ්‍යාව ඒකපුද්ගල බදු බර කියලා එතුමා ගන්නවා. එහෙම එකක් ආර්ථික විද්‍යාවේ කොහෙන් සොයා ගත්තාද කියලා මා දන්නේ නැහැ. ඒකපුද්ගල බදු බර වැඩි වීම කියලා එතුමා අරගෙන තිබෙන්නේ, මුළු බදු ආදායම ජනගහනයෙන් බෙදලායි. එවැනි තීරණයක් ගන්න බැහැ. මොකද, මුළු ජනගහනයම බදු ගෙවන්නේ නැහැ. හැබැයි ජනගහනයෙන් යම් කොටසක් බදු ගෙවනවා; යම් කොටසක් බදු ගෙවන්නේ නැහැ. හැබැයි මුළු බදු ආදායම ජනගහනයෙන් බෙදලා ලැබෙන පිළිතුර ඒකපුද්ගල බදු ආදායම කියලා එකක් හදා ගත්තාම, පොඩි කිරි සප්පයාගේ ඉඳලා හැම මනුෂ්‍යයාම කල්පනා කරනවා, "මගෙනුත් බදු ආදායමක් අය කරලා ඇති"යි කියලා. මෙය වැරදි ආකාරයට අර්ථ කථනය කිරීමක් විධියට තමයි මා දකින්නේ. ඒ වාගේම තමයි ඒකපුද්ගල වියදමත් ගණනය කර තිබෙන්නේ. එක් පුද්ගලයෙකුගෙන් ලැබෙන බදු ආදායම හා වියදම අතර ප්‍රමාණය අඩු කරලා, ඒක රුපියල් 29,966යි කියලා අරගෙන ඒකපුද්ගල බදු ආදායමයි, ඒකපුද්ගල බදු වියදමයි අතර සංසන්දනාත්මකව සලකා බලන වැඩ පිළිවෙළක් තමයි හදලා තිබෙන්නේ. මෙය සම්පූර්ණයෙන්ම වැරැදියි. අපි එතුමාට ආදරය කරනවා වාගේම එතුමා ඉදිරිපත් කළ ඒ කාරණා සම්පූර්ණයෙන්ම වැරදි සහගතයි කියලා මා කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. අය වැය කථාවේ 104වන පිටුව සම්බන්ධයෙන් එතුමා කථා කළා. මේ සටහනේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් මා සොයා බැලුවා. එහි, "ණය වාරික ගෙවීම" යනුවෙන් දම් පාටින් සටහන් කරලා තිබෙනවා. ඒ අනුව 2014 වර්ෂයේදී ණය වාරික ගෙවීම 633යි කියා සටහන් වී තිබෙනවා. 2015 වර්ෂයේදී එය 846 දක්වා වැඩි වෙලා තිබෙනවා. මා ඒ ගැන සොයා බලා කරුණු සියල්ලක්ම එකතු කර ගත්තා. 2015 ණය ආපසු ගෙවීම් වැඩි වීමට හේතු වෙලා තිබෙන්නේ මොකක්ද කියා මා කියන්න කැමැතියි. මෙම සටහනට අනුව දම් පාටින් ලකුණු

කර තිබෙන ආකාරයට 2014 වර්ෂයේදී 633ට තිබුණු ණය වාරික ගෙවීම්, 2015 වර්ෂයේදී 846 දක්වා වැඩි වෙලා තිබෙනවා. එසේ වැඩි වෙලා තිබෙන්නේ, මෙන්න මේ කාරණා නිසායි.

එක් කාරණාවක් තමයි, 2009 වර්ෂයේදී නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කර ඩොලර් මිලියන 500ක් 2015 වර්ෂයේදී කල් පිරීම. ඒක මතක තබාගන්න. පුත්තලම ගල් අඟුරු බලාගාරයේ අදියර 1 සඳහා ලබා ගත් යූඑස් ඩොලර් මිලියන 152 කල් පිරුණේ, 2015 වර්ෂයේදීයි. ඊළඟට, පුත්තලම ගල් අඟුරු බලාගාරයේ අදියර 2 සඳහා ලබා ගත් ඩොලර් මිලියන 891ක ණය ආපසු ගෙවීම ආරම්භ වුණේත් 2015 අවුරුද්දේදීයි. මත්තල ගුවන් තොටුපොළ සඳහා ලබා ගත් යූඑස් ඩොලර් මිලියන 190 ආපසු ගෙවීම ආරම්භ වුණේත්, 2015 වර්ෂයේදීයි. මේ එකතුවීමත් එක්ක තමයි, එතුමා පෙන්වා සිටින ණය වාරික ගෙවීම් සංඛ්‍යා ලේඛනයේ 633 සිට 846 දක්වා වැඩි වුණේ. මෙය අවබෝධ කරගන්න තමයි එතුමා කථා කරන්නේ. මෙය එතුමාට උගන්වන්න අවශ්‍ය කාරණයක් නොවෙයි. හැබැයි එය, කරුණු වරදවා වටහාගෙන ජනතාව මුලා කිරීම සඳහා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් විධියටයි මා හඳුන්වන්නේ.

ඒ විතරක් නොවෙයි. ණය ප්‍රමාණයේ සාමාන්‍ය වර්ධනය බලමු. 2011 සිට 2015 වර්ෂය දක්වා ණය ප්‍රමාණයේ සාමාන්‍ය වර්ධනය අනුව අපි 2016 සිට 2020 දක්වා ගණන් හදලා බැලුවා. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ සංඛ්‍යා ලේඛනත් එක්කයි මා කථා කරන්නේ. ණය ප්‍රමාණයේ සාමාන්‍ය වර්ධනය 2006 සිට 2010 කාලයේ සියයට 15.6යි; 2011 සිට 2015 දක්වා සියයට13.2යි. එතකොට 2016 සිට 2020 වන විට එය සියයට 6.7 දක්වා අඩු වෙන විධියේ වැඩපිළිවෙළක් තමයි මේ වැඩ පිළිවෙළ තුළ සකස් කර තිබෙන්නේ. අපට අය වැය පිළිබඳව විවේචනය කරන්න පුළුවන්. විපක්ෂයේ ඉන්නකොට අපි අය වැය පිළිබඳව විවේචනය කළා. ආණ්ඩුවේ ඉන්නකොට අය වැය පිළිබඳව ආරක්ෂා කරනවා. එය තමයි සාමාන්‍ය සාම්ප්‍රදාය වන්නේ. හැබැයි මේ ක්‍රියාදාමයේදී අපට පිළිගත හැකි කාරණාව වන්නේ, මේ අය වැය කථාව අරගෙන එහාට මෙහාට හරවලා කියවන එක නොවෙයි අප කළ යුත්තේ කියන එකයි. මේ ක්‍රියාදාමය තුළ සත්‍ය කාරණය නිවැරදිව සකස් කර තිබෙනවාය කියන එක තමයි මා විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සුභසාධන වියදම් දෙස බලන්න. 2015 වර්ෂයේ දී මුල් මාස 9 සඳහා සුභසාධන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 92,477ක් වෙන් කර තිබුණා. හැබැයි 2016 මුල් මාස 9ට සුභසාධන වියදම් සඳහා රුපියල් මිලියන 1,28,004ක් වෙන් කර තිබෙනවා. මෙය වැඩිවීමක් හැටියටයි අපි දකින්නේ.

මා විශේෂයෙන්ම කියන්න කැමැතියි, අද මේ රටේ අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නවලට අවශ්‍ය කරන විසඳුම් හා ක්‍රියාවලියන් ගණනාවක් ඇති කරලා තිබෙන බව. දැන් බලන්න, සීනි කර්මාන්තය දෙස. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් දන්නවා, සීනි කර්මාන්තයත් එක්ක ගැට ගැසුණු විශාල ඉඩ කඩම් ප්‍රමාණයක් අම්පාර ප්‍රදේශයේ තිබෙන බව. 1950දීයි අපි සීනි කර්මාන්තය පටන් ගත්තේ. 1990 මැද භාගය වන විට සීනි කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණා. අද අපේ රටේ මුළු සීනි පරිභෝජනය වසරකට මෙට්‍රික් ටොන් ලක්ෂ 7යි. නමුත් අපි නිෂ්පාදනය කරන්නේ මෙට්‍රික් ටොන් 56,000ක් පමණයි. එක අවුරුද්දකට සීනි මෙට්‍රික් ටොන් 6,44,000ක් ආනයනය කරනවා. මෙය තමයි ඇත්ත තත්ත්වය. ඒ හරහා විදේශ රටවලට ගලා යන විදේශ විනිමය රුපියල් බිලියන 35ක් වෙනවා. මේ රුපියල් බිලියන 35ක විදේශ විනිමය ඉතිරි කරගන්න අපි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒ කාලයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාත් විශාල උත්සාහයක් දැරුවා, මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙනයන්න. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වනවා. 2020 වන විට සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් 7,30,000 දක්වා වැඩි වනවාය කියා අපි උපකල්පනය කරලා තිබෙනවා. 2025 වන විට සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් 7,65,000 දක්වා වැඩි වනවාය කියා අපි අනුමාන කරලා තිබෙනවා. 2020දී අලුත් ඉඩම් හෙක්ටයාර 31,000ක නව වගාවක් කිරීමටත්, 2025 වන විට එය හෙක්ටයාර 1,01,000ක් දක්වා වැඩි කිරීමටත් අපි බලාපොරොත්තු වනවා. ඒ සඳහා විශාල වැඩ කොටසක් සිදු කිරීමට අවශ්‍යයි. ඇඹරීමේ ධාරිතාව මෙට්‍රික් ටොන් 2,000ක කර්මාන්තශාලාවක් හදන්න රුපියල් බිලියන 12ක් වැය වනවා. වසර 6කින් ඒ පිරිවැය සම්පූර්ණයෙන්ම ඔවුන්ට අය කරගන්න පුළුවන්. එවැනි කර්මාන්තශාලා 15ක් පමණ අපේ රටට අවශ්‍ය වෙලා තිබෙන කාල වකවානුවක් තමයි දැන් තිබෙන්නේ. 2025දී සීනි ආනයනය නවත්වලා, අපි සීනිවලින් ස්වයංපෝෂිත වන්න නම්, එවැනි කර්මාන්තශාලා විශාල සංඛ්‍යාවක් අපට අවශ්‍යයි. එවැනි කර්මාන්තශාලාවක වැඩ කරන කෙනකුගේ පවුලේ ආදායම රුපියල් 30,000 දක්වා වැඩි කරගන්න පුළුවන් වාතාවරණයක් සකස් කරන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ. ඒ තුළින් සීනි කිලෝවක මිල රුපියල් 95 සිට රුපියල් 75 දක්වා අඩු කරගන්නත් පුළුවන් වනවා. මෙන්න මේ ක්‍රියාදාමය තමයි අපි මේ වැඩ පිළිවෙළ තුළ සකස් කරලා තිබෙන්නේ. ඒ වාගේම මේ ක්‍රියාදාමය තුළ රබර්, පොල්, තේ කර්මාන්ත දියුණු කිරීම සඳහාත් විශාල වැඩ කොටසක් ආරම්භ කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. කුකුළු කර්මාන්තය ගැන බලන්න. මගේ ආසනය තුළ බිත්තර ඇතුළු කුකුළු නිෂ්පාදන විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය වනවා. මෙපමණ කාලයක් අපි කළේ කුකුළන් හදපු එකයි, බිත්තර නිෂ්පාදනය කරපු එකයි විතරයි. මුළු රටේම දේශීය පරිභෝජනයට අවශ්‍ය කුකුළන් ටිකයි, බිත්තර ටිකයි හදලා කන්න දුන්නු එක විතරයි කළේ. රටින් පිටතට කුකුළු නිෂ්පාදන යවන්න අපි වැඩ පිළිවෙළක් සකස් කළාද? ඒ කාලයේ ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමාත් එක්ක අපි ඒ ගැන සාකච්ඡා කළා. ඒ ගැන මා එතුමාට ස්තුතිවන්ත වනවා. එතුමා ඒ සම්බන්ධයෙන් විශාල උත්සාහයක් ගත්තා. මා සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා.

වයඹ පළාතේ හිටපු මහ ඇමතිවරයා විධියට මා ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමා එක්ක සාකච්ඡා කළා. එතුමා විශාල වැඩ පිළිවෙළක් සකස් කළා. රුපියල් 7ට තිබුණු බිත්තරය එතුමා රුපියල් 11 දක්වා වැඩි කළා. හැබැයි එවකට ලක් සතොස ආයතනය භාරව හිටපු ඇමතිවරයා මේ බිත්තර රුපියල් 11ට ගත්තේ නැහැ. ඒ තුළින් අපේ රටේ කුකුළු කර්මාන්තයේ නිරත වී සිටි අයට විශාල විනාශයක් වුණා. පෞද්ගලික පළිගැනීමකට තමයි එතුමා ඒ බිත්තර රුපියල් 11ට ගත්තේ නැත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,මා කියන්න කැමැතියි, කුකුළු නිෂ්පාදන අපනයනයකරුවන් 10,000කගේ ණය සඳහා වන පොලියෙන් සියයට 50ක් දක්වා රජය ගෙවන්න බලාපොරොත්තු වනවාය කියලා. ඒ වාගේම රාජ්‍ය ණය පොලී වියදම දරමින් අධිශීතකරණ 15,000ක් ලබා ගැනීමේ වැඩ

[ගරු දයාසිරි ජයසේකර මහතා]

පිළිවෙළක් සකස් කරනවා. ඒ විතරක් නොවෙයි. අද විශාලම අර්බුදය තිබෙන්නේ කුකුළු පැටවුන් ජනනය කිරීමේ මධ්‍යස්ථාන නැති එකයි. ඒ සඳහාත් විශාල වැඩ කොටසක් සකස් කරලා තිබෙනවා.

තවත් විනාඩි කිහිපයක් ලබා ගෙන මේ කාරණයත් කියන්න මා කැමැතියි. අද අපේ අධිකරණ පද්ධතිය තුළ තිබෙන මාර්ග නීති සම්බන්ධයෙන් බලන්න. විශේෂයෙන්ම කැබිනට් මණ්ඩලයේදීත් මා මේ කාරණය ගැන සාකච්ඡා කළා. රටේ පැවැති යුද්ධය නිසා අවුරුද්දකට මියගිය පිරිසට සමාන පිරිසක් හදිසි අනතුරු නිසා අවුරුද්දකට මියයන බව මා කිව්වා. වසරකට 40,000කට අධික රිය අනතුරු සංඛ්‍යාවක් සිද්ධ වනවා. ගිය අවුරුද්දේ විතරක් 4,840ක් මිය ගියා. යුද්ධය නිසා අවුරුද්දකදී මියගිය පිරිසට සමාන පිරිසක් රිය අනතුරු නිසා එක අවුරුද්දක් ඇතුළත මිය යන තත්ත්වයකට දැන් මේ රට පත් වෙලා තිබෙනවා. මෙයට අපි මොකක්ද කරන්නේ? අපි නීති පද්ධතිය සංවිධානය කරන්නේ නැද්ද? වැඩ පිළිවෙළක් සහිතව අපි මේ ක්‍රියාදාමයට අත ගහන්නේ නැද්ද? එයට තමයි දැන් ස්ථානීය දඩයක් -spot fine එකක්- නියම කරන්න අවශ්‍ය කරන කටයුතු කරන්නේ. එය නිකම් කරන්නේ නැහැ. මේ රටේ පොලීසියට නවීන තාක්ෂණය යොදලා ඒ කටයුතු නිවැරැදිව කරන්න ඔවුන්ට උදවු කරන්න ඕනෑ. එහෙම නැත්නම් සිද්ධ වන්නේ, රුපියල් 2,500ක දඩ මුදල ගහපු ගමන් ඒ රුපියල් 2,500 රජයට ගෙවන්නේ නැතිව, ඉතිරි ටික කාගේ හෝ සාක්කුවට යන වැඩ පිළිවෙළක් තමයි. ඒකටත් අපි වැඩ පිළිවෙළක් සකස් කරලායි තිබෙන්නේ. ඒ නිසා මේ රුපියල් 2,500ක දඩය, වැරැද්දක් කරන කාට හෝ ගහන්න ඕනෑ. මා කියන්නේ මීට වැඩිය දඩ මුදල් ගහන්න ඕනෑ කියලායි. හරි විධියට නම්, තමන්ගේ පඩියට වඩා වැඩි මුදලක් දඩ ගහන්න ඕනෑ. එතකොට තමයි මේක හරි යන්නේ.

පිට රටවලට ගියාම අපි දන්නවා, මොකක්ද, සිද්ධ වන්නේ කියලා. පිට රටවල කවුරුවත් එන්නේ නැහැ, රෑට "drink" එකක් දමා ගෙන විනෝද වන්න. මොකද, බීලා ගිය ගමන් අල්ලනවා. පොලීසියෙන් අල්ලපු ගමන් තමන්ගේ මුළු පඩියම ඉවරයි. ඒ නිසා කරන්නේ තමන්ගේ යාළුවෙක් දමා ගෙන යනවා, "ඔයා අද වාහනය පදවන්න"යි කියලා. ලංකාවේ එහෙම කරනවාද? නැහැ නේ. ලංකාවේ වාහනය පදවන එක්කෙනාත් බොනවා, පිටිපස්සේ යන හතර දෙනාත් බොනවා. ඉතිරි කට්ටියත් බීලා යන ගමන්, "අනේ! රාළහාමි, මේ පාන්දර ගිහිල්ලා එන ගමන් තමයි" කියලා කථා කරලා මොකක් හෝ ෂේප් එකක් දමලා යනවා. මේ සම්බන්ධයෙන් ස්ථාවර වැඩ පිළිවෙළක් ගෙනාවේ නැත්නම්, ලංකාවේ හදිසි අනතුරු විශාල සංඛ්‍යාවක් සිදු වනවා විතරක් නොවෙයි, අපට විශාල අර්බුදයකට මුහුණ පාන්න සිද්ධ වනවා.

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නීතිඥවරියක් විධියට, මහාධිකරණයේ කටයුතු කරපු නීතිඥවරියක් විධියට ඔබතුමිය දන්නවා, මේ නඩු පිළිබඳව අපට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන බව. අද ට්‍රැෆික් නඩුවලට මොකද වෙලා තිබෙන්නේ? මහ මඟදී මොකක් හෝ ප්‍රශ්නයක් ඇති වෙලා ඒක බේරාගන්න බැරි වුණාම, ඒ ප්‍රශ්නය පොලීසියේ රථවාහන අංශයට දානවා. එතකොට මොකද කරන්නේ? නඩු දමනවා. අද රථවාහන නඩුවලින් උසාවි පිරිලා. රිය අනතුරකින් කාගේ හෝ අත-පය කැඩුණාම හෝ මැරුණාම වන්දියක් ගන්න ඒ අහිංසක මුළු පවුලම අවුරුදු ගණන් උසාවි ගානේ රස්තියාදු වෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි ගරු ඇමතිතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි කියන්නේ මේකයි. රක්ෂණ ක්‍රමයක් තුළින්ම ඒ සඳහා ක්‍රමවේදයක් ඇති කරන්න. මුලින්ම රුපියල් 25,000කින් ඒ දේ පටන් ගන්න. අපි සූදානම් ඒ වැඩ කටයුතුවලට අතගහන්න. කැබිනට් මණ්ඩලය ඇතුළේ මම දිගින් දිගටම මේ ගැන කථා කළා. ඒ නිසා රවි කරුණානායක මැතිතුමා මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මම ගොඩක් සන්තෝෂ වෙනවා. මේ වාගේ විශාල වැඩ කොටසක් සහිතව අපි අලුත් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙනයන්න කටයුතු කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඒ සඳහා අපේ සහයෝගය ලබා දීලා උදවු කරමුය කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 5.30]

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම අය වැය ගැන ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් හා යෝජනා රැසක් ඉදිරිපත් වුණා. විශේෂයෙන් මෙවර අය වැය සකස් කරන කොට සියලු ජන කොටස්වලින් යෝජනා සහ අදහස් විමසන්න කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ යෝජනා ලබාගන්නත් කටයුතු කරලා තිබෙනවා. මම දැක්කා මුදල් ඇමතිතුමා කියනවා, විශ්වවිද්‍යාල කණ්ඩායම් ඒ ඒ ප්‍රදේශවලට යවලා, ජනතාවගේ අදහස් හා යෝජනා සියල්ල එකතු කරගෙන ඒවා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා රටේ ජනතාවට සහන ලබාදෙන වැඩ පිළිවෙළක් සහිතව මේ අය වැය යෝජනා ඉදිරිපත් කර තිබෙනවා කියලා.

විශේෂයෙන්ම අද මේ අය වැය තුළින් සහන රැසක් රටේ ජනතාවට ලැබී තිබෙනවා. අද සෑම මාධ්‍යයකම ඒ සහන පිළිබඳව ප්‍රකාශ වෙලා තිබෙනවා මම දැක්කා. මීට කලින් ඉදිරිපත් වුණු සමහර අය වැයවලින් පසුව මාධ්‍යවේදීන් විවේචනාත්මක අදහස් ඉදිරිපත් කර තිබුණු හැටි අපි දැක්කා. නමුත්, මේ අය වැය ජනතාවාදී අය වැයක්. හැම මන්ත්‍රීවරයෙක්ම කථා කරන කොට ඒ ගැන කිව්වා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුත් මේ අය වැය ගැන සුබවාදීව කථා කළා. ඒ අය කථා කරලා කිව්වේත්, රටේ ජනතාවට සහන ලැබී තිබෙන බවයි.

2015 ජනවාරි 8වැනි දා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා හැටියට පත්වෙන කොට, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා හැටියට පත්වෙන කොට රටේ ජනතාවට පොරොන්දු රැසක් ලබා දුන්නා. ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ඇතුළු නව ආණ්ඩුව දින සියයේ වැඩසටහන යටතේ, ඒ ලබා දුන් පොරොන්දු ටික ඉෂ්ට කරන්න, ඒ සහන ලබා දෙන්න පුළුවන්කම

ලැබුණා. එහිදී විශේෂයෙන්ම ඩීසල්, පෙට්‍රල්, ගෑස් ඇතුළු ඉන්ධන මිල අඩු කිරීම, අත්‍යවශ්‍ය භාණ්ඩ මිල අඩු කිරීම, ගැබිනි මාතාවන් සඳහා රුපියල් 20,000ක් වටිනා පෝෂණ මල්ලක් ලබාදීම, සමෘද්ධි දීමනාව වැඩි කිරීම, පෞද්ගලික අංශයේ වැටුප රුපියල් 2,500කින් වැඩි කිරීම, රාජ්‍ය සේවකයන්ටගේ රුපියල් 10,000ක දීමනාවක් ලබා දීම වාගේ පොරොන්දු රැසක් ඉෂ්ට කරගන්න එදා පුළුවන්කම ලැබුණා.

ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට 2001දී අපේ ආර්ථිකය සෘණ මට්ටමට වැටුණා. එසේ සෘණ මට්ටමේ තිබියදී මැතිවරණය ආවා. ඒ මැතිවරණයේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා රටේ ජනතාවට කිව්වා, "මේ ආර්ථිකය ගොඩගන්න මට පුළුවන්. ඒ නිසා මට ජනවරම ලබා දෙන්න" කියලා. රටේ ජනතාව ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ඒ ජන වරම ලබා දුන්නා. එතුමා සැලැස්මක් ඇතුව රටේ ජනතාවට කරුණු ඉදිරිපත් කරලා, එදා රටේ තිබුණු යුද්ධය සම්බන්ධව සාකච්ඡා ආරම්භ කරලා, රටට සාමය උදා කරලා වැටී තිබුණු ආර්ථිකය ගොඩගන්න පටන් ගත්තා. ඒ නිසා ආර්ථිකය ශක්තිමත් වුණා. ඒ අනුව ආර්ථික වර්ධන වේගය 2.4 දක්වා වැඩි කර ගත්තා. සෘණ මට්ටමට වැටී තිබුණු ආර්ථිකය ධන මට්ටමට ගෙනෙන්න ගරු රනිල් වික්‍රමසිංහ වර්තමාන අගමැතිතුමාට එදා පුළුවන්කම ලැබුණා. එතුමාට අදත් අවශ්‍ය වෙලා තිබෙන්නේ මොකක්ද? අදත් එතුමාට අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ රටේ ණය බරින් සිටින ජනතාව නිදහස් කර ගන්නයි. මේ ජනතාව ණය බරින් නිදහස් කර ගන්න ඕනෑය කියන එක එතුමා ප්‍රකාශ කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාත්, අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් මේ රටේ ජනතාව ණය බරින් නිදහස් කරන්න මේ වෙනකොට සැලසුම් සකස් කරලා කටයුතු කර ගෙන යනවා.

විශේෂයෙන් 2001 වසරේ සිට 2004 වසර වෙනකොට අපේ ආර්ථිකය ධන මට්ටමට -2.4 දක්වා- ඇවිත් තිබුණා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ටෝකියෝ සමුළුවට සහභාගි වෙලා කෝටි 45,000ක මුදලක් මේ රටට ලබා ගන්න සාකච්ඡා කර ගත්තා, මේ රටේ ග්‍රාමීය සංවර්ධනය සඳහාත්, යටිතල පහසුකම් සඳහාත්. නමුත් එදා මොකද වුණේ? 2001 වසරේ ඒ තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට රටේ ජනතාව අවුරුදු පහකට බලය ලබා දී තිබුණා. අවුරුදු දෙකක් යනකොට අගමැතිතුමා ආර්ථිකයත් ශක්තිමත් කළා. නමුත් එදා හිටපු ජනාධිපතිතුමිය මොකක්ද කළේ? රටේ ජනතාවගේ වරමින් අවුරුදු පහකට බලය ලබා දී තිබුණු ආණ්ඩුව අවුරුදු දෙකෙන් විසුරුවා දැම්මා. එදා, විමල් වීරවංශ මන්ත්‍රීතුමා ලොකු බලපෑමක් කරලා ඒ තිබුණු ආණ්ඩුව අවුරුදු දෙකෙන් විසුරුවා හැර දමන්නට කටයුතු කළ හැටි මට මතක් වෙනවා. රටේ ජනතාවට බලාපොරොත්තු තිබුණා. නමුත් ඒ නිසා ඒ බලාපොරොත්තු එකක්වත් ඉෂ්ට කර ගන්න බැරි වුණා.

2004 වසරේදී නැවත අනෙක් ආණ්ඩුව බලයට පත් වුණා. අපි විපක්ෂයට ගියා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා හැම අවස්ථාවේදීම බැලුවේ මේ රට සංවර්ධනය කරලා රටේ ජනතාවට සහන ලබා දෙන්නයි. 2015 වසරේ ජනාධිපතිවරණය එනකොට එතුමා අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වන්නේ නැතුව අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන් එක්ක සාකච්ඡා කරලා පොදු අපේක්ෂකයෙකු ඉදිරිපත් කළා. ඒ අනුව අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පත් කර ගත්තා. අද එහි ප්‍රතිඵල රටේ ජනතාවට තිබෙනවා.

ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි මේ ජාතික ආණ්ඩු සංකල්පය ආවේ. අද මේ අය වැය දිහා බලන්න. අද මේ සම්බන්ධයෙන් කොයි තරම් අදහස් හුවමාරු වෙලා තිබෙනවාද කියා බලන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ක, එක්සත් ජාතික පක්ෂය එක්ක, ඒ වාගේම අනෙක් සුළු පක්ෂ එක්ක අදහස් හුවමාරු කරගෙන මේ අය වැය ජනතාවාදී අය වැයක් හැටියට සකස් කර ගන්න ගරු මුදල් ඇමතිතුමාට පුළුවන්කමක් ලැබුණා. ඒ නිසා මම කලින් කියපු විධියට ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සමහර ගරු මන්ත්‍රීවරුන් මේ අය වැය සම්බන්ධව සුබවාදී අදහස් පළ කළා.

අද මේ රටේ සිටින දුප්පත් ජනතාවට සහන රැසක් ලැබී තිබෙනවා. ඒ අනුව අද ග්‍රාමීය සංවර්ධනය සඳහා -යටිතල පහසුකම් සඳහා- විශාල මුදලක් ලබා දීලා තිබෙන බව මම තමුන්නාන්සේලාට සඳහන් කරන්න කැමැතියි. ගරු මන්ත්‍රීතුමන්ලා සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරපු නිසා නැවත නැවතත් ඒවා ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. 2016 සැප්තැම්බර් 21වන දින එක්සත් ජාතින්ගේ සංවිධානයේ 71වන මහා මණ්ඩල සැසි වාරයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 800ක අරමුදල්, ප්‍රදානයක් ලෙස ශ්‍රී ලංකාවට හිමි කර ගැනීමට හැකි වීම එක් ජයග්‍රහණයක්; ආර්ථික ජයග්‍රහණයක්. GSP plus සහනය නැවත ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීම, තවත් ජයග්‍රහණයක්. G-7 සමුළුවේදී යෙන් මිලියන 500ක ආධාරයක් ජපානයෙන් ලබා ගැනීමට මේ නව රජයට හැකි වීම තවත් ජයග්‍රහණයක්. කොයි තරම් මුදලක් මේ රටට දැන් ආධාර වශයෙන් ලැබෙනවාද? ග්‍රාමීය මාර්ග සංවර්ධනය උදෙසා 2015 වර්ෂයේදී රුපියල් ලක්ෂ 300ක් සහ 2016 වර්ෂයේදී රුපියල් ලක්ෂ 600ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා දී තිබෙනවා. නිවාස ව්‍යාපෘතිය උදෙසා - "සැමට හිසට සෙවණක්" ව්‍යාපෘතිය යටතේ නිවාස ලක්ෂ 5ක් ඉදි කර දීම, "උදාගම්" සංකල්පය යටතේ නිවාස 1,000ක් ඉදි කර දීම, දුප්පත් පවුල්වල නිවාස කපරාරුව සඳහා සිමෙන්ති ලබා දීම, නිවාස ණය ලබා දීම සිදු කර තිබෙනවා. කොයි තරම් විශාල මුදලක් ලබා දී තිබෙනවාද? හිටපු නිවාස ඇමති විමල් වීරවංශ මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දී කරපු කතාවකවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ග්‍රාමීය මට්ටමේ සිටින නිවාස නැති අයට මේ ආකාරයට නිවාස ලබා දීමට කටයුතු කරනවා කියා කියනවා අපි අහලා නැහැ. නිවාස හදා දීම තබා නිවාස නොමැති දුප්පත් ජනතාවට අඩුම තරමින් සිමෙන්ති කොට්ටයක්වත් ලබා දෙන වැඩ පිළිවෙළක් පසු ගිය කාලය තුළ තිබුණේ නැහැ. "උදා කළ ගම්මාන" ඇති කරලා තිබුණේ නැහැ. ඒ හින්දා නිවාස වැඩසටහන අසාර්ථක තත්ත්වයකයි එදා පැවතුණේ. ඒ කාලයේ නිවාස වැඩසටහන හරියාකාරව ක්‍රියාත්මක වුණේ නැති නිසා තමයි එය ක්‍රියාත්මක කරන්න අද අපට අවස්ථාව ලැබී තිබෙන්නේ.

සජිත් ප්‍රේමදාස ඇමතිතුමා තමාට ලැබී තිබෙන මුදල් හරියාකාරව මුළු රටටම බෙදී යන විධියට, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම බෙදී යන විධියට සැලැස්මක් අනුව, දර්ශනයක් ඇතිව තම නිවාස වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කටයුතු කර තිබෙනවා. [බාධා කිරීමක්] යූඑන්පී අයට විතරක් නොවෙයි අපි ගෙවල් හදන්නේ. 2014දී තමුන්නාන්සේලා කළේ මොකක්ද? "එක්සත් ජාතික පක්ෂයේ අය" කියලා අපට අඩුම තරමින් එක රැකියාවක් වත් ලබා දෙන්න තමුන්නාන්සේලා කටයුතු කළේ නැහැ. අද විභාග පවත්වා, එම විභාගවලින් සමත් වන අයට පාට, පක්ෂ භේදයක් නැතිව රැකියා ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා කියන්න කැමැතියි, අධ්‍යාපනය උදෙසා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )

මහපොළ ශිෂ්‍යත්ව ආධාර මුදල රුපියල් 2,500 සිට රුපියල් 5,000 දක්වා වැඩි කිරීම, විද්‍යා පීඨ පිහිටුවීම, 1වසර සිට 13වසර දක්වා සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පාසල් අධ්‍යාපනය ලබා දීම නව රජය යටතේ අපි සිදු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රකාශ කළා, සෑම දෙමවුපියෙකුම තමන්ගේ දරුවන්ට 13වන වසර දක්වා අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑ කියලා. ඇත්තටම අද සියලුම දෙමවුපියන් ඒ ගැන සන්තෝෂ වෙනවා. අද තම දරුවන් 13වන වසර දක්වා අධ්‍යාපනය සඳහා යොමු කරවන්න පුළුවන් වෙලා තිබෙනවා කියලා දෙමව්පියෝ ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධ්‍යාපනය ගැන කථා කරනකොට තවත් කාරණයක් පිළිබඳව කියන්න ඕනෑ. ග්‍රාමීය පාසල් සංවර්ධනය කරන්න මේ වන කොට එක පාසලකට -ජාතික පාසලකට- රුපියල් කෝටි 8ක්, 9ක් පමණ මේ වර්ෂය තුළ ලබා දී තිබෙනවා. ඒ වාගේම, පාසල්වල සනීපාරක්ෂක කටයුතු ඇතුළු සියල්ලට විශාල මුදලක් අප ලබා දී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )

මගේ කාල වේලාව අවසන් නිසා, ඔබතුමිය දුන් මේ අවස්ථාවට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා.

මීළඟට, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා.

[අ.භා. 5.43]

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගෙන් අවසරයි. අපේ දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීතුමියයි දැන් මූලාසනයේ ඉන්නේ. අය වැය ලේඛනය යනු, ජාතියක ආර්ථික දර්ශනය, ආර්ථික ගමන් මඟ පෙන්වන කැඩපතක් වාගෙයි. 2017 අය වැය ලේඛනය -ජාතික අය වැය ලේඛනය- නමැති කැඩපත දිහා බැලුවාම අපට පෙනෙන්නේ ඉසව්වක්, නිනව්වක්, දැක්මක්, දර්ශනයක් නැති ආර්ථිකයක් මුදල් ඇමතිතුමා ඇතුළු ආණ්ඩුව මේ රටේ හසුරුවමින් සිටින බවයි. ගිය සැරේ නම් අය වැය ලේඛන තුනක් විතර ඉදිරිපත් වුණා. හැබැයි ඒක අහන්න අපේ මුදල් ඇමතිතුමාත් මේ සභාවේ නැහැ; මුදල් රාජ්‍ය ඇමතිතුමාත් නැහැ; අගමැතිතුමාත් නැහැ; ඉදිරි පේළියම හිස්. ජාතික අය වැය - [බාධා කිරීමක්] හොඳයි, ඔබතුමා ඉන්නවා. ඒ ගැන ස්තුතියි. ඔබතුමා දැන් ආවේ. බොහොම ස්තුතියි, ගරු අධ්‍යාපන ඇමතිතුමනි. නමුත් සභාව හිස්. ඒ කියන්නේ අය වැය හිස්. අය වැයත් හිස් නේ. මේක කී වැනි අය වැයද? ගිය සැරේ නම් තුනක් විතර ආවා. ඊළඟ එක කවදාද එන්නේ? [බාධා කිරීමක්] ඊළඟ එක එන්නේ කවදාද දන්නේ නැහැ. ගිය සැරේ තුනක් ආවා. දැන් මේ ආණ්ඩුව කියන්නේ අපි ළදරුයි, ළපටියි, සුකොමළයි, සුන්දරයි, බාලයි කියලායි. හැබැයි මතක තබා ගන්න ඕනෑ, 2015 ජනවාරි 8 වනදා ඉඳලා තමුන්නාන්සේලා ඉදිරිපත් කළ තුන්වන අය වැය ලේඛනය මෙය බව. තුන්වන අය වැය ලේඛනය. මේ අය වැය ලේඛන තුනෙන් තමුන්නාන්සේලා මොනවාද කරලා තිබෙන්නේ? මේ අය වැයට ඉස්සර වෙලා වැට් බද්දක් පනවලා ජනතාව flat කරලායි මේ සුකොමළ අය වැය ඉදිරිපත් කරන්න මෙතැනට ඇවිල්ලා ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුව රෝහල්වල සිදු කරන ශල්‍යකර්ම සඳහාත් වැට් බද්දක් පනවපු බව අපි අමතක නොකළ යුතුයි. මේ රටේ අහිංසක දරුවන් දහස් ගණනක් හදවත් සිදුරු රෝගයෙන් පෙළෙනවා. ඒ දරුවන්ට ආණ්ඩුවේ රෝහලකින් නොමිලේ ශල්‍යකර්මය කර ගන්න නම් දින දීලා තිබෙන්නේ 2020, 2021 සහ 2022 වර්ෂවලයි. ඒ නිසා ඒ දරුවන්ගේ අම්මාවරු, පියවරු තමන්ගේ ගේ උකස් තියලා, කුඹුර උකස් තියලා, පොලියට සල්ලි අරගෙන; ණයට සල්ලි අරගෙන තමන්ගේ දරුවාගේ ජීවිතය බේරා ගන්න පෞද්ගලික රෝහල්වලට යනවා. හැබැයි මේ ආණ්ඩුව ඒ ශල්‍යකර්මයටත් "වැට්" බද්දක් පැනෙව්වා. මේ නිසා අහිංසක දරුවන් දහස් ගණනකගේ ජීවිතය අනතුරේ වැටිලා තිබෙනවා. ඒක සාපරාධී ක්‍රියාවක්. ඒක සහ ගහනවා. කතරගම දිවියනේ! මේක සහ ගහනවා. මට තිබෙන දුක, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පෝස්ටරය ගහගෙන එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඡන්දය ඉල්ලලා ආණ්ඩුවට හේත්තු වුණු අයත් මේ "වැට්" බද්දට පක්ෂව ඡන්දය දීපු එක ගැනයි. ඒක සහ ගහන අපරාධයක්. ණයට සල්ලි අරගෙන bypass operation එකක් කර ගන්න බලාපොරොත්තුවෙන් හිටපු අය අද ඒ සල්ලි ගෙවන්න ගියාම, අද ඒ අහිංසක මිනිසුන්ට කියනවා, තව රුපියල් ලක්ෂ දෙකක් ගෙවන්න කියලා. කොහෙන්ද ගෙවන්නේ? දැන් මෙතැන ඔක්කෝම අය කියන්නේ, "ඕනෑ තරම් සල්ලි තිබෙනවා, ඕනෑ දෙයක් කරන්න පුළුවන්" කියලායි. හැබැයි අර අහිංසක මිනිහා බද්දෙන් නිදහස් කළේ නැහැ. මේ "බදු අය වැය" නිසා රටේ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් දුකින් පීඩා විඳිනවා. ඒ අහිංසක රෝගීන්ගේ ජීවිතවලට මේ සාපරාධී ආණ්ඩුව වගකියන්න ඕනෑ. මේ "වැට්" බද්ද පනවලා රුපියල් කෝටි දහසක්, එක්දහස් දෙසියයක් තමයි සොයා ගන්නේ. හැබැයි එතනෝල්කාරයින්ට බදු සහන දීලා ආණ්ඩුව රුපියල් කෝටි එක්දහස් අටසියයක් පාඩු ලබනවා.

මහ දවාලේ මහ බැංකුව මංකොල්ල කෑවා, අර්ජුන මහේන්ද්‍රන් හොරා. හැබැයි ඒකේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හැබැයි ඔහු අත් හරින්න සමහරු සූදානම්. මේ රටේ, මේ ජාතියේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වෙලා මහජන බැංකුව ආදී සියලු බැංකු මංකොල්ල කාලා, මහ බැංකුවත් මංකොල්ල කාලා, මේ රටේ අහිංසක ජනතාවට බදු පනවන අය වැයක් ගෙනාවා. හැම තැනකම බදු දැල එළලා. අද ආණ්ඩුවේ ආර්ථික දර්ශනය මොකක්ද? උදේ ඉඳලා රෑ වෙනකල්-

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අගමැතිතුමා මේ සභාවේ නැති වෙලාවක මෙතුමා අගමැතිතුමා ගැන වැරැදි ප්‍රකාශයක් කළා. මම ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒක ඉවත් කර ගන්න කියලා. මොකද, අගමැතිතුමාට හොරෙක් කියලා කියන්න එතුමාට බැහැ. [බාධා කිරීම්] එහෙම නම් අපි කියනවා,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා. [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
උදේ ඉඳලා රාජපක්ෂලාට "හොරු, මිනීමරුවෝ" කියලා කියනවා. [බාධා කිරීම්] රාජපක්ෂලා නැති අතරේ- [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
"කම්බ හොරා" කියලා කියන්නේ හොරා නිසා තමයි. [බාධා කිරීම්] හොරාට "හොරා" කියලා තමයි- [බාධා කිරීම්]

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මට මගේ කාලය දෙන්න. [බාධා කිරීම්] මේ ලිච්ඡවී රජ දරුවෝ වල්ගය උස්සා ගෙන උම්බෑ කියනවා. - [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. කථාවට බාධා කරන්න එපා. ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මේ ලිච්ඡවී රජදරුවෝ වලිගය උස්සාගෙන උම්බෑ කියනවා. මගේ කාලය නාස්ති කරන්න එපා. [බාධා කිරීම්] අලි බබා සහ හොරු හතළිහෙන් එක්කෙනෙක් නැඟිටලා. වාඩි වෙන්න. දැන් තමුන්නාන්සේලාට තිබෙන ආර්ථික දර්ශනය මොකක්ද? ලෝකය පුරාම මේ ආණ්ඩුව ආධාර ඉල්ලාගෙන ගියා. මීට ඉස්සෙල්ලා බැරැක් ඔබාමා හමු වුණා. ඊළඟට නෝර්වේ ගියා. ජර්මන් චාන්සලර්වරයා හමු වුණා. කිසි දෙයක් හම්බු වුණේ නැහැ. අන්තිමට ඉතිරි වුණේ අපි දන්න, "ජින්පිං" විතරයි. දැන් පාත්තරේ උස්සාගෙන ගිහින් ජින්පිං පස්සේ එලවනවා. හිටගෙන ඉන්නවා, පාත්තරේ අරගෙන ගිහිල්ලා. දැන් මේ අයට මොකක්ද තිබෙන දර්ශනය? මොනවාද හදන්නේ? කොළඹ වරාය නගර ව්‍යාපෘතිය, මත්තල ගුවන් තොටුපොළ, හම්බන්තොට මාගම වරාය. මේ සේරම මහින්ද රාජපක්ෂගේ වැඩ; රාජපක්ෂ ආණ්ඩුවේ වැඩ. මේ ගොල්ලන්ට තියෙන්නේ, " අපි යන්නේ කොයි පාරේ - අපේ මහින්ද ගිය පාරේ" වෙන මොකක්වත්ම නැහැ. මොනවාද අලුතෙන් හැදුවේ? මොනවාද අලුතෙන් ගොඩ නැඟුවේ? මොකක්ද දර්ශනය?[බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අකිල විරාජ් කාරියවසම් අමාත්‍යතුමා, ඔබතුමා මොකක්ද පැහැදිලි කරන්නේ?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කියනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ගිය පාරේ යනවා කියා. දෙවියන්ගේම පිහිටයි. මොකද? නැව් එන්නේ නැති වරාය, ගුවන් යානා නැති ගුවන් තොටුපොළවල් තමයි හදා තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
කොළඹ වරාය නගරය හදන්න අපි දුන්නාට වඩා අක්කර ගණනක් මේ ගොල්ලෝ දෙනවා. ජින්පිං හිටියේ නැත්නම් පිං පොං ගහන්න වෙන්නේ මේ ගොල්ලන්ට. මත්තල ගුවන් තොටුපොළ, වරාය දෙකම චීනයට දෙනවා. අපි අක්කර දාහයි දෙන්න හිටියේ. මේගොල්ලෝ අක්කර පහළොස් දාහක් දෙනවා. මහින්දට වැඩියෙ හොඳට කරනවා නේද මහින්දගේ චින්තනය? හොඳයි,හොඳයි. එහෙම යන්න.

මේ අය වැය ලේඛනයේ කෘෂිකර්මාන්තයට දෙන සහන බලමු. එහි තිබෙන ප්‍රස්තාර සටහනේ දැක්වෙන පොහොර සහනාධාරවලට අදාළ කොටස වැඩි වී තිබෙනවා. පොහොර සහනාධාරය සඳහා මෙච්චර වියදම් කළාය කියා පෙන්වනවා. මතක තියා ගන්න ඕනෑ, මේ කාරණය. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා මේ ගරු සභාවේ හිටියා. වියදම ඉහළ ගියාට කුඹුරට වැටෙන,ගොයම් ගහන වැටෙන, බඩ ඉරිඟු ගහට වැටෙන පොහොර ප්‍රමාණය වැඩි වුණේ නැහැ. ඉස්සර රුපියල් තුන්සිය පණහේ වටිනාකමට පොහොර හොණ්ඩරයක් කුඹුරට, හේනට ගියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වස.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
දැන් තමුන්නාන්සේලා දෙන ඒවා පැණි රහයි නේද? පොහොර- යූරියා එහෙම, හරි හොඳ ඒවා නේද? අපි දුන්නේ නරක පොහොර කියලානේ කිව්වේ? තමුන්නාන්සේලා දෙන්නේ හොඳ පොහොර. ඒවායේ වස නැහැ නේද? අනේ හැබෑට කියපු අසත්‍ය දේවල්! දැන් මොකද වෙලා තිබෙන්නේ? ඉස්සර රුපියල් 350ට පොහොර මිටිය ගියා. දැන් රුපියල් දෙදහස් පන්සියයට යනවා. ඉස්සර පොහොර මිටි අටක් දමන තැනට දැන් වැටෙන්නේ එකයි. ප්‍රස්තාර සටහනේ මැද පොහොර සහනාධාර

[ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා]

දැක්වෙන කොටස ඉහළට ගියාට පොහොර ලබා දී නැහැ. බඩ ඉරිඟු ගොවියාට පොහොර නැහැ. හේන් ගොවියාට පොහොර නැහැ. ජාතික නිෂ්පාදනය පහළට. තමුන්නාන්සේලා කොහේද යන්නේ? [බාධා කිරීම්] දැන් තමුන්නාන්සේලා යෝජනා කර තිබෙනවා, මාදුරු ඔය දකුණෙන් අක්කර විසි දාහක් දෙන්න. කාටද දෙන්නේ? මොන ගොවියාටද දෙන්නේ? අතිගරු ජනාධිපතිතුමා කෘෂිකර්ම ඇමතිතුමා වශයෙන් ඉන්නකොට කිව්වේ, "අපි වවමු - රට නගමු" කියා. එතුමා ජනාධිපති වුණාට පස්සේ එතුමාගේ ආණ්ඩුව කියන්නේ, "බදු ගෙවමු - රට හදමු "කියායි. මේ රටේ මිනිස්සු ඉපදිලා ඉන්නේ මේ ආණ්ඩුවට බදු ගෙවන්න. මම කිව්වේ, මුදල් ඇමති කෙනෙක් නැහැ. බදු ඇමතිතුමාත් ඉස්සරහා නැහැ. බදු ඇමතිතුමා මෙතැන ඉන්නේ. එදා "බදු ගෙවමු - රට හදමු" කියලා උදේ ඉඳන් රෑ වෙන තෙක් රූපවාහිනියේත් ගුවන්විදුලියේත් දැන්වීම් දැම්මා. ඒ දමන ඇටිකෙහෙල් දැන්වීම්වලට බදු ගෙවන්නත් ඕනෑ මේ රටේ ජනතාවයි. "බදු ගෙවමු - රට හදමු" කියන දැන්වීමට ගෙවන්නත් ඕනෑ මේ රටේ ජනතාවයි. අපේ ජනාධිපතිතුමා ගැන මට දුක හිතෙනවා.

" අපි වවමු -රට හදමු" කියපු එතුමාට සිද්ධ වුණු දේ! "බදු ගෙවමු - රට හදමු". වෙච්ච දේ! අපි ඉපදිලා ඉන්නේ මේ ආණ්ඩුවට බදු ගෙවන්නයි. මේ ආණ්ඩුව ලොකු ආඩම්බරයකින් කථා කරනවා, ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ බදු ආදායම වැඩියි කියලා. සාක්කු පුරවන්න ආපු එක්සත් ජාතික පක්ෂය, එහෙම නැත්නම් ලිච්ඡවී රජ දරුවන්ගේ යහපාලන ආණ්ඩුව අද අහිංසක ජනතාවගේ සාක්කු ශුද්ධ කරනවා. ජනතාවගේ සාක්කුවල තිබුණු සල්ලි රුපියල් කෝටි 28,000ක් මංකොල්ල කනවා. මේ කරන අපරාධයට හෙණ හත ගහනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
හොඳයි, දැන් මාදුරුඔය දකුණ ව්‍යාපාරයට අක්කර 20,000ක් දෙන කොට පොළොන්නරුවේ අතිගරු ජනාධිපතිතුමාටයි, අම්පාරේ අපිටයි, දෙගොල්ලන්ටම බලපානවා. අද මේ මොහොතේ මාදුරුඔය වනය ආසන්නයේ අවුරුදු 100ක් හේන් වගා කළ ගොවියෝ එළවනවා. ඔවුන් අර ගෙන ගිහිල්ලා උසාවියට දමනවා. ඔවුන්ගේ කිරි හරකෙක් දමන්න දෙන්නේ නැහැ, නඩු දමනවා. හැබැයි, මේ අය වැය ලේඛනයෙන් යෝජනා කරනවා, ඒ ඉඩම් ටික කොම්පැනිකාරයින්ට දෙන්න. ඒ මිනිස්සු ස්වාධීන ජීවිතය ගත කළ අහිංසක ගොවීන්. ඒ අය කොම්පැනිකාරයන්ගේ වහල්ලු කරන්නයි හදන්නේ.

අපේ අධ්‍යාපන ඇමතිතුමාත් ඉන්න වෙලාවේ මම මේ කාරණය කියන්න කැමැතියි. අධ්‍යාපනයට වෙන් කරන මුදලින් රුපියල් කෝටි 7, 600ක් කපලා තිබෙනවා. අපි නොවෙයි කියන්නේ, මේ පොතේ තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ, ඇමතිතුමනි. මම කථා කළාට පස්සේ කථා කරන්න කෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam )
එතුමා මගේ නම සඳහන් කළ නිසා උත්තර දෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඒ මුදල් කපලා නැහැ. හොඳට බලන්න. හැම වැය ශීර්ෂයකම මෙවර වෙන් කළ ප්‍රාග්ධන වියදම වැඩියි. ප්‍රාග්ධන වියදම වැඩි කරලායි තිබෙන්නේ. හොඳට බලන්න.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
රුපියල් කෝටි 7,600ක් කපලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කරුණාකර කථාව අවසන් කරන්න.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayak)
අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් රුපියල් කෝටි 7,600ක් කපලායි තිබෙන්නේ. මේ පොතේ තිබෙනවා, තමුන්නාන්සේට මේ අවුරුද්දේ වියදම් කරන්න තිබුණු මුදල වියදම් කළේ නැහැ කියලා. ඒ කියන්නේ මේ ආණ්ඩුව අසමත්. බැරි බැරි රෝගයෙන් පෙළෙන මේ අසමත්ජාති ආණ්ඩුව මොනවාද මේ කරලා තිබෙන්නේ? කන්දක් විලි ලා මී පැටියෙක් වදලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අබ්දුල්ලා මහරූෆ් මන්ත්‍රීතුමා.

[பி.ப. 5.56]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் 20 நிதியமைச்சர்களினால் 71 வரவு செலவுத் திட்டங்கள் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றன. அந்த வகையில், இந்த வரவு செலவுத்திட்டம் அதிமேதகு ஜனாதிபதி அவர்களதும் கௌரவ பிரதம மந்திரி அவர்களதும் வழிகாட்டலின்கீழ் எங்களுடைய நிதி அமைச்சர் அவர்களால் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. இந்த நாட்டிலே 30 வருட காலமாக இடம்பெற்ற யுத்தத்தின் காரணமாக அழிவுற்ற, நலிவுற்ற எமது வடக்கு, கிழக்குப் பிரதேச மக்களுக்கு, மாணவ சமூகத்தினருக்கு மற்றும் உயர் கல்வி கற்கின்ற மாணவர்களுக்கு இந்த வரவு செலவுத் திட்டம் நம்பிக்கையை ஏற்படுத்தியிருக்கின்றது. இந்த நாடு எந்த இடத்தில் இருந்ததென்பதைப் பற்றிச் சிந்திக்க வேண்டும்.

முன்னாள் மாகாண அமைச்சரான கௌரவ விமலவீர திஸாநாயக்க அவர்கள் மூன்று தடவைகள் என்னோடு பாராளுமன்றத்திலே இருந்திருக்கிறார். இன்றைய அவரது

பேச்சு அவருக்குரிய பேச்சல்ல; இந்த நாட்டை நாசம் செய்த, இந்த நாட்டைச் சூறையாடிய அவர் சார்ந்த குழுவினருடைய குரலாகவே அவர் ஒலித்தார். இந்த நாடு சுமார் 9 இலட்சம் கோடி - 8.9 trillion - ரூபாயைக் கடனாகவும் வட்டியாகவும் செலுத்த வேண்டியிருக்கின்றது. அந்தக் கடன் சுமையைச் சுமத்திய முன்னாள் அமைச்சர் கௌரவ பந்துல குணவர்தன அவர்கள் காலையிலே இங்கு பேசிவிட்டுச் சென்றுவிட்டார். அவர் தான் என்ன கணக்கை - பாடத்தை மாணவர்களுக்கு கற்பித்தார்? என்ற கேள்வியைத்தான் உண்டாக்கிவிட்டுத்தான் சென்றார். ஏன், நான் இதனைக் கூறுகின்றேனென்றால், 6.8 சதவீத வட்டியை எந்தவொரு முதலீட்டாளர்களுக்கும் கடனுதவியாளர்களுக்கும் இந்த நாடு வழங்கிய சரித்திரமில்லை என்பதைத் தெரியப்படுத்துவதற்குத்தான். அதுவும் டொலரிலே! அவர்கள் வாங்கிய கடன் தொகையோடு ஒப்பிடுகையில் கிட்டத்தட்ட 25 சதவீதம் வட்டித் தொகையாகவே உள்ளது. அதையும் சேர்த்து நாங்கள் சுமந்துகொண்டிருக்கின்றோம். புதிதாக நாங்கள் எந்தக் கடனையும் எடுக்கவில்லை.

கடந்த வருடம் சோதனை மிக்கதாக இருந்தது. 2009ஆம் ஆண்டு இந்த நாட்டிலே யுத்தத்தை முடிவுக்குக் கொண்டுவந்தவர்கள், புதியதொரு கலாசாரத்தை உருவாக்கினார்கள். வடக்கிலே 'ஆவா' குழுவை உருவாக்கி, அங்கு ஒரு யுத்த சூழ்நிலையை உருவாக்கினார்கள். தெற்கிலும் கிழக்கிலும் பள்ளிவாசல்கள் மீதும் முஸ்லிம் சமூகத்தின் மீதும் தோட்டத் தொழிலாளர்கள் மீதும் வன்முறையைப் பயன்படுத்தி வேறொரு கலாசாரத்தைக் கொண்டுவந்தார்கள். இதனை முடிவுறுத்த வேண்டும் என்பதற்காகத்தான், மாண்புமிகு பிரதம மந்திரி அவர்களும் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் தற்போதைய தலைவரான மேதகு ஜனாதிபதி அவர்களும் ஒன்றிணைந்தார்கள். பாரிய விட்டுக்கொடுப்புக்கு மத்தியிலே, இந்த நாட்டிலே பொருளாதார அபிவிருத்தியையும் இளைஞர்களுடைய தாகத்தையும் - வேலைவாய்ப்பினையும் பாதுகாப்பையும் - உறுதிப்படுத்தவேண்டும் என்பதற்காக மக்கள் அவர்களுக்கு சனநாயக ரீதியாக வாக்களித்தார்கள். இன்று சிலர் ஒரு 'கண்டாயமாக'- குழுவாக ஒன்றுசேர்ந்திருக்கின்றார்கள். அவர்கள் வைத்துக்கொண்ட பெயர் "கூட்டு எதிர்க்கட்சி!". அவர்கள் தங்களை எதிர்க்கட்சியின் ஓர் அணியாகப் பிரகடனப்படுத்தியிருக்கிறார்கள். இவர்கள் ஒவ்வொருவர் மீதும் பல்லாயிரக் கணக்கான கோடி ரூபாயை வஞ்சமிட்டது தொடர்பில் வழக்குகள் காணப்படுகின்றன. 2017ஆம் ஆண்டு வருகின்றபோது, இந்த ஆசனங்களில் இவர்கள் எவரும் இருக்கமுடியாது. அவர்கள் அனைவரும் நீதிமன்றத்தால் தண்டனைக்குரியவர்களாக மாற்றப்பட்டுவிடுவார்கள்.

இந்த நாட்டில் யுத்தம் முடிவுற்றதற்குப் பிறகு, மேதகு சனாதிபதி அவர்களும் பிரதமர் அவர்களும் இன்று ஒன்றிணைந்து செயற்பட்டுக்கொண்டிருக்கிறார்கள். அன்று ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினுடைய ஆலோசனையைப் பெறவில்லை என்று இந்த எதிர்க்கட்சியினர் கோஷமிட்டார்கள். என்ன நடைபெற்றது? மாண்புமிகு பிரதம மந்திரி அவர்கள் இம்முறை சுமுகமான முறையிலே கலந்துரையாடியதன்மூலம், நிதி அமைச்சர் நல்லதொரு Budgetஐ முன்வைத்திருக்கிறார். அதுபோல், இதனை எப்படி எதிர்ப்பது என்று தெரியாமல், இங்கு மக்கள் விடுதலை முன்னணியினர் "அவர் மூன்றரை மணி நேரம் துவிச்சக்கர வண்டி ஓட்டினார்" என்றார்கள். 2000ஆம் ஆண்டு நான் பாராளுமன்றத்தில் இருந்தபோது அந்த முன்னணி உறுப்பினர்கள் 11 பேர் ஒரு வேனில் செல்வார்கள். இன்று அவர்களின் ஆடம்பரத்தையும் 50க்கும் மேற்பட்ட அரச வாகனங்களைத் துஷ்பிரயோகம் செய்ததையும் பல்லாயிரம் கோடி ரூபாயை வஞ்சம் செய்ததையும் நாங்கள் கண்டுகொண்டிருக்கிறோம். உதாரணம்: அன்று மக்கள் விடுதலை முன்னணி உறுப்பினர்களில் முக்கிய நபராகக் கருதப்பட்ட

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

இன்று இளைஞர்களுக்கு, அதாவது 1,75,000 உயர் வகுப்பு மாணவர்களுக்கு மடிக்கணனி கொடுக்கப்படவிருக்கின்றது. உயர்தர மாணவர்களுக்குக் கற்பிக்கின்ற 28,000 ஆசிரியர்களுக்கு மடிக்கணனி கொடுக்கப்படவிருக்கின்றது. இப்படிக் கொடுக்கப்படுகின்றபோது, மாணவ சமூகம், உயர் கல்வி கற்கின்ற சமூகம் - பல்கலைக்கழகங்களில் இருக்கின்ற மாணவர்கள் - அவர்களை விட்டுப் பிரிந்துவிடுவார்கள் என்று அச்சப்படுகின்றார்கள். அதனால் இதனை இவர்கள் யாரும் வரவேற்றுப் பேசவில்லை.

கௌரவ உறுப்பினர் சுனில் ஹந்துன்னெத்தி அவர்களைக் 'கோப்' குழுவின் தலைவராக்கியது யார்? மாண்புமிகு பிரதம மந்திரி அவர்களுடைய ஆசியுடன், குழுவிலுள்ள 26 உறுப்பினர்களில் ஆளும்கட்சியைச் சார்ந்த பெரும் பான்மையான உறுப்பினர்களால் அவர் தெரிவு செய்யப்பட்டார். அந்த 26 உறுப்பினர்களில் நானும் ஒருவன். யாராவது இந்த அறிக்கைக்கு எதிரானவர்கள் என்று அவரால் துணிந்து சொல்லமுடியுமா? அறிக்கை சபாநாயகரிடம் சமர்ப்பிக்கப்படுவதற்கு முன்னரே கௌரவ உறுப்பினர் பிமல் ரத்நாயக்க அவர்கள் සිරස මාධ්‍ය இல் தோன்றி முறைகேடான முறையிலே அறிக்கைகளை விடுக்கின்றார். இந்த நாட்டிலே சட்டதிட்டங்கள், ஒழுங்குகள் இருக்கின்றன. சபாநாயகரிடம் கையளிக்கப்படும் 'கோப்' அறிக்கை என்பது சுனில் ஹந்துன்னெத்தி அவர்களுடைய தல்ல! அது அந்த 26 உறுப்பினர்களுடைய கூட்டறிக்கை. அதைச் சமர்ப்பிக்கின்ற பொறுப்பு அவருக்கிருக்கின்றது. இவற்றையெல்லாம் பார்க்கின்றபோது அவர்களுடைய வங்குரோத்து அரசியல் வெளிப்படுகின்றது.

அவருடைய கடந்தகால வரலாறு என்ன கூறுகின்றது? அவர்கள் கடந்த காலங்களிலே இளைஞர்களைத் தூண்டுகின்ற செயற்பாட்டின் காரணமாகத்தான் 70 - 77ஆம் ஆண்டு காலப்பகுதியில் பல்லாயிரக்கணக்கான இளைஞர்களைப் பலிகொடுத்தார்கள். வரவு செலவுத் திட்டத்தில் உயர் கல்வி கற்கின்ற மாணவர்களுக்கு, றுகுணு பல்கலைக்கழகத்திற்கு, ஜயவர்தனபுர பல்கலைக்கழகத்திற்கு எனப் பல்வேறுபட்ட உதவித் திட்டங்களை எங்களுடைய நிதியமைச்சர் அவர்கள் அறிவித்தபோது அதனை வரவேற்கவும் இல்லை. காரணம், இவர்களுடைய தொழில் උද්ඝෝෂණය செய்வதாக மட்டும் இருக்கின்றது. ஆனால், இதனை அவர்கள் தொடர்ந்து செய்ய முடியாது. மக்கள் இப்படிப்பட்டவர்களை இனங்கண்டிருக்கிறார்கள். எதிரணியில் இருக்கின்றவர்களின் நிலைமை பரிதாபத்திற்குரியதாகும்.

மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் நாடளாவிய ரீதியில் விஜயங்களை மேற்கொள்கின்றார். அதேபோன்று ஐரோப்பிய நாடுகளுக்கும் நல்லெண்ண விஜயங்களை மேற்கொள்கின்றார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have one minute more.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
මට මිනිත්තු 13ක් දී තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have been allocated only ten minutes. Now, you have one minute left.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
මට two minutes දෙන්න.

விவசாயம், மீன்பிடி, சுகாதாரம் மற்றும் ஏனைய விடயங்கள் அனைத்திற்கும் நிதி அமைச்சர் அவர்கள் பாரியளவு நிதியை ஒதுக்கியிருக்கிறார். எமது நாட்டினுடைய உயர் கல்வியைப் பொறுத்தவரையில் மாணவர்களின் பல்கலைக்கழக அனுமதி 1995ஆம் ஆண்டு வெறும் 9,245 ஆக இருந்தது. 2015ஆம் ஆண்டு 26,000 ஆக உயர்த்தப்பட்டது. 2020ஆம் ஆண்டு வருகின்றபோது அது 50,000 ஆக உயர்த்தப்படும். அதுமாத்திரமல்ல, பல்கலைக்கழக அனுமதி கிடைக்காத மாணவர்கள் உயர் கற்கைநெறிகளை மேற்கொள்வதற்கு வட்டியில்லாக் கடன்திட்ட அடிப்படையில் ஒருவருக்கு 8,00,000 ரூபாய் வரை நிதி வழங்கப்படவிருக்கின்றது. இடைநிலைக் கல்வியாளர்களுக்கு ஆரம்பக் கல்விக்காக 2,00,000 ரூபாய் காப்புறுதித் திட்டத்தை உருவாக்கத் திட்டமிடப்பட்டுள்ளது. இப்படிப்பட்ட நல்ல பல திட்டங்கள் நிதி அமைச்சினூடாகவும் சுகாதார அமைச்சினூடாகவும் விவசாய அமைச்சினூடாகவும் மேற்கொள்ளப்படவுள்ளன.

மேலும், வெளிநாட்டு முதலீட்டாளர்கள் இங்கு முதலீடுகளை மேற்கொள்வதற்கு 500 மில்லியன் டொலருக்கு மேற்பட்ட தொகைக்கு எந்தவொரு வரியும் அறவிடாமல் சலுகை வழங்கப்பட்டிருக்கின்றது. இதன்மூலமாக இளைஞர்களுடைய வேலைவாய்ப்பை அதிகரிக்கத் திட்டமிடப்பட்டுள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please, wind up now.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
இப்படிப்பட்ட நல்ல Budget ஐக் கொடுத்த கௌரவ நிதி அமைச்சர் ரவி கருணாநாயக்க அவர்களுக்கும் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் இந்த நாட்டை ஓர் அபிவிருத்தி அடைந்த நாடாக மாற்றுவதற்கு முனைந்துகொண்டிருக்கின்ற மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களுக்கும் நன்றிகூறி, விடைபெறுகின்றேன்.

[අ.භා. 6.06]

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2017 වර්ෂයේ අය වැය පිළිබඳව අදහස් දක්වන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. කළු ජාතික අයිතීන් ආරක්ෂා කිරීම පිළිබඳ අරගලයේ නායකතුමා වන මාටින් ලූතර් කිං කළ උතුම් කියමනකින් මම මගේ කථාව ආරම්භ කරනවා: "Life's most persistent and urgent question is: What are you doing for others? Living is a form of not being sure, not knowing what next or how. The moment you know how, you begin to die a little."

ඒ කියන්නේ, "ජීවිතයේ නිරන්තරයෙන්ම ඉස්මතු වන හා වහා පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නය වනුයේ ඔබ අනෙකා වෙනුවෙන් කරනුයේ කුමක්ද යන්නයි. ජීවත් වීම යනු අවිනිශ්චිත වූත් එළඹෙන මොහොතේ කුමක් කවර ආකාරයකින් සිදුවේදැයි කිව නොහැකි වූත් ආකෘතියකි. ඔබ එය අවබෝධ කර ගන්න අවස්ථාවේදී ක්‍රම ක්‍රමයෙන් ඔබගේ මරණය ආරම්භ වේ" යන්නයි. මේ උතුම් කියමන සමඟින් මම මගේ අදහස් දැක්වීම ආරම්භ කරන්නට බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රට පසුගිය වසර දහයක් පුරා විනාශ මුඛය කරා ගෙන ගිය අඳුරු යුගය අවසන් කරමින් 2015 ජනවාරි 08 වැනි දා සිදු වූ නිහඬ විප්ලවය සමඟින් යහපත් දේශයක්, ස්වර්ණමය සංවර්ධන යුගයක් නිර්මාණය කිරීම සඳහා අඩිතාලමක් දමන අය වැයක් විධියට මම මේ අය වැය හඳුන්වන්න කැමැතියි. පසුගිය කාල වකවානුව පුරා මේ රටේ රාජ්‍ය දේපළ, රාජ්‍ය ධනය පරිහරණය කළේ පෞද්ගලික න්‍යාය පත්‍රයන්ට අනුකූලවයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගජ මිතුරන් පිනවන්න, ගජ මිතුරන්ගේ අවශ්‍යතාව අනුව තමයි -ඒ සීමිත පිරිසකගේ අවශ්‍යතාවන්ට අනුව තමයි- රාජ්‍ය දේපළ, රාජ්‍ය මුදල්, ජාතික ධනය භාවිත කළේ. 2015 ජනවාරි 08 වැනිදා ඒක වෙනස් වුණාට පසුව මේ කථා කරන මහත්වරුන්ට ඒක දරාගෙන ඉන්න බැහැ. ගැරඬින්ට ලාම්පු තෙල් -භූමිතෙල්- ගැහුවාම දුවනවා වාගේ ඒකාබද්ධ විපක්ෂයයි කියා ගන්නා කල්ලිය අද විකාරයෙන් කෑ ගහනවා. මීට කලින් කථා කරපු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා මන්ත්‍රීවරයෙක් විධියට නොවෙයි කථා කළේ. අපේ ගම්වල දෙහි කපන, ආවේශ වෙච්ච යකැදුරෙක් වාගේ තමයි එතුමා ගරු අග්‍රාමාත්‍යතුමාට දෝෂාරෝපනය කරමින් මෙතැන කෑ ගැහුවේ. අද ඒ අය විකාර වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව බිම ගස්සන්න, මේ ආණ්ඩුව දණ ගස්සන්න මේ අය වැය අල්ලාගෙන පතුරු ගහන්න ඒ අය බලාගෙන හිටියා. ඒ ගරු මන්ත්‍රීතුමන්ලා මතක තියා ගන්න ඕනෑ, මේ දහලන්නේ මේ රටේ ජනතාවත් එක්කය කියන එක.

එදා අවුරුදු 10ක් මේ රටේ ජනතාව වෙනුවෙන් කළේ මොකක්ද කියන එක හොඳ අවබෝධයෙන් බලාගෙන ඉඳලා තමයි ජනතාව ඒ තීන්දුව ගත්තේ. ජනවාරි 08 වැනිදා ගත්තු ඒ තීන්දුව යථාර්ථයක් කරන්න, මේ රටේ අහිංසක මිනිස්සු වාගේම, ගමේ ගොඩේ ජීවත් වන දුප්පත් ජනතාවගේ ඉඳලා, මේ රටේ ඉහළ පෙළේ ජනතාව වාගේම, මේ රටේ ආයෝජනය කරන, මේ රට වෙනුවෙන් කැප කිරීම් කරන ජනතාව වාගේම මහා විශාල පරාසයක් තුළ සිටින සියලු දෙනාටම පිළිගන්න පුළුවන් අය වැයක් තමයි ඊයේ ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළේ. ඒ නිසා අපි එතුමන්ලාට කියනවා, හරි අවබෝධයෙන් කටයුතු කරන්නය කියා. තමන්ගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන්, තමන්ගේ දේශපාලන කුහකකම් වෙනුවෙන් තමන් බලාපොරොත්තු වෙච්ච අරමුණු කරා යන්න බැරි වුණාම මම දැක්කා, ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමාට විරුද්ධව ප්‍රකාශයක් කරනවා. කව්ද මේවා කියන්නේ? රනිල් වික්‍රමසිංහ කියන මේ රටේ කීර්තියක් දිනාගෙන සිටින, -ඔය නායකයෝ කියා ගන්නා පිරිස වාගේ කුණු ගා ගත්තේ නැති,- ශ්‍රේෂ්ඨ නායකයෙකුට විරුද්ධව කථා කරන්නට ගරු විමලවීර දිසානායක වාගේ මන්ත්‍රීවරයෙකු පත්වීම, පව්! මේ අවස්ථාවේදී එතුමා මේ ගරු සභාවේ නැහැ. මේ තරම් පහත් තත්ත්වයට එතුමා වැටෙන්නට වීම, පව්!

මේක පසු ගිය කාලයේ අය වැයක් වාගේ වෙයි කියලා ඒකාබද්ධ විපක්ෂයේ කල්ලිය බලාගෙන සිටියා. එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ යුගයේ අය වැය ගෙනාවේ ඊළඟ වසර ගැන හිතලා විතරයි; කඩින් කඩ පැවැත්වූ මැතිවරණ ගැන හිතලා විතරයි. ඊළඟ අවුරුද්දේ පවත්වන මැතිවරණ ටික ඉලක්ක කරගෙන තමයි අය වැය හැදුවේ. මේ රටේ පසු ගිය අවුරුදු 10ම තිබුණේ ඒ වාගේ පැලැස්තර අය වැයක්. ඒ පැලැස්තර අය වැයෙන් බලාපොරොත්තු වන්නේ ජනතාවට තාවකාලික වින්දනයක් දීලා මේ රටේ ආර්ථිකය ගැන, මේ රටේ අහිංසක මිනිසුන්ගේ බලාපොරොත්තු ගැන හිතන්නේ නැතිව තමන්ගේ දේශපාලන ව්‍යාපාරය ශක්තිමත් කර ගැනීම විතරයි. ඒකට හොඳම උදාහරණය අපි දැක්කා. 2015 අය වැයේදී ජනතාවට මහා ලොකු අල්ලසක් දීලා සූදානම් වුණා, මේ රටේ බලය නැවතත් අරගන්න. තමන්ට අවුරුදු 6ක් බලයේ ඉන්න තිබුණු අවස්ථාව අහිමි කරගෙන අවුරුදු 2ක් ඉතිරිව තිබියදී ආණ්ඩුව වෙනස් කරගෙන විකාර දොඩවන්න වුණේ පසු ගිය අවුරුදු 10 තුළම ජනතාව රවට රවටා අරගෙන ගිය රට අනාගතයට අරගෙන යන ගමනක් නොවෙයි කියලා ජනතාව තේරුම් ගත්ත නිසායි. එම නිසා අපි මේ වෙලාවේ මතක් කරලා දෙනවා, අපි මේ අය වැය ගෙනැල්ලා තිබෙන්නේ තාවකාලිකව ජනතාව සතුටු කරන විධියට නොවෙයි කියලා. රුපියල් බිලියන 9,000ක් පමණ වන මහා විශාල ණය ප්‍රමාණය මේ රටේ අහිංසක මිනිසුන්ගෙන් බදු අය කරගෙන ගෙවන්නට බැහැයි කියන එක මේ රජය තේරුම් අරගෙන තිබෙනවා.

මේ රජය දන්නවා, මේ සා විශාල ණය මුදලක් ගෙවන්නට අහිංසක මිනිසුන්ගේ බදු මුදල්වලින් බැහැ, ඒ නිසා මේ රටට ආයෝජකයින් ගේන්නට ඕනෑ කියලා. ආයෝජකයෝ ගෙනැල්ලා ආයෝජන වැඩි කළ තරමට තමයි අපේ අපනයන ශක්තිය වැඩි වෙන්නේ. අපනයන ආදායම වැඩිවීම තුළින් මේ ණය ගෙවනවා හැර වෙන විකල්පයක් නැහැ කියන එක ගරු මුදල් අමාත්‍යතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ මධ්‍ය කාලීන ආර්ථික ප්‍රතිපත්ති තුළින් හඳුනාගෙන තිබෙන නිසා අවුරුදු 5ක් ඉලක්ක කර ගත් අය වැයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අද උදේ මේ අය වැය සම්බන්ධයෙන් අපේ හිටපු අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා පුදුමාකාර ප්‍රකාශ ටිකක් කළා. එතුමා කළ ප්‍රකාශ ගැන පස්සේ එතුමාට ලජ්ජා හිතෙනවා ඇති. එතුමා කිව්වා, මේ රටේ ආර්ථිකයේ ශක්තිමත්ම, ස්වර්ණමය යුගය විධියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලය තිබුණා කියලා. අපි අහනවා, ඔය කියන ස්වර්ණමය යුගය තිබුණා නම්, ඔය කියන ශක්තිමත් ආර්ථිකය තිබුණා නම්, ඔය කියන බලාපොරොත්තු සහිත අනාගතයක් ජනතාවට දෙන ආර්ථිකයක් තිබුණා නම් ඔබතුමන්ලා ජනවාරි 08වෙනි දා ජනතාව විසින් එළියට විසි කළේ ඇයි කියලා. ඇයි, ඔබතුමන්ලාට ජනවාරි 08වෙනි දා අකුළාගෙන යන්න වුණේ? එම නිසා රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ සීනිබෝල දෙන, සුන්දර කථා කියන අය වැයක් නොවෙයි.

අපි දැක්කා, පසු ගිය කාල සීමාව තුළ සංවර්ධනයේ නාමයෙන් කළ ව්‍යාපෘතිවල තත්ත්වය කොහොමද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ වෙලාවේ එක උදාහරණයක් දක්වන්නට කැමැතියි. රජයේ වියදම හම්බන්තොට වරාය වෙනුවෙන් රුපියල් බිලියන 175යි; ශ්‍රීලන්කන් ගුවන් සේවය වෙනුවෙන් රුපියල් බිලියන 51.6යි; මත්තල ගුවන් තොටුපොළ වෙනුවෙන් රුපියල් බිලියන 27.5යි. මේ වාගේ මහා විශාල ව්‍යාපෘති ගණනාවකට මෙහෙයුම් අලාභය විධියට අපි වාර්ෂිකව ගෙවීම් කරනවා, හම්බන්තොට වරායට රුපියල් බිලියන 18.8ක්; ශ්‍රීලන්කන් ගුවන් සේවයට රුපියල් බිලියන 17.7ක් සහ මත්තල ගුවන් තොටුපොළ වෙනුවෙන් රුපියල් බිලියන 5.9ක්.

ඉදිරි බලාපොරොත්තුවක්, සැලැසුමක් නැතිව කරන්නන් වාලේ තමන්ගේ නම ගහ ගන්න, බෝඩ් ලෑල්ලට ව්‍යාපෘති කිරීමේ පාපය තමයි අද මේ රටේ අහිංසක ජනතාවට ගෙවන්නට සිදු වෙලා තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂය රට බාර අරගෙන ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා මේ රටේ ජනතාව බේරාගන්න පසු ගිය අවුරුද්ද පුරා ඒ පව් ටික තමයි ගෙව්වේ. අපේ රාජ්‍ය නායකයෝ ජාත්‍යන්තරය පුරා ගිහිල්ලා ජාත්‍යන්තරය තුළ මේ රටට ඇති වෙලා තිබුණු ඒ අපකීර්තිය නැති කරගෙන, ශ්‍රී ලංකාව කියන මේ මාතෘ භූමිය ගැන ජාත්‍යන්තරයට අවබෝධයක් ලබාදීලා මේ රටට අයෝජකයෝ ගේන්න පුළුවන් වුණු වසරක් තමයි අපි අවසන් කළේ.

හෙට-අනිද්දා වන විට හම්බන්තොට අක්කර 15,000ක් විශාල භූමි ප්‍රදේශයක මේ කර්මාන්ත ටික ආරම්භ වෙනවා. එම නිසා හම්බන්තොටට ආශ්චර්ය ගෙනාවා කියපු නායකයන්ට මම මතක් කරලා දෙන්නට කැමැති කාරණයක් තිබෙනවා. ඔය ආශ්චර්ය ගෙනාව හම්බන්තොට දිස්ත්‍රික්කයේ 2015 වන විට ඉඩමක් නැති, ගෙයක් නැති මිනිසුන් 10,249ක් හිටියා. ඒ පසු ගිය රජයේ නායකයන්ට 10,249ක් වුණු ඒ අහිංසක මිනිසුන් වෙනුවෙන් ගෙයක් දොරක්, වතුර ටිකක් දෙන්නට බැරි වුණා. හැබැයි අක්කර ගණන් ඉඩම් වෙන් කරගෙන කාර් රේස් දුවන්නට tracks හදා ගන්නට පුළුවන් වුණා. හැබැයි ජනතාව ඒ සියලු දේවල් බලා ගෙන ඉඳලා තමයි ජනවාරි 08වැනි දා තීන්දුව ගත්තේ. ඒ නිසා අපි කියන්නේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයට ආශ්චර්යය ගෙනෙන්නට හැදුවේ වැසිකිළි, එහෙම නැත්නම් සනීපාරක්ෂක පහසුකම් නැති මිනිස්සු 8,400ක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉන්දැද්දීයි. අද රටේ ඇති වී තිබෙන දේශපාලන වෙනසත් එක්ක යන දැවැන්ත සංවර්ධන ගමනේ පළමුවැනි පියවර අපි 2017 මේ අය වැයත් එක්ක ආරම්භ කරනවා. එහෙම ආරම්භ කරන කොට ඒක බලා ගෙන ඉන්න බැරි බන්දුල ගුණවර්ධන මහත්තයලා ඇතුළු ඔය කෑ ගහන පුංචි පුංචි දේශපාලන කල්ලි ටිකට අපි කියනවා, මේක අවබෝධයෙන් අධ්‍යයනය කරන්නය කියලා. එතකොට මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් මොන තරම් ප්‍රගමනයක් ඇති කරන්න කටයුතු කර තිබෙනවාද කියන එක දැන ගන්න පුළුවන්.

විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මෙන්න මේ කාරණය. අය වැය කථාවේදී ප්‍රකාශ කළා වාගේ 2020 වන විට මේ රට හිර වෙන්න තිබෙන ණය උගුලෙන් බේරා ගන්න ගරු අග්‍රාමාත්‍යතුමා,

[ගරු හේෂාන් විතානගේ මහතා]

මහින්ද රාජපක්ෂ යුගයේ ගත් මහා දැවැන්ත ණය උගුල විනය වෙත පවරලා, අහිංසක මිනිසුන්ගේ ඔළුවෙන් ඒ බර අඩු කරලා රට නියම සංවර්ධනයක් කරා ගෙන යන යුගයක් ආරම්භ කරන බව මතක් කරනවා.

2017 අය වැය ලේඛනය පිළිබඳ විවාදයට සම්බන්ධ වන ආණ්ඩු පක්ෂයේ වේවා, විපක්ෂයේ වේවා සෑම මන්ත්‍රීවරයකුටම, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශප්‍රේමී මන්ත්‍රීවරු විධියට තමන් නියෝජනය කරන අහිංසක මිනිසුන් වෙනුවෙන් ඉටු කළ යුතු වගකීමක් තිබෙනවා. 1965 මැලේසියාවෙන් වෙන් වුණු සිංගප්පූරුව ලී ක්වාන් යූ මැතිතුමා විසින් 1990 වන විට සංවර්ධිත රටක් බවට පරිවර්තනය කළා වාගේ අද රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සමඟ එකතු වෙලා මේ ආරම්භ කරන සංවර්ධන යුගය තුළින් තව අවුරුදු 10ක් 15ක් යන කොට ශ්‍රී ලංකාවත් සංවර්ධිත රටක් බවට පරිවර්තනය කරමින් යන ඒ ඓතිහාසික ගමනට ශක්තියක් දීමේ වගකීම කාටත් තිබෙනවා. ඒකෙන් බැහැර වෙන්න කාටවත් බැහැයි කියන එක ප්‍රකාශ කරමින්, මේ අය වැය ලේඛනයට ශුභ පතමින් මගේ කෙටි වචන කිහිපය අවසන් කරනවා.

[பி.ப. 6.18]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நாங்கள் 2017ஆம் வருடத்துக்கான வரவு செலவுத்திட்ட விவாதத்திலே கலந்துகொண்டு எங்களது கருத்துக்களை முன்வைத்துக்கொண்டிருக்கின்றோம். அந்தவகையில் எனக்கும் கருத்துக்களைக் கூறுவதற்கு வாய்ப்பளித்த உங்களுக்கு நன்றி! இன்று இந்த நாட்டின் பொருளாதாரத்தை உற்றுநோக்கும்பொழுது கடந்த காலத்தில் இந்த நாடு குறித்த ஒரு வர்க்கத்தினரின் செயற்பாட்டினால் குட்டிச்சுவராகியிருந்த தன்மையைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இதனால் இப்பொழுது இந்த நாட்டிலே ஒரு பொருளாதார யுத்தம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. இந்த நல்லாட்சியிலே மேதகு ஜனாதிபதி அவர்களினதும் மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களினதும் தலைமையிலே இந்தப் பொருளாதார யுத்தத்துக்கு முடிவுகாண வேண்டிய நிர்ப்பந்தம் ஏற்பட்டிருக்கின்றது. இந்த நாட்டை முன்பு ஆட்சி புரிந்தவர்கள் இவர்களின் தலையிலே இந்தப் பாரிய பொருளாதாரச் சுமையைச் சுமத்திவிட்டு இன்று வெளியிலிருந்து வேடிக்கை பார்த்துக்கொண்டிருக்கின்றார்கள்.

இன்று வரிவிதிப்பு மக்களுக்குப் பாரிய சுமையை ஏற்படுத்தியிருக்கின்றது என்று வரிவிதிப்பைப் பற்றிய பல்வேறு கூச்சல்கள்! வரியைப் பற்றி இவ்வாறு கூச்சலிடும் எதிர்க்கட்சியினர் தங்களது ஆட்சிக் காலத்திலே ஒரு சிலிண்டர் சமையல் வாயுவின் விலையை 2,600 ரூபாய் என்ற வகையிலே நிர்ணயித்து விற்பனை செய்துகொண்டிருந்தனர். ஆனால், இப்பொழுது அதன் விலை 50 வீதத்தால் குறைக்கப்பட்டிருக்கின்றது. அப்படியென்றால் கடந்த ஆட்சியிலே ஒவ்வொரு வீட்டுப் பெண்ணிடமிருந்தும் - ஒவ்வொரு குடும்பத்திடமிருந்தும் 100 வீதமான வரி அறவிடப்பட்டதை இந்த ஒரு விடயமே எடுத்துக் காட்டுகின்றது; நிரூபித்துக் காட்டுகின்றது. எனவே, இந்த வரியைப் பற்றிப் பேசுவதற்கு சம்பந்தப்பட்டவர்களுக்கு எவ்வித அருகதையும் இல்லை என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

நான் இந்தச் சபையிலே வரவு செலவுத் திட்டம் சம்பந்தமாக இரண்டாவது முறையாக பேசுகின்றேன். கடந்த வருடம் 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டம் முன்வைக்கப்பட்டபோது நான் அதிலே பெரிய ஆர்வம் காட்டவில்லை. அந்த வரவு செலவுத் திட்டத்தைப் பற்றி ஓர் ஆதங்கத்தோடு எனது கருத்துக்களை முன்வைக்க வேண்டிய ஒரு நிலைமை அப்பொழுது இருந்தது. ஆனால், 2017ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின் உள்ளடக்கங்களை மிக ஆழமாக உற்றுநோக்குகின்றபோது அது அனைவருக்கும் நன்மைபயக்கும் ஒரு வரவு செலவுத் திட்டமாக அமைந்திருப்பதை அவதானிக்கலாம். இந்த நாட்டில் வாழும் சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் அனைவரையும் அரவணைத்துக்கொண்டு அனைவரையும் சமப்படுத்துவதாக இது அமைந்துள்ளது.

அதேநேரம், நான் இங்கு மலையகத்தைப் பற்றி விசேடமாகக் குறிப்பிட வேண்டும். ஏனெனில் நான் மலையகத்தைச் சேர்ந்த ஒரு பிரதிநிதி. இந்த வரவு செலவுத் திட்டத்தின் ஊடாக மலையக அபிவிருத்தி வேலைகளில் - அபிவிருத்திப் பணிகளில் பல்வேறு அனுகூலங்கள் ஏற்படவிருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. விசேடமாக மலையகத்திலே புரையோடிப்போயிருக்கும் ஒரு விடயம்தான் அந்த மக்களின் குடியிருப்புப் பிரச்சினை. இந்த நாட்டிலே மலையகத்திலுள்ள 'லயன்' அறைகள் 200 வருடங்களாக அவமானச் சின்னங்களாக இருக்கின்றன. இருந்தபோதிலும் இன்று மலையக மக்களும் கௌரவமாக வாழக்கூடிய ஒரு சூழலை இந்த வரவு செலவுத் திட்டம் ஏற்படுத்தியிருக்கின்றது. அடுத்த வருடம் அங்கு சுமார் 25 ஆயிரம் வீடுகளை அமைப்பதற்கான யோசனை முன்வைக்கப்பட்டிருக்கின்றது. மலையக மக்களை 7 பேர்ச் காணிகளுக்குச் சொந்தக்காரர்களாக மாற்றுவதற்கான யோசனை முன்வைக்கப்பட்டிருக்கின்றது. இவ்வாறு மலையக மக்களின் அடிப்படைத் தேவைகளைப் புரிந்துகொண்டு இந்த வரவு செலவுத் திட்டம் தயாரிக்கப்பட்டிருக்கின்றது. அதற்காக கௌரவ நிதி அமைச்சர் ரவி கருணாநாயக்க அவர்களுக்கு நான் எமது சமூகம் சார்பாக நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதுமட்டுமல்ல, வடக்கு, கிழக்கு மாகாணங்கள் மிக நீண்டகால யுத்தத்தின்பின் தற்போது சிறிதுசிறிதாக வழமைக்குத் திரும்பிக்கொண்டிருக்கின்றன. வடக்கு, கிழக்கின் அபிவிருத்தி தொடர்பாகவும் பல முன்மொழிவுகள் இந்த வரவு செலவுத் திட்டத்தில் உள்ளடக்கப்பட்டிருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாகவுள்ளது. இதையும் நாங்கள் வரவேற்க வேண்டும். இது, அனைத்துத் தரப்பினரையும் ஒன்றிணைத்த, சமூக அபிவிருத்திக்கான கொள்கையைக் கொண்ட, அறிவை மையப்படுத்திய பொருளாதார முறையை ஏற்படுத்துவதற்கான, விவசாயத்தை ஊக்குவிப்பதற்கான, தேயிலை, இறப்பர், தெங்கு பொருட்களை அபிவிருத்தி செய்வதற்கான முன்மொழிவுகளைக் கொண்ட ஒரு வரவு செலவுத் திட்டமாகும்.

மேலும், 15,000 உயர்தர பால் மாடுகளை ஒரே வருடத்தில் இந்த நாட்டுக்குக் கொண்டுவந்து அதனூடாக பால் உற்பத்தியை மேற்கொள்ள முடியுமென்றால், பால் மா இறக்குமதிக்காகச் செலவிடும் தொகையை வெகுவாகக் குறைக்கக்கூடியதாக இருக்கும். மலையக தோட்டப்புற மக்களைப் பொறுத்தவரையில் அவர்கள் பாற்பண்ணைகளில் மிக ஆர்வம் காட்டுபவர்களாக இருக்கிறார்கள். ஆகவே, இவ்வாறு தருவிக்கப்படும் மாடுகளிலே கணிசமானவற்றை மலையகத்திற்கு வழங்குவது உசிதமானதென்று நான் இந்த உயரிய சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

பல்வேறு அத்தியாவசியப் பொருட்களின் விலைகள் குறைக்கப்பட்டிருக்கின்றன. நான் ஏற்கெனவே கூறியதைப் போல சமையல் எரிவாயுவின் விலைகூட 25 ரூபாயினால் குறைக்கப்பட்டிருக்கின்றது. எனவே, முன்னைய ஆட்சியில் 2,600 ரூபாய் என்றிருந்த சமையல் எரிவாயுவின் விலை அரைவாசியாகக் குறையுமென நினைக்கின்றேன். அப்படியென்றால், அது 100 சதவீதமான விலைக் குறைப்பு! ஏற்கெனவே 100 சதவீதமான வரி அறவிடப்பட்டிருக்கின்றது என்பது இதிலிருந்து உறுதிப்படுத்தப்படுகின்றது. அதேநேரத்தில், வரி செலுத்துவோரை ஊக்குவிக்க வேண்டுமென்ற நோக்கத்தோடு வரிச் சலுகைகள் வழங்கப் பட்டிருப்பதையும் நாங்கள் இந்த இடத்திலே குறிப்பிட வேண்டும்.

சிரேஷ்ட பிரசைகளுக்கான வட்டி வருமானத்திலே சலுகை! 5-19 வயது வரையான அனைத்துப் பாடசாலை மாணவர்களுக்கும் இரண்டு இலட்சம் ரூபாய் பெறுமதியான காப்புறுதி! இதுவரையும் எந்தவோர் அரசாங்கத்தினாலும் இவ்வாறான முன்மொழிவுகள் முன்வைக்கப்படவில்லை; எந்தவொரு பள்ளி மாணவனுக்கும் அரசாங்கத்தினால் காப்புறுதி வழங்கப்படும் யோசனை முன்வைக்கப்படவில்லை. ஆனால், இந்த வரவு செலவுத் திட்டத்தினூடாக அந்த யோசனை முன்வைக்கப்பட்டிருக்கின்றது. மேலும், உயர் தரத்தில் படிக்கும் சுமார் 1,75,000 மாணவர்களுக்கும் அவர்களுக்குக் கற்பிக்கும் ஆசிரியர்களுக்கும் Tab எனப்படும் கருவி வழங்குவதற்கான யோசனையும் முன்வைக்கப்பட்டிருக் கின்றது. இந்த யோசனையானது, உண்மையிலே உயர்தரத்தில் கல்வி கற்கும் மாணவர்களுக்கும் கற்பிக்கும் ஆசிரியர்களுக்கும் பெரும் வாய்ப்பாகவும் வளமாகவும் அமையும் என்று சொன்னால் அது மிகையாகாது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் மூன்று நிமிடங்கள் இருக்கின்றன.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

ஆகவே, இந்த வரவு செலவுத் திட்டத்துக்கு எதிர்க்கட்சி, ஆளுங்கட்சி என்று வேற்றுமையில்லாமல், அனைத்துத் தரப்பினரும் ஆதரவு வழங்க வேண்டும். இது மக்களின் மேம்பாட்டுக்காகத் தயாரிக்கப்பட்ட வரவு செலவுத் திட்டம்; இந்த நாட்டின் எழுச்சிக்காகத் தயாரிக்கப்பட்ட வரவு செலவுத் திட்டம்; பொருளாதார சிக்கலில் மூழ்கிப்போயிருக்கும் நாட்டை மீட்டெடுக்கும் வரவு செலவுத் திட்டம் என்ற அடிப்படையில், இந்த உயரிய சபையிலே இருக்கும் அனைத்துத் தரப்பினரும் இதற்கு ஆதரவாக வாக்களிக்கவேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

நான் பிரதிநிதித்துவப்படுத்தும் பதுளை மாவட்டத்திற்கு இந்த நாட்டிலே இருக்கும் அதிவேகப் பாதையை விஸ்தரிப்பதற்கான முன்மொழிவும் இந்த வரவு செலவுத் திட்டத்திலே முன்வைக்கப்பட்டிருக்கின்றது. இந்த அதிவேகப் பாதை அமைக்கப்பட்ட பின்பு, பதுளையும் கொழும்பும் மிக நெருக்கமாக வருவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கும். உதாரணத்திற்குச் சொல்வார்கள், "බදුල්ල කෝච්චියේ නැග්ගා වාගේ" என்று. அப்படியென்றால் பதுளை கோச்சியிலே ஏறினால் தொடர்ந்து போய்க்கொண்டே இருக்கவேண்டும்; பயணத்திற்கு முடிவே இல்லை. அவ்வாறான ஒரு நிலைமைதான் பதுளை-கொழும்பு பயணத்தில் இருக்கின்றது. ஆகவே, இந்த அதிவேகப் பாதை அமைக்கப்பட்ட பின்பு, பதுளை கொழும்புக்கு மிக அருகாமையில் வந்துவிடும் என்பதில் எவ்வித ஐயமும் இல்லை. இதனையும் நான் ஒரு நல்ல விடயமாகவே பார்க்கின்றேன்.

அது மாத்திரமல்ல, வட மாகாணத்திலே புதிய தொழில் வாய்ப்புக்களை உருவாக்கும் வகையில், முதலீடுகளை மேற்கொள்வோருக்கு விசேட வரிச் சலுகை!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் உங்களது உரையை முடித்துக்கொள்ள வேண்டும்.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

இந்த வரிச் சலுகைகூட, நாட்டின் எதிர்கால சுபிட்சத்துக்கு வழிசமைக்கும் என்பதிலே எந்தச் சந்தேகமும் இல்லை. மேலும், இந்த நாட்டிலே வெளிநாட்டவர்கள் முதலீடுகளை மேற்கொள்வதற்கு அனைத்து வாய்ப்புக்களும் வசதிகளும் ஏற்படுத்திக் கொடுக்கப்பட்டிருக்கின்றது. அவர்களின் வருகையை ஊக்குவிப்பதற்காகப் பல்வேறு சலுகைகள் இந்த வரவு செலவுத் திட்டத்தினூடாக ஏற்படுத்தப்பட்டிருக்கின்றது. இவ்வாறு செய்வதனூடாக வெளிநாட்டவர்கள் எமது நாட்டுக்கு வந்து முதலீடுகளை மேற்கொள்வார்கள். இந்த நாட்டுக்கு இன்று மிக அதிகமாகத் தேவைப்படுவது வெளிநாட்டு முதலீடு. வெளிநாட்டு முதலீடுகள் வந்து சேர்ந்தால் மாத்திரமே, இந்த நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்த முடியும்; உயர்த்த முடியும். அந்த வகையில், அனைத்துத் தரப்பினருக்கும் சுபிட்சத்தைக் கொண்டுவரக்கூடிய இந்த வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்த மாண்புமிகு நிதி அமைச்சர் ரவி கருணாநாயக்க அவர்களுக்கும் அவரோடு இணைந்து வழிகாட்டியாக இருந்த மாண்புமிகு பிரதம மந்திரி அவர்களுக்கும் இந்த நாட்டின் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் மலையக மக்களின் சார்பாக எனது நன்றியைத் தெரிவித்துக்கொள்வதோடு, வாய்ப்பளித்த குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களுக்கு மீண்டும் நன்றி கூறி, எனது உரையை முடிக்கின்றேன். நன்றி, வணக்கம்!

***එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2016 නොවැම්බර් මස 12වන සෙනසුරාදා පවත්වනු ලැබේ.***

*அப்போது பி.ப. 6.30 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம் 2016 நவம்பர் 12, சனிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Saturday, 12th November, 2016.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Adjournment Motion to be moved by the Hon. I. Charles Nirmalanathan.

## උතුර හා නැඟෙනහිර ඉගැන්වීම් කටයුතුවල ස්වේච්ඡාවෙන් නිරතවූවන් ගුරු සේවයට බඳවා ගැනීම

## வடக்கு, கிழக்கில் தொண்டர் அடிப்படையில் கற்பித்தோரை ஆசிரிய சேவையில் இணைத்தல்

## ABSORPTION OF VOLUNTEERS ENGAGED IN TEACHING IN NORTH AND EAST INTO TEACHERS' SERVICE

[பி.ப. 6.30]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே,

"30 வருட காலமாக வடக்கு, கிழக்கு மாகாணங்களில் இடம்பெற்ற யுத்தம் காரணமாக அப்பிரதேசங்களில் பாரிய ஆசிரியர் தட்டுப்பாடு நிலவியது. அப்பிரதேசங்களில் சுயவிருப்பின் பேரில் கடமையாற்றுவதற்கு முன்வந்த ஆசிரியர்கள் மிகவும் குறைவாகக் காணப்பட்டமை, வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு நியமிக்கப்பட்ட ஆசிரியர்கள் கடமையினைப் பொறுப்பேற்காமை, கடமையைப் பொறுப்பேற்ற ஆசிரியர்களில் அதிகமானவர்கள் மிகவும் குறுகிய காலத்தில் இடமாற்றங்களைப் பெற்றுச்சென்றமை போன்ற காரணங்களினால் இந்நிலை மேலும் மோசமானது. மேலும், வெளி மாகாணங்களில் இருந்து வருகின்ற ஆசிரியர்களுக்குத் தங்குவதற்கான ஆசிரியர் விடுதிகள் காணப்படாமையும் வெளிமாவட்ட ஆசிரியர்களை அதிக காலத்திற்கு நிறுத்தி வைக்கமுடியாத நிலைக்குத் தாக்கம் செலுத்திய மற்றொரு காரணியாக அமைந்தது. இம்மாகாணங்களில் நிலவிய ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்காக ஆட்சேர்ப்புச் செய்வதற்கு தகைமை பெற்றவர்கள் மிகவும் குறைவாகக் காணப்பட்டமையால் இப்பிரதேச மாணவர்களின் கல்வி மட்டமானது மோசமாக வீழ்ச்சியடைந்துள்ளது. யுத்தம் இடம்பெற்ற காலப்பகுதியில் இப்பாடசாலைகள் மூடப்படாது பாதுகாத்து அவற்றின் கல்வி நடவடிக்கைகளைத் தொடர்ச்சியாக மேற்கொள்ளும் பொருட்டுப் பல்வேறு சிரமங்களுக்கு மத்தியில் ஒப்பந்த ஆசிரியர்கள், தொண்டர் ஆசிரியர்கள் மற்றும் பகுதிநேர ஆங்கில ஆசிரியர்கள் என்ற அடிப்படையில் அப்பிரதேசங்களைச் சேர்ந்த கற்ற விடயசார் தகுதி பெற்றவர்களினால் கிடைக்கப்பெற்ற சேவையானது மிகவும் அளப்பரியதாகும்.

இவ்வாறு ஒப்பந்த அடிப்படையில் 167 ஆசிரியர்களும் தொண்டர் அடிப்படையில் 1120 ஆசிரியர்களும் மற்றும் பகுதிநேர ஆசிரியர்களாக 56 பேரும் வட மாகாணத்தில் சேவையாற்றுவதுடன், கிழக்கு மாகாணத்தில் தொண்டர் அடிப்படையில் 445 ஆசிரியர்களும் சேவையாற்றி வருகின்றனர்.

எனவே, வடக்கு, கிழக்கு மாகாணங்களில் கற்பித்தல் பணிகளில் ஈடுபட்டவர்களை ஆசிரியர் சேவையில் இணைத்துக்கொள்வதற்கு அரசு நடவடிக்கை எடுக்கவேண்டும்"

என்று கோரி, இந்த ஒத்திவைப்புப் பிரேரணையை நான் இங்கே சமர்ப்பிக்கின்றேன்.

கௌரவ கல்வி அமைச்சர் அவர்களே, எங்களுடைய பிரதேசங்களில் யுத்தம் நடைபெற்றபோது எங்களுடைய மாணவர்களுடைய கல்வியை மேம்படுத்துவதற்காக இந்த ஆசிரியர்கள் தங்களுடைய அர்ப்பணிப்பைச் செய்திருக் கின்றார்கள். அந்த ஆசிரியர்களுடைய அர்ப்பணிப்பை மதித்து அவர்களுக்கு நிரந்தர நியமனம் கொடுக்கவேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களையும் அரசாங்கத்தையும் கேட்டுக்கொள்கின்றேன்.

அதனடிப்படையில், வட மாகாணத்தில் யாழ்ப்பாணம் கல்வி வலயத்தில் 75 ஆசிரியர்களும், வலிகாமம் வலயத்தில் 232 ஆசிரியர்களும், வடமராட்சியில் 63 ஆசிரியர்களும், தென்மராட்சியில் 25 ஆசிரியர்களும், தீவகத்தில் 103 ஆசிரியர்களும், கிளிநொச்சியில் 284 ஆசிரியர்களும், முல்லைத்தீவில் 163 ஆசிரியர்களும், துணுக்காயில் 40 ஆசிரியர்களும், மன்னாரில் 93 ஆசிரியர்களும், மடுவில் 36 ஆசிரியர்களும், வவுனியா தெற்கில் 190 ஆசிரியர்களும், வவுனியா வடக்கில் 39 ஆசிரியர்களும், மேலதிகமாக, அங்கு பணியாற்றி விடுபட்ட ஆசிரியர்கள் 50 பேரும் உள்ளடங்கலாக மொத்தமாக 1,393 ஆசிரியர்களும் கிழக்கு மாகாணத்தில் 445 ஆசிரியர்களும் உள்ளனர்.

கடந்த காலங்களில் அவர்கள் தமது நியமனம் சம்பந்தமாகப் பல போராட்டங்களை நடத்தியிருக்கின்றார்கள். அதேநேரத்தில், அரசாங்கத்தால் பல உறுதிமொழிகள், பல வாக்குறுதிகள் வழங்கப்பட்டும் அவர்களுக்கு இன்னமும் நிரந்தர நியமனம் வழங்கப்படவில்லை, அவை நிறைவேற்றப்படவில்லை. அதேநேரத்தில், இந்த ஆசிரியர்கள் இன்றுவரையும் தங்களுடைய ஆசிரியர் பணியைத் தொடர்ந்தவண்ணமே உள்ளார்கள். அவர்கள் யுத்த காலத்தில் பணியாற்றியமைக்காக அவர்களுக்கு நிரந்தர நியமனம் வழங்கி அவர்களைக் கௌரவிக்க வேண்டும். கௌரவ அமைச்சரவர்களே, அண்மையில்கூட அவர்கள் கல்வி அமைச்சிற்கு முன்னால் ஆர்ப்பாட்டம் ஒன்றை மேற்கொண்டிருந்தார்கள். அப்போது தங்களால் இது சம்பந்தமான Cabinet Paper தயாராக இருப்பதாக அவர்களிடம் காண்பிக்கப்பட்டது. ஆனால், 8ஆம் மாதம் தயாரிக்கப்பட்ட அந்த Cabinet Paper இன்னமும் அமைச்சரவைக்குச் செல்லவில்லையென்று நினைக்கின்றேன். ஆகவே, மிகவிரைவில் அந்தப் பத்திரத்தை அமைச்சரவையில் சமர்ப்பித்து அவர்களுக்கு நிரந்தர நியமனத்தை விரைவாக வழங்கவேண்டுமென்று அரசாங்கத்தையும் கௌரவ கல்வி அமைச்சர் அவர்களையும் கேட்டுக்கொள்வதுடன், எவ்வளவு காலத்திற்குள் தங்களால் அதனை வழங்கமுடியுமென்ற உறுதிமொழியினைத் தருமாறும் வேண்டிக்கொள்கின்றேன்.

[අ.භා. 6.35]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව මා ස්ථිර කරනවා. ඒ යෝජනාව කාලීන වාගේම, හරිම ප්‍රායෝගික, යුක්තිසහගත, සාධාරණ යෝජනාවක්.

මා මේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරද්දී, වර්තමාන ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට කිසිම ආකාරයකින් දොසක් කියන්නේ නැහැ. මොකද, එතුමාගේ කාලයේ නොවෙයි මේ තත්ත්වය ඇති වුණේ. මේ අවිධිමත්, අයුක්ති සහගත, අමනෝඥ ක්‍රියා කලාපය මීට වසර ගණනාවකට පෙර සිට දිගින් දිගටම සිදු කෙරුණා. නමුත්, වර්තමානයේ ඉන්න අධ්‍යාපන බලධාරින් මේක මේ විධියටම විය යුතුයි කියන එකයි කියන්නේ. ඒක හරිම විහිළු සහගත කථාවක්.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා හොඳටම දන්නවා මේ ප්‍රශ්නය මොකක්ද කියලා. විද්‍යාපීඨ ගුරුවරුන් වාගේම උපාධිධාරි ගුරුවරුන් මේ ප්‍රදේශවලට අනුයුක්ත කිරීමේදී මේ වතාවේත් ඉතාම අවිධිමත්, අමනෝඥ, අයුක්ති සහගත ක්‍රියා කලාපයක් තමයි අනුගමනය කර තිබෙන්නේ. අධ්‍යාපන බලධාරින් හමු

වෙලා මේ සම්බන්ධයෙන් පැහැදිලි කර ගන්න ගියාම, හරිම කනගාටුදායක උත්තර තමයි අධ්‍යාපන ලේකම්වරයා පවා දුන්නේ. ඔහු මටත් කිව්වා, -මා දන්නේ නැහැ, ඔහු උගන්වා තිබෙනවාද කියලා- අනිවාර්යයෙන්ම මේ ගුරුවරු මොන දිස්ත්‍රික්කයේ අය වුණත් උතුරට, නැඟෙනහිරට දමන්න ඕනෑය කියලා. බස්නාහිර පළාතේ කෙනා වුණත් උතුරට, නැඟෙනහිරට දමන්න ඕනෑය කිව්වා. මා කිව්වා, ඔබතුමා කියන එක අතීතයට ගැළපෙනවා කියලා. මොකද, මේ වන විට අධ්‍යාපනයේ තිබෙන යම් යම් තත්ත්ව නිසා ඒ ප්‍රදේශවලින්, ඒ දිස්ත්‍රික්කවලින් විද්‍යාපීඨ ගුරුවරු, වෛද්‍යවරු, ඉංජිනේරුවන්, උපාධිධාරී ගුරුවරුන් යම් ප්‍රමාණයක් බිහි වෙලා තිබෙනවා. අන්න ඒ ප්‍රමාණය ඒ ප්‍රදේශ තුළ තුලනය කරලා, අඩු පිරිස ආසන්න දිස්ත්‍රික්කවලින් අනුයුක්ත කරනවා නම්, මේ ගැටලුවට අවම වශයෙන් හෝ විසඳුමක් ලබා ගන්න පුළුවන්කම ලැබේවි කියලා මා විශ්වාස කරනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ආසන්න දිස්ත්‍රික්කයට අනුයුක්ත කිරීමේ පදනම මත, යම් කාලයකට විතරක් අධ්‍යාපනය අතින් දුෂ්කර නොවන දිස්ත්‍රික්කවලින් දුෂ්කර දිස්ත්‍රික්කවලට ගුරුවරු අනුයුක්ත කිරීම සාධාරණයි. ඒ විතරක් නොවෙයි, දුෂ්කර දිස්ත්‍රික්කවලින් දුෂ්කර නොවන දිස්ත්‍රික්කවලට ගුරුවරු අනුයුක්ත කරනවා වෙනුවට, ආසන්න දුෂ්කර දිස්ත්‍රික්කවලට අනුයුක්ත කිරීමත් සාධාරණයි.

ඊළඟට, දුෂ්කර දිස්ත්‍රික්කවලින් තවත් ඈත දුෂ්කර දිස්ත්‍රික්කවලට ගුරුවරු අනුයුක්ත කිරීම ප්‍රායෝගික නොවන වැඩක්. මෙවර විද්‍යාපීඨ ගුරුවරු ස්ථාපිත කළේ මෙන්න මේ අමනෝඥ ක්‍රියා කලාපය තුළයි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, දකුණේ ඉන්න, බස්නාහිර පළාතේ ඉන්න සිංහල ගුරුවරු දැම්මා උතුරු- නැඟෙනහිර පළාත්වලට. එහෙම කරලා ඒ ගුරුවරුන්ට කිව්වා, දෙමළ ළමයින් ඉන්න පාසල්වල සිංහල උගන්වන්න කියලා. ඒ ගුරුවරුන්ට දෙමළත් බැහැ. ඒ දරුවන්ට සිංහලත් බැහැ. වවුනියාවේ ඉන්න ගුරුවරිය අනුරාධපුරයට දමනවා සිංහල උගන්වන්න කියලා. ඒ ගුරුවරුන්ට සිංහල බැහැ. ඉතින් කොහොමද උගන්වන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඒ නිසා මා ඉල්ලීමක් කරනවා, මේ කටයුත්ත විධිමත්ව ක්‍රියාත්මක කරන්න කියලා. බොහොම ස්තුතියි.

[பி.ப. 6.40]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, சபை ஒத்திவைப்புவேளை பிரேரணையில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு முதலில் உங்களுக்கு நன்றி தெரிவித்துக்கொள்கிறேன். வன்னி மாவட்டப் உறுப்பினர் மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன் அவர்கள் முன்வைத்திருக்கும் இந்தப் பிரேரணையானது மிகவும் நியாயபூர்வமானது. அவரது முன்வைப்பிலே சொன்னதுபோல, மிக நீண்ட காலமாக யுத்தத்தினால் பாதிப்புற்றிருந்த வடக்கு, கிழக்குப் பிரதேசங்களில் ஆசிரியர்கள் இல்லாமல் பாடசாலைகள் மூடிக்கிடந்த காலங்களிலே தொண்டர் ஆசிரியர்களாகச் சேவையாற்றி இன்றும்கூட அந்தப் பணியைச் செய்துகொண்டிருக்கின்றவர்களுக்கு நிரந்த நியமனத்தைப் பெற்றுக்கொடுக்க வேண்டியது கல்வியமைச்சின் கடப்பாடாக இருக்கின்றது. இந்தக் குறுகிய நேரத்திலே ஒரு விடயத்தை மாத்திரம் இச்சபையிலே முன்வைக்கலாமென நினைக்கிறேன்.

இலங்கைத் தீவுக்குள், சுற்றிலும் கடல் இல்லாதபோதிலும் ஒரு தீவு போன்று பல மாவட்டங்களையும் பிரதேசங்களையும் கொண்ட பெருந்தோட்டப் பகுதிகள் இருந்து வருகின்றன. பெருந்தோட்டப் பாடசாலைகளின் கல்வி முறையானது, இலங்கையில் இலவசக் கல்வி அறிமுகப்படுத்தப்பட்டதற்குப் பின்னரும் தனியார் தேயிலைத் தோட்டக் கம்பனிகளின் நிருவாகத்துக்குக் கீழ் இருந்துவந்த நிலைமை காணப்பட்டது. தற்போதைய நிலையில், அங்கு ஆசிரியர் நியமனங்கள் வழங்கப்பட்டு அவர்களுக்குரிய சம்பளத்திட்டமும் அறிவிக்கப்பட்டது. இருந்தாலும், தொண்டர் ஆசிரியர்கள் என்ற நிலையில் இருக்கின்ற பெருந்தோட்ட ஆசிரியர்களின் சம்பள விவகாரம் தொடர்பாக இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர நினைக்கின்றேன். இதற்கு முன்பும் பல்வேறு சந்தர்ப்பங்களில் கல்வி அமைச்சர் அவர்களின் கவனத்திற்கு இந்த விடயத்தை முன்வைத்திருக்கிறோம். வெறும் 6,000 ரூபாய் சம்பளத்துக்கு நியமிக்கப்பட்ட ஆசிரியர்கள் இன்னமும் முழுமையாக பாடசாலைகளில் நியமிக்கப்படாத நிலைமை தொடர்ந்துகொண்டிருக்கிறது. இவர்கள் 6,000 ரூபாய் சம்பளத்துடன் ஆசிரியர் பயிற்சிக் கல்லூரிகளில் பயிற்சியைப் பெறுவதற்காக மட்டக்களப்புக்கும் யாழ்ப்பாணத்துக்கும் ஏனைய மாவட்டங்களுக்கும் அனுப்பப்பட்டிருக்கிறார்கள். பதுளையிலிருந்து நுவரெலியாவிற்கு வந்து பயிற்சியினைப் பெறுவதற்கு அனுமதிக்கப்பட்டிருக்கிறார்கள். எனவே, இந்த 6,000 ரூபாய் சம்பளத்தில் அவர்கள் தங்களது தொழிலைக் கொண்டுநடத்த முடியாமலும் பயிற்சியைப் பெறமுடியாமலும் தத்தளித்துக்கொண்டிருக்கிறார்கள். இந்த ஆசிரியர் சமூகம் தோட்டத் தொழிலாளர்களைப் போன்று சம்பளத்துக்காக பெருந்தோட்டப் பகுதிகளிலே போராடிக்கொண்டிருக்கின்ற நிலைமை மாற்றப்பட வேண்டும். இதற்கான உரிய நடவடிக்கையை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நன்றி! அடுத்து, கௌரவ சிறீதரன் அவர்கள்!

[பி.ப. 6.43]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று வன்னி மாவட்டப் நாடாளுமன்ற உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்களால் கொண்டுவரப்பட்டிருக்கின்ற தொண்டர் ஆசிரியர்களுடைய நியமனம் தொடர்பாக நாங்கள் பல ஆண்டுகளாக இந்தச் சபையிலே பல கோரிக்கைகளை முன்வைத்திருக்கின்றோம். இது தொடர்பாகப் பல தடவைகள் அமைச்சருக்கு கடிதம் எழுதப்பட்டிருக்கிறது. இப்பிரச்சினை ஜனாதிபதி வரையும் கொண்டு செல்லப்பட்டிருக்கின்றது. ஆனால், அவர்களுடைய நியமனங்கள் வழங்கப்படாமல், இவ்வளவு காலமும் இழுத்தடிக்கப்படுவது மிக வேதனைக் குரியது. மிகக் கொடிய யுத்தம் நடைபெற்ற வடக்கு, கிழக்கு மாகாணங்களில் யுத்த காலத்திலும் யுத்தத்திற்குப் பிற்பாடும்கூட அங்கு வாழுகின்ற பிள்ளைகளின் கல்வி வளர்ச்சியிலே இந்தத் தொண்டர் ஆசிரியர்கள் எந்தவித

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

வேதனங்களும் இல்லாமல் தங்களுடைய பணியை மிகவும் சிறப்பாக ஆற்றியிருந்தார்கள். ஆனால், அவர்களுடைய வாழ்வாதாரத்திற்குக்கூட இதனால் எந்த உதவிகளும் கிடைக்கவில்லை.

வடக்கு மாகாணத்திலே கிட்டத்தட்ட 1,393 தொண்டர் ஆசிரியர்களும் கிழக்கு மாகாணத்திலே 740 வரையான தொண்டர் ஆசிரியர்களும் இருக்கிறார்கள். கிழக்கு மாகாணத்தில் உள்ளவர்களில் ஆக 445 பேருக்கு மட்டும்தான் நேர்முகத் தேர்வு நடத்தப்பட்டிருக்கிறது. மிகுதிப்பேர் நேர்முகத் தேர்வு நடத்தப்படாமலே புறக்கணிக்கப்பட்டிருக்கிறார்கள். இவர்களுக்கு ஓர் எழுத்துப் பரீட்சை நடாத்தித்தான் நியமனம் வழங்கப்படுவதாகப் பேசப்படுகின்றது. அது இலங்கையினுடைய சில சட்டதிட்டங்களுக்கு உட்பட்டிருந்தாலும், இவர்கள் கடந்த 5 - 6 ஆண்டுகளுக்கு மேலாக எந்த வேதனமும் இல்லாமல் இந்தப் பிள்ளைகளுக்கான கல்வியை வழங்கியிருக்கிறார்கள். குறிப்பாக, வடக்கு, கிழக்கிலே கணிதம், விஞ்ஞானம், ஆங்கிலம், இலத்திரனியல், ICT போன்ற துறைகளிலே ஆசிரியர்கள் இல்லாத பெரிய பற்றாக்குறை நிலவுகின்றது. இவ்வாறான இந்த இடைவெளிகளை இந்த ஆசிரியர்கள்தான் நிறைவு செய்திருக்கிறார்கள். இவர்களுக்கு இன்னுமொரு பரீட்சை நடத்தி, அந்தப் பரீட்சைப் புள்ளிகளின் அடிப்படையில்தான் இவர்களுக்கு நியமனம் வழங்குவதென்ற ஒரு நிலைமை இருக்குமானால், சிலவேளை அதுகூட ஓர் ஏமாற்று நடவடிக்கையாக அமைந்துவிடும். அவர்களிடம் தகுதி இருக்கின்றது. அவர்கள், க.பொ.த. சாதாரண தரத்தைப் பூர்த்தி செய்திருக்கிறார்கள், க.பொ.த. உயர்தரத்தைப் பூர்த்தி செய்திருக்கிறார்கள், சிலர் ஆங்கில மொழியிலே நல்ல பரிச்சயம் - பாண்டித்தியம் பெற்றிருக்கிறார்கள், சிலர் ICT துறையிலே நல்ல பாண்டித்தியம் பெற்றிருக்கிறார்கள். இவ்வாறான வல்லமை உள்ளவர்களுக்கு ஒரு பரீட்சைக்கு அப்பால், நேர்முகத் தேர்வு நடத்தி நியமனம் வழங்க முடியும்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இவ்வளவு நேரம் பொறுமையாக இருந்து கேட்டுக்கொண்டிருப்பதையிட்டு நாங்கள் மகிழ்ச்சியடைகின்றோம். ஏனென்றால், இந்த நிலைமையை நீங்கள் சரியாகப் புரிந்துகொண்டிருக்கிறீர்கள். ஆகவே, கிட்டத்தட்ட அவர்களுக்கு நியமனம் கிடைத்துவிடும் என்ற ஒரு நம்பிக்கை எனக்கு இருக்கிறது. முல்லைத்தீவு, கிளிநொச்சி, வவுனியா, மன்னார், யாழ்ப்பாணம், அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை ஆகிய பல்வேறு மாட்டங்களில் தொண்டராசிரியர்களாக இருக்கின்ற ஒவ்வொருவரும் எத்தனையோ தடவைகள் போராட்டம் நடத்தியிருக்கிறார்கள்; எத்தனையோ தடவைகள் கொழும்பு வரையும் வந்து போராடியிருக்கிறார்கள்; இதற்காக அவர்கள் உண்ணாவிரதமும் இருந்திருக்கிறார்கள். அவர்களுடைய நியமனத்திற்காக அவர்கள் செய்கின்ற தியாகங்களைத் தயவுசெய்து நீங்கள் கருத்தில் எடுங்கள்!

இறுதியாக, கௌரவ உறுப்பினர் அவர்களால் இந்த உயர்ந்த சபையிலே கொண்டுவரப்பட்ட இந்தப் பிரேரணை மூலமாக ஒரு நல்ல செய்தி அவர்களுடைய காதுகளுக்குச் செல்ல வேண்டும் என்பதை அமைச்சர் அவர்களிடம் தெரிவித்து, சந்தர்ப்பத்திற்கு நன்றிகூறி, நிறைவுசெய்கின்றேன்.

[අ.භා. 6.45]

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වසර 30කට ආසන්න කාලයක් පුරා උතුරු නැඟෙනහිර පළාත්වල පැවති යුද්ධය හේතු කොටගෙන එම පළාත්වල පවතින ගුරු හිඟය ආවරණය කිරීම සඳහා ස්වේච්ඡා, අර්ධකාලීන හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ගුරුවරුන් ස්ථිර සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳව විවාදයේ දී මටත් අදහස් දක්වන්නට අවස්ථාවක් ලබාදීම මා අගය කොට සලකනවා.

මේ වන විට යහ පාලන රජය මඟින් මේ සම්බන්ධයෙන් වූ යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. බොහොම ඉක්මනට මේ කටයුත්ත සිද්ධ වෙයි කියා මා විශ්වාස කරනවා. ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීමේදී දරුවන්ගේ අධ්‍යාපනයට ශක්තියක් ලබාදීම ඓතිහාසික කටයුත්තක් බවට පත් වෙනවා. එම නිසා දරුවන්ට අධ්‍යාපනය ලබාදීම තරම් ජාතික සමගියට රුකුල් දෙන වෙනත් ප්‍රබල සාධකයක් නැහැ කියන එකයි මගේ විශ්වාසය. ඒ අනුව ඉදිරියේදී උතුරු පළාතේ ජීවත් වන දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමේ හැකියාව ලැබෙයි කියා අප විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා යුද්ධය නිසා උතුරු පළාතේ අධ්‍යාපනය බිඳ වැටුණත්, උතුරුමැද පළාතේ අධ්‍යාපනය බිඳ වැටුණේ එහෙම නොවෙයි. අධ්‍යාපන ක්ෂේත්‍රය දේශපාලනීකරණය කරලා, දේශපාලනය අධ්‍යාපනය තුළින් ක්‍රියාත්මක කරන්න උත්සාහ කිරීම නිසා තමයි, එදා උතුරුමැද පළාතේ අධ්‍යාපනය බිඳ වැටුණේ. එම තත්ත්වය 2015 ජනවාරි 08වැනි දායින් පසුව වෙනස් වුණා. මේ වන විට පහේ ශිෂ්‍යත්වය සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල දෙස බැලුවාම, පිළිවෙළින් 5වැනි සහ 6වැනි ස්ථානය දක්වා උතුරුමැද පළාතේ අධ්‍යාපන මට්ටම ඉහළ ගොස් තිබෙනවා. මේ යහ පාලන රජය යටතේ ඉදිරියේදී උතුරු පළාතේත් අධ්‍යාපනය හොඳ තැනකට ගන්න හැකි වෙයි කියා අප විශ්වාස කරනවා. ඒ සඳහා අපේ ශුභාශිංසන පුද කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. A. Aravindh Kumar. You have one minute.

[பி.ப. 6.47]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

இன்று கல்வி அமைச்சுடன் தொடர்பான ஒத்திவைப்புவேளை பிரேரணைமீது நாம் எமது கருத்துக்களை முன்வைத்துக்கொண்டிருக்கின்றோம். வடக்கு, கிழக்கு மாகாணங்கள் மிக நீண்ட காலமாக அசாதாரண சூழ்நிலையில் பல்வேறு இன்னல்களுக்கு முகம்கொடுத்திருக்கின்றன. எனவே, இந்த மாகாணங்களைப் பொறுத்தளவிலே, ஏனைய மாகாணங்களைவிட ஒரு விசேட அளவுகோலின் ஊடாக அங்குள்ள பிரச்சினைகளைப் பார்க்கவேண்டிய தேவை இருக்கின்றது. ஆகவே, அங்கு தற்போது தொண்டர் ஆசிரியர், சமயாசமய ஆசிரியர், பகுதி நேர ஆசிரியர் போன்ற பல்வேறு வகையினராக உள்ளவர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவது

காலத்தின் தேவையாகும். அதிலும் அந்த நியமனத்தைத் தாமதியாது வழங்குவதற்கு ஏற்ற அனைத்துச் செயற்பாடுகளையும் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமென்று நான் இந்தச் சபையினூடாகக் கேட்டுக்கொள்கின்றேன். அதேநேரத்தில், மலையகத்தைப் பொறுத்தவரையில், -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் உங்களது உரையை முடித்துக்கொள்ள வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் பதிலளிக்க இருக்கிறார்.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
அண்மையிலே அங்கு சுமார் 3,000 பேருக்கு ஆசிரிய உதவியாளர் நியமனம் வழங்கப்பட்டது. ஆனால், இந்த ஆசிரிய உதவியாளர்களுக்கு மாதத்துக்கு வெறுமனே 6,000 ரூபாய் மாத்திரமே வழங்கப்பட்டு வருகின்றது. இக்கொடுப்பனவு எந்த வகையிலும் ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு கொடுப்பனவாக இல்லை.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நன்றி.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
ஏனெனில், இன்றுள்ள வாழ்க்கைச் செலவுடன் ஒப்பிடும்போது, இது மிகமிகக் குறைந்த ஒரு தொகையாகும். ஆகவே, இது சம்பந்தமாக ஓர் அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பிப்பதனூடாக மேலும் 10,000 ரூபாயைச் சேர்த்துக்கொடுப்பதாக ஏற்கெனவே கௌரவ கல்வி அமைச்சர் அவர்கள் மட்டுமல்ல, அமைச்சின் -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நன்றி. நன்றி. அடுத்து, கௌரவ கல்வி அமைச்சர் அவர்கள்!

[අ.භා. 6.49]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් විශේෂයෙන්ම මම මේ කරුණ කියන්න ඕනෑ. මීට මාස කීපයකට ඉස්සෙල්ලාත් මේ ගැටලුව උද්ගත වුණා. මේ ගුරුවරු බඳවා ගැනීමට ප්‍රථමයෙන්ම විභාගයක් පැවැත්විය යුතුව තිබුණා. විද්‍යාව ඇතුළු සමහර විෂයයන්වලට ගුරුවරු බඳවා ගැනීම සඳහා පසු ගිය කාලයේ ගුරු ව්‍යවස්ථාව අනුව විභාගයක් පැවැත්විය යුතුව තිබුණා. ඒ අනුව අපි විභාගය පැවැත්වූවා. ඒ වාගේම ගුරු ව්‍යවස්ථාව අනුව අපට ස්වේච්ඡා ගුරුවරු හෝ වෙනත් විවිධාකාරයෙන් ගුරුවරු බඳවා ගන්න පුළුවන්කමක් නැහැ. නමුත්, අපි ඒ වෙලාවේත් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න ගියාම විභාගය පවත්වා අවසන් කරලා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්නය කියන එක සමහර අයගේ ඉල්ලීම වුණා. මොකද, සමහර අයට විභාගයෙන් ගුරු ව්‍යවස්ථාව අනුවත් එන්න පුළුවන්කම තිබෙන නිසා.

විද්‍යාව, ගණිතය ආදී විෂයයන් සඳහා අපි පසු ගිය කාලයේත් 1,500කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගත්තා. පුරප්පාඩු ටික පිරවීමට අවශ්‍ය කටයුතු කරන්න අපට දැන් සිද්ධ වනවා. ඒක තමයි මේ කටයුත්ත ප්‍රමාද වුණේ. කිසි විටෙකත් උතුරු නැඟෙනහිරට කියලා අපි අඩුවක් කරන්නේ නැහැ. අපි විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ විභාගය පැවැත්වූවා. ඒ විභාගයෙන් 4,000කට ආසන්න ප්‍රමාණයක් ගත්තා. මේ දේවල් පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. අධ්‍යාපන පරිපාලන සේවයේ 852ක් ගන්න කටයුතු කරලා, මේ දවස්වල අපි ඒ බඳවා ගැනීමේ කටයුතු සිද්ධ කරනවා. විභාගයේ results out වුණා. අධ්‍යාපන පරිපාලන සේවයේ 1,190ක හිඟයක් තිබෙනවා. අපි විභාග පවත්වා දැන් ඒ බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු කරමින් යනවා. අපට විසඳන්න තිබෙන්නේ ගුරු ප්‍රශ්නය පමණයි. ගුරු ප්‍රශ්නය විසඳීම මෙවර අපේ ප්‍රමුඛතා කාර්යයක් සේ අපි සලකා තිබෙනවා.

උතුරු පළාත තුළත්, නැඟෙනහිර පළාත තුළත් කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ගුරුවරු විශාල ප්‍රමාණයක් සිටින බව මම පිළිගන්නවා. ඇත්ත වශයෙන්ම උතුරු පළාත තුළ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ගුරුවරු 167ක් ද, ස්වේච්ඡා පදනම මත සේවය කරන ගුරුවරු 1,120ක් ද, අර්ධ කාලීන ගුරුවරු 56 දෙනෙක් ද සිටිනවා. ඒ වාගේම නැඟෙනහිර පළාත තුළ ස්වේච්ඡා පදනම මත සේවය කරන ගුරුවරු 445ක් ද සිටිනවා. ඔවුන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සන්දේශය අපි සකස් කරලා තිබෙනවා. ඒ කටයුත්ත ප්‍රමාද වන්න හේතු කීපයක් තිබෙනවා.

එකක් තමයි, අපි ප්‍රථමයෙන් විදුහල්පතිවරු, අනිකුත් සේවාවන් සඳහා  බඳවා ගැනීම. ඒ වාගේම මේ රටේ තිබෙන පාසල් 10,161ම සම්පූර්ණ ගුරු හිඟය සොයා ගන්නත් අපට සිද්ධ වුණා. ඒ වාගේම එම හිඟය ඒ ඒ විෂයයන් අනුව හරියට හඳුනා ගත යුතුව තිබුණා. මොකද, අපට ස්වේච්ඡා ගුරුවරු ගන්න කිව්වාම එක පාරටම ගන්න බැහැ. මොකද, අපි ගුරු හිඟය බලන්න ඕනෑ, ඒ ඒ විෂයයන් අනුව බලන්න ඕනෑ, ප්‍රදේශ අනුව බලන්න ඕනෑ. මේ සමීක්ෂණය කරලා තොරතුරු ටික ගන්නත් සෑහෙන කාලයක් ගත වුණා. සම්පූර්ණ ගුරු හිඟය පිළිබඳව තොරතුරු දැන් අපි පරිගණකගත කරලා තිබෙනවා. ඒ අනුව ඒ තොරතුරු සියල්ල අපේ අමාත්‍යාංශයේ තිබෙනවා. ඒ වාගේම භෞතික සම්පත් හිඟය පිළිබඳ තොරතුරුත් අපට දැන් තිබෙනවා. ඒ නිසා අපි දැන් මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්න ලෑස්තියි.

ඇත්තටම මෙය කෙටුම්පත් කරලා දැන් ටික දවසක් වනවා. මේ පත්‍රිකාව translate කිරීම වැනි දේවල් කරන්න ඕනෑ. පසු ගිය දිනවල අපේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සිටියේ නැහැ. එතුමා විදේශගත වෙලායි සිටියේ. මම හිතන්නේ මේ පිළිබඳව අපි ක්‍රියාත්මක වනවා කියලා අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමාත් දන්නවා. මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළත්, නැතත් මේ කටයුත්ත කෙරෙනවා කියලා එතුමා දන්නවා. දමිළ මාධ්‍යයෙන් වැඩ කරන ඔබතුමන්ලා නියෝජනය කරන ප්‍රදේශවලම නිලධාරිනුත් අපේ අමාත්‍යාංශයේ ඉන්නවා. අපි මේ වැඩය කරන්න කටයුතු කරලා තිබෙනවා කියලා ඒ නිලධාරිනුත් දන්නවා. ඒ නිසා අපි මේ කටයුත්තේ අඩුවක් වෙන්න දෙන්නේ නැහැ. "ළඟම පාසල -

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

හොඳම පාසල" කියන අපේ ව්‍යාපෘතිය යටතේ මේ රටේ තිබෙන පාසල් 10,161න්, පාසල් 7,000කට විවිධ පහසුකම් සහ භෞතික සම්පත් ලබා දෙනකොට විශේෂයෙන්ම උතුරු නැඟෙනහිරට අපි වැඩිපුර මුදල් වෙන් කළා කියලා ඔබතුමන්ලා දන්නවා. ඔබතුමන්ලා මේ පිළිබඳව සොයා බලන්න.

මම පසු ගිය කාලයේ කිලිනොච්චියට ගියා. ජාතික සංහිඳියාව ඇති කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සල්ලි යොදවා දූම්රිය ස්ථානයක් හදලා තිබුණා. අපි ඒක විවෘත කළා. ඒකට පළාත් අධ්‍යාපන ඇමතිතුමා ඇතුළු කණ්ඩායම ආවා. අපි ඒකට ගිහිල්ලා, එන ගමන් නිකමට වාගේ කිලිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලයට ගියා. ඒ ගියාම දැක්කා, කිලිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලයේත් ඉඩ නැතිව සමහර ළමයි ප්‍රධාන ශාලාවේ සිටින බව. එතැන අඩු පාඩුවක් තිබෙන බව දැක්ක නිසා ඒ පාසලට තට්ටු තුනක ගොඩනැඟිල්ලක් දෙන්න ඕනෑ කියලා මම ඒ වෙලාවේම තීරණය කළා. මම බලධාරින්ගෙනුත් ඇහුවා ඇයි, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියට මේ පාසල ඇතුළු කළේ නැත්තේ කියලා. ඒ නිසා උතුරේද, දකුණේද, නැඟෙනහිරද, බටහිරද කියලා භේදයක් අපට නැහැ. අවංකවම මේ රටේ අධ්‍යාපනය දියුණු කරන්න අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා. ඒ නිසා මේ කාරණා ප්‍රමාද වෙන්න හේතු තිබුණා.

ගුරු ව්‍යවස්ථාව අනුව අපට ගුරුවරුන් බඳවා ගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මොකද, ගැටලු රාශියක් තිබූ නිසා. පුරප්පාඩු හරියට හඳුනා ගැනීමේ ප්‍රශ්න ටික විසඳා ගැනීමට තිබූ නිසාත් ඉස්සෙල්ලා අපි විදුහල්පතිවරු සහ අනෙකුත් සේවාවන් සඳහා ප්‍රමුඛතාව දීලා බඳවා ගැනීම් කළ නිසායි මේ ප්‍රශ්නය ඇති වුණේ. දැන් අපට ගුරුවරු 30,000ක් පමණ බඳවා ගන්න අවශ්‍ය වනවා. ඒ වාගේම ඔබතුමන්ලා කියන ඔය ස්වේච්ඡා ගුරුවරු බඳවා ගන්න ගිය අවස්ථාවේදී තවත් ස්වේච්ඡා ගුරුවරු පිරිසක් ඇවිල්ලා උද්ඝෝෂණ කරන්න පටන් ගත්තා. "අපිවත් ගන්න ඕනෑ; අපිවත් ගන්න ඕනෑ" කියලා. ඒ විධියට එක එක තැන්වලින් උද්ඝෝෂණ ගලා එන්න ගත්තා, "ස්වේච්ඡා ගුරුවරු ගන්න ඕනෑ" කියලා. නමුත් අපි පැහැදිලිව, උතුරු නැඟෙනහිරට ගුරු ව්‍යවස්ථාව අනුව ගුරුවරුන් බඳවාගෙන ගුරු හිඟය විසඳන්න බැහැ කියලා හොඳ සාධාරණීකරණයක් කරලා තිබෙනවා. ඒ අනුව තමයි අපි කැබිනට් පත්‍රිකාවක් දාලා තීරණය කළේ ගුරු ව්‍යවස්ථාවෙන් පරිබාහිරව උතුර හා නැඟෙනහිර වෙනමම සලකා කටයුතු කරන්න ඕනෑ කියලා. මොකද, ඔය කියන සුදුසුකම් තිබෙන අය හොයන්න බැහැ. අමාරු කාලයේත් උතුරු නැඟෙනහිර ප්‍රදේශ අල්ලාගෙන හිටි පිරිසක් සිටිනවා. ඒ නිසා තමයි ගුරු ව්‍යවස්ථාවට පටහැනිව කැබිනට් පත්‍රිකාවක් දාලා අපි මේ කටයුත්ත කරන්න ගියේ.

පසු ගිය අගෝස්තු මාසයේ බඳවා ගන්න ගියා නම් අපට අනික් අයටත් පත්වීම් දෙන්න වෙනවා. මේ ගොල්ලන්ට දෙනවා නම් ඇයි, අනිත් අයට දෙන්න බැරි කියලා පුත්තලම පැත්තේ සමහර සිංහල කට්ටිය ආවා; ඇවිත් ඒ ගොල්ලන්ටත් ස්වේච්ඡා ගුරුවරුන් දාන්න ඕනෑ බව කිව්වා. ඉතින් ඔය වාගේ ප්‍රශ්න තිබුණා. ඒ නිසා නිකම්ම නිකම් නොවෙයි, මේ ප්‍රශ්නවලට හේතු කාරණා තිබුණා. ඒ නිසා තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා, ස්වේච්ඡා ගුරුවරු පමණක් නොවෙයි, තවත් ගුරුවරු උතුරු ප්‍රදේශයට හිඟ බව. නැඟෙනහිර ප්‍රදේශයටත් හිඟයි. මුස්ලිම් පාසල්වලටත් හිඟයි. අපි පසු ගිය කාලයේ දින 100 තුළ එනම් මීට අවුරුද්දකට වාගේ ඉස්සෙල්ලා වතුකරයේ පාසල් සඳහා ද්‍රවිඩ මාධ්‍යයෙන් උගන්වන්න අවශ්‍ය කරන ගුරුවරු තුන්දහස් ගණනක් බඳවා ගත්තා. ඒ නිසා පියවරෙන් පියවර ගන්න ඕනෑ. ගුරුවරුන් ගන්නේ නැතුව නොවෙයි. නමුත් ඒක ක්‍රමවේදයක් අනුව කළ යුතුව තිබෙනවා. ඒ නිසා මම කියනවා, ඒ ගැන සැකයක් තියා ගන්න එපා කියලා. ඒ වාගේම ඔබතුමන්ලාට තේරෙනවා ඇති, සම්පත් එන විධිය. උතුරු ප්‍රදේශවල පාසල්වලට ගියාම කොච්චර සල්ලි එනවාද, කොච්චර අපි යොදවලා තිබෙනවාද කියලා තේරෙනවා ඇති. කොටින්ම කියනවා නම්, "ළඟම පාසල - හොඳම පාසල" කියන ව්‍යාපෘතියට පත් කරලා තිබෙන මගේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාත් ද්‍රවිඩ ජාතිකයෙක්. ඒ ප්‍රදේශයේම එක්කෙනෙක්. ඕනෑ නම් සොයා බලන්න. භේදයකින් තොරව හැම තැනම එක වාගේ කරන්න ඕනෑ බවයි අපි කිව්වේ.

ඒ කාරණයට අමතරව ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා විද්‍යාපීඨ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කළා. එතුමා ඒ ගැන මට පෞද්ගලිකවත් කිව්වා. එහි ප්‍රශ්නයක් තිබුණා. අමාත්‍යාංශයටත් ලොකු බලපෑමක් ඇවිල්ලා තිබුණා. විද්‍යාපීඨවලින් තුන්දහස් ගණනක් ගුරුවරු පිටවෙනවා. ජාතික පාසල් 352ක් තිබෙනවා. ජාතික පාසල්වලට සහ දුෂ්කර ප්‍රදේශවල ජාතික පාසල්වලට ගුරුවරු දැමිය යුතුව තිබෙනවා. ඒ සඳහා වෙන කොහෙන්වත් දාන්න බැහැ. අපි ඉතුරු ප්‍රමාණය ඔක්කෝම පළාත් සභාවට දුන්නා. එහෙම නැතිව දුෂ්කර ප්‍රදේශවලට ඒ ප්‍රදේශවල සිටින අයම දාන්න ගියොත්, එහෙමත් නැත්නම් ළඟම දුෂ්කර දිස්ත්‍රික්කයේ අය දාන්න ගියොත්, -උදාහරණයක් හැටියට හම්බන්තොටින් ළඟම දුෂ්කර දිස්ත්‍රික්කයට දාන්න ගියොත්- ප්‍රශ්න මතු වනවා. මාත් බැලුවා, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. එහිදී වෙලා තිබුණේ ඒ ඒ විෂයන් කරපු අය නැති ප්‍රශ්නයයි. ස්ථානගත කිරීමේදී සමහර තැන්වල වැරදි ඒවාත් තිබුණා. නැතුවා නොවෙයි. තැන් තැන්වල වැරදි ඒවාත් තිබුණා. නමුත් එකින් එක අරගෙන බලනකොට මම දැක්ක කාරණය තමයි, අපේ අමාත්‍යාංශය තීරණය කරලා තිබුණා, හැම තැනටම ටික ටික හරි දෙන්න ඕනෑ බව. මොකද, මේක පළමු පත්වීම.

නැඟෙනහිර සමහර පාසල්වලට සිංහල ගුරුවරු ඉල්ලනවා. ඒ වාගේම ද්‍රවිඩ ගුරුවරු ඉල්ලනවා. ඒ නිසා මේ ගුරු පිරිස ටික ටික බෙදලා දෙන්න ඕනෑ කියන තීරණය මත තමයි මේ විධියට දාලා තිබෙන්නේ. කොහොම නමුත් පොඩි පිරිසක් එක එක තැන්වලට දාන්න ගියාම විශාල ප්‍රශ්නයක් ඇති වනවා. මේ ප්‍රශ්න නිසාම පෙරේදා සියලුම ආණ්ඩුකාරවරු, අධ්‍යාපන ඇමතිවරු, පළාත් අධ්‍යාපන ලේකම්වරු ඔක්කෝම අපි ගෙන්නුවා. ගෙන්නලා මේ ගැන සාකච්ඡා කළා. සාකච්ඡා කරලා ගුරු තුලනය පළාත් සභා පාසල් ද, ජාතික පාසල් ද කියන භේදයකින් තොරව කිරීම සඳහා මේ වෙනකොට කැබිනට් පත්‍රිකාවක් දාලා තිබෙනවා.

ජාතික පාසල්වල අතිරික්ත ගුරුවරු 2,000කට වැඩියෙන් ඉන්නවා. ඒ අය පසු ගිය කාලයේ විවිධ ක්‍රමවලට එකතු වෙවී ඉන්නවා. මේ සියලු දෙනාම දෙසැම්බර් 31වෙනිදාට ඉස්සරවෙලා අපි පළාත් සභාවල ඇති පාසල්වලට දමනවා. මම පැහැදිලිව කිව්වා, "කිසිම අතිරික්ත ගුරුවරයෙක් අපි ජාතික පාසල්වල තියා ගන්නේ නැහැ. අපි පඩි ගෙවන්නම්. අනුයුක්ත කරලා හරි පළාත් සභාවලට දමන්න" කියලා.

පසු ගිය කාලවල පළාත් සභාවෙන් පඩි නොගෙවූ නිසා ප්‍රශ්න ඇතිවී තිබෙනවා. අපි පඩි ගෙවීමයි, පළාත් සභාවලට සේවය දෙන එකයි, මේ සියල්ලම සිදු වන්නේ එකම රටේ. "දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, ඒවා එකක්වත් වැඩක් නැහැ. රටේ අධ්‍යාපනය නම්, රටේම අධ්‍යාපනය" කියලා මම කිව්වා. පාසල් 10,161ක් තිබෙනවා. අධ්‍යාපන ඇමතිවරයා විධියට හැමෝගේම අධ්‍යාපනය ගැන බලන්න ඕනෑ. අපි පසු ගිය දිනයක සංඛ්‍යා ලේඛන සියල්ලම හැදුවා. පළාත් අමාත්‍යාංශයේ ලේකම්, පළාත් අධ්‍යක්ෂ, අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයින් මේ ඔක්කෝම එකතු කරලා කමිටුවක් දාලා අපි කිව්වා, "ගුරු තුලනය කරන්න අවශ්‍ය සියලුම පියවර ගන්න" කියලා. මම හිතන්නේ දෙසැම්බර් 31වැනිදා වෙන කොට මේ සියල්ලම තුලනය කරන්න අවශ්‍ය පියවර ගනීවි. හැබැයි, මේක මට තනිවම කරන්නත් බැහැ.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, வடக்கு, கிழக்கிலுள்ள தொண்டர் ஆசிரியர்களுக்கு நியமனம் வழங்குவதற்கு எவ்வளவு காலம் எடுக்கும்? நீங்கள் ஒரு காலவரையறையைச் சொன்னீர்கள் என்றால், அது அவர்களுக்கு ஆறுதலாக இருக்கும். நீங்கள் எவ்வளவு காலத்துக்குள் அவர்களுக்கு இந்த நியமனங்களை வழங்குவீர்கள்?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි. දැන් කැබිනට් පත්‍රිකා හදලා සියලු දේම කරලා තිබෙනවා. ඉදිරි සතියේදී පමණ එය ඉදිරිපත් කරන්න පුළුවන්. ඒකේ කිසිම සැකයක් නැහැ. එහෙම ඉදිරිපත් කළාම එතැන ඉඳලා ක්‍රියාවලිය සිදු වෙන්න ගත වන කාලය විතරයි තිබෙන්නේ. ඒ ගැන මට හරියටම මෙතැනදී කියන්න බැහැ. ඊට පස්සේ ඒක කැබිනට් අනුකාරක සභාවලට ගියාම සමහරවිට කල් යනවා. ඒ ක්‍රියාවලිය කරලා එන්න යන කාලය පමණයි ගත වෙන්නේ. ඒ නිසා ඒකට වැඩි කාලයක් යයි කියලා හිතන්න බැහැ. කොහොමත් මේ දේ නම් කරනවා. ඒ ගැන සැකයක් හිතන්න එපා. මෙය කරන්නට ප්‍රමාද වුණේ අනෙකුත් සාධකවල තිබෙන ප්‍රශ්න නිසා මිසක්, ප්‍රමාද කිරීමේ වුවමනාවක් නිසා නොවෙයි. ඒ ගැනත් මම ගරු මන්ත්‍රීතුමාට කියන්නට ඕනෑ.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමනි, ගුරු ඌනතාව නිසායි ස්වේච්ඡා ගුරුවරු බිහි වෙන්නේ. ගරු මැතිතුමනි, මේක ජාතික අවශ්‍යතාවක් සේ සලකා, විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර ඇති වී තිබෙන ප්‍රශ්නය කල් නොයවා, ඉතාමත්ම කඩිනමින් විසඳන්නය කියා මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්වේච්ඡා ගුරුවරුන්ගේ ප්‍රශ්නය විතරක් නොවෙයි, උතුරු නැඟෙනහිර අධ්‍යාපනය උසස් තැනකට ගෙන ඒම අපේ ප්‍රධාන වගකීමක්; අධ්‍යාපන ඇමතිවරයා විධියට මගේ වගකීමක්. අපේ ආණ්ඩුව බලයට ගෙන එන්නට සහයෝගය දීපු ඡන්දදායකයෝයි මේ ඉන්නේ; මේ වෙනස කරන්න උදවු කරපු ඡන්දදායකයින්. ඒක අප කවදාවත් අමතක කරන්නේ නැහැ. එහෙම නොවුණත්, කිසිම භේදයක් නැතිව අප දේශපාලනය කරනවා. නමුත් මේක විධිමත්ව විසඳන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණය පැහැදිලි කරන්නට ඕනෑ. අපි නිවැරැදිව මේ ව්‍යවස්ථා, රෙගුලාසි මත ක්‍රියා කරන්නට ඕනෑ. ඒකයි අපි ගුරු ව්‍යවස්ථාවට අනුව පුරප්පාඩු ටික හඳුනා ගෙන, පසු ගිය කාලයේ විභාග පැවැත්වුවේ. එතැනිනුත් කොටසක් තේරුණා. මම ඒ අය හම්බ වෙලා පත්වීම් එක්දහස් පන්සිය ගණනක් දුන්නා. ඒකේදී උතුරු පළාතටත් පත්වීම් සෑහෙන කොටසක් ගියා. එහෙම ගියේ සුදුසුකම් තිබෙන අයයි. මෙතැනිනුත් සුදුසුකම් තිබෙන අය යම් පදනමක් උඩ ගන්නට ඕනෑ. සුදුසුකම් තිබෙනවාය කියා අපට පහළින්ම ගන්න බැහැ. අඩුම ගණනේ යම් අධ්‍යාපන මට්ටමකින් ඉහළ අයව ගන්න අපි ඉස්සරලා බලන්න ඕනෑ. මොකද, ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම අපේ වගකීමක්. ස්වේච්ඡා ගුරුවරු ගන්න ඕනෑය කියා, අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළවත් සමත් නැති කෙනෙක් බඳවා ගත්තොත්, ඔහු පද්ධතියට දාපුවාම ප්‍රශ්න එනවා. ඒ නිසා මේවා පියවරෙන් පියවර කළ යුතුයි. ඒක මට කරන්න ඉඩ දෙන්න. මම හරියට කරලා දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you.

***එකල්හි වේලාව අ.භා. 7.00 වුයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2016 ඔක්තෝබර් 27 වන දින සභා සම්මතිය අනුව, 2016 නොවැම්බර් මස 12 වන සෙනසුරාදා පූ,භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி. ப. 7.00 மணியாகிவிடவே மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2016 ஒக்ரோபர் 27ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2016 நவம்பர் 12, சனிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 7.00 p.m.,* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Saturday, 12th November, 2016 pursuant to the Resolution of Parliament of 27th October, 2016.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.